# පෙරදිග සංගීතය

## ගුරු මාර්ගෝපදේශය

## 13 වන ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කෙරේ)**

**සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**ජාතික අධ්‍යාපන ආයතනය**
**මහරගම**
**ශ්‍රී ලංකාව**

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

පෙරදිග සංගීතය
13 ශ්‍රේණිය
ගුරු මාර්ගෝපදේශය
ප්‍රථම මුද්‍රණය - 2017

© ජාතික අධ්‍යාපන ආයතනය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම,
ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

# අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂය මාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද, අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වාදීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියළු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂය මාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරත වීම, පන්ති කාමර මිණුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි, යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද, ආයතන සභාවේ ද, රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයින් හා වෙනත් පාර්ශ්වයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවුඩය

ඉගෙනුම, පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත්කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනාගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කරගනු ලබන්නේ ඉගෙනුමයි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශ, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂය මාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වාගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක් වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා විෂය අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස්කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශ ශික්ෂකයා හට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශ හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගැයීම් සිදුකරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමග ප්‍රත්‍යක්ෂකරණයට පත්විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

## විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශකත්වය හා අනුමතිය** | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| විෂය උපදේශනය | සුදත් සමරසිංහ අධ්‍යක්ෂ, සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| **විෂය සම්බන්ධීකරණය** | ජානකී පතිරණගේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| **විෂය සංස්කරණය** | |
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, (විශ්‍රාමික)<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර. |
| **බාහිර සම්පත් දායකත්වය** | |
| ඩබ්. වී. ජී. විතානගේ | අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, (විශ්‍රාමික)<br>කලාප අධ්‍යාපන කාර්යාලය, රත්නපුර. |
| ඩී. චානක පීරිස් | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය,<br>කොළඹ 07. |
| කපිල මැද්දෙගොඩ | මධ්‍යස්ථානාධිපති,<br>සම්පත් මධ්‍යස්ථානය, මීගොඩ |
| කේ. කේ. එස්. ජයවික්‍රම | සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (විශ්‍රාමික),<br>කලාප අධ්‍යාපන කාර්යාලය, පිළියන්දල. |
| රංජිත් ප්‍රියන්ත සිල්වා | කථිකාචාර්ය, ගුරු විද්‍යාලය, ගිරාගම. |
| ආර්. ඩී. පෙරේරා | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මහනුවර. |
| ඊ. ඒ. ප්‍රේමසිරි | ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, කළුතර. |
| ටී. එච්. එම්. ශාන්ත | මූලටියන කලාප අධ්‍යාපන කාර්යාලය - හක්මන |
| **අභ්‍යන්තර සම්පත් දායකත්වය** | |
| ජානකී පතිරණගේ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව. |
| **භාෂා සංස්කරණය** | |
| අමරසිරි වික්‍රමරත්න | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයන අංශය,<br>ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය,<br>ඔලුවිල්. |
| ශ්‍රීනාත් ගණේවත්ත | භාෂා සංස්කාරක |
| **පරිගණක යතුරු ලියනය** | එම්.ඒ.ජේ.මංචනායක - කුඹුක්ගැටේ ම.ම.වි.<br>ඉබ්බාගමුව.<br>කේ. ඒ. ඒ. ජයරාණි ගුණතිලක |
| **පිටකවර නිර්මාණය** | රවීන්ද්‍ර තේනුවර |
| **විවිධ සහාය** | ප්‍රේමරත්න පෙරේරා<br>එන්. දීපා ශිරෝමණී |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

දෛනික ජීවිතය සාර්ථකව පවත්වා ගැනීම හා යහපත් සමාජයක් ගොඩනැංවීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොටගෙන සහශ්‍රයේ සිදු කළ නව ප්‍රතිසංස්කරණවලට අනුව සකස් කළ උසස් පෙළ නව විෂය නිර්දේශ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. විෂය නිර්දේශයේ අන්තර්ගත නිපුණතා හා නිපුණතා මට්ටම් සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැපයීමට මෙම ග්‍රන්ථය සකස් කොට තිබේ. මෙය සම්පාදනයේ දී හා පරිහරණය කිරීමේ දී අ.පො.ස (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගත යුතු වේ.

සංගීත විෂය හා සබැඳි අරමුණු පදනම් කරගෙන නිපුණතා 08ක් ඔස්සේ නව විෂය නිර්දේශය සැලසුම් කොට තිබේ. 12 වන ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 34ක් ද 13 වන ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 25ක් යටතේ විෂය අන්තර්ගතය ගොනුකර ඇත. නිපුණතා, නිපුණතා මට්ටම් හා සබැඳි ක්‍රියාකාරකම්වල අන්තර්ගත විෂය සන්ධාරයෙන් ලබන දැනුමෙන් පමණක් පෝෂිත ව විභාගවලින් ඉහළ සමාර්ථ ලබාගත්ත ද යහපත් සමාජ ජීවිතයක් ගතකිරීමට එය ප්‍රමාණවත් නොවේ. දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනයෙන් හිස හදවත හා දෑත් ද පෝෂණය කළ යුතුවේ. එකී පෝෂණයෙන් තමා ද සමාජය යහපත් මාවතක් කරා යොමු කරවීමට ගැළපෙන ජීවිතය නංවාලීම අද්‍යතන යුගයේ ප්‍රබල සමාජ අවශ්‍යතාවකි.

මෙම ග්‍රන්ථය භාවිත කරණ සියලු ම ගුරුභවතුන් මෙහි මුල් පිටුවේ සිට අවසාන පිටුව දක්වා ඇති කරුණු අවධානයෙන් යුතු ව කියවා අවබෝධ කරගත යුතු වේ. අපේක්ෂිත අරමුණු කරා එළඹීමට නිපුණතා, නිපුණතා මට්ටම් කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර අදාළ ඉගෙනුම් පල කරා ළඟාවීමට ක්‍රියාකාරකම් ස්වාධීනව සැලසුම් කළ යුතුවේ. යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවලින් තමන් ට අභිමත පරිදි ඉගැන්වීම් ක්‍රමයක් තෝරා ගැනීමට නිදහසක් ඇත. එමෙන්ම තෝරා ගන්නා ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම විය යුතු ය. ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත පල කරා සිසුන්ට ළඟාවීමට අවශ්‍ය පසුබිම හා පහසුකම් සැපයීමට පියවර ගැනීම වැදගත් ය. එක් එක් ක්‍රියාකාරකම් සඳහා කාලච්ඡේද වෙන් කර ඇත. පන්ති කාමරයේ සිසු ශක්‍යතා සලකා බලමින් විවිධ පරිසර තත්ත්වයන් යටතේ කාලච්ඡේද සුදුසු පරිදි යොදා ගැනීමට අවකාශය ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර නූතන ගුරු භූමිකාව ඊට අනුගත විය යුතුව ඇත. ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම යන කාර්යයේ දී ගුරුවරයාගේ වගවීම හා වගකීම පුළුල් පරාසයක් කරා විහිදී ඇත. ක්‍රියාකාරකම් අවසානයේ ඇගයීමට අවශ්‍ය ප්‍රශ්න සකස් කිරීම, ඒ සඳහා ඇගයීම් නිර්ණායක ගොඩනැඟීම ක්‍රියාකාරකම් සැලසුමෙහි සුවිශේෂ අංගයකි. උක්ත ගුරු භූමිකාව පරිණාමන ගුරු භූමිකාව ලෙස නම් කර තිබේ.

වාර සටහනෙහි ක්‍රියාකාරකම් සඳහා අනු අංක ඇතුළත් කර ඇත. අනු අංක 1 සිට 18 දක්වා පළමු වාරයට ද, අංක 19 සිට 31 දක්වා දෙවැනි වාරයට ද, 32 සිට 46 තෙවන වාරයට ද අදාළ වේ. පාඩම් අනුපිළිවෙල වෙනස් කිරීමෙන් ඒවායේ සම්බන්ධතාවය ගිලිහී යා හැකි නිසා හැකි තරම් අනුපිළිවෙල රැකගැනීමට අවධානය යොමු කරන්න. 13 ශ්‍රේණියේ අවසානයේ ප්‍රායෝගික පරීක්ෂණය සිදුවන ආකාරය පහත දැක්වේ.

- ගායනය ප්‍රධාන ව තෝරාගත් සිසුන් අදාළ ප්‍රායෝගික කොටස් ගායනයෙන් ඉදිරිපත් කලයුතු අතර, ඊට අමතරව තෝරාගත් ස්වර වාද්‍ය භාණ්ඩයක මූලික පුහුණුව ප්‍රදර්ශනය කලයුතුවේ. අනතුරුව ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයකින් නිර්දේශිත ප්‍රායෝගික කොටස් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. අවශ්‍ය නම් ස්වර වාද්‍ය භාණ්ඩයක් වෙනුවට තබ්ලාවෙන් නිර්දේශිත කොටස් වාදනය කර පෙන්විය හැකිය.
- වාදනය ප්‍රධාන ව තෝරාගත් සිසුවෙක් වයලීනය, සිතාරය, එස්රාජය, දිල්රුබාව, බටනළාව, සරෝද්, සන්තූර්, බොක්ස් ගිටාර් සහ මැන්ඩලීනය යන භාණ්ඩ එකකින් ප්‍රායෝගිත කොටස් ඉදිරිපත් කල යුතුවේ. අමතරව තමා තුළ ඇති ගායනය පිළිබඳ ඉතා සරල ආකාරයකින් ප්‍රදර්ශනය කළයුතු වේ. නැතහොත් තබ්ලාවෙන් නිර්දේශිත කොටස් වාදනය කර පෙන්විය හැකිය. එසේත් නැතහොත් සැක්සෆෝන්, කොන්සර්ට් ෆ්ලූට් වැනි භාණ්ඩයකින් තමා තුළ ඇති වාදන දක්ෂතා ප්‍රදර්ශනය කලහැකිය. ගායනය ප්‍රධාන කරගත් සිසුන්ට මෙන්ම වාදනය ප්‍රධාන කරගත් සිසුන්ට ද ස්වර පුවරුවෙන් නිර්දේශිත කොටස් වාදනය අනිවාර්ය වේ.

නිර්මාණශීලී ගුරුවරයෙකු ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම සඳහා සරල මග පෙන්වීමක් ලෙස ඉදිරිපත් කර ඇති මෙම ගුරු මාර්ගෝපදේශය අධ්‍යාපන පොදු සහතික පත්‍ර පාඨමාලාවේ ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීමේ කාර්ය සාර්ථක කර ගැනීමට මනා පිටිවහලක් වේවායි පතමු.

# පටුන

පිටුව


| | | |
|---|---|---|
| 1.0 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 2.0 | ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු | xi |
| 3.0 | මූලික නිපුණතා | xii -xiii |
| 4.0 | පෙරදිග සංගීත විෂය අරමුණු | xiv |
| 5.0 | ජාතික පොදු අරමුණු සහ පෙරදිග සංගීත විෂය අරමුණු අතර සම්බන්ධතා දැක්වීම | xv |
| 6.0 | නිපුණතා, නිපුණතා මට්ටම, විෂය අන්තර්ගතය, ඉගෙනුම් පල සහ කාලච්ඡේද | xvi - xxv |
| 7.0 | වාර බෙදා දැක්වීම | xv |
| 8.0 | පෙරදිග සංගීත විෂය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/ වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | 1.1 උත්තර භාරතීය සංගීතයට අයත් විවිධ ස්වර සංගති සහ හැඩයන්ගෙන් යුත් රාග කිහිපයක ස්වභාවය හඳුනා ගනිමින් ශිල්පීය ගුණාංග සහිත ව ගායනයේ/වාදනයේ යෙදෙයි. | • ජය ජයවන්ති, භෛරව සහ හංසධ්වනි යන රාගවල සර්ගම්<br>• නිර්දේශිත රාගයන්හි ස්වර අභ්‍යාස ගමක්, මීන්ඩ් සහිත ව<br>• නිර්දේශිත රාගවලට අයත් මධ්‍යලය ගීත වාදිත සහ ඒවායේ විශේෂ ස්වර සංගති, පූර්වාලාප සහ මධ්‍යාලාප, ඩාලා සමඟ රාග විස්තාරණය<br>• විවිධ තානාලංකාර ගායනය/වාදනය<br>• කුසලතා සහිත ව සමස්ත ගායනය/වාදනය | • ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරමින් රාගධාරී ගීත ගායනයේ වාදනයේ යෙදෙයි.<br>• නිර්දේශිත රාගවල සෛද්ධාන්තික පසුබිම හා සුවිශේෂ ලක්ෂණ අධ්‍යයනය කරමින් ප්‍රායෝගික කුසලතා වර්ධනය කරගනියි. | 06<br>03<br>27<br>12<br>09 |
| | 1.2 සමප්‍රකෘති රාග යුගලයක සමප්‍රකෘති බව ප්‍රායෝගික ව පැහැදිලි කරයි. | • භෛරව-කාලිංගඩා යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව රාග විස්තර හා ස්වර විස්තාර විශේෂ ස්වර සංගති මඟින් ප්‍රායෝගිකව | • සමප්‍රකෘති රාග දෙකක සමවිෂමතා ප්‍රායෝගික ව දක්වයි. | 08 |
| | 1.3 විලම්බලය ඛ්‍යාල් ගීතයක් / වාදිතයක් සුවිශේෂ ශිල්පාංග සහිත ව ගයා/වයා ප්‍රදර්ශනය කරයි. | • බාගේශ්‍රී, දේස්, ආසාවරී, ජයජයවන්ති, භෛරව යන රාග අතරින් එකකට අයත් විලම්බ ඛ්‍යාල් ගීතයක් වාදිතයක් පූර්වාලාප, මධ්‍යාලාප, බෝල් ආලාප, සෙඩාර්ඞ් ආලාප, සහ තානාලංකාර සමග.(වාදනය කරන සිසුන් පිළිබඳව අවධානය යොමුකරන්න.) | • විලම්බලය ඛ්‍යාල් ගීතයක් සුවිශේෂ ශිල්පාංග සහිත ව ගයා/වයා ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | 14 |
| | 1.4 විලම්බලය හා සුවිශේෂ ව බැඳුණු තාල පද එකිනෙක සසඳමින් ඒවා ප්‍රායෝගික ව අභ්‍යාස කරයි. | • ඒක්තාල්, තීලවඩා, හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ නිරූපණය<br>• ඉහත තාල හා සමාන වෙනත් තාල හා ප්‍රායෝගික ව සන්සන්දනය (චෞතාල්, පංජාබි, ත්‍රිතාල්)<br>• තාල අධ්‍යයනය සමගුණ නිරූපණය. (හින්ච් තාලය, බෙම්ටෝ තාලය, පංජාබි තාලය සහ ධමාර් තාලය) | • උත්තර භාරතීය රාගධාරී සංගීතයේ ඇතුළත් තාල පද ප්‍රායෝගික ව භාවිත කිරීමේ කුසලතාව ලබයි. | 04<br>06<br>04<br>08 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 2.0 විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි. | 2.1 අපරදිග සංගීතය තුළ සංගීත නිර්මාණයන්හි ස්වභාවය ගවේෂණය කරමින් ඒවාට දායක වූ සංගීතඥයන් කිහිප දෙනෙකුගේ තොරතුරු විමර්ශනය කරයි. | • ත්‍රිතාල්, ඒක්තාල්, තාල තබ්ලාවෙන් වාදනය.<br>• Symphony ස්වභාවය සහ මොසාර්ට්, බිතෝවන්, බාක් සංගීතඥයන්ගේ තොරතුරු<br>• Ballet, Opera ( බැලේ, ඔපෙරා)වල සංගීතයේ ස්වභාවය<br>• සංගීතය වින්දනාත්මක සවන්දීමේ අභ්‍යාස | • බටහිර සංගීතය තුළ පිළිගත් උත්තරීතර සංගීතඥයින් පිළිබඳ දැනුම ලබමින් බටහිර සංගීත කෘති සංසන්දනාත්මකව අගයයි. | 04<br>04<br>04 |
| 3.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි. | 3.1 බටහිර සංගීත භාණ්ඩවල ස්වභාවය හඳුනා ගනිමින් වර්ග කරයි.<br>3.2 වාදන දක්ෂතා ප්‍රදර්ශනය කරයි. | • Strings, Wind, Percussion වර්ගීකරණය, සහ පාසල් පද්ධතියේ භාවිත වන සංගීත භාණ්ඩ හඳුනාගැනීම.<br>• ස්වර පුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ වාදනය | • බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණයේ යෙදෙමින් භාණ්ඩ හඳුනාගනියි. භාණ්ඩ වාදනය කරයි. | 02<br>06 |
| 4.0 සංගීත රසාස්වාද යේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි. | 4.1 සම්භාව්‍ය සංගීත ශිල්පීන් හඳුනා ගනිමින් ඔවුන්ගේ සංගීත කෘති රසාස්වාදයේ හුරු වෙයි. | • ගසල් ගායන ශෛලිය (පන්කජ් උදාස්, ජග්ජිත්සිං) ගුලාම් අලි<br>• ඛ්‍යාල් ගායන ශෛලිය (උස්තාද් අමීර් ඛාන්, පර්වීන් සුල්තානා, පණ්ඩිත් ජස්රාජ් ,උස්තාද් රෂීඩ් ඛාන්, පණ්ඩිත් බිම්සන් ජෝෂී)<br>• තබ්ලා ඒකල වාදන (උස්තාද්, අල්ලාරක්ඛා, උස්තාද් ශබීර් හුසේන්) (පණ්ඩිත් අනින්දෝ චැටර්ජි, උස්තාද් අෆාක් හුසේන් ඛාන්)<br>• සිතාර්, එස්රාජ්, දිල්රුබා සන්තූර්, බටනලා, වයලීන්, ෂෙහනායි, සරෝද්, සාරංගි, වාදන රසාස්වාදය | • උත්තර භාරතීය සංගීතයේ අති ප්‍රවීන සංගීතඥයින්ගේ නිර්මාණ රස විඳිමින් ඔවුන්ගේ ගායන වාදන අධ්‍යයනයට පෙළඹෙයි. | 08<br>08<br>04<br>04 |
| 5.0 දේශීය ජන සංගීතාංග පිළිබඳ ව ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින් සංස්කෘතික උරුමයන් රැක ගනියි. | 5.1 සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ/වාදනයේ දක්ෂතා දක්වයි. | • මුද්‍රප්පදය සහිත ප්‍රශස්ති<br>• තාලරූප දෙකක් සහිත හටන් කාව්‍ය<br>• සැවුලා වන්නම හා එහි තාල රූපයේ විශේෂත්වය.<br>• ගණපති සවිදම, අස්නෙ, මංගලම්<br>• වැලපුම් ගී | • දේශීය ජන සංගීතාංග අගයකරමින් ප්‍රාසාංගිකව යොදාගැනීමේ හැකියාව ලබාගැනීමට ගායනයේ /වාදනයේ යෙදෙයි. | 02<br>02<br>02<br>02<br>02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 6.0 සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | 6.1 භාරතීය සංගීතයේ ප්‍රභවය සහ විකාශය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි. | • වෛදික ගායනා සංගීතයට මුල් වූ අයුරු<br>• ගෝත්‍රික ගීත උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම<br>• පද්‍ය ප්‍රබන්ධ උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම<br>• සංගීතඥයන්ගේ පරිශ්‍රමය උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම (සාරංගදේව, අමීර්ඛුෂ්රු, පණ්ඩිත් භාත්ඛණ්ඩේ, මහාචාර්ය වී.එස්. නිගාම් පඬිවරුන්ගෙන් සංගීතයට සිදු වූ සේවය) | • භාරතීය සංගීතයේ වර්ධනයට හා විකාශයට බලපෑ හේතු විමර්ශනයට කරයි.<br>• නිර්දේශිත ඉන්දීය සංගීතඥයන් සිවුදෙනෙකු අගයයි. | 04<br>04<br>04<br>04 |
| 7.0 ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි. | 7.1 ව්‍යාවහාරික සංගීතයේ නිර්මාණ පිළිබඳ ව තර්කානුකූල ව අදහස් දක්වමින් තොරතුරු ගවේෂණය කරයි. | • එක් එක් යුගවල දී මෙරට චිත්‍රපට සංගීතයේ ඇති වූ වෙනස්කම් (මුල් යුගයේ දකුණු ඉන්දීය ආභාසය රේඛාව චිත්‍රපටයේ සංගීතය, සත්සමුදුර චිත්‍රපටයේ සංගීතය ආශ්‍රයෙන් විචාරය)<br>• නිර්දේශිත චිත්‍රපටවල සංගීත අධ්‍යක්ෂවරයා හා සංගීත නිර්මාණය පිළිබඳ ව සැකෙවින් සාකච්ඡා කිරීම.<br>• ගුරුවරයාගේ අභිමතය පරිදි තෝරාගත් චිත්‍රපට ගීතයක් ගායනය හා භාණ්ඩ මගින් වාදනය<br>රේඛාව - ඕළු නෙළුම්<br>මාතලන් - කොවුලන් හඬයි<br>සන්දේශය - කටේ කිරි සුවඳ<br>රන්මුතුදූව - ගලන ගඟකි<br>සත්සමුදුර - සිනිඳු සුදුමුතු<br>බඹරු ඇවිත් - උදුම්බරා<br>හිතක පිපුණු මල් - කමලාශනී<br>හුලවාලි - කුඩා ගමේ<br>එක්ටැම්ගේ - උන්මාද සිතුවම්<br>විසිදෑල - ගුමුගුමුව වදුලේ<br>• ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය ඔස්සේ මතු වන සිංහල සංගීතයෙහි බටහිර බලපෑම | • මෙරට චිත්‍රපට සංගීතයේ වර්ධනීය අවස්ථා විචාරයේ යෙදෙයි.<br>• චිත්‍රපට ගීත ගයමින් රසවිඳියි.<br>කණ්ඩායම් සංගීතයෙහි සාධනීය ලක්ෂණ සාකච්ඡා කරමින් ගීත නිර්මාණයේ යෙදෙයි. | 08<br>04<br>04<br>04 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදා බැලීම් කරයි. | 8.1 සරල ගීතයක අන්තර්ගතය විමසමින් විවිධ සුවිශේෂ කොටස් සහිත ව ගීත නිර්මාණය කරයි. | • Interlude & Introduction<br>• Bits, Counter Points, Chords, Adlib යන සංකල්ප පිළිබඳ ගී තනු ඇසුරින් අවබෝධය<br>• ඉහත කොටස් ඇතුළත් ගීත නිර්මාණය | • සරල ගීතයක අන්තර්ගත කොටස් විමසමින් නව නිර්මාණ බිහි කරයි. | 04<br>04<br>04 |
| | 8.2 පාසලේ පවතින සංගීත භාණ්ඩ හා විවිධ ආදේශ භාණ්ඩ උපයෝගි කරගනිමින් වාද්‍ය බණ්ඩයක් සාමූහික ව නිර්මාණය කරයි. | • සංගීත වාද්‍ය බණ්ඩයක් සාමූහික ව නිර්මාණය කරයි. | • වාද්‍ය බණ්ඩයක් සාමූහික ව නිර්මාණයේ අත්දැකීම් ලබයි. | 06 |
| 9.0 සංකේතානුසාරයේ සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි. | 9.1විවිධ සංකේත ඇසුරු කරමින් සංගීත ප්‍රස්තාර කරයි. | • අපරදිග සංගීත ප්‍රස්තාරවල ප්‍රකාශන සංකේත (f.ff.p.pp.slur, staccato, legato, pizzicato)<br>• සංගීත ප්‍රස්තාරයක් ඇසුරින් ඉහත සංකේත භාවිත හුරුව<br>• නූතන සරල සංගීතයේ ප්‍රස්තාර විධි සහ සංකේත එම ප්‍රස්තාරයක් ඇසුරින් ප්‍රායෝගික ව භාවිත හුරුව | • බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ දී භාවිත වන ප්‍රකාශන සංකේත හඳුනා ගනියි.<br>• නූතන ව්‍යාවහාරික සංගීතයට අවශ්‍ය පරිදි සංගීත ප්‍රස්තාර කිරීමේ ක්‍රම ශිල්ප භාවිත කරයි. | 02<br>04<br>04 |
| 10.0 සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි. | 10.1 සංගීත ස්වරවල භෞතික විද්‍යාත්මක තත්ත්වයන් පරීක්ෂා කර ස්වර සුසංයෝග කිරීමේ හැකියාව ලබයි. | • ස්වර සුසංයෝග කිරීමේ ක්‍රියාකාරකම් සහ කෝඩ්ස් ගොඩනැගෙන අයුරු Chords & Harmony | • එක් ස්වරයක් හා සමඟ තවත් ස්වරයක් සුසංයෝග කිරීමේ විධි හඳුනා ගනියි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය සන්ධාරය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2 සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි. | • අපට සංගීතය ඇසෙන අයුරු<br>• ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු<br>• කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු | • සංගීත අධ්‍යයනයේ දී කර්ණේන්ද්‍රිය හා ස්වරාලය වැදගත් වන අයුරු ජීව විද්‍යාත්මක හේතු දක්වමින් පැහැදිලි කරයි. | 03<br>03<br>02 |
| 11.0 සංගීතයේ මනෝ විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර තම ජීවිතය වඩාත් සාර්ථක කර ගනියි. | 11.1 සංගීතය හා බැඳි මනෝ විද්‍යාත්මක කරුණු අධ්‍යයනය කර එහි ඇති වාසිදායක තත්ත්වයන් ජීවිතයට එකතු කර ගනියි. | • බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාව (හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය ඇසුරින්)<br>• මනෝ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් ලෙස- මානසික ආතතිය පහ කරන ප්‍රතිකාර ක්‍රමයක් ලෙස සංගීතය (සංගීත චිකිත්සාව) | • සංගීතමය ඥානය හා බුද්ධිය අතර ඇති සම්බන්ධතාව විග්‍රහ කරයි.<br>• සංගීතය මානසික හා කායික සුවය සඳහා භාවිත කරයි. | 08<br><br>02 |
| | | ප්‍රයෝගික නොවන ඇගයීම් (වාර 3 සඳහා)<br>ප්‍රයෝගික ඇගයීම් (වාර 3 සඳහා) | | 18<br>18<br>-----<br>287<br>----- |

# හැඳින්වීම

නව සහශ්‍රයේ දී සිදු කළ නිපුණතා පාදක ක්‍රියාකාරකම් මූලික ප්‍රතිසංස්කරණ චක්‍රයේ දෙවැනි අදියර 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ. නව ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය යටතේ ඉදිරිපත් කරන ලද විෂය නිර්දේශවල මූලික අරමුණු වන්නේ දැනුම, කුශලතා, ආකල්ප හා යහපත් ජීවන පුරුදු මෙන් ම උසස් රසඥතාවෙන් යුතු මානව හිතවාදී චින්තනයෙන් යුත් පුද්ගලයකු වශයෙන් ක්‍රියාකාරී වැඩලොවට අවශ්‍ය නිපුණතාවෙන් යුක්ත මානව සම්පත් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම ය. එම අරමුණු සාක්ෂාත් කිරීමට දායක වීම අධ්‍යාපන ක්‍රියාවලියෙහි නියුක්ත සැමගේ වගකීමකි.

අ.පො.ස (උ.පෙළ) 12, 13 ශ්‍රේණි නව විෂය නිර්දේශ සැලසුම් කිරීමේ දී උක්ත කරුණු මෙන් ම නර්තන අධ්‍යාපන අරමුණු හා විෂය සුවිශේෂතා සැලකිල්ලට ගෙන තිබේ. දේශීය සංස්කෘතික හර පද්ධතීන් හඳුනාගැනීම, අගය කිරීම, ආරක්ෂා කිරීම හා පවත්වාගෙන යාම මෙන් ම අන්‍ය සංස්කෘතික ලක්ෂණ හඳුනාගැනීම, අගය කිරීම හා ජාත්‍යන්තර තලයේ දී නොසැලී කටයුතු කිරීම සඳහා අවශ්‍ය විෂයානුබද්ධ හා පුද්ගල ශක්‍යතා වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

අ.පො.ස (උ.පෙළ) නර්තන විෂය හා සබැඳි අරමුණු 07 ක් පදනම් කොට ගෙන නිපුණතා 8ක් ඔස්සේ නව විෂය නිර්දේශ සැලසුම් කොට තිබේ. 12 ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 35ක් හා 13 ශ්‍රේණියේ දී නිපුණතා මට්ටම් 25ක් යටතේ විෂය අන්තර්ගතය ගොනු කර ඇත. අ.පො.ස (උ.පෙළ) විෂය ප්‍රතිසංස්කරණ 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට නියමිත අතර දීර්ඝ වශයෙන් කරුණු හා උපදෙස් ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථයෙන් ඉදිරිපත් කිරීමට සැලසුම් කොට තිබේ.

| අනු අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 01 | • ජය ජයවන්ති, රාගයේ ගමක්, මීන්ඩ් සහිතව ස්වර අභ්‍යාස<br>ජය ජයවන්ති, රාගයේ සර්ගම්<br>ජය ජයවන්ති, රාගයේ මධ්‍යලය ගීත ,විශේෂ සංචර<br>සංගති , පූර්වාලාප සහ බඩත් ආලාප සමග රාග විස්තාරණය<br>ජය ජයවන්ති, රාගයේ විවිධ තානාලංකාර ගායනය/වාදනය<br>ශිල්පාංග සහිතව ඉදිරිපත් කිරීම | 19 | - | - |
| 19 | • භෛරව රාගයේ ගමක්, මීන්ඩ් සහිතව ස්වර අභ්‍යාස<br>භෛරව රාගයේ සර්ගම්<br>භෛරව රාගයේ මධ්‍යලය ගීත ,විශේෂ සංචර<br>සංගති , පූර්වාලාප සහ බඩත් ආලාප සමග රාග විස්තාරණය<br>භෛරව රාගයේ විවිධ තානාලංකාර ගායනය/වාදනය<br>ශිල්පාංග සහිතව ඉදිරිපත් කිරීම | - | 19 | - |
| 32 | • හංසධ්වනි රාගයේ ගමක්, මීන්ඩ් සහිතව ස්වර අභ්‍යාස<br>හංසධ්වනි රාගයේ සර්ගම්<br>හංසධ්වනි රාගයේ මධ්‍යලය ගීත ,විශේෂ සංචර<br>සංගති , පූර්වාලාප සහ බඩත් ආලාප සමග රාග විස්තාරණය<br>හංසධ්වනි රාගයේ විවිධ තානාලංකාර ගායනය/වාදනය<br>ශිල්පාංග සහිතව ඉදිරිපත් කිරීම | - | - | 19 |
| 20 | • භෛරව-කාලිංගඩා යන රාග යුගලයන්හි සම ප්‍රකෘති බව රාග විස්තර හා ස්වර විස්තාර විශේෂ ස්වර සංගති මගින් ප්‍රායෝගිකව | - | 08 | - |
| 21 | • භාගේශ්‍රී , දේස් , ආශාවරී, ජය ජයවන්ති, භෛරව යන රාග අතරින් එකකට අයත් විලම්භලය ගීතයක් පූර්වාලාප, මධ්‍යාලාප, බෝල්ආලාප, සහ තානාලංකාර සමග. | - | 14 | - |
| 02 | • ඒක්තාල්, තීලවඩා, හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ | 04 | - | - |
| 03 | නිරූපණය | 06 | - | - |
| 33 | • ඉහත තාලපද සමග සමගාමී වෙනත් තාලපද හා සන්සන්දනය | | | 08 |
| 22 | • ත්‍රිතාල් , ඒක්තාල්, තබ්ලාවෙන් නිරූපණය | - | 04 | - |
| 04 | • සරල තාල පද අධ්‍යයනය ( හින්ච්,බෙම්ටෝ,පංජාබි) | 04 | - | - |
| 05 | • Symphony ස්වභාවය සහ මොසාර්ට්, බේතෝවන්, බාක් | 04 | - | - |
| 23 | සංගීතඥයින්ගේ තොරතුරු | - | 04 | - |
| | • Ballet, Operaවල සංගීතයේ ස්වභාවය | | | |
| | • සංගීතය වින්දනාත්මක සවන් දීමේ අභ්‍යාස | 04 | - | - |
| 06 | • Strings, Wind, Percussion සිද්ධාන්තය, සහ පාසල් පද්ධතියේ | | | |
| 07 } | භාවිත වන සංගීත භාණ්ඩ හඳුනාගැනීම. | 02 | 02 | 02 |
| 24 } | • ස්වරපුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව වාදනය | | | |
| 34 } | | - | - | 08 |
| 35 | • ගසල් ගායන ශෛලිය (උස්තාද් පන්කජ්උදාස්, ජග්ජිත්සිං) | 02 | - | - |
| 08 | • ඛ්‍යාල් ගායන ශෛලිය (උස්තාද් අමීර්ඛාන්, උස්තාද් බඩේගුළාම් අලිඛාන්, පර්වීන් සුල්තානා, පණ්ඩිත් ජස්රාජ් සිං) | | | |

| අනු අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලච්ඡේද | තෙවන වාරය කාලච්ඡේද |
|---|---|---|---|---|
| 36 | • තබ්ලා වාදනයක අංග (උස්තාද්, අල්ලාරක්බා, උස්තාද් සakිර් හුසේන්. පණ්ඩිත් අනින්දෝ චැටර්ජි) | - | - | 08 |
| 37 | • සිතාර්, එස්රාජ්, සන්තූර්, බටනලා, වයලීන් ෂෙහනායි වාදන රසාස්වාදන | - | - | 04 |
| 09 | • මුද්‍රපදය සහිත ප්‍රශස්ති | 02 | - | - |
| 10 | • තාලරූප දෙකක් සහිත හටන් කාව්‍ය | 02 | - | - |
| 11 | • සැවුලා වන්නම හා එහි තාලරූපයේ විශේෂත්වය. | 02 | - | - |
| 12 | • ගණපති සවිදම, අස්නෙ, | 02 | - | - |
| 13 | • වැළපුම් ගී | 02 | - | - |
| 25 | • වෛදික ගායනා සංගීතයට මුල් වූ අයුරු | - | 04 | - |
| 26 | • ගෝත්‍රික ගීත උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම | - | 04 | - |
| 27 | • පද්‍ය ප්‍රබන්ධ උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම | - | 04 | - |
| 28 | • සංගීතඥයින්ගේ පරිශ්‍රමය උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම (සාරංගදේව, අමීර්ඛුෂ්රූ, භාත්ඛණ්ඩේ, මහාචාර්ය නිගාම් පඬිවරුන්ගෙන් සංගීතයට සිදුවූ සේවය ) | - | 04 | - |
| 29 | • එක් එක් යුගවලදී මෙරට චිත්‍රපට සංගීතයේ ඇති වූ වෙනස්කම් (මුල් යුගයේ දකුණු ඉන්දීය ආභාසය රේඛාව චිත්‍රපටයේ සංගීතය, සත්සමුදුර චිත්‍රපටයේ සංගීතය ආශ්‍රයෙන් විචාරය) | - | 08 | - |
| 30 | • නිර්දේශිත චිත්‍රපටවල සංගීත අධ්‍යක්ෂවරයා හා සංගීත නිර්මාණය පිළිබඳව සැකෙවින් සාකච්ඡා කිරීම. | - | 04 | - |
| 31 | • ගුරුවරයාගේ අභිමතය පරිදි තෝරාගත් චිත්‍රපට ගීතයක් ගායනය හා භාණ්ඩ මගින් වාදනය (රේඛාව-ඕලු නෙලුම්, මාතලන්-කොවුලන් හඬයි සන්දේශය-කටේ කිරි සුවඳ, රන්මුතුදූව-ගලන ගඟකි, සත්සමුදුර-සිනිඳු සුදුමුතු, බඹරුඇවිත්-උදුම්බරා, හිතකපිපුණුමල්-කමලාශනී, හුලවාලි-කුඩා ගමේ. එක්ටැම්ගේ-උන්මාද සිතුවම්, වීසිදෑල- ගුමුගුමුව වදුලේ) | - | 04 | - |
| 38 | • Interlude & Introduction | - | - | 04 |
| 39 | • Bits, Counter Points, Chords, Adlib යන සංකල්ප පිළිබඳ ගීතනු ඇසුරින් අවබෝධය. | - | - | 04 |
| 40 | • ඉහත කොටස් ඇතුළත් ගීත නිර්මාණය | - | - | 04 |
| 41 | • ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය තුළින් මතුවන සිංහල සංගීතයෙහි බටහිර බලපෑම. | - | - | 04 |
| 42 | • සංගීත වාද්‍ය ඛණ්ඩයක් සාමූහිකව නිර්මාණය. | - | - | 06 |
| 43 | • අපරදිග සංගීත ප්‍රස්තාරවල ප්‍රකාශන සංකේත | - | - | 02 |
| | (f.ff.p.pp.slur, staccato, legato, pizzicato) | - | - | 04 |
| 44 | • සරල ප්‍රස්තාරයක් ඇසුරින් ඉහත සංකේත භාවිත හුරුව | | | |
| 45 | • නූතන සරල සංගීතයේ ප්‍රස්තාර විධි සහ සංකේත එම ප්‍රස්තාරයක් ඇසුරින් ප්‍රායෝගිකව භාවිත හුරුව | - | - | 04 |

| අනු අංක | විෂය අන්තර්ගතය | පළමු වාරය කාලච්ඡේද | දෙවන වාරය කාලඡේද | තෙවන වාරය කාලඡේද |
|---|---|---|---|---|
| 14 | • ස්වර සුසංයෝග කිරීමේ ක්‍රියාකාරකම් සහ ''කෝඩ්ස්'' ගොඩනැගෙන අයුරු Chords & Harmony | 06 | - | - |
| 15 | • අපට සංගීතය ඇසෙන අයුරු | 04 | - | - |
| 16 | • ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු | 03 | - | - |
| 17 | • කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු | 03 | - | - |
| 18 | • බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාවය (හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය ඇසුරින්) | 10 | - | - |
| 46 | • සංගීත චිකිත්සාව | | | 02 |
| | (ඇගයීම් - ප්‍රායෝගික වන ඇගයීම 01-02- | 06 | 06 | 06 |
| | ප්‍රායෝගික නොවන ඇගයීම 01-02-03- | 06 | 06 | 06 |
| | මුළු කාලච්ඡේද | 93 | 95 | 95 |
| | මුළු කාලච්ඡේද- 283 කි. | | | |

# ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

දෛනික ජීවිතය සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොටගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින්, ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම හ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩනැගීම සහ ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගයනට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම.

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාමට සහාය වීම.

4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුශලතා, පෝෂණය කිරීම.

# 3.0 මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

**1. සන්නිවේදන නිපුණතා :**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලාදයී අයුරින් අදහස් හුවමාරු කරගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය සහ කාලය ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කරගැනීම.

**2. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා :**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයන්
- චිත්තවේගී බුද්ධිය

**3. පරිසරයට අදාළ නිපුණතා :**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීව - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුශලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතා, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සැප පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළ බැහැර කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත්වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා :**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරි ම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා.

**5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා :**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල ව හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහාගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා :**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා :**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැන්වීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.)

# 4.0 පෙරදිග සංගීත විෂයයේ අරමුණු

1. රාගධාරී සංගීතාංග සහ සිද්ධාන්ත ඇසුරින් ශික්ෂණය ලබා ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

2. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා බැඳි ජනගායන, වාදන පිළිබඳ විමර්ශනාත්මක අත්දැකීම් ලබා එහි අගය විශ්ව සංගීතය කරා රැගෙන යාමට පෙළඹෙයි.

3. ශ්‍රී ලාංකේය, භාරතීය සහ බටහිර සම්භාව්‍ය සංගීතඥයින්ගේ නිර්මාණ පරිශීලනය කරමින් සම්භාව්‍ය සංගීත රසාස්වාදයේ හුරුව ලබයි.

4. ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ ප්‍රබලතම අංගය ලෙසට අගය කරමින් සරල ගී සංකල්පයේ විකාශය සහ නූතන ස්වභාවය පිළිබඳ ව ප්‍රායෝගික සංවාදයේ යෙදෙයි.

5. ශ්‍රී ලංකාවේ සහ උත්තර භාරතයේ වඩාත් ජනප්‍රිය වූ සම්භාව්‍ය ගණයේ ලා සැලකෙන තෝරාගත් චිත්‍රපට ගීත ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.

6. දේශීය රංග සම්ප්‍රදායන් හා බැඳි රංග ශෛලීන් සහ සංගීත ශෛලීන් පිළිබඳ අධ්‍යයනය කරමින් නූතන ප්‍රසංග වේදිකාවට ගැළපෙන ලෙස නිර්මාණ කරණයේ යෙදෙයි.

7. බටහිර සංගීත නිර්මාණ විමර්ශනය කර විශ්ව සංගීත නිර්මාණ අගයයි.

8. විශ්ව සංගීතාංග ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග විශ්වයට මුදා හැරීමටත් අවශ්‍ය මට්ටමට සංගීත ප්‍රස්තාකරණයේ බටහිර ක්‍රමවේද පිළිබඳ අභ්‍යාසයේ යෙදෙයි.

9. සංගීතයේ භෞතික විද්‍යාත්මක පදනම විග්‍රහ කරමින් නව තාක්ෂණ විධි සංගීත නිර්මාණකරණයේ දී යොදා ගැනීම අත්හදා බැලීම් කරයි.

10. සංගීත විෂයය ඉගෙනීමට, සංරක්ෂණය සහ නිර්මාණකරණයට අන්තර් ජාලය සහ පරිගණකය යොදා ගන්නා අයුරු ප්‍රායෝගිකව හඳුනා ගනියි.

11. නූතන වෙළඳපොළට ගැළපෙන පරිදි සංගීත භාණ්ඩ නිෂ්පාදනයට පෙළඹෙයි.

# 5.0 ජාතික අරමුණු සහ විෂය අරමුණු අතර සම්බන්ධතාව

| පෙරදිග සංගීත විෂයයේ අරමුණු | ජාතික අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | i | ii | iii | iv | v | vi | vii | viii |
| 1. රාගධාරී සංගීතාංග සහ සිද්ධාන්ත ඇසුරින් ශික්ෂණය ලබා ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි. | | | | | ✓ | | | |
| 2. ශ්‍රී ලාංකේය සංස්කෘතික උරුමය හා බැඳි ජනගායන, වාදන පිළිබඳ විමර්ශනාත්මක අත්දැකීම් ලබා එහි අගය විශ්ව සංගීතය කරා රැගෙන යාමට පෙලඹෙයි. | | ✓ | | | | | | |
| 3. ශ්‍රී ලාංකේය, භාරතීය සහ බටහිර සම්භාව්‍ය සංගීතඥයන්ගේ නිර්මාණ පරිශීලනය කරමින් සම්භාව්‍ය සංගීත රසාස්වාදයේ හුරුව ලබයි. | ✓ | | | | | | | |
| 4. ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීත ක්ෂේත්‍රයේ ජනප්‍රියතම අංගය ලෙසට අගය කරමින් සරල ගීතයේ විකාශය සහ නූතන ස්වභාවය පිළිබඳ ව ප්‍රායෝගික සංවාදයේ යෙදෙයි. | | | ✓ | ✓ | | | | |
| 5. ශ්‍රී ලංකාවේ සහ උත්තර භාරතයේ වඩාත් ජනප්‍රිය වූ සම්භාව්‍ය ගණයේ ලා සැලකෙන තෝරාගත් චිත්‍රපට ගීත ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි. | ✓ | | | | | | | |
| 6. දේශීය රංග සම්ප්‍රදායයන් හා බැඳි රංග ශෛලින් සහ සංගීත ශෛලින් පිළිබඳ අධ්‍යයනය කරමින් නූතන ප්‍රසංග වේදිකාවට ගැළපෙන ලෙස නිර්මාණ කරණයේ යෙදෙයි. | | | ✓ | | | | | |
| 7. බටහිර සංගීත නිර්මාණ විමර්ශනය කර විශ්ව සංගීත නිර්මාණ අගයයි. | | | | | | | | ✓ |
| 8. විශ්ව සංගීතාංග ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග විශ්වයට මුදා හැරීමටත් අවශ්‍ය තත්ත්වයට සංගීත ප්‍රස්තාකරණයේ බටහිර ක්‍රමවේද පිළිබඳ ව අභ්‍යාසයේ යෙදෙයි. | | | | | | | | ✓ |
| 9. සංගීතයේ භෞතික විද්‍යාත්මක පදනම විග්‍රහ කරමින් නව තාක්ෂණ විධි සංගීත නිර්මාණකරණයේ දී යොදා ගැනීම පිළිබඳ ව අත්හදා බැලීම් කරයි. | | | | | | | ✓ | |
| 10. සංගීත විෂය ඉගෙනීමට, සංරක්ෂණය සහ නිර්මාණකරණයට අන්තර් ජාලය සහ පරිගණකය යොදා ගන්නා අයුරු ප්‍රායෝගික ව හඳුනා ගනියි. | | | | | | | ✓ | |
| 11. නූතන වෙළෙඳපොළට ගැළපන පරිදි සංගීත භාණ්ඩ නිෂ්පාදනයට පෙලඹෙයි. | | | | ✓ | | ✓ | | |

**13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය**
**පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික**

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 1.2**

උත්තර භාරතීය සංගීතයට අයත් රාගකිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයෙ වාදනයේ යෙදේ.

**2. විෂය සන්ධාරය -**

- ජය ජයවන්ති, රාගයේ ගමක්, මීන්ඞ් සහිතව ස්වර අභ්‍යාස
- ජය ජයවන්ති, රාගයේ සර්ගම්
- ජය ජයවන්ති, රාගයේ මධ්‍යලය ගීත, විශේෂ සංචර සංගති, පූර්වාලාප සහ බඩත් ආලාප සමග රාග විස්තාරණය
- ජය ජයවන්ති, රාගයේ විවිධ තානාලංකාර ගායනය/වාදනය ශිල්පාංග සහිතව ඉදිරිපත් කිරීම

**3. උපකරණයේ සවභාවය**

- ප්‍රායෝගික ව ගායනයේ / වාදනයේ යෙදවීම.

**4. කාලය** කාලච්ඡේද 02

**5. අරමුණු** -

- රාගධාරී ගීත ශිල්පාංග සහිතව ඉදිරිපත් කරයි.
- රාගයේ ස්වභාවය ප්‍රායෝගිකව පැහැදිලි කරයි.
- රාග විස්තර පැහැදිලි කරයි.
- රාගධාරී සංකල්ප කිහිපයක් පිළිබඳ ව පැහැදිලි කරයි.

**6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

ගුරු උපදෙස්

- මෙම ඇගයීම පිළිබඳ ව සිසුන් මුලින්ම දැනුවත් කරන්න.
- පළමු වාරයට අයත් ජයජයවන්ති රාගය පළමු වාරයේ ප්‍රායෝගික ඇගයීම සඳහා යොදා ගත හැකිය. මේ අනුව ඉදිරි වාරවලට අයත් රාග ද මේ අනුව සකසා ගත හැකිය.
- ක්‍රියාත්මක කරවීම.
  1 රාගයට අයත් සර්ගම් ගීතය ගායනයට/වාදනයට සලස්වන්න.
  2 ස්වර විස්තාරයක් හෝ ස්වර සංගති 4 ක් ගායනයට/වාදනයට සලස්වන්න.
  3. රාගයට අයත් මධ්‍යලය ගීතය ගායනයට හෝ වාදනයට සලස්වන්න.
  4. රාගයට අයත් තානාලංකාර ගායනයට හෝ වාදනයට සලස්වන්න.
  5. ඉදිරියේ දැක්වෙන ප්‍රශ්න 4 ඉදිරිපත් කර පිළිතුරු ලබා ගන්න. (එක් පිළිතුරකට ලකුණු 01 බැගින් පිළිතුරු 4 ට ලකුණු හතරකි)

1 රාගයේ වාදි සංවාදී නම් කරන්න.
2 රාගයේ මුඛ්‍යාංගය ප්‍රායෝගික ඉදිරිපත් කරන්න.
3 ආලාප වර්ග නම් කර ඉන් එක් වර්ගයකට ප්‍රායෝගික උදාහරණයක් ලෙස කෙටි ආලාප කොටසක් ඉදිරිපත් කරන්න.
4 රාගයේ ආරෝහණ - අවරෝහණ ප්‍රායෝගික ව ඉදිරිපත් කරන්න.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | සර්ගම් ගීතය නිවැරදි ව ගායනය කිරීම | ලකුණු 04 |
| 2 | ස්වර විස්තාරයක් හෝ ස්වර සංගති 4 ක් ගායනයට/වාදනයට | ලකුණු 04 |
| 3. | මධ්‍යලය ගීත නිවැරදිව ගායනය / වාදනය කිරීම | ලකුණු 04 |
| 4 | තානාලංකාර ගායනයට හෝ වාදනයට | ලකුණු 04 |
| 5 | කෙටි ප්‍රශ්න හතරේ පිළිතුරුවල නිරවද්‍යතාවයට | ලකුණු 04 |

**13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය**
**පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික නොවන**

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 3.1**
- තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය සහ භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

**2. විෂය සන්ධාරය -**
- ඒක්තාල්, තිලවඩා, හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ නිරූපණය
- ඉහත තාලපද සමග සමගාමී වෙනත් තාලපද හා සන්සන්දනය

**3. උපකරණයේ සවභාවය**
- ශ්‍රවණය මගින් ඒක්තාල්, තිලවඩා, තාල පද හඳුනාගැනීම, හඳුනාගත් තාල පද ලිඛිත ව ප්‍රස්තාර කිරීම, අදාල තාලපද සමගුණ නිරූපණය, ඒක්තාල්, තිලවඩා, යන තාල පද සමග සමගාමී වෙනත් තාල පද ප්‍රස්තාර කරවීම, හා ඒවා අතර සමවිෂමකම් දැක්වීම වැනි ප්‍රායෝගික හා ලිඛිත කොටස් ඇතුළත් මිශ්‍ර ඇගයීමකි. ලිඛිත ස්වභාවය වැඩි නිසා ලිඛිත ඇගයීමක් ලෙසට වර්ග කර ගත හැකිය.

**4. කාලය**
- කාලච්ඡේද 02

**5. අරමුණු**
- ශ්‍රවණය මගින් තාල පද වෙන්කර හඳුනාගෙන ප්‍රස්තාර කරයි.
- එම තාල පද සමගුණ වශයෙන් අතින් නිරූපණය කරයි.
- එම තාල පද සමග සමගාමී වෙනත් තාල පද ප්‍රස්තාර කර සමගුණ වශයෙන් අතින් නිරූපණය කරයි.
- ඒවා අතර සමවිෂමකම් ලිඛිතව දක්වයි.

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්
- මෙම ඇගයීම ඒක්තාල්, තිලවඩා, චෞතාල්, ත්‍රිතාල් සහ පංජාබි යන තාල පද පහක් ඇසුරින් පවත්වන බව සිසුන් ට කල්වේලා ඇතුව දැනුම් දෙන්න. මෙහි විෂය සන්ධාරයේ ඇතුළත් පාඩම් දෙක නිම කර අවසානයේ මෙම ඇගයීම තවත් කාල ඡේද 2 ක දී නිම කළ හැකිය. එම පාඩම් පිළිබඳ ඉගෙනුම දීර්ඝ කිරීමට මෙම ඇගයීම යොදා ගත හැකිය. මෙම සිසුන් ත්‍රිතාල් තාලය පිළිබඳ අභ්‍යාස පහළ ශ්‍රේණි වල දී ද , ඉටු කර ඇති නිසා ඉතිරි තාල පද 04 ට වැඩි අවධානය යොමු කරන්න.
  පහත දැක්වෙන පියවර අනුගමනය කරන්න
  පියවර 01.
- ඒක්තාල්, තිලවඩා, චෞතාල්, සහ පංජාබි යන තාල පද ඇතුළත් ශ්‍රව්‍ය පටයක් සකසා ගෙන ශ්‍රවණයට සළසන්න. නැතහොත් ඔබගේ තාල පද වාදනයේ දක්ෂතාවය මත ( නිවැරදි අවනද්ධාක්ෂර සහිත ) එම තාල සජීවී ව තාල පද වාදනයේ යෙදෙන්න. ශ්‍රවණය කළ පිළිවෙළ අනුව තාල පද වෙන් කර නම් කරවන්න. '' තිටකත ගදිගන '' , '' තිරිකිට ධිං'' වැනි අවනද්ධ කොටස් වාදනය කර හෝ ශ්‍රවණයට සළසා නිවැරදිව ලිවීමට යොමු කරන්න.
  පියවර 02.
- ශ්‍රවණය කළ පිළිවෙළ අනුව එම තාල පද නියමිත සංඥා ආදිය සහිතව ප්‍රස්තාර කරවන්න.
  පියවර 03.
- එම තාල පද සුදුසු ලය මත සමගුණයෙන් අතින් තාල නිරූපණය කරවන්න.
  පියවර 04.
- ශ්‍රවණය කළ පිළවෙළ අනුව තාල පද වලට සමගාමී වන වෙනත් තාල පද දෙකක් ප්‍රස්තාර කරවා ඒවායේ සමගුණ අතින් නිරූපණය කරවන්න.

පියවර 05.

- සුදුසු වගුවක් භාවිත කර ඒක්තාල්-චෞතාල් සහ තීලවඩා-පංජාබ් හෝ ත්‍රිතාල් සමග සැසඳීමක් කරවන්න.

නිර්ණායක -

1 ශ්‍රවණය කළ පිළිවෙළ අනුව තාල පද වෙන් කර නම් කිරීම. '' තිටකත ගදිගන '' '' තිරිකිට ධිං'' වැනි අවනද්ධ කොටස් ශ්‍රවණය මගින් නිවැරදිව ලිවීම. ලකුණු 04
2 ශ්‍රවණය මගින් හඳුනාගත් තාල පද නිවැරදිව ප්‍රස්තාර කිරීම ලකුණු 04
3. තාල පද සම, ගුණ වශයෙන් නිරූපණය ලකුණු 04
4. ඉහත තාල සමග සමගාමී වන වෙනත් තාල පද දෙකක් ප්‍රස්තාර කර ඒවායේ සමගුණ අතින් නිරූපණය ලකුණු 04

5 සුදුසු වගුවක් භාවිත කර ඒක්තාල්-චෞතාල් සහ තීලවඩා-පංජාබ් හෝ ත්‍රිතාල් සමග සැසඳීම ලකුණු 04

----------

මුළු ලකුණු 20 යි.

----------

ලකුණු 20 න් 15 කට අඩුවෙන් ලැබූ සිසුන් සඳහා නැවත මෙම පාඩම් සරලව ඉගැන්විය යුතුවේ.

13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය
පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික නොවන

1. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම**
සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ / වාදනයේ දක්ෂතා දක්වයි.

2. **විෂය සන්ධාරය :-**
මුද්‍රපදය සහිත ප්‍රශස්ති, හටන් කාව්‍ය, සැවුලා වන්නම , ගණපති සව්දම, අස්නෙ, වැලපුම් ගී යන සේ ගී වර්ග

3. **උපකරණයේ ස්වභාවය :-** විවෘත ග්‍රන්ථ පරීක්ෂණ, ඉදිරිපත් කිරීම සහ පැවරුම මිශ්‍ර ව.

4. **කාලය :-** කාලච්ඡේද 02

5. **අරමුණු :-**
- සේ ගී වර්ගවල ස්වභාවය අවබෝධ කර ගනියි.
- නිර්දේශිත ගී වර්ග වල සුවිශේෂතා පැහැදිලි කරයි.
- නිර්දේශිත ගී වර්ග එකින් එක සංසන්දනය කරයි.
- නිර්දේශිත ගී වර්ගවල විශේෂ ලක්ෂණ පිළිබඳ තර්කානුකූලව අදහස් දක්වයි.

5. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

**පහත දැක්වෙන ග්‍රන්ථ පරිශීලනය මගින් මෙම ඇගයුමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට සිසුන් ට කාලය ලබා දෙන්න. මෙම ග්‍රන්ථ ඔබ පුස්තකාලයේ නොමැති නම් පහත දැක්වෙන පිටු අංක වල ඡායා පිටපත් හැකි ප්‍රමාණයක් රැස්කර සිසුන්ට ඒවා පරිශිලනය කිරීමට යොමු කරන්න.**

- ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය - සී. ද එස්. කුලතිලක (පිටු අංක 186 - 190 ) 8 වන පරිච්ඡේදය
- ප්‍රශස්ති කාව්‍ය රසය - ජේ ඊ සේදරමන් ( පෙරවදන හා මුල් පිටු කිහිපය )
- හෙළ ගී මග - ඩබ්.බී. මකුළොලුව ( ඉහත විෂය සන්ධාරයට අයත් කොටස් )
- ශ්‍රී ලංකාවේ සංගීත ප්‍රභවය හා විකාශය - දුරස්ථ ගුරු අධ්‍යාපනය ( පිටු අංක 1 - 15)
- ශ්‍රී ලංකාවේ ජන සංගීතය - දුරස්ථ ගුරු අධ්‍යාපන ( පිටු අංක 18 - 20)

**මෙම ඇගයීම ඉදිරිපත් කිරීමට පාසලේ පහසුකම් ඇති පරිදි සහ සිසුන්ගේ හැකියාව පරිදි, පහත දැක්වෙන ක්‍රියා මාර්ග එක් එක් සිසුවාට තෝරාගත හැකිය.**

- **ශ්‍රී ලංකාවේ සේ ගී අතරින් තෝරා ගත් ගී '' යන නම මාතෘකා කර ගැනීම හා රැස්කර ගත් කරුණු එක් කළ Power Point Presentation එකක් හෝ නිර්මාණය කළ CD තැටියක්.**
- **ඉහත මාතෘකාව මත ප්‍රේක්ෂකයින් ඉදිරියේ පවත්වනු ලබන විනාඩි 15 කට නොඅඩු නිදර්ශණාත්මක කථාවක්.**
- **ඉහත මාතෘකාව යොදා ගනිමින් අනුමාතෘකා යටතේ රැස්කර ගත් තොරතුරු ඇතුළත් කර , අවශ්‍ය අවස්ථාවලදී රූපසටහන් එක්කර සැකසූ අභ්‍යාස පොතක්.**
- **රැස්කර ගත් තොරතුරු පිළිවෙළට ඇසුරු ලිපි ගොනුවක්**
- **පන්තියේ බිත්තියේ එල්ලා තැබීමට සුදුසු දෘශ්‍ය උපකරණයක්.**

**ඉහත ක්‍රියාමාර්ග දක්වා ඇත්තේ ගුණාත්මක බවින් වැඩි ක්‍රියාමාර්ගය අංක එකට යොදමින්ය. ඉදිරියේ දක්වන ක්‍රියාමාර්ග තුළද ගුණාත්මක බවින් වැඩිම ක්‍රියාමාර්ගය මුලින් දක්වා ඇත.**

**අභිමත ක්‍රියාමාර්ගයක් යොදා ගත්ත ද, එක් එක් විෂය මාතෘකාව සඳහා ලබා දෙන ඉඟි සිසුන් විසින් ආවරණය කළ යුතුවේ. පන්තියේ දී ලබා ගත් සටහන් පමණක් ප්‍රමාණවත් නොවේ. ලකුණු පිරිනැමීමේ දී ශිෂ්‍යා ගේ ඉදිරිපත් කිරීමේ ක්‍රියාමාර්ගය පිළිබඳව ද අවධානය යොමු කරන්න.**

- අනු මාතෘකා

**සේ ගී**

- සේ ගී යන්නට කෙටි නිර්වචනයක් සපයන්න.
- සේ ගී වර්ග කර දක්වන්න.
- සේගීවල සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

**ප්‍රසස්ථි හා හටන් ගී**

- ප්‍රශස්ති ගීතවල ආරම්භය හා ව්‍යාප්තිය හා සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. ඒවා ඇතුළත් ග්‍රන්ථ නම් කරන්න.
- පන්තියේ අධ්‍යයනය නොකළ තවත් ප්‍රශස්ති ගීතයක් දක්වන්න. ( සවුන්ඩ් ට්‍රැක් හෝ වීඩියෝ ට්‍රැක් එකක් මගින්, තමන්ගේ ම ගායනය මගින්, ගීත ස්වර ප්‍රස්තාරයක් මගින්, පදමාලාවක් පමණක් ලියා දක්වමින් )
- හටන් ගී හා ප්‍රශස්තිවල සමවිෂමතා දක්වන්න.

**සවුදම්, මංගලම් හා අස්නෙ**

මේවා පිළිබඳ කෙටි විස්තරයක් සහ භාවිත කරන අවස්ථා.

නිදසුන් සඳහා ගායනයක් හෝ ගීත ස්වර ප්‍රස්තාරයක්.

**වැළපුම් ගී**

- වැලපුම් ගී වල නාදමාලාව, පදමාලාව, රිද්මය, අතර ඇති සම්බන්ධතාවය හා ස්වර පරාසය, තාලය පිළිබඳ ඇති වෙනස්කම් විස්තර කරන්න.

**වන්නම්**

- වන්නම් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
- උඩරට, පහතරට, සබරගමු, වන්නම්වල ආරම්භය හා විශේෂ ලක්ෂණ
- ඔබ කැමති වන්නමක් නිදසුන් ලෙස ගායනයක් හෝ ගීත ස්වර ප්‍රස්තාරය

6. **ඇගයීම් නිර්ණායක**

| | |
|---|---|
| 1. ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් ක්‍රියාමාර්ගයේ නිර්මාණාත්මක බව | -ල. 04 |
| 2. දී ඇති අනුමාතෘකාවල විෂය කරුණු වල නිරවද්‍යතාවය | - ල. 04 |
| 3. එක් එක් අනුමාතෘකාවේ තොරතුරු පැහැදිලි කිරීම හා ශෛලිය | - ල. 04 |
| 4. ඉදිරිපත් කිරීමේ ක්‍රියාමාර්ගයේ ආකර්ශණීය බව | - ල. 04 |
| 5. අනුමාතෘකා ආවරණය වන පරිදි ප්‍රායෝගික නිදසුන් දැක්වීම | - ල. 04 |
| ---------- | |
| මුලු ලකුණු | 20 යි. |
| ---------- | |

ලකුණු 20 න් 15 කට අඩුවෙන් ලැබූ සිසුන් සඳහා නැවත මෙම පාඩම් සරලව ඉගැන්විය යුතුවේ.

**13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය**
**පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික**

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 10.1**

සංගීත ස්වරවල භෞතික විද්‍යාත්මක තත්ත්වයන් පරීක්ෂා කර ස්වර සුසංයෝග කිරීමේ හැකියාව ලබයි.

**2. විෂය සන්ධාරය -**

- ස්වර සුසංයෝග කිරීමේ ක්‍රියාකාරකම් සහ කෝඩ්ස් ගොඩනැගෙන අයුරු Chords & Harmony

**3. උපකරණයේ සවභාවය**

- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්

**4. කාලය**

- කාලච්ඡේද 02

**5. අරමුණු**

- ස්වර සුසංයෝග වීමේ සිද්ධාන්ත පසුබිම පිළිබඳ අදහස් දක්වයි.
- සරල තනුවක් නිර්මාණය කරයි.
- විවිධ ශිල්ප ක්‍රම ( Chords & Harmony )යොදා ගනිමින් ස්වර සුසංයෝග කරයි.
- නිර්මාණය ඉදිරිපත් කරයි.

**6. උපකරණ ක්‍රියාත්මක කිරිම සඳහා උපදෙස්**

ගුරු උපදෙස්

- මෙම ඇගයීම ගුරුවරයාගේ මග පෙන්වීම් මත කරනු ලබන නිර්මාණාත්මක ක්‍රියාකාරකමකි. තනිතනිව හෝ සිසුන් කණ්ඩායමක් ලෙස යොදා ගෙන ඉටු කළහැකිය.
- මේ සඳහා ශිෂ්‍යා තුළ Chords & Harmony සංකල්ප පිළිබඳ ප්‍රායෝගික දැනුම අවශ්‍ය වේ.
- ක්‍රියාත්මක කරවීම.

1. සරල තනුවක කොටසක් ( Melody) ශිෂ්‍යාට සපයන්න.

නිදසුනඃ-

ස - ග - / ප - ම ග / රි - ග ම / ප - - - /
ප - ග - / ම - රි - / ග - රි - / ස - - - /

2. ස්වර පුවරු භාණ්ඩයක් යොදා ගනිමින් ශිෂ්‍යාට තනිව පුහුණු වීමට ඉඩ සළසන්න. ( ස්වරස්ථාන නිවැරදි නොවේ නම් උපකාරී වන්න)
3. ශිෂයාගේ දැනුම මත 3rd Harmony, or 5th Harmony Chords යොදවන්න.
4. ශිෂයාගේ දැනුම මත Bass Part or Counter Part යොදවන්න.
5. එම කොටස් 3 ස්වරපුවරු වාද්‍ය භාණ්ඩයක් හෝ වෙනත් වාද්‍ය භාණ්ඩයක් මගින් වැයීමට සලස්වන්න.
6. ශිෂයාගේ දැනුම මත Melody කොටසට ගැලපෙන ලෙස තවත් ස්වර පාද දෙකක් සිසුන් ලවා නිර්මාණය කරවන්න. එම ස්වර පාද වල සුදුසු බව පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
7. ශිෂයාගේ දැනුම මත Harmony, Bass Part , Counter Part යොදවන්න.
8. පන්තියේ සිසුන් ප්‍රමාණවත් පරිදි සිටී නම් එක් එක් කොටස් එකිනෙකාට බෙදා දී එකවර ගායනයේ හෝ වාදනයේ යොදවා ඉදිරිපත් කරවන්න. ප්‍රමාණවත් සිසුන් නොමැති නම් 10, 11 ශ්‍රේණි වල සිසුන් සහභාගී කරවා ගනිමින් සුදුසු ලෙස ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | Chords & Harmony යෙදීමේ නිවැරදි තාවය | ලකුණු 04 |
| 2 | Bass Part or Counter Part යෙදීමේ නිවැරදි තාවය | ලකුණු 04 |
| 3. | නිර්මාණය නිවැරදිව ගායනය / වාදනය කිරීම/ඉදිරිපත් කිරීම | ලකුණු 04 |
| 4 | සහභාගීත්වය/නිර්මාණශීලි බව | ලකුණු 04 |
| 5 | සමස්ත නිර්මාණයේ මිහිරිතාවය ට | ලකුණු 04 |

## 13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය
## පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික නොවන

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -**

11.1සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි.

11.1 සංගීතය හා බැඳි මනෝ විද්‍යාත්මක කරුණු අධ්‍යයනය කර එහි ඇති වාසිදායක තත්ත්වයන් ජීවිතයට එකතු කර ගනියි.

**2. විෂය සන්ධාරය -**

- අපට සංගීතය ඇසෙන අයුරු
- ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු
- කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු
- බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාවය (හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය ඇසුරින්)

**3. උපකරණයේ සවභාවය**

- කථනය

**4. කාලය**
- කාලච්ඡේද 02

**5. අරමුණු**
- සංගීතය සඳහා උපකාරීවන ඉන්ද්‍රියන් පිළිබඳ අදහස් දක්වයි.
- කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු සාකච්ඡා කරයි.
- හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය ඇසුරින් බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාවය විමසයි.

**6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

ගුරු උපදෙස්
- මෙම ඇගයීම රැස්කරගත් තොරතුරු ඇසුරින් ශිෂ්‍යා විසින් කරනු ලබන කථාවකි.
- ක්‍රියාත්මක කරවීමට පහත දැක්වෙන කරුණු ඔස්සේ ශිෂ්‍යා මෙහෙයවන්න

1. සංගීතය විෂයේ දී පුද්ගලයාට උපකාරී වන ස්වරාලයේ සහ කර්ණේන්ද්‍රියේ ක්‍රියාකාරීත්වය දළ රූපසටහන් මගින් පැහැදිලි කිරීම.
2. අපට සංගීතය ඇසෙන අයුරු.
3. කටහඬෙහි මිහිර ඇති වීමට හේතු.
4. ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධිය කෙටියෙන්.
5. සංගීතය හා බුද්ධිය අතර සම්බන්ධය පිළිබඳ අදහස්.
6. බුද්ධි වර්ධනයට සංගීකය විෂය ඉවහල් වන අයුරු.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | ඉදිරිපත් කරනු ලබන කරුණු වල නිවැරදි තාවය | ලකුණු 04 |
| 2 | අදහස් ඉදිරිපත් කිරීමේ පිළිවෙළ/ පැහැදිලි බව | ලකුණු 04 |
| 3. | කථන කුසලතා/ඉදිරිපත් කිරීම | ලකුණු 04 |
| 4 | තර්කානුකුල බව | ලකුණු 04 |
| 5 | සමස්තය | ලකුණු 04 |

**ක්‍රියාකාරකම 01**

## ජයජයවන්ති රාගය

**නිපුණතාවය 1.0** :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායනා වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** :- උත්තර භාරතීය සංගීතයට අයත් විවිධ ස්වර සංගති සහ ස්වභාවයන්ගෙන් යුත් රාග කිහිපයක ස්වභාවය හඳුනා ගනිමින් ශිල්පීය ගුණාංග සහිත ව ගායනයේ/වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම 3.1** :- ජයජයවන්ති රාගය ගයමු වයමු.

**කාලච්ඡේද** :- 19

**ඉගෙනුම් පල** :-

- ජයජයවන්ති රාගයේ ස්වර අභ්‍යාස ගායනය/වාදනය කරයි.
- ජයජයවන්ති රාගයේ රාග ලක්ෂණ සහ ස්වභාවය අවබෝධ කරගනියි.
- ජයජයවන්ති සර්ගම් ගායනය/වාදනය කරයි.
- මධ්‍යලය ගී ගායනය/වාදනය කරයි.
- ජයජයවන්ති රාගයේ ආලාප හා මධ්‍යාලාප ගායනය/වාදනය කරයි.
- තානාලංකාර නිර්මාණය කර ගායනය/වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- තාම්පුරාව, සර්පිනාව, තබ්ලාව, දෘශ්‍යාධාර

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

ජයජයවන්ති රාගයේ ස්වර අභ්‍යාස සර්ගම් මධ්‍යලය ගී ආලාප මධ්‍යාලාප තානාලංකාර ප්‍රායෝගික ව ගායනය/වාදනය පුහුණු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. මේ තුළින් රාග සංගති, රාග ස්වභාවය පිළිබඳ මනා අවබෝධයක් ලැබෙන අතර, රාග රසවින්දන ශක්තිය වර්ධනය වී නිර්මාණකරණයට ද අවස්ථාව ලැබෙනු ඇත.

මේ සඳහා ජයජයවන්ති රාගයේ ස්වර අභ්‍යාස, සර්ගම් මධ්‍යලය ගී, ආලාප, මධ්‍යාලාප, තානාලංකාර පුහුණුව හා ඇගයීම කාලච්ඡේද 19ක් වෙන් කර ඇත.

රාග ස්වභාවය මැනවින් විදහා දක්වෙන ගීත මේ සඳහා යොදාගත හැකිය. ඇමුණුමේ දක්වෙන ගීතයක් හෝ වෙනත් සුදුසු මධ්‍යලය ගීතයක් හෝ තෝරා ගත හැකිය.

වාදනය කරන සිසුන් සඳහා රාගාංග මැනවින් විදහා දක්වෙන වාදිතයක් යොදාගත හැකිය.

ශ්‍රැති ස්වර ස්ථාන ස්වර සංගති තාලය සහ මිහිරිතාව රසභාව පිළිබඳ වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරීමේ කාර්යයෙහි යොදවන්න.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් අතරතුර දී හා අවසානයේ දී කරනු ලබන ඇගයීම් මගින් සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම පිළිබඳ ව සොයා බලා දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකිය.

පළමු වාරයට ජයජයවන්ති රාගයත් දෙවන වාරයට භෛරව රාගයත් තුන් වන වාරයට හංසධ්වනි රාගයත් ඉගැන්වීමට අපේක්ෂිත ය. පහත දක්වෙන ජයජයවන්ති රාගයේ පාඩම සංවර්ධන සැලසුම අනෙක් රාගවලට ද යොදාගත හැකිය.

පාඩම සංවර්ධනය :-

- සිසුන්ට ගැළපෙන ශ්‍රැතියක් තෝරා ගන්න. ඇමුණුමේ දක්වා ඇති ජයජයවන්ති රාගයේ ස්වර අභ්‍යාස හෝ රාගයේ ස්වර සංගති හෝ ඉස්මතු වන ලෙස ඔබ සකසා ගත් ස්වර අභ්‍යාස ගායනය/වාදනය කරවන්න. ගායනය කරන සිසුන්ට ස්වරයෙන් හා ආකාරයෙන් ස්වර අභ්‍යාස ගායනය කරවන්න. හුස්ම පාලනය කරගනිමින් කටහඬ පාලනය කරගනිමින් ශ්‍රැතියෙහි පිහිටා ගායනය කරවන්න.

(කාලච්ඡේද 01)

- ස්වර අභ්‍යාස සහ දෘශ්‍යාධාර සහායයෙන් ජයජයවන්ති රාගයේ විස්තර සාකච්ඡා කරන්න. ජයජයවන්ති රාගයේ ස්වභාවය ගැන අවබෝධය ලබා දෙන්න. උචිත ශ්‍රැති ස්වර තෝරා දෙන්න. ආරෝහණ අවරෝහණ ස්වර සංගති ගායනය/වාදනය කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුමේ දැක්වෙන සර්ගම් ගීතය ආවර්තයෙන් ආවර්තය ගායනය/ වාදනය කරවන්න. නිවැරැදි ස්වර ගායනය/වාදනය කෙරෙහි අවධානය යොමු කරන්න. ගයන/වයන ලද සර්ගම් ප්‍රස්තාරය සිසුන්ට ගොඩ නැඟීමට සලස්වන්න. සිසුන් විසින් ගොඩ නගන ලද ප්‍රස්තාරය දෘශ්‍යාධාරයක් මඟින් සසඳා ප්‍රස්තාර දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුමේ දැක්වෙන ජයජයවන්ති රාගයට අයත් මධ්‍යලය ගීතය තෝරා ගන්න. වාදනය කරන සිසුන්ට රාගාංග ප්‍රධාන කොටසක් වාදිතයක් අවශ්‍ය නම් යොදා ගත හැකිය. ආවර්තයෙන් ආවර්තය ගායන/වාදන කරන සිසුන් ලවා ප්‍රස්තාර ගොඩ නඟන්න.

  ස්ථායි කොටස හා අන්තරා කොටස තාලය හා සම්බන්ධ වෙමින් ගායනය වාදනය කරවන්න. ඔබ සකසා ගත් ජයජයවන්ති මධ්‍යලය ගීතයේ දෘශ්‍යාධාරයක් මඟින් රාගයට අදාළ ස්වර සංකේතවල තාල සංකේතවල වැදගත්කම පැහැදිලි කරන්න. ශ්‍රැතිය හා ස්වරස්ථාන පිළිබඳ අවධානය යොමු කරන්න.

(කාලච්ඡේද 02)

- මෙතෙක් ඉගෙන ගත් ජයජයවන්ති රාගයේ රාගාංග හා ප්‍රධාන ස්වර සංගති පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. ඒ ආශ්‍රිත ව ආලාපයන් ගොඩ නඟන්න. ස්වරයෙන් හා ආකාරයෙන් ගායනය කරවන්න. වාදනය නම් ඒ ඒ භාණ්ඩයන්ට සුවිශේෂී ව ආලාපයන් වාදනයට යොමු කරන්න.

(කාලච්ඡේද 02)

- ඉගෙන ගත් ආලාප මධ්‍යලය ගීතය සමඟ යොදා ගනිමින් මධ්‍යාලාප පිළිබඳ ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවන්න. තබ්ලාවෙන් තාලය වාදනය කරන අතර ආලාප ඛණ්ඩ ගායනය/වාදනය කරවන්න. ගීතයේ මුඛඩාවෙන් තාලය සමඟ සම්බන්ධ වන ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 02)

මධ්‍යාලාප ස්වරයෙන්, ආකාරයෙන්, බෝල් ආලාප (ගීතයේ වචන යොදාගෙන) ගායනය කරවීමට යොමු කරන්න. ස්ථායි මුඛඩාව සහ අන්තරා මුඛඩාව යොදාගෙන ස්ථායි ආලාප, අන්තරා ආලාප ලෙස මධ්‍යාලාප ගායනය/වාදනය කිරීමට යොමු කරන්න.

(කාලච්ඡේද 02)

- ජයජයවන්ති රාගයේ රාගාංග ඇසුරු කරමින් සිසුන් ලවා තානාලංකාර නිර්මාණය කරවන්න. විවිධ තානාලංකාර වර්ග අනුව තානාලංකාර නිර්මාණයට යොමු කරන්න. එම තානාලංකාර ගායනය/වාදනය කරවන්න. ස්වරයෙන් හා ආකාරයෙන් ගායනය කිරීමට යොමු කරවන්න.

(කාලච්ඡේද 02)

- ගොඩනගා ගත් තානාලංකාර තාලයට අනුකූල ව ගායනය/වාදනය කරවන්න. මධ්‍යලය ගීතයේ තාලය තබ්ලාවෙන් වාදනය කරන්න. තානාලංකාර ගායනය/වාදනය කර ගීතයෙන් තාලයට සම්බන්ධ වීමේ ක්‍රියාකාරකම්වල යොදවන්න. ස්වර තානාලංකාර, ආකාර තානාලංකාර, බෝල් තානාලංකාර ගායනය කිරීමට යොමු කරන්න. වාදනයේ දී තිහායි වැනි ක්‍රම ශිල්ප යොදාගෙන තානාලංකාර වාදනය කළ හැකි ය.

(කාලච්ඡේද 02)

- ජයජයවන්ති රාගයේ පූර්වාලාප, මධ්‍යලය ගීතය හෝ වාදිතය හෝ මධ්‍යාලාප, තානාලංකාර වැනි ශිල්පාංග සහිත ව රාගධාරී ගායනයක්/වාදනයක් ඉදිරිපත් කිරීමට යොමු කරන්න. ශ්‍රැතියට අනුව මිහිරි ව ගැයීමට/වැයීමට උපදෙස් දෙන්න. නිවැරදි ව ස්වර ස්ථාන ගායනයට/වාදනයට අවශ්‍ය අවස්ථාවන්හි දී මඟ පෙන්වන්න. තාලයට අනුකූල ව ගායනයට/වාදනයට අවධානය යොමු කරන්න.

(කාලච්ඡේද 03)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- පාඩම ආරම්භයේ සිට ම නිවැරදි ස්වර ස්ථාන ශ්‍රැතියට හා තාලයට අනුකූල වීම පිළිබඳ නිරන්තර ඇගයීමක් කළ යුතු ය.
- ජයජයවන්ති රාගයේ මධ්‍යලය ගීතය ගායනය/වාදනය කරවා ඉතා සුදුසු ලෙස අගයන්න.
- ප්‍රස්තාර කිරීම හා රාගයේ සුවිශේෂතා තහවුරු වීමට සුදුසු ඇගයීම් සකසා ගන්න.

**මූලාශ්‍ර**


- මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි - රාගාලංකාර
- මහාචාර්ය දයා රත්නසේකර - හින්දුස්ථානි සංගීත ආක්ෂිප්තිකා තරංගනි (තෘතීය භාගය)
- ආචාර්ය ප්‍රේමදාස මුදුන්කොටුව - සම්භාව්‍ය සංගීත කෘතීන්

ඇමුණුම 01

## ජයජයවන්ති රාගය

මේලය - බිලාවල්

ආරෝහණ - ස රිරි, රි ගු රි ස, නි ධ ප රි, ග ම ප, නි සං

අවරෝහණ - සං නි ධ ප, ධ ම රි ගු රි ස

ජාතිය - සම්පූර්ණ

වාදි - රි

සංවාදි - ප

මුඛ්‍යාංගය - රි ගු රි ස, නි ධ ප, රි

ගානසමය - රාත්‍රී දෙවන ප්‍රහරය

පරමේල ප්‍රවේශක රාගයක් වශයෙන් ද හඳුන්වනු ලැබේ. අමීර් කුෂ්රු පඬිතුමා ජයජයවන්ති රාගය හඳුන්වා දුන් බව සඳහන් වේ. මිශ්‍ර රාගයකි. සෝරට් රාග අංග හා ගෞඩ බිලාවල් අංග සම්මිශ්‍රණයක් ලෙස දක්වයි.

ආරෝහණයේ දී ශුද්ධ ගාන්ධාරයත් ශුද්ධ නිශාදයත් යොදා ගන්නා අතර අවරෝහණයේ දී කෝමල ගාන්ධාරයත් කෝමල නිශාදයත් යොදා ගනී. සමහර විට අවරෝහණයේ දී ශුද්ධ ගාන්ධාරය යෙදේ. එහෙත් කෝමල ගාන්ධාරය යෙදෙන්නේ අවරෝහණයේ දී පමණයි. කෝමල ගාන්ධාරය බොහෝවිට රිෂභයන් දෙකට මැදිව යොදා ගනී. ඒ අනුව ජයජයවන්ති රාගයේ කෝමල ගාන්ධාරය වක්‍ර ස්වරයක් ලෙස යෙදේ.

නිස, රිගුරිස, ස, ධනිරි, (ස) ධනිරි, රි රිගුරිස, නිධපරි, ගමපනිසං, රිගමග රිගු රිස, පධ මග, ම ප නි සං, වැනි ස්වර සංගති බහුලව යෙදේ. මන්ද්‍ර ප සිට මධ්‍ය සප්තකයේ රි ස්වරය දක්වා ගමන් කිරීම මෙම රාගයේ යෙදෙන අනන්‍යතාවයකි.

**ඇමුණුම 02**

ජයජයවන්ති රාගය

ස්වර අභ්‍යාස

1. රි ගු රි ස
   රි ග ම ග රි ගු රි ස
   රි ග ම ප ම ග රි ගු රි ස
   රි ග ම ප ධ ප ම ග රි ගුරි ස
   රි ග ම ප නි ධ ප ධ ම ග රි ගුරි ස
   රි ග ම ප නි සං රිං සං නි ධ ප ධ ම ග රි ගු රි ස

2. මග රිගමප
   මග රිගමප ධප
   මග රිගමප නිනිධප
   මග රිගමප නිසං නිනිධප
   මග රිගමප නිසංරිංසං නිනිධප
   මග රිගමප නිසංරිංගුංරිංසංනිසං නිනිධපමප

3 නිස ධනිරි,
රිගු රිස නිස ධනිරි,
රිගමග රිගු රිස නිස ධනිරි,
රිගමපමග රිගු රිස නිස ධනිරි,
රිමපනි ධපමග රිගු රිස නිස ධනිරි,
රිමපනි සංනිධපමග රිගු රිස නිස ධනිරි,

ඇමුණුම 03

සර්ගම්

කඩප් තාලය

ස්ථායි

| | | | |
|---|---|---|---|
| ප ප | රි රි රි | රි රි | රි ග ස |
| රි ග | ග ම ප | ග ම | රි ගු රි |
| නි නි | ස - ස | රි ගු | රි - ස |
| නි ධ | නි ස ස | රි නි | ධ නි ප |

අන්තරා

| | | | |
|---|---|---|---|
| ම ම | ප නි නි | සං - | නි සං සං |
| නි නි | සං රිං ගු | රිං සං | රිං සං නි |
| ධ ප | ධ ම ග | ම ප | නි ස ස |
| සං නි | ධ ම ප | ධ ම | රි ගු රි |
| නි නි | ස - ස | රි ගු | රි - ස |
| නි ධ | නි ස ස | රි නි | ධ නි ප |

පහත දැක්වෙන ගීත අතුරින් කැමති මධ්‍යලය ගීතයක් තෝරා ගත හැකි ය.

- දාමිණී දමකේ
- මොරෙ මන්ධර අබ ලෝනගි ආයේ
- රේ ගන ජායේ කාරි බදරියා
- ඉතවන

ක්‍රියාකාරකම 02

## ඒක්තාල්, තීලවාඩා තාල හඳුනාගැනීමේ අභ්‍යාස

**නිපුණතාව 1.0** : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.4** : තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය හා භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම** : ඒක්තාල්, තීලවාඩා, හඳුනාගැනීමේ අභ්‍යාස සහ සමගුණ නිරූපණය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- ඒක්තාල්, තීලවාඩා තාල හඳුනාගනියි.
- ඒක්තාල්, තීලවාඩා තාලවල ඨේකා සමගුණයෙන් නිරූපණය වන අන්දම අවබෝධ කරගනියි.

**ගුණාත්මක යෙදවුම්** : තාල ප්‍රස්තාරගත කරන ලද පුවරු, ශ්‍රව්‍ය උපකරණ

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්:**

තාලවල ගති ලක්ෂණ පිළිබඳ ව සාකච්ඡා කරමින් ඒවා ප්‍රායෝගික ව භාවිත වන අන්දම අවබෝධ කරවීම මෙම පාඩමින් අපේක්ෂිත යි. දෑතින් තාල නිරූපණය කිරීමේ දී දෑත් සංයෝග කිරීම හෙවත් ආඝාත තැබීම '**තාලී**' ලෙසත් දෑත් වියෝග කිරීම '**ඛාලී**' ලෙසත් උත්තර භාරතීය තාල ශාස්ත්‍රයෙහි හැඳින්වෙන බව සිසුන්ට උගන්වන්න. ඒක්තාල් හා තීලවාඩා තාලවල මාත්‍රා, විභාග, තාලසංඥා හා ඨේකා යෙදෙන අන්දම ගුරුවරයා විසින් පැහැදිලි කළ යුතු ය. තාල අතින් ප්‍රදර්ශනය කරමින් අදාළ තාලයේ ඨේකාව උච්චාරණය කරන අන්දම සිසුන්ට පැහැදිලි කරන්න. ඒක්තාල් භාරතීය සංගීතයෙහි ඛ්‍යාල් ගායනා සඳහාත්, තරාණා ගායනා සඳහාත්, තබ්ලා ඒකල වාදන සඳහාත් භාවිත කෙරෙන තාලයක් බවත්, තීලවාඩා තාලය බඩා ඛ්‍යාල් සඳහා පමණක් භාවිත කෙරෙන තාලයක් බවත් සිසුන්ට විස්තර කර දෙන්න. භාත්ඛණ්ඩේ තාල ප්‍රස්තාර ක්‍රමය අනුගමනය කරමින් මෙහි ඇමුණුමෙහි සඳහන් ආකාරයට ඒක්තාල් හා තීලවාඩා තාලවල තාල් ප්‍රස්තාර සිසුන් වෙත ලබා දෙන්න. ඉහත තාලවලට අදාළ අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි තබ්ලාවෙන් උත්පාදනය කරන ආකාරය පිළිබඳ අවබෝධය සිසුන්ට ලබා දෙන්න. මේ සඳහා අදාළ තාලවල ඨේකා ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය ඛණ්ඩ ද භාවිත කළ හැකි ය. පාඩම සංවර්ධනය සඳහා මඟ පෙන්වා ඇති පරිදි කාලච්ඡේද 04 සැලසුම් කරගන්න.

**පාඩම සංවර්ධනය :**

ඇමුණුමෙහි සඳහන් එක්තාල් හා තීලවාඩා තාල ප්‍රස්තාර සිසුන් වෙත ලබා දෙන්න. එම තාලවල මාත්‍රා, විභාග, තාල සංඥා හා ඨේකා විස්තර කරමින් ඒවායෙහි තාල ආකෘති ගොඩනැඟී ඇති අන්දම සිසුන්ට විස්තර කරන්න. එහි ඨේකා උච්චාරණය කර අතින් තාල් දමා පෙන්වන්න. සිසුන් තාල් අභ්‍යාසයෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

ඒක්තාල් ඨේකාවට අයත් අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි හඳුනා ගැනීම සඳහා ඔබ සූදානම් කරගත් ශ්‍රව්‍ය ඛණ්ඩය සිසුන්ට ඇසීමට

සලස්වමින් ඒක්තාල් ඨේකාවේ අක්ෂරයන් ගේ ධ්වනි පිළිබඳ අවබෝධය සිසුන් වෙත ලබා දෙන්න. එම ධ්වනි තබ්ලාවෙන් උපදවා ගන්නා ආකාරය එකිනෙක පැහැදිලි කරමින් ඨේකාව තබ්ලාවෙන් වයා පෙන්වන්න. ඒක්තාල් වාදනය කර ඇති ඛ්‍යාල් ගායනා හා තරාණා ගායනා ද සිසුන්ට ඇසීමට සලස්වන්න. ඒක්තාල් ඨේකාව විවිධ ලයෙන් වාදනය කිරීමේ දී මතු වන රසයන් ගේ වෙනස පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

(කාලච්ඡේද 01)

තීලවාඩා ඨේකාවට අයත් අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි හඳුනා ගැනීම සඳහා ඔබ සූදානම් කරගත් ශ්‍රව්‍ය ඛණ්ඩය සිසුන්ට ඇසීමට සලස්වමින් තීලවාඩා ඨේකාවේ අක්ෂරයන් ගේ ධ්වනි පිළිබඳ අවබෝධය සිසුන් වෙත ලබා දෙන්න. එම ධ්වනි තබ්ලාවෙන් උපදවා ගන්නා ආකාරය එකිනෙක පැහැදිලි කරමින් ඨේකාව තබ්ලාවෙන් වයා පෙන්වන්න. තීලවාඩා වාදනය කර ඇති බඩා ඛ්‍යාල් ගායනා සිසුන්ට ඇසීමට සලස්වන්න.

(කාලච්ඡේද 01)

සිසුන් ලවා ඒක්තාල් ඨේකාව හා තීලවාඩා ඨේකාව සමගුණයෙන් තබ්ලාවෙන් වාදනය කරවමින් ඔවුන් ප්‍රායෝගික අභ්‍යාසයෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඒ ඒ කොටස් අවසානයේ වාචික ප්‍රශ්න හා ප්‍රායෝගික යෙදවීම් මඟින් සිසුන් ඇගයීමට ලක් කරන්න.

ඇමුණුම

ඒක්තාල්

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| ධිං | ධිං | ධගෙ | තිරිකිට | තූ | නා | කත් | තා | ධගෙ | තිරිකිට | ධී | නා |
| X | | 0 | | 2 | | 0 | | 3 | | 4 | |

තීලවාඩා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| ධා | තිරිකිට | ධිං | -ධිං | ධා | ධා | තිං | තිං | තා | තිරිකිට | ධිං | -ධිං | ධා | ධා | ධිං | ධිං |
| X | | | | 2 | | | | 0 | | | | 3 | | | |

**ක්‍රියාකාරකම 03**

## තාල සංසන්දනය

**නිපුණතාව 1.0** : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.4** : තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය හා භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම** : තාල සංසන්දනය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :

- ඒක්තාල් හා තීලවාඩා තාල සමඟ සමගාමී වූ වෙනත් තාල හඳුනාගනියි.
- තාල සංසන්දනය කරයි.

**ගුණාත්මක යෙදුම්** : ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ, තබ්ලාවක්

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක්:**

ඒක්තාල් හා තීලවාඩා තාල සමඟ සමගාමී වූ වෙනත් තාල හඳුනාගෙන ඒවා සංසන්දනය කරමින් තාලවල ගති ලක්ෂණ පිළිබඳ අවබෝධ කරවීම මෙම පාඩමින් අපේක්ෂිත යි. ඒක්තාල් හා සමගාමී වූ තාලයක් වන චෞතාල් ද, ත්‍රිතාල් හා සමගාමී වූ තාල දෙකක් වන තීලවාඩා හා පංජාබි තාලවල තාල ප්‍රස්තාර සිසුන් වෙත ලබාදෙන්න. ඒක්තාලයේ හා චෞතාලයේත් තීලවාඩා, පංජාබි හා ත්‍රිතාල් වලත් මාත්‍රා, විභාග හා තාලස්ථාන සමාන වුවත්, යෝකා එකිනෙක වෙනස් බව පැහැදිලි කරන්න. ඒක්තාල් භාරතීය සංගීතයෙහි ඛ්‍යාල් ගායනා සඳහාත්, තරාණා ගායනා සඳහාත්, තබ්ලා ඒකල වාදන සඳහාත් භාවිත කෙරෙන තාලයක් බවත්, චෞතාල් ධ්‍රැපද් ගායනා සඳහා භාවිත කෙරෙන තාලයක් බවත් විස්තර කර දෙන්න. එසේ ම ත්‍රිතාල් ඛ්‍යාල් ගායනා සඳහාත්, ගත් වාදන සඳහාත්, තරාණා ගායනා සඳහාත්, තබ්ලා ඒකල වාදන සඳහා භාවිත කෙරෙන තාලයක් බවත්, පංජාබි ඨුම්රි හා ටප්පා ගායන ශෛලින් සඳහා භාවිත කෙරෙන තාලයක් බවත්, තීලවාඩා තාලය බඩා ඛ්‍යාල් ගායනා සඳහා පමණක් භාවිත කෙරෙන තාලයක් බවත් සිසුන්ට විස්තර කර දෙන්න. එක ම තාලයක් වුවත් විවිධ ලයෙන් වාදනය වීමේ දී ඒවායේ රස භාවයන් වෙනස් වන අන්දම ශාස්ත්‍රීය ගායන වාදන ඇතුළත් ශ්‍රව්‍ය ඛණ්ඩ ඇසීමට සැලැස්වීමෙන් සිසුන්ට අවබෝධ කර දෙන්න. මෙම මාතෘකාව සඳහා වෙන් කර ඇති කාලච්ඡේද 06 පාඩම සංවර්ධනය සඳහා මඟ පෙන්වා ඇති පරිදි වෙන්කර ගත හැකි ය. ඉගැන්වීමට නියමිත කාලච්ඡේදයට හෝ කිහිපයට හෝ ගැළපෙන පරිදි ක්‍රියාකාරකම් සැලැස්ම ගුරුවරයා විසින් ගොඩනඟාගත යුතු වෙයි.

**පාඩම සංවර්ධනය :**

ඇමුණුමෙහි 1 කොටසෙහි සඳහන් තාල ප්‍රස්තාර හා වගුව සිසුන් වෙත ලබාදෙන්න. ඒක්තාල් හා චෞතාල්හි මාත්‍රා, විභාග, තාලස්ථාන සමාන මුත් යෝකා එකිනෙක වෙනස් බව පැහැදිලි කරන්න. ඒක්තාල් විලම්බ, මධ්‍ය හා ද්‍රැත යන ත්‍රිවිධ ලයෙහි ම භාවිත වන තාලයක් බවත්, චෞතාල් විලම්බ ලයෙහි භාවිත වන තාලයක් බවත් සිසුන්ට පහදා දෙන්න. ඒක්තාල් හා චෞතාල් වාදනය කර ඇති ශාස්ත්‍රීය ගායන වාදන ශ්‍රව්‍ය උපකරණ ආධාරයෙන් සිසුන්ට ඇසීමට සලස්වන්න. සිසුන් ගේ අදහස් ද විමසමින් ප්‍රායෝගික භාවිතයේ දී ඒවායේ ඇති වන වෙනස් කම් සාකච්ඡා කරන්න. සංවෘතාංගයෙන් හා විවෘතාංගයෙන් වාදනය වන අයුරු පැහැදිලි කරන්න.

(කාලච්ඡේද 02)

ඇමුණුමෙහි 2 කොටසෙහි සඳහන් තාල ප්‍රස්තාර හා වගුව සිසුන් වෙත ලබාදෙන්න. ත්‍රිතාල්, පංජාබි හා තීලවාඩා තාලවල මාත්‍රා, විභාග, තාලස්ථාන සමාන මුත් ඨේකා එකිනෙක වෙනස් බව පැහැදිලි කරන්න. ත්‍රිතාල් විලම්බ, මධ්‍ය හා දෘත යන ත්‍රිවිධ ලයෙහි ම භාවිත වන තාලයක් බවත්, පංජාබි විලම්බ හා මධ්‍ය ලයෙහි භාවිත වන තාලයක් බවත්, තීලවාඩා විලම්බ ලයෙහි පමණක් භාවිත වන තාලයක් බවත් සිසුන්ට පහදාදෙන්න. ඉහත තාල වාදනය කර ඇති ශාස්ත්‍රීය ගායන වාදන ශ්‍රව්‍ය උපකරණ ආධාරයෙන් සිසුන්ට ඇසීමට සලස්වන්න. ත්‍රිතාල්, පංජාබි හා තීලවාඩා තාලවල ඨේකා වාදනයේ දී මතු වන රිද්මීය ලක්ෂණ පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න

(කාලච්ඡේද 04)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

එක් එක් විෂය කොටස අවසානයේ වාචික හා කෙටි ප්‍රශ්න මඟින් අගයන්න.

**අතිරේක උදවු :-**

සම්භාව්‍ය තාල දීපනී - ඩී. ආර්. පීරිස් - පිටු අංක 85-93 තෙක්

**ඇමුණුම**

**1 කොටස**

චෞතාල්

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| ධා | ධා | දිං | තා | කිට | ධා | දිං | තා | තිට | කත | ගදි | ගෙන |
| X | | 0 | | 2 | | 0 | | 3 | | 4 | |

ඒක්තාල්

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
| ධිං | ධිං | ධාගේ | තිරිකිට | තූ | නා | කත් | තා | ධාගේ | තිරිකිට | ධී | නා |
| X | | 0 | | 2 | | 0 | | 3 | | 4 | |

| චෞතාල් | ඒක්තාල් |
|---|---|
| • මාත්‍රා 12<br>• විභාග 06<br>• තාලී හා ඛාලී X, 0, 2, 0, 3, 4 ලෙස යෙදේ.<br>• එක් විභාගයකට මාත්‍රා 02 බැගින් යෙදේ<br>• ඨේකාව පඛාවජ් අක්ෂරයන්ගෙන් නිර්මිත ය.<br>• ධෘපද් ගායනා සඳහා උපයෝගි වෙයි.<br>• විලම්බ හා මධ්‍ය ලයවල භාවිත වෙයි.<br>• පඛාවජ් ඒකල වාද නකෙරේ. | • මාත්‍රා 12<br>• විභාග 06<br>• තාලී හා ඛාලී X, 0, 2, 0, 3, 4 ලෙස යෙදේ.<br>• එක් විභාගයකට මාත්‍රා 02 බැගින් යෙදේ<br>• ඨේකාව තබ්ලා අක්ෂරයන්ගෙන් නිර්මිත ය.<br>• ඛ්‍යාල් ගායනා හා තරාණා ගායනා සඳහා උපයෝගි වෙයි.<br>• අතිවිලම්බ, විලම්බ, මධ්‍ය, දෘත හා අතිදෘත ලය වල භාවිත වෙයි.<br>• තබ්ලා ඒකල වාදනය කෙරේ. |

**2 කොටස**

ත්‍රිතාල්

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධා | ධිං | ධිං | ධා | ධා | ධිං | ධිං | ධා | ධා | තිං | තිං | තා | තා | ධිං | ධිං | ධා |
| X | | | | 2 | | | | 0 | | | | 3 | | | |

පංජාබි

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධා | ගධිං | -ග | ධා | ධා | ගධිං | -ග | ධා | ධා | කතිං | -ක | තා | තා | ගධිං | -ග | ධා |
| X | | | | 2 | | | | 0 | | | | 3 | | | |

තීලවාඩා

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධා | තිරිකිට | ධිං | -ධිං | ධා | ධා | තිං | තිං | තා | තිරිකිට | ධිං | -ධිං | ධා | ධා | ධිං | ධිං |
| X | | | | 2 | | | | 0 | | | | 3 | | | |

| ත්‍රිතාල් | පංජාබි | තීලවාඩා |
|---|---|---|
| • මාත්‍රා 16.<br>• විභාග 04.<br>• තාලී හා ඛාලී X, 2, 0, 3 ලෙස යෙදේ.<br>• එක් විභාගයකට මාත්‍රා 04 බැගින් යෙදේ.<br>• යේකාව තබ්ලා අක්ෂරයන්ගෙන් නිර්මිත ය.<br>• ඛ්‍යාල් ගායනා තරාණා ගායනා හා ගත් වාදන සඳහා උපයෝගි වෙයි.<br>• අතිවිලම්බ, විලම්බ, මධ්‍ය, ද්‍රැත හා අතද්‍රැත ලයවල භාවිත වෙයි.<br>• තබ්ලා ඒකල වාදනය කෙරේ. | • මාත්‍රා 16.<br>• විභාග 04.<br>• තාලී හා ඛාලී X, 2, 0, 3 ලෙස යෙදේ.<br>• එක් විභාගයකට මාත්‍රා 04 බැගින් යෙදේ.<br>• යේකාව තබ්ලා අක්ෂරයන්ගෙන් නිර්මිත ය.<br>• ඨුම්රි හා ටප්පා ගායනා සහ ධූන් වාදන සඳහා උපයෝගි වෙයි.<br>• විලම්භ හා මධ්‍ය ලයයන්හි භාවිත වෙයි. | • මාත්‍රා 16.<br>• විභාග 04.<br>• තාලී හා ඛාලී X, 2, 0, 3 ලෙස යෙදේ.<br>• එක් විභාගයකට මාත්‍රා 04 බැගින් යෙදේ.<br>• යේකාව තබ්ලා අක්ෂරයන්ගෙන් නිර්මිත ය.<br>• බඩා ඛ්‍යාල් ගායනා සඳහා පමණක් උපයෝගි වෙයි.<br>• අතිවිලම්බ හා විලම්බ ලයෙහි භාවිත වෙයි.<br>• තබ්ලා ඒකල වාදනය නොකෙරේ. |

ක්‍රියාකාරකම 04

# Symphony ස්වභාවය

**නිපුණතාවය 2.0** :- විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 2.1** :- අපරදිග සංගීතයෙහි සංගීත නිර්මාණවල ස්වභාවය ගවේෂණය කරමින් ඒවාට දායක වූ සංගීතඥයන් කිහිප දෙනෙකුගේ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** :- 04

**ක්‍රියාකාරකම** :- **Symphony ස්වභාවය**

**ඉගෙනුම් පල** :-

- **Symphony** සංධ්වනි පිළිබඳ ව නිර්වචනය කරමින් එහි ඓතිහාසික පසුබිම සංක්ෂිප්ත ව අවබෝධ කරගනී.
- ප්‍රසිද්ධ සංධ්වනි නිර්මාපකයන්ගේ ජීවන ස්වභාවය අධ්‍යයනය කරයි.
- ලෝක ප්‍රකට සංධ්වනි නිර්මාණ අසමින් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්**:-

- සංධ්වනි ඇතුළත් **DVD/CD** තැටි හා වාදන යන්ත්‍ර
- සංධ්වනි වාදකයන් ස්ථානගත කිරීම් දැක්වෙන ඡායාරූප
- සංධ්වනියක ස්වර ප්‍රස්තාර කොටසක් (අපරදිග)
- මොසාර්ට්, බේතෝවන් හා බාක් යන සංගීතඥයන්ගේ ඡායාරූප

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**:-

- මෙම පාඩම අපරදිග සංගීතයේ යෙදෙන සන්ධ්වනියෙහි ස්වභාවය පිළිබඳ ව සිසුනට පැහැදිලි අවබෝධයක් ලබාදීම සඳහා ගොඩනගා ගත යුත්තකි. එහිදී සංධ්වනිය පිළිබඳ ව ඇති නිර්වචන හා සංධ්වනියේ විශේෂ ලක්ෂණ ද, මොසාර්ට්, බේතෝවන් හා බාක් යන සංගීතඥයන්ගේ ජීවන තොරතුරු හා සංගීත නිර්මාණ පිළිබඳව ද සිසුන් දැනුම්වත් කළ යුතුවේ. ඒ සඳහා 1,2,3.4 යන ඇමුණුම් භාවිත කරමින් සිසුන් ක්‍රියාකාරකම්හි යෙදවීම මෙයින් අපේක්ෂා කෙරේ.
- සංගීතඥයන් ගැන හැඳින්වීමේ දී මොසාර්ට්, බේතෝවන් හා බාක් යන සංගීතඥයන්ගේ ජීවන තොරතුරු, සංගීත නිර්මාණ, සංධ්වනි ප්‍රස්තාර ආදිය පිළිබඳ ව තොරතුරු ඇතුළත් කියවීම් පත්‍රිකාවක් අංක 02,03,04 යන ඇමුණුම් වල ගුරුවරයාගේ පහසුව පිණිස සැකෙවින් දක්වා ඇත. එම කරුණු ද, පදනම් කරගනිමින් සවිස්තර පත්‍රිකාවක්, සිසුන්ට සපයා දෙන්න.

**පාඩම සංවර්ධනය** :-

- සංධ්වනි ඇතුළත් **DVD** හෝ **CD** පටය සිසුන්ට ප්‍රදර්ශනය කරමින් හෝ සංධ්වනි වාදකයන් ස්ථානගත කිරීම් දැක්වෙන ඡායාරූපය ප්‍රදර්ශනය කරමින් පාඩමට පිවිසිය හැකිය. මේ මූලික කොටසට අදාළ කියවීම් පත්‍රිකාව ඇමුණුම අංක 01 සිසුනට ලබා දෙන්න. සංධ්වනියක ස්වරූපය හා එහි විශේෂ ලක්ෂණ, භාවිත සංගීත භාණ්ඩ, ප්‍රකාශන සඳහා භාවිත සංකේත, ආදිය පිළිබඳ ව සිසුන් හා සාකච්ඡා කරමින් සංධ්වනි රචකයන් හා නිර්මාතෘවරුන් ආදීන් පිළිබඳ ව පුළුල් ආකාරයකින් සාකච්ඡා කළ යුතු වේ.

( කාල ඡේද 01)

• බාක් සංගීතඥයාගේ ඡායාරූපය පන්තියට ප්‍රදර්ශනය කරන්න. ඇමුණුම් 02 කොටසට අදාළ ව ඔබ සකස් කර ඇති කියවීම් පත්‍රිකාව සිසුනට ලබා දෙන්න. එහි සැලසුම් කළ ක්‍රියාකාරකම්හි සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 01)

• මොසාර්ට් සංගීතඥයාගේ ඡායාරූපය පන්තියට ප්‍රදර්ශනය කරන්න.

ඇමුණුම් 03 කොටසට අදාළ ව ඔබ සකස් කර ඇති කියවීම් පත්‍රිකාව සිසුනට ලබා දෙන්න. එහි සැලසුම් කළ ක්‍රියාකාරකම්හි සිසුන් යොදවන්න.

(කාල ඡේද 01)

• බීතෝවන් සංගීත නිර්මාණකරුවාගේ ඡායාරූපය පන්තියට ප්‍රදර්ශනය කරන්න. ඇමුණුම් 04 කොටසට අදාළ ව ඔබ සකස් කර ඇති කියවීම් පත්‍රිකාව සිසුනට ලබා දෙන්න. එහි සැලසුම් කළ ක්‍රියාකාරකම්හි සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 01)

• ලෝකප්‍රකට සංධ්වනි නිර්මාණකරුවන්ගේ සන්ධ්වනි නැරඹීමට සලස්වන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

• එක් එක් කාලච්ඡේදය අවසානයේ දී මොසාර්ට්, බීතෝවන් හා බාක් යන සංගීතඥයන්ගේ ජීවන තොරතුරු, සංගීත නිර්මාණ, සංධ්වනි ප්‍රස්තාර ආදිය පිළිබඳව වාචික ව හෝ කෙටි ලිඛිත ප්‍රශ්න මඟින් හෝ සිසුන් අගයන්න.

• ඒ ඒ සුවිශේෂ කොටස් පැහැදිලි වන පරිදි සන්ධ්වනිවල ස්වභාවය, සංගීතය පිළිබඳ ව හෝ මොසාර්ට්, බීතෝවන් හා බාක් යන සංගීතඥ -යන්ගේ ජීවන තොරතුරු, සංගීත නිර්මාණ, සංධ්වනි ප්‍රස්තාර ආදිය අළලා එක් සංගීතඥයකු පිළිබඳව කුඩා පොත් පිංචක් සකස් කිරීමට මඟ පෙන්වන්න. සුදුසු පරිදි අගයන්න.

පැවරුම්:-

• ලෝක ප්‍රකට සංධ්වනි නිර්මාණකරුවන්ගේ සංධ්වනි නැරඹීමට සිසුන් යොමුකරවන්න.

අතිරේක උදවු:-

• 1997 පෙරදිග සංගීතය අ.පො.ස උසස් පෙළ ගුරු අත්පොත පිටු අංක 70 සිට පිටු අංක 80
• අන්තර්ජාලය www.youtube.com පිරික්සීම.

ඇමුණුම 1

සන්ධ්වනි පිළිබඳ නිර්වචන කිහිපයක්:-

• .. Music Written For the Ochestra..'' ..වාදක මණ්ඩලයක් සඳහා ලියන ලද සංගීත සංරචනය සන්ධ්වනිය යි...
• ..එකවර නාද වීම යි..''

**සන්ධ්වනියක ස්වරූපය හා විශේෂ ලක්ෂණ:-**

- තේමාවක් තිබීම.
- කොටස් 4කින් හෝ 5කින් හෝ සමන්විත වීම.
- එක් නාද රූපණයක් සන්ධ්වනිය පුරා ම විටින් විට නාද වීම.
- අදහස් ප්‍රකාශනය සඳහා සංකේත භාවිතය.
- භාවාත්මක හැඟීම් ප්‍රකාශය විශේෂත්වය ලෙස සැලකීම.
- විවිධ ස්වර පරාසයන්ට අයත් විවිධ සංගීත භාණ්ඩ රාශියක් භාවිත විම.
- ආරම්භයේ පටන් ස්වර සංවාදාත්මක ලක්ෂණය තිබීම.
- මෙහෙයවන්නකු සිටීම.

**සංධ්වනියකට අයත් වන සංගීත භාණ්ඩ**

මූලික වර්ග තුනට ම අයත් වන භාණ්ඩ තිබීම.
(Wood wind, Brass wind,String and Percussion )
සංගීත භාණ්ඩ වාදකයන් අවම 35කට වැඩි ප්‍රමාණයක් සිටිය යුතු වීම.

(එක් එක් යුගවල දී ප්‍රමාණයේ වෙනසක් තිබිය හැකි ය.)
එක් එක් සංගීත භාණ්ඩ වර්ගයට සාපේක්ෂ ව අනෙක් සංගීත භාණ්ඩ යොදා ගැනීම.
(පහත දැක්වෙනුයේ සංගීත භාණ්ඩ ප්‍රමාණය දැක්වෙන දළ සටහනකි.)

| සංගීත භාණ්ඩය | සංධ්වනියක් සඳහා තෝරා ගන්නා ප්‍රමාණය | ස්වර පරාසය |
|---|---|---|
| වයලීන් | 36 | ප සිට ස තෙක් |
| වියෝලා | 10 | ස සිට ස තෙක් |
| චෙලෝ | 10 | ස සිට ග තෙක් |
| ඩබල් බේස් | 04 | ම සිට ග තෙක් |
| කොන්සට් ෆ්ලූට් | 02 | ස සිට ස තෙක් |
| පිකලෝ | 01 | රි සිට නි තෙක් |
| ඕබෝ | 02 | නි සිට ප තෙක් |
| කොරැන්ගලී | 01 | ග සිට ධ තෙක් |
| ක්ලැරිනට් | 02 | රි සිට ධ තෙක් |
| බේස් ක්ලැරිනට් | 01 | රි සිට ධ තෙක් |
| බැසූන් | 03 | නි සිට ම තෙක් |
| ෆ්‍රෙන්ච් හෝන් | 04 | නි සිට ම තෙක් |
| ට්‍රම්පට් | 03 | ම සිට නි තෙක් |
| ත්‍රොම්බෝන් | 03 | ග සිට නි තෙක් |
| ටියුබා | 01 | ග සිට ම තෙක් |
| ටිම්පනි ඩ්‍රම් | 2 හෝ 4 | ග සිට ප තෙක් |

- සංධ්වනි ආකෘතිය හෝ සමූහ වාදන ආකෘතිය හෝ අනුගමනය කරමින් ගොඩනැගූ දේශීය නිර්මාණ

පන්සිළු - ලයනල් එදිරිසිංහ
ගොයම් දා මඟුල - ඩබ්.බී. මකුලොලුව
මහාභිනිෂ්ක්‍රමණය - „
මාර පරාජය - „
හිරගෙයින් මරුමුවට - „
උකුසා වන්නම ආශ්‍රිත සමූහ වාදන - ෂෙල්ටන් ප්‍රේමරත්න
සිංහල අවුරුද්ද - ප්‍රේමසිරි කේමදාස
වැස්ස - „
මගේ කාලයේ මවුනි - „

ඇමුණුම 2

- **බාක් (1685 - 1750)**

**ජීවන තොරතුරු:-**

- නම:- ජොහාන් සෙබස්තියන් බාක්
- උපත :-1685.03.21 Eisenach ප්‍රදේශය.
- විපත:- Leipzig 21.03.1750
- සිය පියාගෙන් සංගීතය හැදෑරීම ආරම්භ කොට පියාගේ අභාවයෙන් පසු ව සිය වැඩිමහලු සොහොයුරු ජොහාන් ක්‍රිස්ටෝපර් බාක්ගෙන් සංගීතය හදාරා ඇත.

**සංගීත නිර්මාණ**

- ඔපෙරා හැර අතිමහත් සියලුම සංගීත නිර්මාණ ඔහු විසින් සම්පාදනය කරනු ලැබ ඇත.
- ඔහුගේ වාදිත සම්පාදන විශේෂ විය.
- ඔහුගේ ඕගන් වාදිත වල සමූහ ගායන අංග ද ඇතුළත් කර තිබීම විශේෂත්වයකි.
- **Toccata In D Minor** නිර්මාණය හක්ස්ට්හුඩ් ආභාසයෙන් කෙරුණු කෘතියකට නිදසුනකි.
- **Great fantasia** සහ **Fugue in G Minor** තවත් එබඳු ම නිර්මාණයෝ වෙති.
- ඕගන් සඳහා **Chorale** නිර්මාණ 170 ක් ප්‍රබන්ධ කොට ඇත.
- ඔහු දේවස්ථාන කෘති, කැන්ටාටා. මොටෙට්, පැෂන් යනුවෙන් විවිධ සංගීත කෘති රැසක් ම ලොවට දායාද කොට ඇත.

ඇමුණුම 3

- **මොසාර්ට් (1765 - 1791)**

ජීවන තොරතුරු

- නම:- වුලුෆ්ගැන්ග් ඇමඩියුස් මොසාර්ට්
- උපත:- බටහිර අවුස්ත්‍රියාවේ බැවේරියාවේ සැල්ස්බර්ග් නුවර දී 1765.01.27
- විපත:- වියානාවේ දී 1791.12.05
- ඔහුගේ පියා ද දක්ෂ සංගීතඥයකු ලෙස ප්‍රසිද්ධ ව සිටි බව සැලකේ.
- හේඩ්න් සංගීතඥයාගේ කුළුපග මිතුරෙක් විය.

සංගීත නිර්මාණ

- නව අවුරුදු වියේදී ඔහුගේ ප්‍රථම සංධ්වනියද, එකොළොස්වන වියේදී ප්‍රථම ඔරටෝරියෝව ද, දොළොස් වන වියේ දී ප්‍රථම ඔපෙරාව ද ප්‍රබන්ධයෙන් ඔහු දක්ෂයෙක් විය.
- **Mass** ගායනා 15ක්, සුළු සමූහ වාදන කණ්ඩායම් සඳහා වාදිත 30ක්, විවිධ සංගීත භාණ්ඩ සඳහා ලියැවුණු කොන්සර්ටෝ 50ක්, සොනාටා 17ක්, පමණ නිර්මාණ අතර කැපී පෙනේ.

ඇමුණුම 4

- **බේතෝවන් (1770 - 1827)**

වියානා පරපුරේ තවත් සංගීත යෝධයකු ලෙස බීතෝවන් හැඳින්විය හැකිය.

ජීවන තොරතුරු

- නම:- ලුඩ්විග් වැන් බේතෝවන්
- උපත:- ජර්මනියේ දී 1770.12.16
- විපත:- වියානා නුවර දී 1827.03.26

සංගීත නිර්මාණ

කෝරල් සිම්ෆනිය - 9

පැස්ටරෝල් සිම්ෆනිය - 6

E Flat Major - 3

ඔහුගේ 9 වන සිම්ෆනිය නිර්මාණය කරන විට හේ බිහිරෙක් විය. යුරෝපා සංගීත ඉතිහාසයේ අවසන් සම්භාව්‍ය සංගීතඥයා වන්නේ බීතෝවන් ය.

**ක්‍රියාකාරකම 05**

# Ballet, Opera වල සංගීතයේ ස්වභාවය

**නිපුණතාව 2.0** :- විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවිධතා ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම2.1** :- අපරදිග සංගීතයෙහි සංගීත නිර්මාණවල ස්වභාවය ගවේෂණය කරමින් ඒවාට දායක වූ සංගීතඥයන් කිහිප දෙනෙකුගේ තොරතුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** :- 04

**ක්‍රියාකාරකම** :- Ballet, Opera වල **සංගීතයේ ස්වභාවය**

**ඉගෙනුම් පල** :-

- Ballet, Opera අංගයන්හි මූලික සංකල්පය සංක්ෂිප්තව අවබෝධ කරගනී.
- ප්‍රසිද්ධ Ballet, Opera කිහිපයක නිර්මාණකරුවන් හා සංගීතමය ස්වභාවය අගය කරයි.
- ලෝක ප්‍රකට Ballet, Opera නිර්මාණ නරඹමින් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්** :-

- Ballet, Opera ඇතුළත් DVD/CD පට හා එම යන්ත්‍ර.
- Ballet, Opera විස්තර කෙරෙන සටහනක්.
- Ballet, Opera වල දර්ශන සහිත පින්තූර.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:-**

අපරදිග සංගීතයේ ඇති ශ්‍රේෂ්ඨතම සංගීත අංගය සංධ්වනිය බව සිසුනට මූලික ව ම හඳුන්වා දිය යුතු කරුණ වේ. එහි දී සන්ධ්වනිය පිළිබඳ ව ඇති නිර්වචන කිහිපයක් ම පන්තියට පැහැදිලි කරදීම මෙම පාඩමේ මූලික ව ම කියා දිය යුතු වැදගත් අංගයකි. එවැනි නිර්වචන කිහිපයක් අංක 01 ඇමුණුමේ දක්වා ඇත. මෙම පාඩම අරභයා ඇමුණුමේ දක්වා ඇති කොටස් ද, උපයෝගී කරගනිමින් සිසුන්ගේ භාවිතය සඳහා කියවීම් පත්‍රිකාවක් හා ක්‍රියාකාරී සැලැස්මක් ඔබ සකසා ගන්න. එය ඉන් පසු ව සටහනක් ලෙස සිසුන්ට භාවිත කළ හැකි ය.

සංගීතඥයන් ගැන හඳින්වීමේ දී මොසාර්ට්, බේතෝවන් හා බාක් යන සංගීතඥයන්ගේ ජීවන තොරතුරු, සංගීත නිර්මාණ, සංධ්වනි ප්‍රස්තාර ආදිය පිළිබඳ ව තොරතුරු ඇතුළත් කියවීම් පත්‍රිකාවක් හා ක්‍රියාකාරී සැලැස්මක් ඔබ විසින් සූදානම් කරගත යුතු වේ. ඒ සඳහා අංක 02, 03, 04 යන ඇමුණුම්වල කරුණු ද, පදනම් කරගත හැකි ය.

**පාඩම සංවර්ධනය** :-

ඔබ තෝරා ගත් සන්ධ්වනියක කොටසක් හෝ කොටස් කිහිපයක් හෝ සිසුනට ශ්‍රව්‍ය/දෘශ්‍ය මාධ්‍යයෙන් රස විඳීමට සලස්වන්න. රූප මාධ්‍යයෙන් දර්ශනය වීම සිසුන්ගේ අවබෝධය පහසු වීමට ඉමහත් රුකුලක් වේ. මේ මූලික කොටසට අදාළ කියවීම් පත සිසුනට ලබා දෙන්න. සන්ධ්වනියක ස්වභාවය විමසීමේ දී සන්ධ්වනියක ස්වරූපය හා එහි

විශේෂ ලක්ෂණ, එහි ලා භාවිත සංගීත භාණ්ඩ ලැයිස්තුවක්, ප්‍රකාශන සඳහා භාවිත සංකේත, අවසාන වශයෙන් සන්ධ්වනි රචකයන් හා නිර්මාතෘවරුන් පිළිබඳ විස්තර පුළුල් ආකාරයකින් සාකච්ඡා කළ යුතු වේ.

(කාලච්ඡේද 02)

**Ballet** බැලේ :-

රංග ශෛලියකි. මෙහි වාද්‍ය ප්‍රධාන කොටගෙන ඇත. ගායනය අදාළ නැත. බැලේ Ballet යන වචනය ප්‍රංශ භාෂාවෙන් බිඳී ආ වචනයකි. ඉතාලි භාෂාවේ බැල්ලෝ Ballo බැලට්ටෝ Balletto බැලාරා Balara යනුවෙන් හැඳින්වෙන්නේ කෙටි නර්තනය යන වචනයයි.

මෙම චාරිත්‍රානුකූලව කෙරෙන නැටුම් ක්‍රමය ආරම්භ වූයේ 15 හා 16 වන ශතවර්ෂයේ ඉතාලියේ රාජ සභාවේදීය. මුල් කාලයේදී මෙය දේවස්ථාන තුළ රඟ දැක්වුව ද, පසු කාලයක දී එහි රඟ දැක්වීමත් නැරඹීමත් තහනම් විය. දේවස්ථානයෙන් පිටත රඟ දැක්වීම ඇරඹුණේ 13 වන ශත වර්ෂයේ දී ය. මෙය ඉතාලියේ සිට ප්‍රංශය දක්වා පැතිර ගියේත් වර්ධනය වූයේත්, කැතරින් ඩී. මෙඩිසි නැමති වංශවත් කාන්තාවගේ බලපෑම මතයි. මෙය තව දුරටත් වර්ධනය වූයේ ඇගේ විවාහ මංගල්‍යයේ දී **ලි පැරඩයිස් ඩී ආමර්** නැමති වැඩසටහන ඉදිරිපත් කිරීම නිසයි.

20 වන සියවසේ දී ආරම්භ වූ නූතන බැලේ Modern Ballet සම්භාව්‍ය බැලේ හා Classical නිදහස් නර්තනය Free Style මුසු කරගත් නිර්මාණාත්මක නර්තන විශේෂයක් ලෙස හැඳින්විය හැක. ජෝර්ජ් බලාන්සින් George Balanchine විසින් සම්භාව්‍ය නොවන හා සම්භාව්‍ය නාට්‍යයන්හි අංග උපාංග ඇසුරින් මේ නාට්‍ය කලා ගොඩ නඟා ඇත. විශේෂය වන්නේ නූතන බැලේ සඳහා කථාවක් නිතරම නොයෙදීම යි. එහි භාව ප්‍රකාශන හා රූපණ මඟින් අදහස් ප්‍රකාශ කෙරේ. Mood and Feelings එහෙත් සාම්ප්‍රදායික පාද චලන භාවිත කෙරේ. ඒ නිසා මේවා හඳුන්වන්නේ අර්ධ සාම්ප්‍රදායික යනුවෙනි. Neo Classical විවිධ ඉරියව් හා අංගහාර මගින් ඇති කරන රංග වින්‍යාස ලක්ෂණ විශාල වශයෙන් නූතන බැලේ නාට්‍යයන්හි දක්නට ලැබේ. බැලේ නර්තනය ඉතා දුෂ්කර වුත්, ඉතා කැපවීමකින් පුහුණු වියයුතු වූත් නර්තන සම්ප්‍රදායකි. විශේෂයෙන්ම මුළු ශරීරයේ ම බර රඳා පවතින්නේ පාදවල ඇඟිලි මතයි. මුලදී මෙය ඉතා වේදනා ගෙනදෙන කාර්යයකි. බැලේ නර්තනය ආශ්‍රිතව නිමැවුනු විශිෂ්ඨ චිත්‍රපට රාශියක් ලොව පුරා ප්‍රසිද්ධියට පත්ව ඇත. "Swan Lake" හංසවිල ඉන් එකකි.

**Opera** ඔපෙරා :-

අපරදිග සංගීත ඉතිහාසයේ ඔපෙරා තෙක් පැමිණි ගමන් මගේ ඊට පෙර භාවිත සංගීත ක්‍රම දෙකක් ගැන සඳහන් වේ. එම සංගීතයේ විවිධ පරිණාමයන් සඳහන් වන යුග කිහිපයක් වේ. ඒ අතරින් 14 වන ශත වර්ෂයේ පමණ ආරම්භ වූ යුගය '' මැඩ්රිගල්'' යුගය නමින් නම් කෙරේ. එම යුගයේ අපරදිග සංගීතය දේවස්ථානයේ භාවිත වූ සංගීත අංග ගණනාවකි. එහි දී වූ විශේෂයක් වූයේ දේවස්ථාන සඳහා වෙන් වූ සංගීත බණ්ඩ නොතිබීමයි. එහෙත් කැන්ටාටා නම් සංගීතාංගයට සමූහ ගායන මෙන් ම සමූහ වාදන ද ඇතුළත් විණි. කැන්ටාටා ව ආරම්භ වූයේ ඉතාලියෙනි. එය වර්ධනය වූයේ ජර්මනියේ දී ය. මෙහි ගීතවල ආගමික පසුබිමකින් යුත් කාව්‍ය භාවිත විය. කැන්ටාටාව ආගමික උත්සව දිනයන්හි දේවස්ථාන තුළ යොදා ගැනිණි. කල් යත් ම සංගීත ශාලා තුළට ද ඇතුළු විණි. ඊට පසු කැන්ටාටාවට වඩා වර්ධනය වූ ඔරටෝරියෝ නම් සංගීතාංගය ප්‍රචලිත විණි. එය ඒකල, සමූහ අංග දෙකෙන් ම වර්ධනය වූවකි. මේ අංග දෙක ම රඟපෑම්වලින් තොර වූ ඒවා විය. මේවාට සමකාලීන වූ ද ගීත, වාද්‍ය, නෘත්‍ය යන අංග තුනෙන් ම පෝෂණය වූ ද ඔපෙරාව 16 වන ශත වර්ෂයේ දී ගීත නාටක ලෙස යුරෝපීය බහුතර ජනයාගේ වැදගත් විනෝදාංශයක් ලෙස ඉදිරියට ආවේ ය. ඔපෙරාවේ ගීත ඒකනාද ගුණයෙන් යුතු වූවත් සංගීත බණ්ඩ බහුනාද විය. බටහිර ඔපෙරාවෙන් සංගීතාංග රාශියක් බිහිවිය. වයලින්, බටනළා, බැසුන් යන භාණ්ඩ පමණක් නොව ඔබෝ, හාප්සිකෝර්ඩ් යන භාණ්ඩ ද ඔපෙරා මගින් වර්ධනය විය. විශේෂයෙන් වයලීනය ශීඝ්‍රව ජනප්‍රිය වූයේ ඔපෙරා සංගීතයේ වාද්‍ය භාණ්ඩයක් ලෙසිණි.

**ක්‍රියාකාරකම 06**

# String, Wind, Percussion Instruments

**නිපුණතාව 3.0** : වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.1** : බටහිර සංගීත භාණ්ඩවල ස්වභාවය හඳුනා ගනිමින් වර්ග කරයි.

**ක්‍රියාකාරකම** : Strings, Wind, Percussion සිද්ධාන්තය, සහ පාසල් පද්ධතියේ භාවිත වන සංගීත භාණ්ඩ හඳුනාගැනීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- Strings, Wind, Percussion යන වර්ගවලට අයත් භාණ්ඩ නම් කරයි.
- පාසල් පද්ධතියේ එම භාණ්ඩ භාවිත වන බව පිළිගනියි.
- භාණ්ඩ ලැයිස්තු ගත කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- වාද්‍ය භාණ්ඩවල රූප සටහන්

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- භාරතීය සංගීත භාණ්ඩ වර්ගීකරණයේ දී තන්ත්‍රී, ඝන, අවනද්ධ, ශුෂිර වශයෙන් වර්ග හතරකට බෙදා දක්වුව ද, බටහිර සංගීතයේ දී ඒවා Strings, Wind, Percussion වශයෙන් වර්ග තුනකට වෙන් කරනු ලැබේ. සිංහල බසින් එම වර්ග තුන **තන්ත්‍රීය, ශුෂිර** සහ **සමාඝාත** වශයෙන් නම් කළ හැකි ය. මුල දී බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය Aerophone, Chordrophone, Membrophone, ආදී වශයෙන් දක්වා තිබුණ ද, නූතන ව්‍යවහාරයෙන් එම බෙදීම ඉවත් වී ඇත. කෙසේ වුවත් පියානෝ වැනි සුදු-කළු ස්වර පුවරුවක් සහිත සංගීත භාණ්ඩ Key Board සංගීත භාණ්ඩ වශයෙන් නම් කෙරේ. මේ පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් යොදා ගෙන ඇමුණුමේ දක්වා ඇති පරිදි වගුවකින් බටහිර සංගීත භාණ්ඩ වර්ග කිරීමට සිසුන් යොමු කළ හැකි ය. පාසලේ බටහිර තූර්යවාදක කණ්ඩායමේ String Instruments නොමැති වුවත්, Wind Instruments, Percussion Instruments යන වර්ග දෙකට අයත් භාණ්ඩ භාවිත වේ. මේවායේ පොදු ලක්ෂණ මෙන් ම වෙනස්කම් ද දක්නට ඇත.

**පාඩම සංවර්ධනය**

- බටහිර සංගීත භාණ්ඩයක් හෝ වයලීනයක් හෝ බටහිර ක්‍රමයට වයා පාඩමට පිවිසෙන්න. බටහිර තන්ත්‍රීය භාණ්ඩ රූපසටහන් ප්‍රදර්ශනය කර ඒවා හඳුනාගැනීමට යොමු කරන්න. වාදනය කරන ආකාරය අනුව Plucking Instruments සහ Bowing Instruments වශයෙන් තන්ත්‍රීය භාණ්ඩ නැවත දෙකොටසකට බෙදෙන බව පැහැදිලි කරන්න. Percussion Instruments යන වර්ගය පැහැදිලි කරන්න. වගුව සපයන්න.

  (කාලච්ඡේද 01යි)
- Wind Instruments යන වර්ගය පිළිබඳ පැහැදිලි කරන්න. ඒවායේ පොදු ලක්ෂණ සාකච්ඡා කරන්න. පිඹීමේ ස්ථානය සහ යොදා ගෙන ඇති අමුද්‍රව්‍ය අනුව නැවත වර්ග වන බව පැහැදිලි කරන්න. වගුව සපයන්න.

  (කාලච්ඡේද 01යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් විෂය කොටස අවසානයේ වාචික ප්‍රශ්න හෝ කෙටි ලිඛිත ප්‍රශ්න මඟින් අගයන්න.


පැවරුම -

- බටහිර සංගීත භාණ්ඩ වර්ගීකරණය අනුව අදාළ සංගීත භාණ්ඩවල රූප සටහන් තෝරා අලවා පන්ති කාමරයේ එල්ලා තැබීමට සුදුසු දෘශ්‍ය උපකරණයක් ගොඩ නංවන්න. එය සුදුසු පරිදි අගයන්න.

අතිරේක උදවු -

- ඔබ පාසලේ හෝ වෙනත් පාසලක හෝ ඇති බටහිර තූර්ය වාදක කණ්ඩායමක සංගීත භාණ්ඩ පිළිබඳ ව විමසා බලන්න.

ඇමුණුම:-



**ක්‍රියාකාරකම 07**

## ස්වර පුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ වාදනය

**නිපුණතාව 3.0** :- වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** :- වාදන දක්ෂතා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- ස්වර පුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ වාදනය

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- මයිනර් කෝඩ් (Minor Chord) හඳුනා ගනියි.
- Minor Chord සමඟ ස්වර පුවරුවෙන් ස්වර සප්තකය වාදනය කරයි.
- Minor Chord මිහිරි බව හඳුනාගෙන පවසයි.
- Chord සමඟ ගී වාදනය ඉතා මිහිරි බව හඳුනාගෙන පවසයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සිසුන් විසින් සපයා ගන්නා ලද සංගීත භාණ්ඩ
- ඇමුණුම 01

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

12 ශ්‍රේණියේ දී Major Chord මාරු කරමින් ඕර්ගනයෙන් ගීත වාදනය කිරීමේ හැකියාව සිසුන් විසින් ළඟා කරගනු ලැබ ඇත. 13 ශ්‍රේණියෙහි අපේක්ෂාව වනුයේ Minor Chord සමඟ ගීත වාදනය සඳහා සිසුන් යොමු කිරීම ය.

මෙහිදී C Minor Scale එකෙන් වාදනය වන මුල් Chord 03 පුහුණු කරවීම අපේක්ෂිත ය. ඇමුණුම 01හි සඳහන් ක්‍රියාකාරකම සිසුන් අතට පත් කොට ස්වයං අධ්‍යයනය මගින් අපේක්ෂිත ඵලය කරා ගමන් කිරීමට සිසුනට මඟ පෙන්වන්න.

**පාඩම සංවර්ධනය :-**

- C Minor Scale ස්වර පුවරුවෙන් වාදනය කොට පෙන්වා එහි නාදමාලාවේ සිසුනට දැනෙන වෙනස පිළිබඳ ව විමසමින් පාඩමට පිවිසෙන්න.
- C Major Scale හා C Minor Scale වෙන වෙන ම ස්වර පුවරුවෙන් වයා පෙන්වා දෙකෙහි නාද මාලාවන්හි ඇති වෙනස පිළිබඳ ව විමසන්න.
- ඇමුණුම 01 සිසුන් අතට පත් කොට එම ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය පිළිබඳ උපදෙස් :-**

වාදනය කිරීමේ හැකියාව මැනෙන සේ ඇගයීම සකසා ගත යුතු ය.

**අතිරේක උදවු :-**

බටහිර සංගීතය පිළිබඳ ව ලියැවුණු පොතපත.

**ඇමුණුම 01**

පහත සඳහන් පියවර අනුව පුහුණු වන්න.

**පියවර 01**

C Major Scale ය. (ස්වර අෂ්ටකය) වාදනය කිරීමට පුහුණු වන්න.

ආරෝහණය :- ස රි ග ම ප ධ නි ස

අවරෝහණය :- ස නි ධ ප ම ග රි ස

**පියවර 02**

C Minor Scale එකට අයත් ප්‍රධාන Chord 03 වාදනයට පුහුණු වන්න. (වමතින් හා දකුණින්)

C Minor → C $E^b$ G (ස ග ප)

G Minor → G $B^b$ D (ප නි රි̇)

F Minor → F $A^b$ C (ම ධ ස̇)

**පියවර 03**

ස්වර අෂ්ටකය දකුණතින් වාදනය වන අතරතුර වමතින් අදාළ Chord වාදනයට පුහුණු වන්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | $C^m$ | $G^m$ | $C^m$ | $F^m$ | $C^m$ | $F^m$ | $G^m$ | $C^m$ |
| ආරෝහණය :- | ස | රි | ග | ම | ප | ධ | නි | ස̇ |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | $C^m$ | $G^m$ | $F^m$ | $C^m$ | $F^m$ | $C^m$ | $G^m$ | $C^m$ |
| අවරෝහණය :- | ස̇ | නි | ධ | ප | ම | ග | රි | ස |

**පියවර 04**

C Minor Scale එකට අදාළ ව වාදනය කළ හැකි සෙසු Chord පහත වගුව ඇසුරින් හඳුනා ගෙන වාදනයට පුහුණු වන්න.

| ස්වරය | Chord | Chord වලට අයත් ස්වර |
|---|---|---|
| ස | C Minor | ස ග ප |
| රි | G Minor / D Minor / $B^b$ Major | ප නි රි̇ / රි ම ධ / නි̣ රි ම |
| ග | C Minor / $E^b$ Major | ස ග ප / ග ප නි |
| ම | F Minor / $B^b$ / D Minor | ම ධ ස̇ / නි̣ රි ම / රි ම ධ |
| ප | C Minor / G Minor / $E^b$ Major | ස ග ප / ප නි රි̇ / ග ප නි |
| ධ | F Minor / $A^b$Major / $B^b$ Major | ම ධ ස̇ / ධ ස̇ ග̇ |
| නි | $B^b$ / G Minor / $E^b$ Major | නි රි ම / ප නි රි̇ / ග ප නි |

**පියවර 05**

ඉහත වගුවේ එක් ස්වරයකට අදාළ ව Chord කිහිපයක් භාවිත කළ හැකි බව පෙන්වා ඇත. එනමුත් ඒවා භාවිත කළ හැකි වනුයේ වාදනය කරනු ලබන සංගීත ඛණ්ඩයෙන් මතු කරනු ලබන භාවයට අනුව ය. එය පුහුණුවෙන් හා අත්දැකීම් ඇසුරින් ලබාගත යුත්තකි.

පහත අභ්‍යාසයෙහි යෙදෙන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| $C^m$ | $D^m/B^b/G^m$ | $C^m/E^b$ | $F^m/B^b$ | $C^m/G^m/E^b$ | $F^m/A^b$ | $B^b/G^m/E^b$ | $C^m$ |
| ස | රි | ග | ම | ප | ධ | නි | ස̇ |

එක් ස්වරයක් සඳහා භාවිත කළ හැකි එක් එක් Chord වෙන වෙන ම ගෙන වමතින් Chord හා දකුණතින් ස්වර අෂ්ටකය වාදනයට පුහුණු වන්න.

**ක්‍රියාකාරකම 08**

## ඛයාල් ගායන ශෛලිය රස විඳීම

**නිපුණතාව** :- සංගීත රසාස්වාදනයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම** :- සම්භාව්‍ය සංගීත ශිල්පීන් හඳුනාගනිමින් ඔවුන්ගේ සංගීත කෘති රසාස්වාදනයේ හුරු වෙයි.

**ක්‍රියාකාරකම** :- ඛ්‍යාල් ගායන ශෛලිය රස විඳීම (උස්තාද් අමීර්ඛාන්, පර්වීන් සුල්තානා, පණ්ඩිත් ජස්රාජ් සිං, උස්තාද් රෂීඩ්ඛාන්, පණ්ඩිත් බිම්සෙන් ජෝෂි)

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් ඵල** :-

- ඛ්‍යාල් ගායන ශෛලිය පිළිබඳ තොරතුරු රැස්කරයි.
- ඛ්‍යාල් ගායනයට ප්‍රවීණ සංගීතඥයන් කිහිප දෙනෙක් හඳුනාගනියි.
- ඔවුන්ගේ ගායන, වාදන අධ්‍යයනයට පෙළඹෙයි.
- ඛ්‍යාල් ශෛලිය රසවිඳියි.

**ගුණාත්මක යෙදවුම් :-**

- නිර්දේශිත ශිල්පීන්ගේ රූපසටහන් සහ තොරතුරු ඇතුළත් කියවීමේ පත්‍රිකා ( 2010 ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ පිටු අංක 72 හා 73 )
- නිර්දේශිත ශිල්පීන් ගයන ඛ්‍යාල් ගීත ඇතුළත් ශ්‍රව්‍ය තැටි හා වාදන යන්ත්‍රයක්.
- සර්පිනාව, තබ්ලාව

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

හින්දුස්ථානි සංගීතයේ ප්‍රධාන ගායන ශෛලියක් වූ ඛ්‍යාල් ගායන ශෛලියේ විශේෂතා හඳුනාගැනීමත්, ඛ්‍යාල් ශෛලියේ ප්‍රවීණයන් පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කිරීමත් ඛ්‍යාල් ගායන ශෛලිය රස විඳීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත යි. ගායනයන් ශ්‍රවණයට සලස්වා ඒ පිළිබඳ ව විචාරාත්මක අධ්‍යයනයක් කිරීමට සිසුන් මෙහෙයවීම ගුරුවරයාගේ වගකීමකි.

**පාඩම සංවර්ධනය :-**

- ඛ්‍යාල් ගායන ශෛලියේ විශේෂතා සිසුන් සමග සාකච්ඡා කරන්න. බඩාඛ්‍යාල්, චෝටාඛ්‍යාල්, වෙනස හඳුන්වන්න. මෙම ගායන ශෛලිය පිළිබඳ ප්‍රායෝගික දක්ෂතා වර්ධනය කර ගැනීමේ දී අවධානය යොමු කළ යුතු විශේෂ කොටස් පිළිබඳ පැහැදිලි කරන්න.

  කාලච්ඡේද 01
- නිර්දේශිත ඛ්‍යාල් ගායකයන් පිළිබඳ තොරතුරු ඇතුළත් පත්‍රිකාව සිසුන්ට ලබා දී එය කියවීමට යොමු කරන්න. මෙම සංගීතඥයන්ගේ කෘතීන් වෙන් වෙන් වශයෙන් ශ්‍රවණයට යොමු කරමින් රසස්වාදනයට හුරු කරවන්න. කාලච්ඡේද 01

**ඇගයීම හා තක්සේරුකරණය පිළිබඳ උපදෙස් :-**

ලිඛිත හෝ වාචික ක්‍රම උපයෝගි කර ගනිමින් ඛ්‍යාල් ගායන ශෛලිය හා සංගීතඥයින් පිළිබඳ ඇගයීමක් කරන්න.

**අතිරේක උදවු** නිර්දේශිත සංගීතඥයින් පිළිබඳ තොරතුරු අන්තර්ජාලයෙන් පරීක්ෂා කරවන්න.

**ක්‍රියාකාරකම 09**

## මුද්‍රප්පදය සහිත ප්‍රශස්ති ගීතයක්

**නිපුණතාව 5.0** :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 5.1** :- සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ/වාදනයේ දක්ෂතා දක්වයි.

**ක්‍රියාකාරකම** :- මුද්‍රප්පදය සහිත ප්‍රශස්ති ගීතයක්

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- ප්‍රශස්තිවල ආරම්භය හා ව්‍යාප්තිය විස්තර කරයි.
- ප්‍රශස්තිවල සුවිශේෂ ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- ප්‍රශස්ති ගීත ගායනා කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ප්‍රශස්ති ගීතය ලියූ දෘශ්‍යාධාරය
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට
- ඇමුණුම අංක 1ට අදාළ කියවීම් පත්‍රිකා

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක :-**

කෝට්ටේ යුගයෙන් ආරම්භ වී, මහනුවර යුගයේ දී ව්‍යාප්ත වූ මෙම ගීත විශේෂය හඳුන්වා දී, සුවිශේෂ ලක්ෂණ සාකච්ඡා කර, මුද්‍රප්පදය සහිත ප්‍රශස්ති ගීතයක් ඉගැන්වීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ.

ඇමුණුම I කොටසට අදාළ ශීර්ෂ ඔස්සේ කියවීම් පත්‍රිකාවක් සකස් කර, සිසුන්ට බෙදා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**පාඩම සංවර්ධනය :-**

- ප්‍රශස්ති ගීතයක කැමති කොටසක් ගායනය කර පාඩමට පිවිසෙන්න. ඔබ විසින් ඉදිරිපත් කළ ගීත කොටස පිළිබඳ ව සිසු අදහස් විමසන්න. ඇමුණුම අංක I කොටසට අදාළ විෂය කොටස් සඳහා ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකාව බෙදා දී, සිසුන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න. සටහනක් පිළියෙළ කරවන්න.

  (කාලච්ඡේද 01)

- ඇමුණුම අංක II කොටස යටතේ මුද්‍රප්පදය සහිත ප්‍රශස්ති ගීතයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර, සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

  (කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ඇමුණුම I කොටස අවසානයේ ලිඛිත කෙටි ප්‍රශ්න පත්‍රයක් මඟින් අගයන්න.

**පැවරුම :-**

'ප්‍රශස්ති' පිළිබඳ ව ලිපියක් සකස් කිරීමට යොමු කරවන්න.

**අතිරේක උදවු :-**

- 2010 පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

- ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය - සී. ද එස්. කුලතිලක - 8 පරිච්ඡේදය - පිටු අංක 186 සිට

**ඇමුණුම (විෂයය කරුණු හා බැඳි ශීර්ෂ)**

**ඇමුණුම I කොටස**

- ප්‍රශස්ති යන්න හැඳින්වීම හා සේ ගී යටතේ වර්ග කෙරෙන බව, ආරම්භය හා ව්‍යාප්තිය, කවිකාර මඩුව ආශ්‍රිත ව ගොඩනැඟීම, ලබා ඇති සංගීත ආභාසය, ලියවුණ පොත්පත්, ඉන්දියානු සංගීතඥයන්ගේ දායකත්වය, සුවිශේෂ ලක්ෂණ (මුද්‍රප්පදය, බෙරපද, වන්දිභට්ටයන්, සංගීත භාණ්ඩ) ගීතවල භාෂාව, නාද රටා හා රිද්මය

**ඇමුණුම II කොටස** **මුද්‍රප්පදය සහිත ප්‍රශස්ති**

- බානුසේ ගිමා සඳදෙය - බානුසේ ගිමා
- තුරු රත්න සිරි ලෙසිනා
- වරමාතී සුබ චරිතේ
- ලක්ෂ්මී බුජවාසා

මෙම ගීතවලින් කැමති ගීතයක් හෝ කිහිපයක් නිවැරදි ව ගායනය කරවන්න.

**ක්‍රියාකාරකම 10**

# හටන් කවි

**නිපුණතාව 5.0** :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 5.1** :- සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ/වාදනයේ දක්ෂතා දක්වයි.

**ක්‍රියාකාරකම** :- හටන් කවි

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- හටන් ගීතවල පසුබිම හා විශේෂ ලක්ෂණ විස්තර කරයි.
- හටන් ගීත ගායනයට කැමැත්ත පළ කරයි.
- හටන් ගීත ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට
- ගීතය ලියූ දෘශ්‍යාධාරය
- කියවීම් පත්‍රිකා පිටපත්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

හටන් ගීතවල පසුබිම හා විශේෂ ලක්ෂණ විස්තර කරමින් තිත් දෙකකට අයත් හටන් ගීතයක් ඉගැන්වීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ.

ඇමුණුම I කොටසින් පාඩම සංවර්ධනයට මඟ පෙන්වා ඇති ආකාරයට ගුරුවරයා විසින් කියවීම් පත්‍රිකාවක් සකස් කර ගත යුතු ය.

**පාඩම සංවර්ධනය :-**

- සිසුන් දන්නා හටන් ගීතයක් ගායනය කිරීමට අවස්ථාවක් ලබා දෙන්න. ගායනා කළ ගීත විශේෂය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම අංක 01 කොටසට අදාළ ව ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකාවේ පිටපත් සිසුන්ට ලබා දී, ක්‍රියාකාරකමේ යොදවන්න. සටහනක් පිළියෙළ කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම අංක 02 කොටසට අදාළ හටන් ගීතයේ දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර, සිසුන් ක්‍රියාකාරකමේ යොදවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ඇමුණුම I කොටස අවසානයේ එහි ඇතුළත් ශීර්ෂ ඔස්සේ කතාවක් පැවැත්වීමට නියම කර, අගයන්න.

**පැවරුම :-**

- හටන් ගී හා ප්‍රශස්ති ගී පිළිබඳ ව සංසන්දනයක් කරන්න.

**අතිරේක උදවු :-**

- 2010 පෙරදිග සංගීතය 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය (පිටු අංක 83, 84)

- ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය - සී. ද එස්. කුලතිලක - 8 පරිච්ඡේදය - පිටු අංක 186 සිට

**ඇමුණුම (විෂයය කරුණු හා බැඳි ශීර්ෂ)**

**ඇමුණුම I කොටස**

- හටන් ගී හැඳින්වීම හා සේ ගී යටතේ වර්ග වීම, තේමාව, අන්තර්ගතය, භාෂා ශෛලිය, ලියවුණ ග්‍රන්ථ, රිද්මය හා තාල ලක්ෂණ නාද රටාවන් හටන් ගීවලට ගැළපෙන ආකාරය හා විශේෂ ලක්ෂණ.

**ඇමුණුම II කොටස**

- යනෙන කළු ගඟ එතෙර වැඩ සිට රුපුන් යන මං බලව බලවා
- පුරණ සමුදුර දුවන නැව් දකලා
- ලේසි නොව බැඳ අල්ලා
- කපන කොටන බිම පෙරළන

මෙම ගීතවලින් කැමති ගීයක් ගායනය කරවන්න.

ක්‍රියාකාරකම 11

## සැවුලා වන්නම හා එහි තාල රූපයේ විශේෂත්වය

**නිපුණතාව 5.0** :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 5.1** :- සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ/වාදනයේ දක්ෂතා දක්වයි.

**ක්‍රියාකාරකම** :- සැවුලා වන්නම හා එහි තාල රූපයේ විශේෂත්වය

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- සැවුලා වන්නම අයත් වන සම්ප්‍රදායය හඳුනා ගනියි.
- සැවුලා වන්නමේ තාල රූපයේ විශේෂත්වය අගය කරයි.
- සැවුලා වන්නම තාල තබමින් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :-

- සැවුලා වන්නම ලියූ දෘශ්‍යාධාරය (ඇමුණුම අංක 01)
- සර්පිනාව, ගැටබෙරය, තාලම්පට

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :-

ව්‍යාකරණ හා කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳ හසළ දැනුමක් ඇති උගතුන් නිර්මාණය කළ ගීත සේ ගී බවත්, ජන ගී වර්ගීකරණය බෙදෙන කොටස් දෙකින් එකක් සේ ගී වන බවත් සිසුන්ට පහදා දෙන්න.

උඩරට වන්නම් සම්ප්‍රදායයට අයත් වන සැවුලා වන්නම සුළු මහ දෙතිතට ගැයෙන ආකාරය පැහැදිලි ව ප්‍රදර්ශනය කරමින්, ගායනය, වාදනය කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ.

**පාඩම සංවර්ධනය** :-

- මීට පෙර උගත් උඩරට වන්නමක් ගායනය කිරීමට කැමති සිසුවෙකුට හෝ සිසුවියකට හෝ අවස්ථාව ලබා දෙන්න. ඒ පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඇමුණුම අංක 01 ඇතුළත් දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කරන්න. සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

- පදමාලාව ගායනය කිරීමට හැකි වූ පසු ස්වර ප්‍රස්තාරය ද ගායනය කරවන්න. විවිධ ක්‍රම ශිල්ප අනුගමනය කරමින් ගායනය, වාදනය කරවන්න. ගැටබෙරය භාවිත කරමින් ගායනය, වාදනය කරවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :-

- තාල තබමින් දක්ෂ ලෙස ගායනය/වාදනය කළ සිසුන් තෝරා අගය කරන්න.

**පැවරුම** :-

නිදහස් කාලච්ඡේද වල දී සුළු මහ දෙතිත බෙරපදය ගැටබෙරයෙන් වාදනය කිරීමට පවරන්න. (ගුරු මඟ පෙන්වීම ලබා දෙන්න.)

**අතිරේක උදවු :-**

- උඩරට නැටුම් කලාව - ජේ. ඊ. සේදරමන්
- දහ අට වන්නම - සී. ද එස්. කුලතිලක
- සිංහල නර්තන කලාව - මහාචාර්ය මුදියන්සේ දිසානායක

**ඇමුණුම (01)**

**තානම** තම් තම්දෙන තානම් - දන තම්දෙන තානම්

තම් තම්දෙන තානත් තෙයි තම්ද - නා තම්ද නා නා

සුරිඳුන් පෙර සිටන් - බල යුත් සැවති දුන්

සහ ගොස් කළ යුදෙන් අසුරන් ජය නොලදින්

බර අත් ගෙන කගින් - ඇන කොත්තව්වලින්

අසුරන් කළ යුදෙන් ජය ගෙන කඳ කුමරුන්

ගසමින් කග පතින් - දෙපළු ව අසුර සෙන්

දුරු පා අත ලූවෙන් - පළු දෙක ගෙන සැණෙකින්

එම වම් පළුවකින් - එ උපන් සැණයකින්

සැවුලා නම එයින් - ලොව පළ කළ උපතින්

ක්‍රියාකාරකම 12

## ගණපති සවුදම - අස්නෙ -මංගලම්

**නිපුණතාව 5.0** :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 5.1** :- සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ/වාදනයේ දක්ෂතා දක්වයි.

**ක්‍රියාකාරකම** :- ගණපති සවුදම - අස්නෙ -මංගලම්

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-
- ගණපති සවුදම මංගලම් හා අස්නෙ පිළිබඳ විස්තර කරයි.
- ගණපති සවුදම මංගලම් හා අස්නෙ ගායනය කිරීමට යෝජනා කරයි.
- ගණපති සවුදම මංගලම් හා අස්නෙ තාලානුරූප ව ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ඇමුණුම අංක 01 ගණපති සවුදම හා ඇමුණුම අංක 02 අස්නෙ ලියූ දෘශ්‍යාධාර හා ඇමුණුම අංක 03 මංගලම් ලියූ දෘශ්‍යාධාරකය.
- සර්පිනාවක්, ගැටබෙරයක්, තාලම්පටක්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

සේ ගී යටතේ එන ගණපති සවුදම හා අස්නෙ ප්‍රායෝගික ව ඉගෙනීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ. ගීත දෙක ඉගැන්වීම සඳහා කාලච්ඡේද දෙකක් වෙන් කර ඇත. පහත දැක්වෙන ගීත ගායනය සඳහා යොදා ගන්න.

(01) ගණපති සවුදම - අකුළාගෙන සොඬ කන්පොතු නෙරවා
මූසික වාහනයට නැඟුණා

(02) අස්නෙ - අපගෙ මුනි රජාණන්

(03) මංගලම් - මංගලම් ජය /// මංගලම්

**පාඩම සංවර්ධනය :-**

- ගණපති සවුදමේ එන ද්‍රැත ලයෙන් ගයන බෙරපද කොටස ගායනය කර, පාඩමට පිවිසෙන්න. ඒ පිළිබඳ ව සිසු අදහස් විමසන්න.
- ඇමුණුම අංක 01 දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර ගණපති සවුදම ගායනය කර සිසුන්ට ශ්‍රවණය කිරිමට සලස්වන්න. පාද වශයෙන් නාදමාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම අංක 02 දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර, අස්නෙ ගායනය කර සිසුන්ට ශ්‍රවණය කිරීම සඳහා අවස්ථාව ලබා දෙන්න. පාද වශයෙන් නාදමාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ඇමුණුම අංක 03 දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර මංගලම් කවිය ගායනය කර සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්තාව ලබා දී, පාද වශයෙන් නාදමාලාව තහවුරු වනතෙක් ගායනය කරවන්න.

(කාලච්ඡේද 01)

- ගණපති සවුදම මංගලම් හා අස්නය නිවැරදි ව හා දක්ෂ ලෙස ගායනය කළ සිසුන් අගයන්න.

**පැවරුම :-**

මෙම ගීතයන්ට අමතර ව වෙනත් සවුදම් හා අස්නේ ඇතුළත් ගීත එකතුවක් කිරීමට යොමු කරවන්න.

**අතිරේක උදවු :-**

- හෙළ ගී මඟ - ගණපති සවුදම - පිටු අංක 217

**ඇමුණුම (01)**

**ගණපති සවුදම**

**මහ තනිතිත**

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| + | නිනි | ස | - | රි | ග | ම | මග | රි | ම | ග | රි | ග | රි | ස | - |
| + | අකු | ළා | S | ගෙ | න | සො | ඬS | ක | න් | පො | තු | නෙ | ර | වා | S |
| + | නි- | ස | රි | ග | ම | ම | මග | රි | මම | ගරි | ගරි | ස | - | - | - |
| + | මූS | සි | ක | වා | S | හ | නS | S | යට | නැS | ගූS | නා | S | S | S |

මෙම නාද මාලාව අනුව ගීතයේ ඉතිරි පාද ගැයේ.

ගතලා අබරණ නුවණට අගපත් ලම්බෝදර නාමය දරනා
සකලා සතහට නුවණ සදාදෙන සුරලොව සැපතින නිති වසනා
ගසලා සයවැනි වරට මෙ සවුදම ගණපති වරමින් අද මෙතනා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| තත් | ජිත් | තොන් | නන් | අකු | ලා | ගෙන | සොඬ | දික් | කුඳ | තරිකිට | දිරිකිට | ගජ | තෙකු | වැන් | නේS |
| තොං | තොකි | න්න | කිට | පිං | ඇති | ගණ | දෙවි | ක්‍රත | කිට | විත | කිට | නුව | ණක් | දෙන් | නේS |
| තරිකිට | දොම් | - | දිරිකිට | දොම් | - | තරිකිට | දොම් | දිරිකිට | දොම් | - | තරිකිට | දිරිකිට | දොම් | ගණ | පති |
| ජෙහෙ | ජෙහෙ | ජික් | කිට | කුට | රකු | ටෙම් | -න | ටමි | මම | ගණ | පති | සුර | සවු | දම් | + |

**ඇමුණුම 02**

**අස්නෙ**

අපගෙ මුනි රජාණන් ආ.............

එ කුසිනාරා නුවර ආ.............

වැඩම කළ තුලා‍ය බුජ ආ.............

මධ්‍යයේ සයන කරා ආ.............

දූන් සොඳුර තනි ව ම

රුදු කොමළ බුජ වැල ඳ

පවර රජ කුමරියක

ගෙන්වාලා අභිෂේක

සිංහ පුරවර සොඳා
රජ ඉසුරු විඳ විඳා
කරන නොපනත් රඳා
නැව් නැඟී යන සඳා

කොයි ගොසින් කොයි අනේ
රැකෙම් දෝ දෙවියනේ
සුසුම් ලා යකින්නී
නෙක් කඳුළු ඉසින්නී

**ඇමුණුම 03**

තුන් සුළු දෙමහ සිවු තිත
මංගලම් ජය /// මංගලම්
මංගලම් සුභ /// මංගලම්
මංගලම් සිරි /// මංගලම්
මංගලම් මේ සබේ සැමට ම
වේවා ජයසිරි මංගලම්

ක්‍රියාකාරකම 13

## වැලපුම් ගී

**නිපුණතාව 5.0** :- දේශීය ජන සංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කර ගනිමින්, සංස්කෘතික උරුමයන් රැක ගනියි.

**නිපුණතා මට්ටම 5.1** :- සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ/වාදනයේ දක්ෂතා දක්වයි.

**ක්‍රියාකාරකම** :- වැලපුම් ගී

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- ''වැලපුම් ගී'' අර්ථකථනය කරයි.
- වැලපුම් ගී දුකක් ඇති වුණ අවස්ථාවන්වල දී ගායනා කර ඇති බව පිළිගනියි.
- වැලපුම් ගී හැඟීම් ප්‍රකාශ වන සේ ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ගීතය ලියූ දෘශ්‍යාධාරයක්
- කියවීම් පත්‍රිකා පිටපත්
- සර්පිනාව, තාලම්පට, උඩැක්කිය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

සේ ගී යටතේ එන වැලපුම් ගීත පිළිබඳ ව සාකච්ඡාවක් කරමින්, ගීතයක් ගායනය කිරීම මෙම පාඩමින් අපේක්ෂා කෙරේ. මෙහි අවසානයේ දක්වා ඇති ශීර්ෂ මේ සඳහා යොදාගෙන කියවීම් පත්‍රිකාවක් සකස් කර ගැනීම ගුරුවරයාගේ කාර්යභාරයයි.

**පාඩම සංවර්ධනය :-**

- වැලපුම් ගීයක් ගයා/වයා පාඩමට පිවිසෙන්න. ඔබ විසින් ගායනය කරන ලද එම ගීතය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න. ඇමුණුම 01 කොටසට අදාළ ශීර්ෂ ඔස්සේ ඔබ විසින් සකස් කළ කියවීම් පත්‍රිකා බෙදා දීම ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම අංක 02ට ඇතුළත් වැලපුම් ගීවලින් ඔබ කැමති එක් වැලපුම් ගීයක් ගායනය කර සිසුන්ට ශ්‍රවණය කිරීමට අවස්ථාව ලබා දී, පාදයෙන් පාදය නාදමාලාව තහවුරු වන තෙක් ගායනය කරවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- වැලපුම් ගී පිළිබඳ ව ලිඛිත ප්‍රශ්න මඟින් අගයන්න.
- වැලපුම් ගීතය නිවැරදි ව ගායනය කළ සිසුන් තෝරා අගය කරන්න.

**පැවරුම :-**

ඇමුණුමේ 01ට අදාළ ශීර්ෂ ඔස්සේ සඟරාවකට ලිපියක් සකස් කිරීමට මඟ පෙන්වන්න.

**අතිරේක උදවු :-**

- 2010 - පෙරදිග සංගීතය - 13 ශ්‍රේණිය ගුරු මාර්ගෝපදේශය
- සිංහල ගීත, නැළවිලි ගීත - ආනන්ද ජයසිංහ

**ඇමුණුම (01) ට අදාළ ශීර්ෂ**

- වැලපුම් ගී නිර්වචනය කිරීම.
- වැලපුම් ගී ගායනා කළ අවස්ථා
- වැලපුම් ගීවල භාෂාව, නාදරටා, අර්ථය, රිද්මය පිළිබඳ තොරතුරු

**ඇමුණුම (02)**

- අනේ මගේ දරු දෙන්නා
- වනසා නෑයන් හිමි සඳ බස පිළිරුගෙනේ
- අඬන හිමාලේ හිටියොත් දෙන්නා
- මොහු හැර වෙන දන් ගන්නෝ නැද්දෝ
- පෙම්මා සුරතල් කියමින් දෙතනේ කිරි බොම්මා

යන ගීතවලින් එක් ගීතයක් ගායනය කරවන්න.

ක්‍රියාකාරකම 14

## ස්වර සුසංයෝග කිරීමේ ක්‍රියාකාරකම් - කෝඩ්ස් ගොඩ නැඟෙන අයුරු

**නිපුණතාව 10.0** : සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 10.1** : සංගීත ස්වරවල භෞතික විද්‍යාත්මක තත්ත්වයන් පරීක්ෂා කර ස්වර සුසංයෝග කිරීමේ හැකියාව ලබයි.

**ක්‍රියාකාරකම** : ස්වර සුසංයෝග වන අයුරු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :
- ස්වර සුසංයෝග කිරීමේ ක්‍රමවේද පැහැදිලි කරයි.
- සුංයෝග වීමට ගැළපෙන ස්වර නම් කරයි.
- ස්වර එකිනෙක සුසංයෝග වන විට මිහිරක් ඇති බව පිළිගනියි.
- සුසංයෝග කිරීමේ විද්‍යාත්මක ක්‍රමය අනුව කෝඩ්ස් ගොඩ නගයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- කෝඩ්ස් ගොඩ නැඟෙන ආකාරය ලියා දක් වූ දෘශ්‍ය උපකරණයක්.
- ස්වර පුවරුවක් හෝ ගිටාරයක්.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- ස්වර සුසංයෝග වන අයුරු සහ කෝඩ්ස් ගොඩ නැඟෙන අයුරු මෙම සිසුන් 10, 11 ශ්‍රේණිවල දී ද අධ්‍යයනය කර ඇත. මෙම ශ්‍රේණියේ දී එම සිද්ධාන්ත නැවත ස්මරණය කරමින් තව දුරටත් ස්වර සුසංයෝගී වන ක්‍රම පිළිබඳ අත්හදා බැලීම් කරනු ලැබේ. ඒ සඳහා මෙහි ඇමුණුමේ දැක්වෙන විෂය කොටස් ඔබට උපකාරී වනු ඇත. එක් ස්වරයකට විවිධ ස්වර කිහිපයක් හාර්මනී කළ හැකි බව ද, ඒ ඇසුරින් වෙනත් වෙනත් කෝඩ්ස් නිර්මාණය කළ හැකි බව ද, මෙම ක්‍රියාකාරකමින් සිසුන් හඳුනා ගනු ඇත. මූලික තනුවට අදාළ ව හාර්මනී කළ හැකි විවිධ ස්වර ඇතුළත් තවත් ස්වර පාද කිහිපයක් නිර්මාණය කිරීමට දක්ෂතා ලැබෙනු ඇත.

**පාඩම සංවර්ධනය**

- මීට පෙර වසරවල දී සිසුන් අධ්‍යයනය කර ඇති මේජර් මයිනර් කෝඩ්ස් ගොඩ නැඟෙන ආකාර $1+5+8, 1+4+8$ යන ස්වර එක් වී සෑදෙන අයුරු නැවත මෙනෙහි කරන්න. ඇමුණුමේ දැක්වෙන පළමු, දෙවන හා තෙවන කාලච්ඡේදවලට වෙන් කර ඇති ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 03 යි)

- අධ්‍යයනය කළ විෂය කරුණු අනුව විවිධ කෝඩ්ස් ගොඩ නගා අත්හදා බැලීමට සිසුන් යොමු කරන්න. සාමූහික ක්‍රියාකාරකම්වල ද යොදවන්න.

(කාලච්ඡේද 03 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් විෂය කාල පරිච්ඡේදය අවසානයේ ප්‍රායෝගික කොටස් මඟින් අගයන්න.


පැවරුම -
- සරල සංගීත ප්‍රස්තාර සපයා ගෙන ඒ මත දක්වා ඇති කෝඩ්ස් හඳුනාගෙන ඒවා ඒ ඒ විභාගය මත යොදාගත් ආකාරය විමසා බලන්න.

අතිරේක උදවු -
- සිංහල සංගීතයේ රෝහණ ලකුණ

ඇමුණුම 1.

**ක්‍රියාකාරකම 1.**
**පහත දැක්වෙන කොටසේ පියවරින් පියවර කියවමින් ක්‍රියාකාරකමේ යෙදෙන්න.**

1. පහත රූපසටහනේ අංක 1 සිට 12 තෙක් ස්වර අනුපිළිවෙළින් ලියන්න.




2. මධ්‍ය ස ස්වරයේ සිට උච්ච ස ස්වරය තෙක් ශුද්ධ ස්වර හතකි. සියලු ස්වර සංඛ්‍යාව 12 කි. **ස ස්වරයේ** සිට **කෝමළ රි** ස්වරය තෙක් දුර අර්ධ ස්වරයකි. (*Semitone)* **ග ස්වරයේ** සිට **ම** ස්වරය දක්වා දුර ද අර්ධ ස්වරයකි. (Semitone) ස ස්වරයේ සිට **ශුද්ධ රි** ස්වරය තෙක් දුර සම්පූර්ණ ස්වරයකි. (Tone) ඒ අනුව සම්පූර්ණ ස්වර සප්තකය තුළ අර්ධ ස්වර 12 ක් (12 Semitones) ඇති බව හඳුනාගන්න.
3. සී මේජර් කෝඩ් එකට අයත් අංක ලියා ඒ යටින් ඊට අයත් ස්වර ලියන්න.
4. එම ස්වර අතරත කොපමණ අංක නැතහොත් අර්ධ ස්වර පිහිටා ඇත්දැයි විමසා බලන්න.
5. පහත දැක්වෙන සංඛ්‍යා විමසා බලන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| ස | | | | ග | | | ප |
| ස | අර්ධ ස්වර 3 | | | ග | අර්ධ ස්වර 2 | | ප |

ස + 3 ග + 2 ප

මේ අනුව F Major, G Major ආදි මේජර් කෝඩ්ස්වල ස්වර අතර ද F +3 A +2 C වශයෙන් සහ G +3 B +2 D අර්ධ ස්වර පිහිටන බව වටහා ගන්න. මේ අනුව සියලු මේජර් කෝඩ්ස් මෙසේ වේ.

***දෙවන කාලච්ඡේදය***

6. ස ස්වරයේ සිට ග ස්වරය අතරත අංක 3කි. ග ස්වරයේ සිට ප ස්වරය අතරත අංක 2කි.
   අපි මෙම සංඛ්‍යා දෙක දෙපසට මාරු කර බලමු. ඒ අනුව පහත හිස්තැන්වල ස්වර සොයන්න.
   ස +2 …… +3 ……

7. සී මයිනර් කෝඩ් එකට අයත් ස්වර ගොඩ නැගී ඇත් දැයි බලන්න.

මේ අනුව F Minor, G Minor ආදි මයිනර් කෝඩ්ස්වල ස්වර අතර ද F +2 $A^b$ +3 C වශයෙන් සහ G +2 $B^b$ +2 D අර්ධ ස්වර පිහිටන බව වටහා ගන්න. මේ අනුව සියලු මයිනර් කෝඩ්ස් මෙසේ වේ.

8 දැන් අපි සංඛ්‍යා රටාවක් අනුව තවත් සංඛ්‍යාවක් එකතු කර බලමු.

ස +3 …… + 2 …… +3……..
ස +2 …… + 3 …… +2……..

9 සී මේජර් සෙවනත් සහ සී මයිනර් සෙවන්ත් යන කෝඩ්ස් ගොඩ නැගී ඇත.

10. වෙනත් අයුරකින් සංඛ්‍යා රටා ගොඩනඟා බලමු. ඒ අනුව පහත හිස්තැන් වල ස්වර සොයන්න.

ස +3 …… + 3 ….....
ස +2 …… + 2 ……

ඉහත කෝඩ්ස් දෙක පිළිවෙළින් " C- Augmented සහ C- Diminished (සී- ඔග්මන්ටඩ් සහ සී- ඩිමිනිෂ්) යනුවෙන් නම් කෙරේ.

__නෙවන කාලච්ඡේදය__

11. දැන් අපි Major 7th , Minor 7th යන සෙවන්ත් කෝඩ්ස්වලට තවත් සංඛ්‍යාවක් එකතු කර බලමු.

ස +3 …… + 2 …… +3…….. +2………
ස +2 …… + 3 …… +2…….. +3………

ඉහත කෝඩ්ස් දෙකෙහි අවසානයේ යෙදෙන ''උච්ච රි'' ස්වරය ''ස'' ස්වරයේ සිට නව වන ස්වරය යි. ඒ අනුව ඒවා නව වන ස්වරය අඩංගු කෝඩ්ස් වේ. මේ නිසා මේවා නම් කරන්නේ C- Major added 9th සහ C- Minor added 9th යනුවෙන් ඉහත කෝඩ්ස්වල ස්වර තුන බැගින් වෙන් කර බලන්න.

සගප, ගපනි, පනිරි, වශයෙන් වෙන් කළ හැකි ය. ඒවා වෙන් වශයෙන් ගත් කල ද වෙන වෙන ම කෝඩ්ස් තුනකි. සී මේජර් හෝ මයිනර් කෝඩ්වලට 6 වන ස්වරය එකතු කර අත්හදා බලන්න.

12. සර්පිනාවක්, විද්‍යුත් ස්වර පුවරුවක් සපයා ගන්න. ඉහත කෝඩ්ස් වෙන වෙන ම වයා බලන්න. එක් එක් කෝඩ් එකෙහි ස්වරවල හඬ මිශ්‍ර ව ඔබට ඇසෙන විට සිතට දැනෙන අරුත විමසා බලන්න. සමහර කෝඩ්ස්වල ගැඹුරු බවක් ද, නැතහොත් තාණ්ඩව ශෛලිය ද, සමහර කෝඩ්ස්වල ලාලිත්‍ය බවක් ද, නැතහොත් ලාස්‍ය ශෛලිය ද ඔබට දැනෙනු ඇත. තවත් සමහර කෝඩ්ස්වල භයංකාර බවක්. ගුප්ත බවක්, විස්මය ජනක බවක් ආදි වශයෙන් විවිධ හැඟීම් දැනෙනු ඇති. මේ අනුව ස්වර එකිනෙක හාර්මනී වීමේ දී භාව ප්‍රකාශනයක්, රසයක් උපදින බව වටහා ගන්න. එය ඔබේ සංගීත නිර්මාණ කාර්යයට ඵලදායී වනු ඇත. නව විද්‍යුත් ස්වර පුවරුවල වම්පස ඇති ස්වර සප්තකයෙන් ඉහත ආකාරයේ කෝඩ්ස් එකවර වයන විට ඊට අදාළ කෝඩ්ස් නාමය ද පුවරුව ඉදිරිපස ඩිස්ප්ලේ පැනලයේ සටහන් වේ .

13. මේ අනුව ස්වර සුසංයෝග වීමේ සංඛ්‍යා විද්‍යාත්මක අසිරිය ඔබට වැටහෙන්නට ඇති. සංඛ්‍යා පිහිටන ආකාරය විමසා බලන්න. එහි කිසියම් සමාකාරී රටාවක් ඇති වන බව ඔබට පෙනේවි. මේ අනුව ස ස්වරයට රි ස්වරය ද හාමනී වන අවස්ථා ඇති බව හඳුනාගන්න. එහෙත් ස ස්වරයත් රි ස්වරයත් පමණක් හුදෙකලා ව හාමනී නොවන බවද වටහා ගන්න.

14 10, 11 ශ්‍රේණිවල දී හාර්මනී පිළිබඳ ව ඔබ ලබා ඇති දැනුම සහ මෙම ක්‍රියාකාරකම් මඟින් ලබා ගත් ස්වර සුසංයෝග වීමේ දැනුම සම්බන්ධ කරගනිමින් ගුරුවරයා සමඟ පාද දෙකක සරල තනුවක් මත හාර්මනී ස්වර පාද ලියා ඒවා එක වර වාදනය කර නිර්මාණාත්මක අත්දැකීම් ලබන්න.

**ක්‍රියාකාරකම 15**

## අපට සංගීතය ඇසෙන අයුරු

**නිපුණතාව 10.0** : සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 10.2** : සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** : අපට සංගීතය ඇසෙන අයුරු.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- කර්ණේන්ද්‍රියේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.
  සංගීත අධ්‍යයනයේ දී කර්ණේන්ද්‍රිය වැදගත් වන අයුරු පිළිගනියි.
  කොටස් නම් කරමින් කර්ණේන්ද්‍රියේ රූප සටහන් අඳියි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- කර්ණේන්ද්‍රියේ කොටස් නම් කර ඇඳ දක්වූ දෘශ්‍ය උපකරණයක්
- සමූහ වාදනයක් අඩංගු ශ්‍රව්‍ය තැටියක් හා වාදන යන්ත්‍රයක්

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- සංගීතය හදාරන ආධුනිකයකුට තමාගේ කර්ණේන්ද්‍රියේ නිවැරදි සංවේදීතාව ඉතා මත් අවශ්‍ය ය. ගුරුවරයා ගයා පෙන්වන කොටසක් ශිෂ්‍යයා හොඳින් ශ්‍රවණය කර සහ අනුකරණය කරමින් ශිෂ්‍යයා ද ඒ අයුරින් ගායනය කිරීමට පෙලඹේ. මෙහි දී ශ්‍රවණය ඉතා වැදගත් වේ. ගුරුවරයා ඉදිරිපත් කරන මීන්ඩ්, ගමක් ආදි ශිල්පාංග හා ප්‍රයෝග ඒ අයුරින් ම ඉදිරිපත් කිරීමට උත්සාහ ගන්නේ ශ්‍රවණය මගිනි. එසේ ම පන්ති කාමරයේ දී සමහර සිසුන් ස්වරස්ථාන නිවැරදි ව ඉදිරිපත් නොකරන්නේ ශ්‍රවණයේ වැරැද්දක් නිසා හෝ අවධානයෙන් සවන් නොදීම නිසා හෝ විය හැකි ය. මේ පිළිබඳ ව ශිෂ්‍යයා මෙන් ම ගුරුවරයා ද අවධානය යොමු කළ යුතු ව ඇත.

**පාඩම සංවර්ධනය**

- සමූහ වාදනයක් අඩංගු ශ්‍රව්‍ය තැටිය වාදනය කර සිසුන් අවධානයෙන් යුතු ව සවන් දීමට යොමු කරවන්න. එම වාද්‍ය ඛණ්ඩයෙහි ඇසෙන සංගීත භාණ්ඩ වෙන් කර නම් කිරීමට ඉඩ සලසන්න. මීළඟට අතිමන්ද්‍ර, අතිඋච්ච ආදී වශයෙන් නිකුත් වන ස්වර ඛණ්ඩ වෙන් කර හඳුනා ගැනීමට යොමු කරවන්න. ඒවා පිළිබඳ සාකච්ඡා කරන්න.
  (කාලච්ඡේද 01 යි)
- පාසලේ ජීව විද්‍යාගාරයේ ඇති කර්ණේන්ද්‍රියේ ආකෘතියක් හෝ රූපසටහනක් හෝ මගින් කොටස් පැහැදිලි කරන්න. ඒවායේ ක්‍රියාකාරිත්වය විස්තර කරන්න. නාදයක් නිකුත් වූ තැන සිට ඇසීම තෙක් සිදුවන ක්‍රියාවලිය පහදා දෙන්න. මෙහිදී ශිෂ්‍යා 10 ශ්‍රේණියේ දී නාද පිළිබඳ ලබා ඇති දැනුම ද පදනම් කරගන්න.
  (කාලච්ඡේද 01 යි)
- අවධානයෙන් යුතු ව සවන් දීමේ ක්‍රියාකාරකම්වල යොදවන්න. ස්වර අන්තරයන් සියුම්ව ශ්‍රවණය මගින් හඳුනා ගැනීමට හැකි ක්‍රියාකාරකම්වල යොදවන්න. රාගධාරී සංගීතයේ විවිධ රාග හා බැඳි සමස්ත හඬ රටා ස්මරණයේ මතකයේ රඳවා ගැනීමට සවන්දීම ඉවහල් වන අයුරු සාකච්ඡා කරන්න. ප්‍රායෝගික අභ්‍යාසවල යොදවන්න.
  (කාලච්ඡේද 01 යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාල පරිච්ඡේදය අවසානයේ සුදුසු ප්‍රශ්න මඟින් අගයන්න.

පැවරුම - • නිදහස් කාලයේ දී පහත ඇමුණුමේ දැක්වෙන ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

අතිරේක උදව් - • 10, 11, විද්‍යා පෙළ පොත්.

ඇමුණුම:-


**ක්‍රියාකාරකම 1.**

- 10 වන ශ්‍රේණියේ දී සිසුන් අධ්‍යයනය කර ඇති ''නාදයේ භෞතික විද්‍යාත්මක පදනම'' පිළිබඳ ක්‍රියාකාරකම් අතරින් පිටු අංක 125හි දැක්වෙන කාර්යයෙහි නැවත යොදවන්න. පහත දැක්වෙන සංකල්ප ද, භාවිතයට ගනිමින් ධ්වනිය පිළිබඳ සටහනක් ගොඩනගන්න.
    - ‌o කම්පනය සහ සංඛ්‍යාතය
    - o සාමාන්‍ය උෂ්ණත්වය සහිත වායුගෝලය තුළ ධ්වනි තරංග ගමන් ගන්නා වේගය
    - o සම්පීඩනය සහ විරලනය
    - o මිනිස් කනට ඇසෙන සංඛ්‍යාත පරාසය
    - o තරංගයක රූපසටහනක් ඇඳ ''ශීර්ෂ, නිම්නය, තරංග ආයාමය, + 0 –, යන සංකල්ප ලකුණු කරන්න.
    - o ඔසිලස්කෝප් නම් උපකරණය සපයා ගත හැකි නම් එමගින් නාද තරංගවල රටා සහ හැඩයන් හඳුනාගන්න

**ක්‍රියාකාරකම 2.**

- කර්ණේන්ද්‍රියේ රූපසටහනක් මත පහත කොටස් නම් කර ඒ එක් එක් කොටසේ ක්‍රියාත්මක ස්වරූපය විමසන්න. (මේ සඳහා 10, 11 ශ්‍රේණිවල දී ඉගෙනුම සඳහා යොදා ගත් විද්‍යා විෂයයේ පෙළ පොත් භාවිතයට ගන්න)
    - o පිට කන, මැද කන, සහ ඇතුළු කන.
    - o කර්ණපටහ පටලය.
    - o මුද්ගරිකාව, නිසාතිය සහ දරණිකය යන අස්ථිකා තුන.
    - o කර්ණ සංඛය සහ ඒ තුළ ඇති තරලය.
    - o අර්ධකවාකාර නාල ශරීරයේ සමබරතාව ඇති කිරීමට හේතු වීම.

- ඇසීමේ ක්‍රියාවලිය සිදුවන ආකාරය සහ සංගීත ස්වරවල නිශ්චිත සංඛ්‍යාතයන් මොළය මඟින් නිවැරැදි ව තේරුම් ගන්නා ආකාරය පහත කරුණු සමඟ සැකෙවින් සාකච්ඡා කරන්න.
    - o නාද තරංගයේ සංඛ්‍යාතයට අනුව කර්ණ සංඛයේ ඇතුළත ඇති තරලය සිදු කරන සම්පීඩන සහ විරලන නිසා පාදාශ්‍ර පටලය සහ ඒ හා සම්බන්ධ තන්තුවල ස්පර්ශය මඟින් සංගීත ස්වරවල ඇති නිවැරැදි සංඛ්‍යාතයන් මොළය විසින් ස්වර වෙන් කොට හඳුනා ගනු ලබන අයුරු.
    - o සෙම්ප්‍රතිශ්‍යාව වැනි රෝගතත්වවල දී සංගීතමය ස්වරස්ථාන නිවැරැදි ව හඳුනා ගැනීමට නොහැකි වන අයුරු සහ ඊට බලපාන හේතු.
    - o සංගීතය හදාරන ආධුනිකයකුට තම කර්ණේන්ද්‍රියේ සංවේදීතාව වැඩිදියුණු කර ගැනීමට සහ ස්වරස්ථාන නිවැරැදි ව හඳුනා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ලැයිස්තුවක් පිළියෙළ කරන්න.
    - o පහත දැක්වෙන අයුරින් කර්ණේන්ද්‍රියේ රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.




1. බාහිර ශ්‍රවණ නාලය
2. කර්ණ පටහ පටලය (කන් බෙරය)
3. නිසාති අස්ථිකාව
4. මුද්ගරිකා අස්ථිකාව
5. දරණක අස්ථිකාව.
6. අර්ධකවාකාර නාල
7. වෙස්ටිබියුලර් ස්නායුව
8. කොක්ලියා ස්නායුව
9. කර්ණ සංඛය (කොක්ලියාව)
10. යුෂ්ටේකීය නාලය

පන්තියේ ගුරුතුමාගෙන් අසා දැනගන්න. කියවන්න.

**WHAT CAUSES HEARING PROBLEMS?**

Sometimes people are born with hearing problems. Injuries and infections can also cause hearing problems. People with hearing problems hear less well than others. People with very serious problems cannot hear any sounds. They are totally *deaf* (unable to hear).

Hearing problems can come from injured eardrums. Infections or other diseases can damage parts of the ear. Cancer can damage nerves. Children can be born with a missing or damaged cochlea or other ear parts. Some people slowly lose their hearing as they get older. **Loud music and other loud noises can also cause hearing loss.**

Doctors treat ear infections with medicines or use tubes to drain the ear. Ear doctors can give some people hearing aids, small machines that make sounds louder. They can give people with very serious hearing loss a cochlear implant. The implant is a tiny artificial cochlea that changes sound waves to signals. The signals are fed to the nerves that lead to the brain.

ක්‍රියාකාරකම 15

## ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු

**නිපුණතාව 10.0** : සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්ව අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 10.2** : සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්ව අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** : ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :
- ස්වරාලයේ පිහිටීම සහ කොටස් නම් කරයි.
- ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු විමසයි.
- ස්වරාලයේ නිවැරැදි පැවැත්මට බලපාන කරුණු සාකච්ඡා කරයි.
- උච්ච, මන්ද්‍ර ස්වර ගායනයේ දී ස්වරාලය හසුරුවාගත යුතු ආකාරය පැහැදිලි කරයි.
- නිවැරැදිව ස්වරස්ථාන ප්‍රතිනිර්මාණය කිරීමට අවශ්‍ය ගායන අභ්‍යාසයන් හි වැදගත්කම පැහැදිලි කරයි

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- ස්වරාලයේ කොටස් නම් කර ඇඳ දක් වූ දෘශ්‍ය උපකරණයක්
- සොප්රානෝ ගායනයක් හෝ මානසවිල ගීත නාට්‍යයේ කොටසක් හෝ අඩංගු ශ්‍රව්‍ය තැටියක් හා වාදන යන්ත්‍රයක්

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**
- සංගීතය හදාරන ආධුනිකයකුට තමාගේ කර්ණේන්ද්‍රියේ නිවරැදි සංවේදීතාව මෙන් ම ස්වරාලය නිවැරැදි ව හැසිරවීමේ කුසලතාව ද ඉතා ම අවශ්‍ය ය. උච්ච මන්ද්‍ර තීව්‍ර කෝමල ආදි වූ විවිධ ස්වර ප්‍රතිනිර්මාණය කිරීමේ දී ස්වරාලය නිවැරදි ව හැසිරවීමේ හැකියාව ද ආධුනිකයකුට අත්‍යවශ්‍ය ය. ඒ සඳහා ස්වරාලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම ප්‍රයෝජනවත් වනු ඇත.

**පාඩම සංවර්ධනය**
- සොප්රානෝ ගායනයක් හෝ මානසවිල ගීත නාට්‍යයේ කොටසක් හෝ අඩංගු ශ්‍රව්‍ය තැටිය වාදනය කර සිසුන් අවධානයෙන් යුතු ව සවන් දීමට යොමු කරවන්න. එම ගායන ඛණ්ඩය තුළ ඇසෙන හඬතල වෙන්කර නම් කිරීමට ඉඩ සලසන්න. මීළඟට මන්ද්‍ර, උච්ච ආදි වශයෙන් නිකුත් වන ස්වර ඛණ්ඩ වෙන්කර හඳුනා ගැනීමට යොමු කරවන්න. ඒවා පිළිබඳ ව සාකච්ඡා කරන්න. විවිධ ස්වර වර්ණ ස්වරාලයෙන් නිකුත් වන අයුරු සාකච්ඡා කරන්න.

  (කාලච්ඡේද 01 යි)
- පාසලේ ජීව විද්‍යාගාරයේ ඇති ස්වරාලයේ ආකෘතියක් හෝ රූප සටහනක් හෝ මඟින් කොටස් පැහැදිලි කරන්න. හැකි නම් ස්වරාලයේ ක්‍රියාකාරිත්වය පෙන්වන දෘශ්‍ය පටයක් නැරඹීමට අවස්ථාව සලසන්න. එක් එක් කොටසේ ක්‍රියාකාරිත්වය විස්තර කරන්න. උච්ච මන්ද්‍ර ස්වර නිකුත් කිරීමේ දී ස්වර තන්තුවල සිදුවන ක්‍රියාවලිය පහදා දෙන්න. මෙහිදී ශිෂයයා 10 ශ්‍රේණියේ දී කටහඬ පිළිබඳ ලබා ඇති දැනුම ද පදනම් කරගන්න.

  (කාලච්ඡේද 01 යි)

- අවධානයෙන් යුතුව සවන් දීමේ ක්‍රියාකාරකම්වල යොදවන්න. ස්වර අන්තරයන් සියුම්ව ශ්‍රවණය මඟින් හඳුනා ගැනීමට හැකි ක්‍රියාකාරකම්වල යොදවන්න. රාගධාරී සංගීතයේ විවිධ රාග හා බැඳි සමස්ත හඬ රටා ස්මරණයේ මතකයේ රඳවා ගැනීමට සවන් දීම ඉවහල් වන අයුරු සාකච්ඡා කරන්න. ප්‍රායෝගික අභ්‍යාසවල යොදවන්න.

(කාලච්ඡේද 01යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාල පරිච්ඡේදය අවසානයේ සුදුසු ප්‍රශ්න මඟින් අගයන්න.


පැවරුම - • නිදහස් කාලයේ දී පහත ඇමුණුමේ දැක්වෙන ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

අතිරේක උදවු - • 10, 11, විද්‍යා පෙළ පොත්.


ඇමුණුම:-

<u>ක්‍රියාකාරකම 1.</u>

- පහත සඳහන් රූපසටහන් සහ මඟපෙන්වීම් උපයෝගි කර ගනිමින් ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු දැක්වෙන ලිපියක් සකස් කරන්න.




ගායනයේ දී ඇදුණු ස්වරතන්තු      ආශ්වාස කිරීමේ දී ඉහිල්වූ ස්වරතන්තු



- ඉහත රූපසටහන් ඇඳ ස්වරාලයේ කොටස් නම් කරන්න. ගායනයේ දී සහ ගායනය නොකර සිටින අවස්ථාවේ දී ස්වර තන්තු ඇදීම සහ ඉහිල් වීම පිළිබඳ සාකච්ඡා කරන්න.
- ඉහත රූපසටහන යොදා ගනිමින් උගුරේ ස්වරාලය පිහිටීම පිළිබඳ විමසන්න.
- උච්ච මන්ද්‍ර ස්වර ගායනයේ දී ස්වරාලය කෙසේ වේ දැයි විමසා බලන්න.
- Soprano සහ Bass වැනි කටහඬේ විවිධ තල ඇති කිරීමේ දී ස්වරාලයේ ක්‍රියාකාරිත්වය විමසන්න.
- ගායන හැකියා වර්ධනය කරගැනීමට ස්වරාලය හැසිරවීමේ පුහුණුව සඳහා සුදුසු අභ්‍යාස ගොඩ නඟන්න.
- අනවශ්‍ය පරිදි කථා කිරීමෙන් හෝ අනවශ්‍ය පරිදි කෑගසමින් හෝ ගායනා කිරීමෙන් උගුරේ බැරෑඩිය ඇති වන අයුරු සාකච්ඡා කරන්න.
- බටනළා වාදකයකුගේ කටහඬ ගොරෝසු වන්නේ කුමක් නිසා දැයි විමසන්න.
- ප්‍රතිශ්‍යාව වැනි රෝග තත්ත්වයන්හි දී ස්වරාලයේ වන වෙනස සාකච්ඡා කරන්න.
- ගායකයකු ලෙස ස්වරාලය නිවැරැදි ව පරිස්සමින් තබා ගැනීමට කළ යුතු සහ නොකළ යුතු චර්යාවන් පෙළ ගසන්න.

ක්‍රියාකාරකම 17

## කට හඬේ මිහිර සොයමු.

**නිපුණතාව 10.0** : සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 10.2** : සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** : කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු

**කාලච්ඡේද සංඛ්‍යාව** : 03

**ඉගෙනුම් පල** :

- කටහඬෙහි මිහිරිතාව ඇති වීමට බලපාන කරුණු විමසයි.
- කටහඬෙහි ගුණාත්මක බව ඇති කර ගැනීමට ඉටු කළ යුතු චර්යාවන් පැහැදිලි කරයි.
- කටහඬෙහි විවිධ හඬතල පැහැදිලි කරයි.

**ගුණාත්මක යෙදවුම්:**

- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- සොප්රානෝ ගායනයක් හෝ මානසවිල ගීත නාටකයේ හෝ, කොටසක් අඩංගු ශ්‍රව්‍ය තැටියක් හා වාදන යන්ත්‍රයක්

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- යම්කිසි පුද්ගලයකු ගායනයක් ඉදිරිපත් කිරීමේ දී ඔහුට ම ආවේණික වූ හඬක් ඇති වීම ස්වාභාවික ය. සමහර පුද්ගලයන්ගේ කටහඬ සිහින්, සියුම් බවකින් යුක්ත වුව ද තවත් සමහරුන්ගේ කටහඬ ගැඹුරු ය. මෙසේ වීමට ජීව විද්‍යාත්මක හේතු බලපාන බව පෙනේ.

**පාඩම සංවර්ධනය**

- සොප්රානෝ ගායනයක් හෝ මානසවිල ගීත නාටකයේ කොටසක් හෝ වෙනත් සමූහ ගායනයක හෝ අඩංගු ශ්‍රව්‍ය තැටිය වාදනය කර සිසුන් අවධානයෙන් යුතු ව සවන් දීමට යොමු කරවන්න. එම ගායන ඛණ්ඩයෙහි ඇසෙන විවිධ කට හඬ වෙන්කිරීමට ඉඩ සලසන්න. ඒවා වෙන්කොට ගත හැකි වූයේ කෙසේ දැයි සාකච්ඡා කරන්න.

(කාලච්ඡේද 01යි)

- ඇමුණුමේ දැක්වෙන තොරතුරු ද එක්කර ගනිමින් කට හඬේ ඇතිවන විවිධතා පිළිබඳ ව සාකච්ඡා කරන්න. සිසුන්ට අදහස් දැක්වීමට ඉඩ සලසන්න.

(කාලච්ඡේද 01යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාල පරිච්ඡේදය අවසානයේ සුදුසු ප්‍රශ්න මගින් අගයන්න.

පැවරුම -

- ඔබේ පන්තියේ ගායනයේ යෙදෙන යහළු-යෙහෙළියන් ගේ කට හඬ එකිනෙකට වෙනස් වන්නේ මක් නිසා දැයි විමසන්න.

අතිරේක උදවු -

- 10, 11, විද්‍යා පෙළ පොත්.

ඇමුණුම:-

**පහත දැක්වෙන කරුණු සම්බන්ධ කර ගනිමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.**

- විවිධ අභ්‍යාස මඟින් ස්වරාලයේ නම්‍යතාව ඇති කිරීමටත්, නිවැරැදි ස්වරස්ථාන මතු කර ගැනීමටත්, අලංකාර විධි (මීන්ඩ් ගමක් ආදි) යොදා ගනිමින් කටහඬෙහි මිහිර ඇතිකර ගැනීමටත් හැකි බව.
- කටහඬෙහි ගුණාත්මක බව ඇති කිරීමට බලපාන ජීවවිද්‍යාත්මක සාධක
  - මුහුණු ප්‍රමාණය හා මාංස පේශිවල පිහිටීම. (මුහුණු ප්‍රමාණයෙන් විශාල වූ අයගේ කටහඬ ගැඹුරු බවට ව්‍යාවහාරික සංගීතයේ ගායක-ගායිකාවන්ගෙන් නිදසුන්)
  - මුඛ කුහරයේ සහ නාස් කුහරයේ ධාරිතාව, දිව, තොල්පටවල ඝනකම  කටහඬෙහි විවිධතා ඇති කිරීමට බලපාන බව.
  - උගුරේ සිහින් බව හෝ මහත් බව (උගුර සිහින් ගායිකාවන්ගේ කටහඬ සිහින් බව සහ උගුර මහත් ගායකයන්ගේ කටහඬ ගැඹුරු බවට ගායක-ගායිකාවන්ගෙන් නිදසුන්)
  - දත්වල පිහිටීම කටහඬෙහි ගුණාත්මක බවට බලපාන බව (දත් ඉදිරියට නෙරා ඇති ගායක-ගායිකාවන්ගේ කටහඬෙහි අමුතු මිහිරක් ඇති බවට නිදසුන්)
  - කටහඬෙහි විවිධ හඬතල ඇති කිරීමට ගැහැනු පිරිමි බව බලපාන බව.
- කටහඬෙහි මිහිරිතාව නැති කිරීමට බලපා හැකි චර්යාවන් ලැයිස්තුවක් පිළියෙළ කරන්න. (දුම් පානය, සීතල බීම පානය වැනි)
- ප්‍රතිශ්‍යාව ඇති විට ගායන අභ්‍යාසයන්හි යෙදීම අපහසු වන්නේ ඇයි?
- ගායනයේ දී නාසික හඬ නිකුත්වීම සුදුසු ද? නුසුදුසු ද?
- මුඛය අවශ්‍ය පරිදි හරිහැටි විවෘත නොකර කරනු ලබන ගායනයෙන් මිහිරක් ලැබේ ද?
- කියවන්න, අවබෝධ කර ගන්න.

Soprano (Italian *sopra,* “above”), highest female voice. The normal range of the soprano is about two octaves, generally with its lowest note at middle C, although many sopranos exceed these limits. Sopranos are classified as dramatic, lyric, or coloratura. A dramatic soprano has a powerful and theatrical voice; a lyric soprano, a lighter, smoothly flowing voice; and a coloratura soprano, an extremely flexible and light voice capable of performing highly ornamented virtuoso passages such as trills and runs. The similar unchanged boy’s voice is sometimes termed *boy soprano.* Male sopranos who were castrated as boys in the 18th century in order to keep their soprano voices were known as castrati. The term *mezzo-soprano* is used for a female voice that has a range between the soprano and contralto, the lowest female singing voice

Alto or Contralto lowest of the three principal ranges of voice found in women or young boys, the other two being the soprano and mezzo-soprano. The contralto has a range of about two octaves upward from E or F below middle C. Originally the term also was applied in choral music to the highest male voice, the countertenor, or

**ක්‍රියාකාරකම 18**

## සංගීතය හා බුද්ධිය

**නිපුණතාව 11.0** : සංගීතයේ මනෝ විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර තම ජීවිතය වඩාත් සාර්ථක කර ගනියි.

**නිපුණතා මට්ටම 11.1** : සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** : බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාව (හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යායය ඇසුරින්)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් පල** :
- බුද්ධිය පිළිබඳ අදහස් දැක්වූ දාර්ශනිකයින් සහ මනෝවිද්‍යාඥයින් නම් කරයි.
- බුද්ධිය පිළිබඳ නිර්වචන දක්වයි.
- හොවාර්ඩ් ගාඩ්නර් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.
- ගාඩ්නර් ගේ බහුවිධ බුද්ධීන් නම් කරයි.
- එක් එක් බුද්ධි වර්ග පිළිබඳ කෙටියෙන් විස්තර කරයි.
- සංගීත රිද්මයානුකූල බුද්ධිය පිළිබඳ තොරතුරු අර්ථ දක්වයි.
- සංගීතය හා බුද්ධිය අතර සම්බන්ධතාවය විග්‍රහ කරයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- භාවපූර්ණ වාද්‍ය ඛණ්ඩයක් ඇතුළත් ශ්‍රව්‍ය තැටියක්.

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- බුද්ධිය යන්න විවිධ මනෝවිද්‍යාඥයන් විසින් විවිධ අයුරින් අර්ථකථනය කර ඇත. මුල දී සංගීතාදී කලාවන් ඇසුරු කරන පුද්ගලයන්ට වඩා ගණිතය විද්‍යාව වැනි විෂයයන් සම්බන්ධ පුද්ගලයින් බුද්ධිමත් පිරිසක් බව පිළිගෙන ඇත. ඇල්ෆ්‍රඩ්බිනේ වැනි මනෝවිද්‍යාඥයන් විසින් මුල් කාලයේ බුද්ධි පරීක්ෂණ නමින් පරීක්ෂණ විශේෂයක් ද ලෝකයට හඳුන්වා දෙනු ලබා තිබුණු අතර ඒවායේ ඇත්තේ තර්කණ හැකියාව මැනීමේ ප්‍රශ්න පමණි. එහෙත් නූතන ලෝකයේ බුද්ධිය යන්න වෙනත් ආකාරයකට පිළිගෙන ඇත. ගාඩ්නර් ගේ බහුවිධ බුද්ධිය පිළිබඳ න්‍යාය අද ලෝකයේ පිළිගත් මතය යි.

  සංගීතය සියුම් කලාවන් අතුරින් ඉතා සියුම් කලාව වන්නේ එහි මාධ්‍ය නාද හා ස්වර වන නිසා ය. නාද හෝ ස්වර හෝ අත ගා බැලිය නොහැකි ය. ඒවා පහසුවෙන් හැසිරවිය නොහැකි ය. ඒ සඳහා වෙන ම ම පුහුණුවක් අවශ්‍ය ය. නිවැරදි ස්වර ස්ථාන හඳුනාගැනීමේ දී පුද්ගලයා වේගවත් මානසික ක්‍රියාවලියක යෙදිය යුතු ය. නිවැරදි ශ්‍රැතියකට ස්වර ස්ථානය අඩුවැඩිකරමින් නිවැරැදි ව ඉදිරිපත් කිරීමට මනස පිහිටවන ආකාරය කෙතරම් විස්මය ජනක ද? එය පුද්ගලයන් එතරම් ගැඹුරකින් අධ්‍යයනයේ යෙදෙනුයේ අල්ප ව ය. මේ පිළිබඳ තරමක් ගැඹුරින් සිතා බැලීමට හා අධ්‍යයනය කිරීමට උසස් පෙළ සංගීතය විෂය හදාරන සිසුන් මෙහෙයවීම වඩාත් ඵලදායි වේ. මෙම ක්‍රියාකාරකම් පෙළ ඔබට ඒ සඳහා මඟ පෙන්වනු ඇත.

**පාඩම සංවර්ධනය**

- භාව පූර්ණ වාද්‍ය කණ්ඩය හොඳින් ශ්‍රවණයට සලසන්න. දෑස් පියාගෙන එය නැවත ශ්‍රවණයට සලසන්න. ශ්‍රවණයේ දී සිසුන් තුළ ඇති වූ හැඟීම් විමසන්න. ඇමුණුමේ දක්වෙන තොරතුරු ඇතුළත් දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර බුද්ධිය යනු කුමක් ද යි හඳුනා ගැනීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.

(කාලච්ඡේද 01යි)

- එක් එක් මනෝවිද්‍යාඥයන් විසින් බුද්ධිය පිළිබඳ පළ කළ අදහස් සාකච්ඡා කරන්න.

  (කාලච්ඡේද 01යි)
- හොවාර්ඩ් ගාඩ්නර් පිළිබඳ කෙටි සාකච්ඡාවක් කරන්න. ඇමුණුමේ දක්වා ඇති බහවිධ බුද්ධිය පිළිබඳ තොරතුරු පදනම් කරමින් සිසුන් සමග විමසීමක යෙදෙන්න.

  (කාලච්ඡේද 01යි)
- එක් එක් බුද්ධි තත්වයන් හා බැඳුණු විෂයයන් පිළිබඳ සාකච්ඡාවක යෙදෙන්න.

  (කාලච්ඡේද 01යි)

- සංගීතයේ බහුවිධ බුද්ධිය පිළිබඳ තොරතුරු පදනම් කරගනිමින් සාකච්ඡාවක යෙදෙන්න.

  (කාලච්ඡේද 04යි)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාල පරිච්ඡේදය අවසානයේ සුදුසු ප්‍රශ්න මගින් අගයන්න.

පැවරුම - • බහුවිධ බුද්ධි සංකල්පය අනුව සංගීතය බුද්ධිමය ශිල්පයක් වශයෙන් පිළිගනු ලබයි. ගණිතය විද්‍යාව භාෂාව වැනි ඕනෑ ම විෂයයකින් සංවර්ධනය කරනු ලබන වියුක්ත බුද්ධිය සංගීතය මගින් ද ප්‍රමාණාත්මක ලෙස මෙන් ම ගුණාත්මක වශයෙන් ද නිරූපණය කිරීමට හැකි වනු ඇත. මෙම කියමන විමසන්න.

අතිරේක උදවු - • නව ඉගෙනුම් ප්‍රවණතා 1 සිට 9 - මහාචාර්ය රෝලන්ඩ් අබේපාල

**ඇමුණුම 01**

**ක්‍රියාකාරකම 1. කියවීමේ පත්‍රිකාව**

''බුද්ධිය'' යන්න හඳුනා ගැනීමට උත්සාහ ගනිමු.

මේ පිළිබඳ ව විවිධ අදහස් දැක්වූ සහ පර්යේෂණ කළ දාර්ශනිකයෝ සහ මනෝ විද්‍යාඥයෝ බොහෝ දෙනෙකි. ඒ අතරින් කිහිප දෙනෙක් පහත දැක්වෙති.

1. Plato – ප්ලේටෝ
2. Aristotal –ඇරිස්ටෝටල්
3. Jean Piajet - ජීන් පියාජේ
4. Sigmen Froid - සිග්මන් ෆ්‍රොයිඩ්
5. Jeramy S Bruner - ජෙරමි එස් බ්රූනර්
6. Guilford - ගිල්ෆර්ඩ්
7. Alfred Binet-ඇල්ෆර්ඩ් බිනේ

***<u>නිර්වචන කිහිපයක් විමසමු</u>***

<u>බිනේ ගේ නිර්වචනය</u> - අවස්ථාවට අනුකූල ව තමන් විසින් ම අනුවර්තනය විය හැකි පුද්ගලයාගේ ප්‍රජානන හැකියාව.

<u>ස්පියර්මන්ගේ නිර්වචනය</u> - සියලු ම ප්‍රජානන ක්‍රියාවලියන්ගේ යටි ආධාරකය වශයෙන් තිබෙන පොදු සාධකය බුද්ධිය යි.

<u>ගාඩ්නර් ගේ නිර්වචනය</u> - සැණෙකින් 'ගැටලු' විසඳා ගැනීම සඳහා ද, අනාගත ඒවා කල් වේලා ඇති ව බලාපොරොත්තු විය හැකි වීම සඳහා ද ප්‍රයෝජනයට ගත හැකි වන්නා වූ තම අත්දැකීම් සම්භාරය බුද්ධිය යි.

<u>පියාජේ</u> - තම ප්‍රජානන ව්‍යූහයේ පරිසරය අතර අඛණ්ඩ ව පවතින්නා වූ අන්තර් ක්‍රියාවන්ගේ ඵලය බුද්ධිය යි.


මේ අනුව බුද්ධිය යනු

''ඉගෙනීමෙන් හා අත්දැකීම් රාශියක් මගින් ලබා ගන්නා වූ දක්ෂතාවන් හා හැකියාවන් සමූහයක් වේ''


''කෙනෙකුගේ ක්‍රියාවන් හා චර්යාවන් කෙරේ උපකාරී වන ප්‍රජානනමය ලක්ෂණය බුද්ධිය යි.

''පරිසරයට අනුව හැඩ ගැසීමටත්, ඉගෙනීමටත්, වියුක්ත චින්තනයේ යෙදීමටත්, ඇති හැකියාව බුද්ධිය යි''

මොළයේ එක් එක් කොටස විවිධ විෂයයන් සඳහා වෙන වෙන ම මණ්ඩල වශයෙන් වර්ධනය වන අදහස දැක්වූ මනෝ විද්‍යාඥයෝ පිරිසක් මුල දී සිටියහ. පහත රූප සටහන බලන්න.




ඉහත අදහස නිසා ''සංගීතය හැකි අය ට ගණිතය විද්‍යාව විෂයයන් නොහැකිය'' යන මතය පැතිරී තිබිණි.
''ගිල්ෆර්ඩ්'' නම් මනෝවිද්‍යාඥයා බුද්ධියේ ව්‍යූහ නැතහොත් සාධක 120කින් යුක්ත බව පැවසීය.
පහත රූප සටහන බලන්න.



**ක්‍රියාකාරකම 2.**

**කියවීමේ පත්‍රිකාව.**

1. හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධිය පිළිබඳ අදහස් සාකච්ඡා කරන්න.



**''හොවාර්ඩ් අර්ල් ගාඩ්නර් '' යනු අමෙරිකානු හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ සංවර්ධන මනෝවිද්‍යාව පිළිබඳ මහාචාර්ය වරයෙකි. එතුමා 1943.07.11 දින අමෙරිකාවේ දී උපත ලත් අයෙකි. එතුමා මනෝවිද්‍යාව පිළිබඳ ග්‍රන්ථ කිහිපයක් ලියා පළ කර ඇත.**

''කොළඹ විශ්වවිද්‍යාලයයේ අධ්‍යාපන පීඨයේ ප්‍රකාශනයක් ලෙස 2001 නොවැම්බර් මස පළ වූ ''ඉගෙනුම් මූලාශ්‍ර'' නම් සඟරාවේ මහාචාර්ය රෝලන්ඩ් අබේපාල විසින් රචිත ලිපියේ කොටස් කිහිපයක් පහත දැක්වේ. ඒවා කියවන්න. ඊට අමතර ව එතුමා විසින් ''නව ඉගෙනුම් ප්‍රවණතා'' නමින් ලියා පළ කර ඇති සඟරාවේ 1 සිට 9 තෙක් කාණ්ඩවල සංගීතය හා බුද්ධිය පිළිබඳ ලිපි පළ කර ඇත. ඒවා කියවන්න.

බහුවිධ බුද්ධිය (Multiple Inteligence) පිළිබඳ සිද්ධාන්තය ඉදිරිපත් කළ (1984) ඇමරිකානු මනෝවිද්‍යාඥයකු වන හොවාර්ඩ් ගාඩ්නර් 1984 දී බුද්ධි වර්ග 7ක් ද 1997 දී බුද්ධි වර්ග 8 ද හඳුන්වා දුන්නේ ය. 1998 දී අන්තර්ජාලයට ප්‍රකාශයක් නිකුත් කරන ගාඩ්නර් තම සොයා ගැනීම් පිළිබඳ මෙසේ සඳහන් කරයි. ''මනුෂ්‍ය බුද්ධිය අතිශයින් ම පුළුල් වූ බොහෝ සෙයින් පොදුවේ පැතිර ගිය නිපුණතා සමූහයකින් සමන්විත ය. දැනට ඉන් 8ක් මම ගණනය කළෙමි. තව බොහෝ තිබිය හැකිය''

ඔහු විසින් ගණනය කළ නිපුණතා 8 පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. වාචසික භාෂාමය බුද්ධිය | - | Verble – Linguistic Inteligence |
| 2. සංගීත- රිද්මානුකූල බුද්ධිය | - | Music – Rhythmic Inteligence |
| 3. තාර්කික- ගණිතමය බුද්ධිය | - | Logical – Mathematical Inteligence |
| 4. දෘශ්‍ය- අවකාශමය බුද්ධිය | - | Visual – Spatial Inteligence |
| 5. කායික- සංචලනමය බුද්ධිය | - | Bodily - Kinesthetic Inteligence |
| 6. අන්තර් පුද්ගල බුද්ධිය | - | Inter- Personal Inteligence |
| 7. පුද්ගල- ඇතුළාන්ත බුද්ධිය | - | Intra- Personal Inteligence |
| 8. ස්වභාව ධර්ම බුද්ධිය | - | Naturalist Inteligence |

මීට අමතර ව මෑතක දී තවත් බුද්ධිමය නිපුණතාවක් හඳුන්වා දී ඇත. එය පැවැත්ම හා සදාචාරය පිළිබඳ බුද්ධිය - existential and moral වශයෙන් හඳුන්වා ඇත.
එක් එක් බුද්ධිමය නිපුණතා පිළිබඳ ව හඳුනා ගැනීමට පහත දැක්වෙන සටහන උපකාරී වනු ඇත.

ශ්‍රී ලංකාවේ මෑත කාලීන බුද්ධිමතුන් රාශියක් අතරින් කිහිපදෙනෙක් නිදසුන් ලෙස පහත දැක්වෙති.

| බුද්ධි වර්ගය | කාර්යය | පුද්ගල නාමය |
|---|---|---|
| වාචසික භාෂාමය | කවියා | තොටගමුවේ ශ්‍රීරාහුල හිමි, මාර්ටින් වික්‍රමසිංහ, මුනිදාස කුමාරතුංග- එදිරිවීර සරච්චන්ද්‍ර |
| ගණිතමය | විද්‍යාඥයා | මහාචාර්ය ගුණපාල ( නාසා ආයතනය) |
| සංගීතමය | ගායකයා/සංගීතඥයා | පණ්ඩිත් අමරදේව, ආචාර්ය ප්‍රේමසිරි කේමදාස |
| දෘශ්‍ය අවකාශමය | චිත්‍ර ශිල්පියා | ජෙෆ්රි බාවා, සොලියස් මෙන්ඩිස් |
| පුද්ගල ඇතුළාන්ත | මනෝවිද්‍යාඥයා | පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රිය හිමි. |
| කායික සංචලනමය | නර්තන ශිල්පි/ක්‍රීඩිකා | චිත්‍රසේන - වජිරා- සුසන්තිකා ජයසිංහ |
| අන්තර් පුද්ගල | නිදහස් සබඳතා | ගරු ඇස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක |
| ස්වභාව ධර්ම | ස්වභාව ධර්ම විද්‍යාඥ | මහාචාර්ය සෙනරත් පරණවිතාන |

සංගීත විෂයේ විවිධ කොටස් ඇසුරින් බහුවිධ බුද්ධිය වර්ධනය වන අයුරු විමසා බලමු.

1. වාචසික භාෂාමය බුද්ධිය -Verble – Linguistic Inteligence

   ගීත ගායනයේ දී පද රචනය නැතහොත් භාෂාත්මක නිර්මිතය වැදගත් වේ. සරල ගී, ජන ගී, නූර්ති ගී ආදිය ගායනය කිරීමේ දී පදමාලාවෙන් ප්‍රකාශිත අදහස පිළිබඳ ව ද අවධානය කරමින් භාවමය රසය මතු කිරීමට උනන්දු වේ. බොහෝ සංගීතඥයන් තුළ භාෂාත්මක ශක්‍යතාව ද ඉහළින් පිහිටා ඇත. ආනන්ද සමරකෝන් , සුනිල් සාන්ත වැනි සංගීතඥයන්ගේ ගීත ඔවුන් අතින් ම පද රචනා වූ ඒවා වේ. පණ්ඩිත් අමරදේවයන් තුළ භාෂාමය බුද්ධිය මැනවින් පවතින බව ගීත ගායනය මඟින් පෙනේ.

2. සංගීත- රිද්මානුකූල බුද්ධිය - Music – Rhythmic Inteligence

   නාද, ස්වර, ස්වරස්ථාන පිළිබඳ අවබෝධය ඇති වන්නේ සංගීතමය බුද්ධිය නිසාය. එසේ ම රාග, තාල, මෙන්ම රිද්මය මඟින් ද සංගීතමය බුද්ධිය සංවර්ධනය වේ.

3. තාර්කික- ගණිතමය බුද්ධිය - Logical – Mathematical Inteligence

   Harmony, Chords ආදිය මඟින් ද, පද වැලකට තනුවක් නිර්මාණය කිරීම, කවුන්ටර්, බිට්ස් යෙදීම ආදිය මඟින් ද, ගොඩ නැඟෙන්නේ තාර්කික ගණිතමය බුද්ධියයි. එසේ ම නාදයේ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යනයෙන් ද මෙම බුද්ධිය වර්ධනය වේ.

4. දෘශ්‍ය- අවකාශමය බුද්ධිය - Visual – Spatial Inteligence

   වේදිකාවේ ඉදිරිපත් කරනු ලබන සංගීතමය ක්‍රියාකාරකම් මඟින් මෙම බුද්ධිය වර්ධනය වේ. එසේම ස්වර ප්‍රස්තාර කිරීමෙන් මෙම බුද්ධිය වර්ධනය වේ.

5. කායික- සංචලන බුද්ධිය - Bodily - Kinesthetic Inteligence

   වේදිකාවේ ඉදිරිපත් කරනු ලබන සංගීතමය ක්‍රියාකාරකම් මඟින් මෙම බුද්ධිය වර්ධනය වේ. ශරීරය සුඛනම්‍ය ලෙස හැසිරවීම කායික සංචලනයයි. වයලීනයක් වැනි වාද්‍ය භාණ්ඩයක් වාදනය කිරීමට අත, අතැඟිලි, වැළමිට, ආදියේ නම්‍යතාව මෙන් ම බිම හිඳ ගැනීමට ශරීරයේ නම්‍යශීලි බව අවශ්‍ය වේ. ගායනයක දී නිවැරදි ඉරියව් ආදිය මඟින් කායික සංචලනමය බුදධිය ඇති වේ.

6. අන්තර් පුද්ගල බුද්ධිය - Inter- Personal Inteligence

   මෙම බුද්ධිය නොමැති ව සමූහ ගායනයක් ඉදිරිපත් කළ නොහැකිය. විශේෂයෙන් සමූහ වාදනයක

දී එකිනෙකා අතර සම්බන්ධතාව ඉතා වැදගත් ය. එක් භාණ්ඩයකින් වාදනය කළ යුතු කොටසක් ගිලිහී යාමෙන් සමස්ත වාදනය ම ඇනහිටිය හැකිය.

7. පුද්ගල- ඇතුළාන්ත බුද්ධිය - Intra- Personal Inteligence
ස්ව සංකල්පය හා අධිෂ්ඨානය මෙන් ම ආත්ම විශ්වාසය ද ඒකල ගායනවාදනවල දී අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන් රාගධාරී ගායන වාදනවලින් මෙම බුද්ධිය වර්ධනය වනුයේ වැඩි කාලයක් තම ගායනය වාදනය නිවැරදි ව ඉදිරිපත් කිරීම මඟින් ය. පෙර හා මධ්‍ය වශයෙන් ආලාපකරණය, තානාලංකාර, වාදනයකදී නම් ජලා ආදියෙන් මෙම බුද්ධිය වර්ධනය වේ.

8. ස්වභාව ධර්ම බුද්ධිය - Naturalist Inteligence
ඉපදීම, ජීවත් වීම, මරණය ආදි ස්වභාවධර්මයේ නොවැළැකිවිය හැකි ධර්මතා ගීත මඟින් අධ්‍යයනයට සැලසේ. එසේ ම පරිසරය පිළිබඳ ව සංවේදී වීමට ද සංගීත පන්ති කාමරයෙන් හා භාණ්ඩ වාදනයෙන් ඉඩ සැලසේ.

මේ අනුව සංගීතය බහුවිධ බුද්ධියේ එක් නිපුණතාවයක් වන අතර මෙම විෂය මඟින් බහුවිධ බුද්ධිය හා සම්බන්ධ නිපුණතා 8 ම වර්ධනය වන බව පිළිගත යුතු ය. සමස්ත විෂය තුළ පමණක් නොවේ එක් ඒකකයක පාඩමක මාතෘකාවක් වුව ද මෙසේ විශ්ලේෂණය කිරීමෙන් බහුවිධ බුද්ධිය වර්ධනය වන බව පෙනෙනු ඇත.

**ක්‍රියාකාරකම 19**

## භෛරව රාගය

**නිපුණතාව 1.0** :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** :- උත්තර භාරතීය සංගීතයට අයත් විවිධ ස්වර සංගති සහ ස්වභාවයන්ගෙන් යුත් රාග කිහිපයක ස්වභාවය හඳුනා ගනිමින් ශිල්පීය ගුණාංග සහිත ව ගායනයේ/වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** :- භෛරව රාගය

**කාලච්ඡේද** :- 19

**ඉගෙනුම් පල** :-

- භෛරව රාගයේ ස්වර අභ්‍යාස ගායනය/වාදනය කරයි.
- භෛරව රාගයේ සර්ගම් ගායනය/වාදනය කරයි.
- භෛරව මධ්‍යලය ගී ගායනය/වාදනය කරයි.
- ආලාප හා මධ්‍යාලාප ගායනය/වාදනය කරයි.
- තානාලංකාර නිර්මාණය කර ගනී. ගායනය/වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- තාම්පුරාව, සර්පිනාව
- තබ්ලාව
- දෘශ්‍යාධාර

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

භෛරව රාගයේ ස්වර අභ්‍යාස, සර්ගම් මධ්‍යලය ගීතය/වාදිතය, ආලාප මධ්‍යාලාප තානාලංකාර ප්‍රායෝගික ව ගායනය/වාදනය පුහුණු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. මේ මඟින් රාග සංගති, රාග ස්වභාවය පිළිබඳ ව මනා අවබෝධයක් ලැබෙන අතර, රාග රස වින්දන ශක්තිය වර්ධනය වී නිර්මාණකරණයට ද අවස්ථාව ලැබෙනු ඇත.

මේ සඳහා භෛරව රාගයේ ස්වර අභ්‍යාස, සර්ගම්, මධ්‍යලය ගී, ආලාප, මධ්‍යාලාප, තානාලංකාර පුහුණුව හා ඇගයීමට කාලච්ඡේද 19ක් වෙන් කර ඇත.

රාග ස්වභාවය මැනවින් විදහා දක්වෙන ගීත මේ සඳහා යොදා ගත හැකිය. ඇමුණුමේ දක්වෙන ගීතයක් හෝ වෙනත් සුදුසු මධ්‍යලය ගීතයක් හෝ තෝරාගත හැකිය.

වාදනය කරන සිසුන් සඳහා රාගාංග මැනවින් විදහා දක්වෙන වාදිතයක් අවශ්‍ය නම් යොදාගත හැකිය.

ශ්‍රැතිය, ස්වර ස්ථාන, ස්වර සංගති, තාලය, මිහිරිතාව, රස භාව පිළිබඳ ව වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරීමේ කාර්යයෙහි යොදවන්න.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් අතරතුර දී හා අවසානයේ දී කරනු ලබන ඇගයීම් මඟින් සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම පිළිබඳ ව සොයා බලා දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකි ය.

**පාඩම සංවර්ධනය :-**

- පාඩම් අංක 01 ජයජයවන්ති රාගය පාඩම සංවර්ධන සැලසුම අනුගමනය කරමින් ඔබ පාඩම් සංවර්ධනය සැලසුම් කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- නිවැරැදි ස්වර ස්ථාන ශ්‍රැතියට හා තාලයට අනුකූල වීම පිළිබඳ ව නිරන්තර ඇගයීමක් පාඩම ආරම්භයේ සිට ම කළ යුතු ය.
- භෛරව රාගයේ මධ්‍යලය ගීතය, පූර්වාලාප, මධ්‍යාලාප, තානාලංකාර සමඟ ගායනය/වාදනය කරවා සුදුසු ලෙස අගයන්න.
- ප්‍රස්තාර කිරිමට හා රාගයේ සුවිශේෂතා තහවුරු වීමට සුදුසු ඇගයීම් සකසා ගන්න.

**මූලාශ්‍ර :-**

- මහාචාර්ය සංගීත් නිපුන් සනත් නන්දසිරි - රාගාලංකාර
- මහාචාර්ය දයා රත්නසේකර - හින්දුස්ථානි සංගීත අක්ෂිපිතිකා තරංගනි ප්‍රථම ගායනය
- ආචාර්ය ප්‍රේමදාස මුදුන්කොටුව - සම්භාව්‍ය සංගීත කෘතීන්

නිර්දේශිත මධ්‍යලය ගී

- ධනධන මූරත ක්‍රිෂ්ණ මුරා රි
- ජාගෝ මෝහන

සර්ගම්

- | සධ | පපධ | මප | මගරි |

**ක්‍රියාකාරකම 20**

## සමප්‍රකෘති රාග

**නිපුණතාව 1.0** :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** :- සමප්‍රකෘති රාග යුගලයක සමප්‍රකෘති බව ප්‍රායෝගික ව පැහැදිලි කරයි.

**ක්‍රියාකාරකම** :- සමප්‍රකෘති රාග හඳුනා ගනිමින් එහි සමවිෂමතා සොයමු.

**කාලච්ඡේද** :- 08

**ඉගෙනුම් පල** :-

- භෛරව, කාලිංගඩා රාගවල සමප්‍රකෘති ලක්ෂණ හඳුනා ගනියි.
- එම රාගයන්හි ප්‍රධාන ස්වර සංගති ගායනය, වාදනය කරයි.
- එම රාගයන්හි සම විෂමතා වගුගත කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- තාම්පුරාව, සර්පිනාව, ඇමුණුම

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

භෛරව හා කාලිංගඩා රාග අතර සමප්‍රකෘති ලක්ෂණ පිළිබඳව රාග විස්තර, ස්වර විස්තර, විශේෂ ස්වර සංගති මඟින් ප්‍රායෝගික අවබෝධය ලබා දීම මෙම ක්‍රියාකාරකම් මඟින් අපේක්ෂිත ය.

**පාඩම සංවර්ධනය :-**

- ඉගෙන ගත් භෛරව රාගය ගායනය/වාදනය කර පාඩමට පිවිසෙන්න. භෛරව රාගයට අයත් රාග විස්තර හා ස්වර සංගති අභ්‍යාසයෙහි යෙදෙමින් මතක් කර දීම.

  (කාලච්ඡේද 01)

- ඇමුණුම් අංක 02 දක්වා ඇති කාලිංගඩා රාගයේ ස්වර අභ්‍යාස නිදසුනට ගනිමින් ඔබ කැමති ලෙස රාග අංග සහිත ව ස්වර අභ්‍යාස ගොඩනගා ගායනය/වාදනය කරවන්න.

  (කාලච්ඡේද 01)

- ඇමුණුම් අංක 01 ඇසුරෙන් කාලිංගඩා රාගයේ රාග විස්තර සපයා ගනිමින් සිසුන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල යොදවන්න.

  (කාලච්ඡේද 01)

- කාලිංගඩා රාගයේ ස්වර විස්තර හා ස්වර සංගති ගායනය/වාදනය කරවන්න.

  (කාලච්ඡේද 02)

- භෛරව රාගයේ හා කාලිංගඩා රාගයේ ස්වර සංගති හා ප්‍රධාන අංග නිවැරැදි ස්වර ස්ථාන මතු වන පරිදි ඒකල, යුගල ආදී විවිධ ක්‍රම භාවිත කරමින් අභ්‍යාසයෙහි යොදවා, රාග දෙක අතර සම ප්‍රකෘති බව පිළිබඳ ස්වයං අධ්‍යයනයකට යොමු කරන්න.

  (කාලච්ඡේද 02)

- රාග දෙකේ සම විෂමතා පහත දක්වෙන මාතෘකා අනුව සාකච්ඡා කරමින් සටහනක් පිළියෙළ කරන්න.

- මේලය
- යෙදෙන ස්වර
- ජාතිය
- වාදී, සංවාදී, විවාදී ස්වර
- මුඛ්‍යාංග
- ප්‍රධාන ස්වර සංගති
- ගානසමයන්
- න්‍යාස ස්වර ස්ථාන

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- භෛරව හා කාලිංගඩා රාගවල ස්වර සංගති ගායනය/වාදනය කරවා සුදුසු පරිදි අගයන්න.
- භෛරව හා කාලිංගඩා රාගවල සම විෂමතා වගු ගත කරන්න.

**අතිරේක උදවු :-** Musicology of India Part II - V. S. Nigam කෘතිය.

**ඇමුණුම අංක 01**

| රාගය | මේලය | ආරෝහණ අවරෝහණ | ජාතිය | වාදී | සංවාදී | මුඛ්‍යාංගය | ගානසමය |
|---|---|---|---|---|---|---|---|
| භෛරව | භෛරව | සරි, ගම ප, ධ, නිසំ<br>සំනිධ, ප, මග, රිස | සම්පූර්ණ | ධ | රි | සගමප ධ, ප, | උදය සන්ධි ප්‍රකාශ රාග |
| කාලිංගඩා | භෛරව | සරි, ගම ප, ධ, නිසំ<br>සំනිධ, ප, මග, රිස | සම්පූර්ණ | ප | ස | ධප,<br>ගමග,<br>නිසරිග,ම | උදය සන්ධි ප්‍රකාශ රාග |

| | ස්වර සංගති | |
|---|---|---|
| භෛරව 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10. | ස ධ නි ස<br>ස රි රි ස<br>ග (ම) රි ස<br>ග ම ධ ධ ප<br>ම ග (ම) රි රි ස<br>නි ස ග ම ධ ධ ප<br>ග ම ධ සំ<br>සំ නි ධ ප<br>නි ස ග ම රි රි ස<br>ම ග (ම) රි ස | • රිෂභය සහ ධෛවතය ආන්දෝලනය කෙරේ.<br>• උත්තරාංගවාදී රාගයකි.<br>• මන්ද්‍ර සප්තකයේ සහ මධ්‍ය සප්තකයේ ස්වර ද ඇසුරු කරයි. |

| | ස්වර සංගති | |
|---|---|---|
| කාලිංගඩා 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10. | නි̣ ස රි ග<br>ග ම ග රි ස<br>ධ ප, ග ම ග<br>සරි සරි ගමග<br>මධ මධ නි නි ස̇<br>ස̇රි̇ ස̇රි̇ නි නි ස̇<br>ස̇ නි ධ ප<br>ග ම ග, රි ස<br>ගමපධපමප ගමග<br>ම ග රි ස | • රිෂභය සහ ධෛවතය ආන්දෝලනය නොවේ.<br>• ගමග ස්වර සංගතිය නිතර යෙදේ..<br>• ගාන්ධාරය මත බොහෝ විට න්‍යාස වේ.<br>• මධ්‍ය සප්තක සහ උච්ච සප්තක ස්වර වැඩි වශයෙන් ඇසුරු කරයි. |

| කාලිංගඩා පල්ටා | භෛරව පල්ටා |
|---|---|
| 1. නි̣ ස රි ස<br>නි̣ ස රි ග රි ස<br>නි̣ ස රි ග ම ග රි ස<br>නි̣ ස රි ග ම ප ප ම ග රි ස<br>නි̣ ස රි ග ම ධ ප ම ග ම ග රි ස<br>නි̣ ස රි ග ම ප ධ නි ධ ප ම ග ම ග රි ස<br>නි̣ ස රි ග ම ප ධ නි ස̇ නි ධ ප ම ග ම ග රි ස | 1. නි̣ ස ග ම, රි රි ස<br>නි̣ ස ග ම, ප ම ග ම රි රි ස<br>නි̣ ස ග ම, ප ධ ප ම ග ම, රි රි ස<br>නි̣ ස ග ම, ප ධ නි ධ ප ධ, ප ම ග ම ග රි රි ස<br>නි̣ ස ග ම, ප ධ නි ස̇, නි ධ ප ධ,<br>– ප ම ග ම ග රි රි ස |
| 2. ග ම ග රි ස<br>ග ම ප ග ම ග ම රි ස<br>ග ම ප ධ ප ම ග ම ග රි ස<br>ග ම ප ධ නි ධ ප ම ග ම ග රි ස<br>ග ම ප ධ නි ස̇ නි ධ ප ම ග ම ග රි ස | 2. ග ම රි රි ස<br>ග ම ධ ප ම ප ග ම රි රි ස<br>ග ම ධ නි ධ ප ම ප ග ම රි රි ස<br>ග ම ධ නි ස̇ නි ධ නි ධ ප ම ප ග ම රි රි ස |

කාලිංගඩා මධ්‍යලය ගීත

- රාම නාම භජන කරෝ
- අබ හෝ ලන
- වන කෝකිල පංචම නාද ඇසේ

ක්‍රියාකාරකම 21

## විලම්බ ලය ගීතයක් ගයමු/වයමු

**නිපුණතාව 1.0** :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** :- විලම්බ ලය ඛ්‍යාල් ගීතයක් සුවිශේෂ ශිල්පාංග සහිත ව ගයා/වයා ප්‍රදර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- විලම්බ ලය ගීතයක් සුවිශේෂ ශිල්පාංග සහිත ව ගයමු/වයමු.

**කාලච්ඡේද** :- 14

**ඉගෙනුම් පල** :-

- විලම්බ ලය ගීතයක් ගායනය/වාදනය කරයි.
- පූර්වාලාප මධ්‍යාලාප ගායනය/වාදනය කරයි.
- තානාලංකාර තාලානුකූලව නිර්මාණය කර ගායනය/වාදනය කරයි.
- සම්භාව්‍ය සංගීතයේ දී විලම්බ ලය ගායනයේ විශේෂත්වය අගයයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- විලම්බ ලය ගායනයක්/වාදනයක් සහිත, CD/DVD/ Pen drive අන්තර්ජාල සේවා
- තාම්පුරාව/සර්පිනා
- තබ්ලාව

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

බාගේශ්‍රී දේස්, ආසාවරී, ජයජයවන්ති, භෛරව යන රාග අතරින් එක් රාගයකට අයත් විලම්බ ලය ගීතයක් පූර්වාලප, මධ්‍යාලාප, බෝල් ආලාප සහ තානාලංකාර සමඟ ගායනය/වාදනය කිරීම මෙම පාඩමින් අපේක්ෂිත ය.

ඒ මඟින් විලම්බ ලය ගීතයක ස්වභාවය පිළිබඳ මනා අවබෝධයක් ලැබේ. එමෙන් ම රාග රසභාව සහ ඛ්‍යාල් ගායනය හෝ වාදනය හෝ වින්දන ශක්තිය වර්ධනය වී ඛ්‍යාල් ගායනයක් හෝ වාදනයක් හෝ ප්‍රායෝගික ව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙනු ඇත.

ඉහත රාග අතරින් එක් රාගයක කැමති විලම්බ ලය ගීතයක් තෝරාගත හැකි ය. වාදනය සඳහා රාගාංග සහිත විලම්බ ලය වාදිතයක් අවශ්‍ය නම් යොදා ගත හැකිය.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් අතරතුර දී හා අවසානයේ දී කරනු ලබන ඇගයීම් මඟින් සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම පිළිබඳ ව සොයා බලා දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකි ය.

**පාඩම සංවර්ධනය :-**

- තෝරා ගත් රාගයේ ඉගෙන ගත් මධ්‍ය ලය ගීතය ගායනය/වාදනය කරවීමෙන් පාඩමට පිවිසීම කළ හැකි ය. විලම්බ ලය ගීතයක්/වාදිතයක් සවන් දීමට සලස්වන්න. ඒ මඟින් විලම්බ ලය ගීතයක හෝ වාදිතයක හෝ ස්වරූපය වෙත අවධානය යොමු කිරීමට ක්‍රියාකාරකම්වල යොදවන්න.

(කාලච්ඡේද 01යි)

- තෝරා ගත් රාගයේ විලම්බ ලය ගීතය හෝ වාදිතය හෝ ස්ථායි, අන්තරා වශයෙන් ගායනය/වාදනය කරවන්න.

(කාලච්ඡේද 02)

- පූර්වාලාප සමඟ ගීතය පුහුණු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාකරකම් හි යෙදවීම.

(කාලච්ඡේද 01)

- මධ්‍යාලාප ගොඩ නැඟීම, මධ්‍යාලාප ගායනය/වාදනය හා තාලය සමඟ බද්ධ වීම් ක්‍රියාකරකම් හි යෙදවීම.

(කාලච්ඡේද 03)

- තානාලංකාර නිර්මාණය හා විලම්බ ලය ගීතයට හා තාලයට උචිත ව ගායනය/වාදනයට මඟ පෙන්වීම.

(කාලච්ඡේද 03)

- ශිල්පාංග සහිත ව රාගධාරී ගායනයක් ලෙස විලම්බ ලය ගීතය ඉදිරිපත් කිරීම ට අවස්ථාව ලබාදීම හා ඇගයීම.

(කාලච්ඡේද 04)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- සෑම ක්‍රියාකාරකමක් අතරතුර දී කරන ලද ඇගයීම් තුළින් දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැක.

**පැවරුම :-** විවිධ ප්‍රසංගයක දී හෝ වෙනත් ප්‍රායෝගික සංගීත වැඩ සටහනක දී විලම්භලය ගීතය සම්පූර්ණ ශිල්පාංග සහිත ව ඉදිරිපත් කිරීම.

**මූලාශ්‍ර :-** හින්දුස්ථානි සංගීත් ආක්ෂිප්තිකා තරංගනී ප්‍රථම භාගය, ද්විතීය භාගය, තෘතීය භාගය) මහාචාර්ය රත්නසේකර.

රාගාලංකාර - මහාචාර්ය සනත් නන්දසිරි.

සම්භාව්‍ය සංගීත (කෘතීන්) - ආචාර්ය ප්‍රේමදාස මුදුන්කොටුව.

පහත දක්වෙන විලම්බ ලය ගීතයක් හෝ ඔබ කැමති වෙනත් විලම්බ ලය ගීතයක් තෝරා ගත හැකි ය.

- **බාගේශ්‍රී රාගය**
  - කෛසේක ටේ රජනී සජනී
  - මෝහෙමනා වන ආ
  - මාන මනා වේ මේරී
  - බහු ගුන කා මන ආවේ
- **දේස් රාගය**
  - හෝජී මිහාරි බේ ග සුන ලිජෝ
- **ආසාවරී රාගය**
  - කාරික රූං මෙ එකපල නමානේ
- **ජයජයවන්ති රාගය**
  - පාලනා ගඩලා
  - පියා හම ජා නලි නීරේ
  - ජබ් තේ ලා - ගලී
- **භෛරව රාගය**
  - බාල මුවා මොරේ සෛයා

**ක්‍රියාකාරකම 22**

## සරල තාල පද අධ්‍යයනය - හින්ච්, බෙම්ටෝ, පංජාබි

**නිපුණතාව 1.0** : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.4** : තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය හා භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම** : තාල පද අධ්‍යයනය - (හින්ච්, බෙම්ටෝ, පංජාබි)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- පංජාබි, හින්ච් හා බෙම්ටෝ තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කරන අයුරු ප්‍රායෝගික ව අවබෝධ කරගනියි.

**ගුණාත්මක යෙදුම්** : අදාළ තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කරන අයුරු දැක්වෙන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා තබ්ලාවක්.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

පංජාබි, හින්ච් හා බෙම්ටෝ තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කිරීම පිළිබඳ ප්‍රායෝගික අවබෝධය සිසුන්ට ලබාදීම මෙම පාඩමින් අපේක්ෂිත යි. අදාළ අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි තබ්ලාවෙන් උත්පාදනය කරන ආකාරය පිළිබඳ අවබෝධය සිසුන්ට ලබාදෙන්න. මේ සඳහා අදාළ තාලවල ඨේකා ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය බණ්ඩ භාවිත කළ හැකි ය. පංජාබි යනු ශාස්ත්‍රීය සංගීතයේ භාවිත වන තාලයක් බවත් හින්ච් හා බෙම්ටෝ යනු සරල සංගීතයෙහි භාවිත වන තාල බවත් සිසුන්ට උගන්වන්න. හින්ච් හා බෙම්ටෝ තාලවල ඨේකා සම ලයෙන් වාදනය වීමේ දී මතු වන රිද්මීය වෙනස සංසන්දනාත්මක ව සිසුන්ට පැහැදිලි කරන්න. පහත දැක්වෙන ආකාරයට වෙන් කරගනිමින් පාඩම සැලසුම් කරගන්න.

**පාඩම් සංවර්ධනය :**

මෙහි ඇමුණුමෙහි ඇතුළත් පංජාබි තාලයේ ඨේකාව තාල ප්‍රස්තාර සහිත ව සිසුන්ට ලබා දෙන්න. පංජාබි ඨේකාවට අයත් අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි හා ඨේකාව වාදනයේ දී මතු වන රිද්ම රටාව හඳුනාගැනීම සඳහා ඔබ සූදානම් කරගත් ශ්‍රව්‍ය බණ්ඩය සිසුන්ට ඇසීමට සලස්වන්න. එම ධ්වනි තබ්ලාවෙන් උපදවාගන්නා ආකාරය එකිනෙක පැහැදිලි කරමින් ඨේකාව සමගුණයෙන් තබ්ලාවෙන් වයා පෙන්වන්න. සිසුන් ලවා ඨේකාව තබ්ලාවෙන් වාදනය කරවමින් ඔවුන් ප්‍රායෝගික අභ්‍යාසයෙහි යොදවන්න.

(කාලච්ඡේද 02)

මෙහි ඇමුණුමෙහි ඇතුළත් හින්ච් හා බෙම්ටෝ තාලවල ඨේකා තාල ප්‍රස්තාර සහිත ව සිසුන්ට ලබා දෙන්න. එම ඨේකාවලට අයත් අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි හඳුනාගැනීම සඳහා ඔබ සූදානම් කරගත් ශ්‍රව්‍ය බණ්ඩ සිසුන්ට ඇසීමට සලස්වන්න. එම ඨේකා දෙක වාදනයේ දී මතු වන රිද්ම රටාවල වෙනස සිසුන්ට පෙන්වා දෙමින් එම ධ්වනි තබ්ලාවෙන් උපදවාගන්නා ආකාරය එකිනෙක පැහැදිලි කරන්න. ඨේකා සමගුණයෙන් තබ්ලාවෙන් වයා පෙන්වන්න. සිසුන් ලවා ඨේකා තබ්ලාවෙන් වාදනය කරවමින් ඔවුන් ප්‍රායෝගික අභ්‍යාසයෙහි යොදවන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඒ ඒ කොටස් අවසානයේ වාචික ප්‍රශ්න හා ප්‍රායෝගික යෙදවීම් මඟින් සිසුන් ඇගයීමට ලක් කරන්න.

# ඇමුණුම

පංජාබි

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධා | ගධිං | -ග | ධා | ධා | ගධිං | -ග | ධා | ධා | කතිං | -ක | තා | තා | ගධිං | -ග | ධා |
| X | | | | 2 | | | | 0 | | | | 3 | | | |

බෙම්ටෝ

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ධා | ති | ධි | නා | ති | නා | තා | ති | ධි | නා | ධි | නා |
| X | | | 2 | | | 0 | | | 3 | | |

හීන්ච්

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| ධිං | නධි | ධිනා | තිං | නධි | ධිනා |
| X | | | 0 | | |

ක්‍රියාකාරකම 23

## සංගීතය ට වින්දනාත්මක ව සවන් දීමේ අභ්‍යාස

**නිපුණතාව 2.0** :- විශ්ව සංගීතයේ ස්වභාවය වටහා ගනිමින් විවධතා ගවේශණය කරයි.

**නිපුණතා මට්ටම 2.1** :- අපරදිග සංගීතය තුළ සංගීත නිර්මාණයන්හි ස්වභාවය ගවේශණය කරමින් ඒවාට දායක වූ සංගීතඥයන් කිහිපදෙනෙකු විමර්ශනය කරයි.

**ක්‍රියාකාරකම** :- සංගීතය වින්දනාත්මක ව සවන්දීමේ අභ්‍යාස

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-
- නිවැරදි ව සංගීතයට සවන් දෙන අයුරු දැන ගනියි.
- වින්දනාත්මක ව සවන් දෙයි.
- නිවැරදි වින්දනය මඟින් රසාස්වාදයට අමතර ව මානසික සැහැල්ලුව ළඟා කරගත හැකි බව අත්දැකීමෙන් පවසයි.
- සරල ගී රසාස්වාදය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**
- හඬ ශ්‍රවණයට සැලැස්විය හැකි උපකරණයක්
- සරල ගීත ඇතුළත් CD හෝ Pen එකක්
- ඛ්‍යාල් ගායනයක් ඇතුළත් CD හෝ Pen එකක්
- සිම්පනියක් හෝ යානි වැනි සංගීතවේදියකුගේ වාදනයක් ඇතුළත් CD හෝ Pen එකක්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

'ඇසෙනවා' හා අසනවා යන්න එක් දෙයක් ලෙස පෙනුණ ද මෙම ක්‍රියාවන් දෙක පරස්පර ය. සංගීතයේ දී වැදගත් අසනවා, ශ්‍රවණය කරනවා නැතහොත් සවන් දෙනවා යන්න ය. සවන් දීමත් වින්දනාත්මක ව සවන් දෙනු ලබනුයේ කෙසේ ද යන්න පහදා දීම හා ඒ පිළිබඳ ව අත්දැකීම් ලබාදීම මෙම පාඩමේ අපේක්ෂාවයි.

අප සවන් යොමන සංගීත ශෛලියේ සංගීතමය ලක්ෂණ පිළිබඳ ව දැනසිටීම වින්දනාත්මක ව සවන් දීමට අත්‍යවශ්‍ය ය. එය සාහිත්‍යමය අගයකින් ද සමන්විත වන්නේ නම් සාහිත්‍යමය කරුණු පිළිබඳ ව ද මනා අවබෝධයක් හා අවධානයක් තිබිය යුතු ම ය.

වින්දනාත්මක ව සංගීතයට සවන් දීම කියාදීම පළමු කාලච්ඡේදයෙන් අපේක්ෂිත ය. ඒ සඳහා ඇමුණුම 01හි සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න. දෙවන කාලඡේදයේ දී සරල ගීතයකට සවන් දීමට සිසුන් යොමු කළ යුතු වෙයි.

තෙවන කාලච්ඡේදයේ දී හින්දුස්ථානි ශාස්ත්‍රීය ගායනයක් හෝ වාදනයක් වින්දනය සඳහා භාවිත කළ යුතු ය. මධ්‍යලය ගීතයක් (ඛ්‍යාල් ශෛලියෙන්) උචිත ය. සිවු වන කාලච්ඡේදයේ දී බටහිර සංගීතයට අයත් සිම්පනියක් වින්දනය කිරීම සඳහා යොදා ගන්න.

වින්දනීය ක්‍රියාවලියෙහි සාර්ථකත්වය උදෙසා අසන්නාගේ සිතෙහි ජනිත වන චිත්තරූප ඉතා වැදගත් ය. මේ පිළිබඳ ව සිසුන් දැනුම්වත් කරන්න.

**පාඩම සංවර්ධනය :-**

- සරල ගීතයක ස්ථායි කොටස ශ්‍රවණයට සලස්වා එහි අවසානය තෙක් ඒකාග්‍ර වූ සිතකින් එම ගීතයට සවන් දුන්නා දැයි විමසමින් පාඩමට පිවිසෙන්න.
- ඇමුණුම 01හි සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

(කාලච්ඡේද 01)

- සිසුනට ගැළපෙන ආකාරයේ ගීතයක් තෝරාගෙන ශ්‍රවණයට සලස්වන්න.

(කාලච්ඡේද 01)

**ගුරු උපදෙස් :-**

- ගීතයෙහි අරුතට ගැළපෙන අයුරින් තනුව නිර්මාණය වී ඇද්ද, භාණ්ඩ භාවිතය උචිත ද, ගායනය රසය තීව්‍ර කරනවා ද වැනි කරුණු පිළිබඳ වත් සිතමින් විඳීමට සිසුන් යොමු කරන්න.
- ඛ්‍යාල් ශෛලියට අයත් ගායනයක් හෝ වාදනයක් (මධ්‍ය ලය ගීතයක්) වින්දනය කිරීමට යොමු කරවන්න.
- පළමු ව ඛ්‍යාල් ගායනයක හෝ වාදනයක හෝ ශෛලිය පිළිබඳ ව අවබෝධයක් ලබා දෙන්න. රාග භාවය හා රස භාව මතුවීම පිළිබඳ ව ද විමසමින් වින්දනය සඳහා සිසුන් යොමු කරවන්න.

(කාලච්ඡේද 01)

- බටහිර සිම්පනියක් හෝ යානි වැනි සංගීතඥයකුගේ වාදනයක් හෝ වින්දනය කිරීම සඳහා සිසුන් යොමු කරන්න.
- සිම්පනියක් යොදා ගන්නේ නම් එහි ආකෘතිය හා සංගීත භාවිතය පිළිබඳ ව සරල අවබෝධයක් ලබා දෙන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය පිළිබඳ උපදෙස් :-**

එක් එක් කාලච්ඡේදය අවසානයේ දී වාචික ප්‍රශ්න හෝ විචාරශීලී සාකච්ඡාවක් හෝ මඟින් ඇගයීමට ලක් කරන ප්‍රශ්නාවලිය තුළ දී තමා ලද අත්දැකීම් ඇතුළත් ව කෙටි විචාරයක් ලිවීමට මඟ පෙන්වන්න.

**ඇමුණුම 01**

**ගුරු උපදෙස් :-**

සංගීතය වින්දනය කිරීමේ දී මානසික ඒකාග්‍රතාව අත්‍යවශ්‍ය ය. ඒ සඳහා පහත ක්‍රියාකාරකමෙහි සිසුන් යොදවන්න.

1. සිසුන් සන්සුන් ව අසුන් ගන්වන්න.
2. සිසුන්ගේ සිතට ගලා එන සියලු සිතිවිලි නවතා සිත හිස් කිරීමට උපදෙස් දෙන්න.
3. සිතට ගලා එන සිතුවිලි නැවතීමෙන් පසු සිතට දැනෙන සැහැල්ලුව විඳීමට සිසුන් යොමු කරන්න.
4. සිසුනට සිත එක අරමුණක පිහිටුවා ගැනීමට උපදෙස් දෙන්න.
5. ඔවුනට පරිසරයෙන් ඇසෙන එක් හඬකට පමණක් සිත යොමු කොට දිගින් දිගට ම එම හඬ පමණක් ශ්‍රවණය කිරීමට උපදෙස් දෙන්න.

**ක්‍රියාකාරකම 02**

1. ගීතයක් ඇසීමට සලස්වා සිත වෙනත් කිසි දු අරමුණකට ගමන් නොකරන සේ එය ශ්‍රවණයට යොමු කරන්න.
2. ශ්‍රවණයෙන් පසු සිත වෙනත් අරමුණු කරා ගමන් කළා දැයි විමසමින් එය නොවීමට උත්සාහ කරමින් නැවත නැවත ශ්‍රවණයට අවස්ථාව සලසන්න.
3. ගීතයට අදාළ චිත්ත රූප මඟින් තම වින්දනය තීව්‍ර කර ගැනීමට උපදෙස් දෙන්න.
4. ඔබගේ නිර්මාණශීලී අදහස් මඟින් මෙම ක්‍රියාකාරකම තව දුරටත් සංවර්ධනය කරන්න.

**ක්‍රියාකාරකම 24**

## ස්වර පුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ වාදනය

**නිපුණතාව 3.0** :- වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** :- ස

**ක්‍රියාකාරකම** :- ස්වර පුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව හෝ වාදනය

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් පල** :-

- C Minor ස්කේලයට අයත් ගීතයක් ස්වර පුවරුවෙන් වාදනය කරයි.
- C Minor ස්කේලයට අයත් ගීතයක් තෝරාගත් වාද්‍ය භාණ්ඩයෙන් වාදනය කරයි.
- Minor Chordහි ගීතයන්හි ඇති මිහිරි බව හඳුනාගෙන වාදනයට කැමැත්ත ප්‍රකාශ කරයි.
- C Minor ස්කේලයට අයත් ස්වර භාවිතයෙන් එම Chord එකෙන් වැයෙන ගීත නිර්මාණය වී ඇති බව දැන ගනියි.
- තබ්ලාව වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- සිසුන් විසින් සපයා ගන්නා ලද සංගීත භාණ්ඩ
- ඇමුණුම 01හි ඇතුළත් ස්වර ප්‍රස්තාරය සහිත දෘශ්‍යාධාරය

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

Minor Chord භාවිත කරමින් ගීත වාදනය කරවීම මෙම පාඩමින් අපේක්ෂිත යි. වමතින් Chord වයන අතර දකුණතින් ගීතය වාදනය විය යුතුයි. Drums Beat සහිත Organ සතු ව ඇති සිසුන්ට Drum Beat එකක් ද භාවිත කරමින් ගීත වාදනයට මග පෙන්වන්න. මේ සඳහා පළමු කාලච්ඡේදය භාවිත කරන්න.

දෙවන කාලච්ඡේදයේ දී ඔවුන් විසින් තෝරාගන්නා ලද වෙනත් සංගීත භාණ්ඩයකින් ද මෙම ගීතයට වාදනය කිරීමට හුරු කරවන්න.

මෙම කාලච්ඡේද දෙක සඳහා ම ඇමුණුම 01හි සඳහන් ගීතය භාවිත කරන්න. ස්වර වාද්‍ය භාණ්ඩය වයනවා වෙනුවට තබ්ලා වාදනය කරන සිසුන් ලවා තබ්ලාව සඳහා දී ඇති පාඩම් වාදනය කරවන්න.

**පාඩම සංවර්ධනය :-**

- පසුගිය වාරයේ සිසුන් ඕගනයෙන් පුහුණු වූ C Minor ස්කේලය වාදනය පිළිබඳ සිසු හැකියා පිරික්සමින් පාඩමට පිවිසෙන්න.
- ඇමුණුම 01හි ඇති ගීතයේ ස්වර සහිත දෘශ්‍යාධාරය ප්‍රදර්ශනය කර සිසුන් අතැති ඕගන් මගින් එය වාදනයට පුහුණු (Chord සමඟ) කරවන්න.

(කාලච්ඡේද 01)

- සිසුන් තෝරා ගත් වාද්‍ය භාණ්ඩයෙන් ඇමුණුම 01හි ඇති ගීතය වාදනය කරවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

සිසුන්ගේ වාදන හැකියා අගයා වැරදි නිවැරදි කළ හැකි අයුරින් ඇගයීම සැකසිය යුතු ය.

**අතිරේක උදවු :-**

වාදන සහිත වීඩියෝ දර්ශන හා ගී ප්‍රස්තාර සහිත පොත්.

**ක්‍රියාකාරකම 25**

# වේද ගායනා භාරතීය සංගීතයට මුල් වූ අයුරු

**නිපුණතාව 6.0** :- සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 6.1** :- භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම** :- වේද ගායනා සංගීතයට මුල් වූ අයුරු.

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-

- භාරතීය සංගීතයේ ප්‍රභවයට වේද ගායනා බලපා ඇති ආකාරය විස්තර කරයි.
- වේද ගායනා සංගීතයට මුල් වී ඇති ආකාරය අගය කරයි.
- වේද ගායනා සංගීතයට මුල් වී ඇති අයුරු සොයා ගනියි.

**ගුණාත්මක යෙදවුම් :-**

- කියවීම් පත්‍රිකාවල ඡායා පිටපත්
- සර්පිනාව

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

භාරතීය සංගීතයේ විකාශයට වේද ගායනා මුල් වී ඇති ආකාරය පිළිබඳ ව සාකච්ඡා කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ. ඇමුණුම වශයෙන් දක්වා ඇති මාතෘකා ශීර්ෂ මේ සඳහා යොදා ගත හැකි ය. ඉගැන්වීමට නියමිත කාලච්ඡේද හතරට ගැළපෙන පරිදි ක්‍රියාකාරකම් සැලැස්ම, ගුරුවරයා විසින් සකස් කර ගත යුතු වේ.

**පාඩම සංවර්ධනය :-**

- ඍග් වේදයේ දෙවියන් උදෙසා ස්තෝත්‍ර ''ඕම්'' කාරයෙන් ගයා ඇත. එම ''ඕම්'' කාරය ගායනා කර පෙන්වන්න. එම ගායනය පිළිබඳ ව සිසු අදහස් විමසන්න. ඇමුණුම අංක 01හි ඇතුළත් විෂයය කරුණු අනුව ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකා බෙදා දෙන්න. සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

  (කාලච්ඡේද 02)

- ඇමුණුම අංක 02හි ඇතුළත් සාම වේදයේ ගීත ගැයූ සම්මුතික ක්‍රමයේ සිට ස්වර සප්තකය තෙක් වර්ධනය වූ ආකාරය පිළිබඳ ව කියවීම් පත්‍රිකා සකස් කර සිසුන්ට බෙදා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

  (කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් විෂයය කොටසක් අවසානයේ ලිඛිත ප්‍රශ්න මඟින් අගයන්න.

**පැවරුම :-**

''වේද ගායනා භාරතීය සංගීතයේ ප්‍රභවයට මුල් වී ඇත.'' මෙම මාතෘකාව ඔස්සේ ලිපියක් සකස් කරවන්න.

**අතිරේක උදවු :-**

- 2010 පෙරදිග සංගීතය - 13 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශය.
- භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය - දූරස්ථ අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
- විශ්ව සංගීත ක්ෂේත්‍ර - සී. ද එස්. කුලතිලක

ඇමුණුම - (විෂය කරුණු හා බැඳි ශීර්ෂ)

ඇමුණුම 01 කොටස

- ඉන්දු ආර්ය ශිෂ්ටාචාරය පිළිබඳ කරුණු දැනගැනීමට පැරණි වේද ග්‍රන්ථ ඉවහල් වීම.
- වේදය ග්‍රන්ථ කොටස් 4කින් යුක්ත වීම. ඉන් පළමු වැන්න ඍග්වේදය වීම. එම ග්‍රන්ථ කොටස් හතර දැක්වීම.
- ඇදහිලි හා විශ්වාස මත ගොඩනැගුණ ගීතිකා ඍග්වේදයේ ඇතුළත් වීම.
- වේද ගීත ගයන ආකාරය සාමවේදයේ දක්වන අයුරු.
- ''අග්නි මීලේ පුරෝහිතම්'' - මෙහි පාදයෙන් පාදයට ඇති ලඝු, ගුරු අක්ෂර සංඛ්‍යාව අක්ෂර අටක විරිතක් වීම. (අනුෂ්ටුප් චන්දස)
- වේද ගීතිකා විරිතක් හෝ ඡන්දස් ක්‍රමයක් හෝ මත ගොඩනැගීම.

ඇමුණුම 02 කොටස

- සාමවේදයේ ගීතිකා සම්මුතික ක්‍රමයකට ගැයීම.
- ''අග්නි මීලේ පුරෝහිතම්'' පාද තුනේ ඇති සිරස්, තිරස් සංකේත හා සංකේත නොමැති ස්ථාන ද වීම.
- නාද ස්ථාන 3ක් ගොඩනැගීම. සංගීතයේ ස්වර තුනක ප්‍රභවය, එය උදාත්ත, අනුදාත්ත, ස්වරිත වීම.
- වේද ගීත ගායනා කරන පිළිවෙළ වර්ධනය වීමත් සමඟ ම නාදස්ථාන හතර තෙක් වර්ධනය වීම හා අවස්ථා හතර දැක්වීම. (ආර්චික, ගාථික, සාමික, ස්වරාන්තරික වශයෙන්)
- සාම ගීතිකා ප්‍රස්තාර ක්‍රමයක් මත ලියා ඇති බව.
- වේද ග්‍රන්ථවල ගීතිකා, ගාන ග්‍රන්ථ කිහිපයක ම පළ වීම.
- ගැයිය යුතු පිළිවෙළ අංක 1 සිට 6 දැක්වීම. මෙය භාරතීයයන්ගේ මුල් ම ස්වර සාධනය වීම.
- සාම වීණා සංගීත භාණ්ඩය පදනම් කරගෙන වර්තමානයේ භාවිත වන ස්වර සප්තකය තෙක් වර්ධනය වීම.

**ක්‍රියාකාරකම 26**

## ගෝත්‍රික ගීත උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම

**නිපුණතාව 6.0** :- සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 6.1** :- භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම** :- ගෝත්‍රික ගීත උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම.

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-

- විවිධ රටවල සංගීතයේ විකාශයට, ගෝත්‍රික ගීතවල බලපෑමක් ලැබී ඇති බව අවබෝධ කර ගනියි.
- භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය කෙරෙහි ගෝත්‍රික ගීතවල දායකත්වය විස්තර කරයි.
- භාරතීය සංගීතය හා බැඳි ආර්ය ගෝත්‍රවල ඓතිහාසික තොරතුරු විමසා බලමින් පිළිගනියි.

**ගුණාත්මක යෙදවුම් :-**

- නිර්දේශ කර ඇති ග්‍රන්ථ හෝ එම ග්‍රන්ථවලින් ඇමුණුමට අදාළ ව උපුටා ගත් කොටස් හෝ ඇතුළත් කරමින් සකස් කර ගත් කියවීම් පත්‍රිකා.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

ගෝත්‍රික ගීත භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය කෙරෙහි බලපා ඇති ආකාරය පිළිබඳ ව තොරතුරු අධ්‍යයනය මඟින් විමසා බලමින් ගවේෂණාත්මක අත්දැකීමක් සිසුන්ට ලබා දීම මෙයින් අපේක්ෂා කෙරේ. ඇමුණුමට අදාළ ව, තොරතුරු එක්රැස් කර ගැනීමට නම් කර ඇති ග්‍රන්ථයක් ඍජු ව ම සපයා ගත හැකි ය. ගුරුවරයා සතු අවබෝධය අනුව වෙනත් උචිත ශ්‍රව්‍ය ආධාර හෝ දෘශ්‍යාධාර හෝ භාවිත කරමින් සිසු අත්දැකීම් පෝෂණය කිරීම ගුරුවරයාගේ අභිමතය පරිදි සිදු කළ හැකි ය.

**පාඩම සංවර්ධනය :-**

- මීට පෙර ක්‍රියාකාරකමේ දී ඉගෙන ගත් ''වේද ගායනය භාරතීය සංගීතයේ ප්‍රභවයට මුල් වූ අයුරු'' යළි සිහිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ අනුව ගෝත්‍රික ගීත ද භාරතීය සංගීතයේ විකාශයට බලපා ඇති බව පෙන්වමින් සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න. ඇමුණුම අංක 01 කොටසට අදාළ ශීර්ෂ ඔස්සේ ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකාව බෙදා දී, සිසුන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න.

  (කාලච්ඡේද 02)

- ඇමුණුම අංක 02 කොටසට අදාළ ව භාරතීය සංගීතය හා බැඳි ආර්ය ගෝත්‍රවල ඓතිහාසික තොරතුරු හා විවිධ සංගීත මූලාශ්‍රය පිළිබඳ ව ද භාරතීය සංගීතයේ ප්‍රභවයට බලපෑ ගෝත්‍රික ගීත නාද මාලාවන්ගෙන් රාග බිහි වීම පිළිබඳ ව ද ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකා බෙදා දී සිසුන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න.

  (කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ''භාරතීය සංගීතයේ විකාශයට ගෝත්‍රික ගීත බලපා ඇත.'' මෙම මාතෘකාවට රචනාවක් ලිවීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදවු :-**

- ලංකාවේ සංගීත සම්භවය සී. ද ඇස්. කුලතිලක
- සංගීත සංහිතා - පිටු අංක 466 - 476
- භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය (දූරස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලාව)

**ඇමුණුම - (විෂය කරුණු හා බැඳි ශීර්ෂ)**

**ඇමුණුම 01 කොටස**

- විවිධ රටවල ද සංගීතයේ ප්‍රභවය හා විකාශයට ගෝත්‍රික ගීතවල බලපෑම.
- අප්‍රිකානු රටවල ද සන්නිවේදන මාධ්‍යයක් ලෙස බෙර වර්ග භාවිත කිරීම. විවිධ රිද්ම රටාවලින් පණිවිඩ දීම. සන්නිවේදනය සඳහා බෙරයකට තැළීම. ප්‍රීතිමත් අවස්ථාවල දී කරන ගායනාවන්ට මෙම භාණ්ඩ එකතු කර ගැනීම. බටහිර ලෝකයේ යොදාගන්නා SHAMBA RAMBA රිද්මවලින් කොංගෝ භාණ්ඩ වැනි භාණ්ඩයන් නිර්මාණය සඳහා ගෝත්‍රික ගීත මූලික වූ බව සංගීතඥයන්ගේ පිළිගැනීම.
- ශ්‍රී ලංකාවේ ගල් ගුහාවල වාසය කරන වැද්දන්ගේ ගීත. විද්වතුන් ඒවා නව ශිලා යුගයකට අයත් බව පැවසීම.
- පැටගෝනියාවේ දකුණු තුඩුවේ ටියරා ඩෙල්ෆුයගෝ ප්‍රදේශයේ වාසය කරන යමාන ගෝත්‍රිකයන්ගේ ගීත ද ප්‍රාග් ඓතිහාසික තත්ත්වයක් ඉසිලීම. ලෝකයේ ඉතා ම පැරණි ම නාදමාලාවන් ලංකාවේ හා පැටගෝනියාවේ ගෝත්‍රික ජනයා අතර පවතින බව ආචාර්ය ''සැක්ස්'' පැවසීම.

  අප්‍රිකාවේ - පිග්මි සහ බ්‍රෂ්මන් ගෝත්‍රිකයන්

  මලයාවේ - වනචාරී සෙමාං ගෝත්‍රිකයන්

  ඕස්ට්‍රේලියාවේ පැපුවා නිව්ගිනියා ගෝත්‍රික යන මොවුන්ගේ ගීතවලින් පැරණි ගායන ස්වරූපය විදහා පෑම.

**ඇමුණුම 02 කොටස**

- ගායනයෙහි දක්ෂතාව ආර්ය සමාජය ඉන්දියාවේ පහළ වීමට පෙර අනාර්ය ගෝත්‍රිකයන් අතර ද පැවතීම.
- ස්වභාව ධර්මයේ සිදුවීම් නිසා ඒ වෙනුවෙන් කාලය වැය කිරීමේ හේතුවෙන් නැටුමට හා ගීත ගායනයට අවස්ථාවක් නොලැබීම.
- ජීවත් වීමේ සටනට කණ්ඩායම් වශයෙන් එක්වීම. එවිට ඔවුන්ට සංගීතය නැති ව ම බැරි සමාජ අවශ්‍යතාවක් වීම.
- දේවත්වය ආරෝපණය කර, එම බලවේගයන් යාඥා කළේ ගායනයෙන් වීම. භාණ්ඩ වාදනය ආරම්භ වීම.
- අද්භුත බලවේග පිනවීමට කාලයෙන් විශාල කොටසක් යෙදවීම.
- මෙම පරමාර්ථය සාර්ථක කර ගැනීමට සංගීතය හා නැටීම යොදා ගැනීම.
- භාරතයේ දේව සභාවේ ''අග්නි'' පිදීම හැම ශිෂ්ටාචාරයක ම පැවතීම. පැරණි නාදමාලාවන්ගේ මුල් ස්වභාවයන් අදත් ආරක්ෂාව පැවතීම. එයට හේතුව වී ඇත්තේ ලෝකයේ තැනින් තැන විසිරී සිටින ගෝත්‍රික ජනයා වීම.
- ස්වර නිර්මාණය සඳහා ගෝත්‍රික ගීත නාදමාලා ඉවහල් වීම.
- රාග බොහෝ ගණනක් ආර්යයන් භාරතයට සංක්‍රමණය වීමට පෙර විසූ ගෝත්‍රිකයින්ගේ ගීත නාදමාලාවන් මඟින් බිහිවීම.
- විවිධ ගෝත්‍රවලින් රාග බිහිවීම.

  තක්ක ගෝත්‍රය, රෝකාමී ගෝත්‍රය, ආභිරාස් ගෝත්‍රය, සාවරී ගෝත්‍රය, කන්ග්‍රා කඳුකරයේ ජනතාව, වීරාව ගෝත්‍රය

  **<u>බිහි වූ රාග</u>** - තොන්ක් රාගය, මාලව රාගය, අභීර් රාගය, සාවරී රාගය, පහාඩිසහ මාන්ඩ් රාග, භෛරව රාගය

ක්‍රියාකාරකම 27

## පද්‍ය ප්‍රබන්ධ උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම

**නිපුණතාව 6.0** :- සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 6.1** :- භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම** :- පද්‍ය ප්‍රබන්ධ උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම.

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-

- පද්‍ය ප්‍රබන්ධ උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑ ඇති ආකාරය විස්තර කරයි.
- රාගධාරී සංගීතය ඇසුරින් නිර්මාණය වූ භක්ති කාව්‍යයක් ලෙස ගීත ගෝවින්දය පිළිගනියි.
- විවිධ යුගවල දී විවිධ ගායන ශෛලීන් බිහි කරමින්, පද්‍ය ප්‍රබන්ධ යටතේ නිර්මාණය කළ භජන් ගීත ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ඇමුණුම්වලට අදාළ ව සකස් කර ගත් කියවීම් පත්‍රිකාවල ඡායා පිටපත්
- සර්පිනාව - භජන් ගීත ඇතුළත් ශ්‍රව්‍ය තැටි හෝ දෘශ්‍යාධාර

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

රාගධාරී සංගීතය ඇසුරු කරමින් නිර්මාණය වී ඇති මහා කවි ජයදේවයන්ගේ ගීත ගෝවින්දයේ ඇතුළත් පද්‍ය ප්‍රබන්ධ මීරාභජන්, තුල්සිදාස්, කබීර්දාස්, සූර්දාස් නිර්මාණය කළ පද්‍ය ප්‍රබන්ධවලින් සැකසුනු භජන් ගීත ත් ගායනය කිරීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ.

**පාඩම සංවර්ධනය :-**

- මහා කවි ජයදේවගේ ''ගීත ගෝවින්දයෙහි'' ඇතුළත් ගීත හෝ පද්‍යයක් හෝ ගයමින් එය උතුරු ඉන්දීය රාගධාරී සංගීතය ඇසුරු කර ඇති ආකාරය සිසුන් සමඟ සාකච්ඡා කරන්න. ඇමුණුම අංක 01 හි ඇතුළත් විෂය කොටස් සඳහා ඔබ විසින් සකස් කරන ලද කියවීම් පත්‍රිකා බෙදා දී සිසුන් සැලසුම් කළ ක්‍රියාකාරකම්වල යොදවන්න.

- මීරා භජන් කිවිඳිය ද උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට භජන් ගීත ප්‍රබන්ධ කරමින් ගායනය කර ඇත. එම ගීතයක් ගායනය කරමින් සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.

(කාලච්ඡේද 02)

- ''තුල්සිදාස්'' පද්‍ය ප්‍රබන්ධ ඇසුරින් නිර්මාණය කරන ලද භජන් ගීතයක් ගායනය කරවන්න.
- මීට අමතර ව උතුරු ඉන්දීය සංගීතයට හිමි වූ පද්‍ය සාහිත්‍යයෙහි ලා පද්‍ය ප්‍රබන්ධ කළ කබීර්දාස්, සූර්දාස් යන අය නිර්මාණය කළ භජන් ගීතයන්ගෙන් එක් ගීතයක් ගායනය කරවන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට පද්‍ය ප්‍රබන්ධ බලපා ඇති ආකාරය පිළිබඳ ව නිදසුන් සමඟ රචනාවක් ලියන්න.

**අතිරේක උදවු :-**

- විමල් අබේසුන්දර - සංගීත සංහිතා
- භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය (පිටු අංක 10 - 11) (දූරස්ථ ගුරු අධ්‍යාපන පාඨමාලාව)
- ශාන්ති ගීතදේව - රාග දෘෂ්ටි (පිටු අංක 85 - 86)
- දයා රත්නසේකර - සංගීත සම්භාවනා

**ඇමුණුම - (විෂය කරුණු හා බැඳි ශීර්ෂ)**

**ඇමුණුම 01 කොටස**

- සංස්කෘත සාහිත්‍යයේ මුදුන් මල්කඩක් වූ ගීත ගෝවින්දය පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීම. (විවිධ භාෂාවලට පරිවර්තනය වීම. (හින්දි, ලතින්, ජර්මන්)

  මෙහි එන ප්‍රබන්ධ රාග අනුව නිර්මාණය වීම. (වසන්ත, ගුර්ජරී, රාම්කලී, මාලවගෞඩී)

  රාධා - ක්‍රිෂ්ණා ආදරය තේමාකොට පද්‍ය ප්‍රබන්ධ කිරීම.

  රාම්කලි රාගය අනුව නිර්මාණය වූ පද්‍ය පන්තියක කොටසක්.

  (1) චන්දන චර්චිත නීල කලේවර පීත වසන මනමාලී
  කේලි චලන් මණි කුණ්ඩල මණ්ඩිත ගණ්ඩ යුගඃ සිතසාලී

  හරිරිහ මුග්ධ වධූ නිකරේ
  විලාසිනී විලසිත කේලිපරේ

  (2) ධීර සමීරේ යමුනා තීරේ - වසති වනේ වනමාලී
  ගෝපී පීන පයෝධර මර්දන - චංචල කර යුග ශාලී

  රති සුඛ සාරේ - ගතමභිසාරේ
  මදන මනෝහර වේශම්
  නකුරු නිතම්බනි - ගමන විලම්බන
  මනුසර තං - හෘදයේ ශම්

  මෙම ගීතයට තනුවක් යොදා ගායනය කරන්න.

  - මීරා භජන් කිවිඳිය විසින් රචිත පද්‍ය ප්‍රබන්ධ

    - තුමබින මොරේ කෝන කබර හේ
    - පග ගුංගරු බාද මීරා නාචීරේ
    - මේරේ තු ගිරධර ගොපාල
    - රාම රතන ධන පායෝ - පායෝජී මෛනේ

**ඇමුණුම 02 කොටස**

- තුල්සිදාස් ප්‍රබන්ධ කළ භජන් ගීතයක් ගායනය කිරිම.

  - ඵුමක චලිත රාමචන්ද්‍ර
- කබීර්දාස් ප්‍රබන්ධ කළ මහා කවියෙකු මෙන් ම උසස් ගායකයෙකි.

  - චාන්දරියා ජී තෙරේ ජීනී
- සූර්දාස් ප්‍රබන්ධ කළ භජන් ගීතයක් ගායනය කිරීම.

  - යශෝධා හි පාලන කුධු ලාවේ

ක්‍රියාකාරකම 28

## සංගීතඥයන්ගේ පරිශ්‍රමය උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම

**නිපුණතාව 6.0** :- සංගීත ඉතිහාසය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**නිපුණතා මට්ටම 6.1** :- භාරතීය සංගීතයේ ප්‍රභවය සහ විකාශය පිළිබඳ තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම** :- සංගීතඥයන්ගේ පරිශ්‍රමය උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට බලපෑම.

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-

- උතුරු ඉන්දීය සංගීතයේ විකාශයට සංගීතඥයන් කළ සේවය විස්තර කරයි.
- උතුරු ඉන්දීය සංගීතය වෙනුවෙන් ඔවුන් කළ සේවය අගය කරයි.
- උතුරු ඉන්දීය සංගීතය වෙනුවෙන් කළ නිර්මාණ ගායනය, වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- කියවීම් පත්‍රිකාවල ඡායා පිටපත්

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

උතුරු ඉන්දීය සංගීතයේ විකාශය සඳහා සංගීතඥයන් බොහෝ දෙනෙකු දායක වී ඇත. ඔවුන් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ තම දායකත්වය ලබා දී ඇත. මේල, රාග, තාල, විවිධ ග්‍රන්ථ, සංගීත භාණ්ඩ, ගායන ශෛලීන්, ප්‍රස්තාකරණය වැනි නිර්මාණයන් මඟින් දායක වී ඇත. ඔවුන් පිළිබඳ ව සිසුන්ට අවබෝධයක් ලබා දීම මෙම ක්‍රියාකාරකමින් අපේක්ෂා කෙරේ. මේ සඳහා පහත සංගීතඥයෝ තෝරා ගැනෙති.

(1) සාරංගදේව (2) අමීර්ඛුෂ්රු

(3) චතුර්පණ්ඩිත් ශ්‍රී විෂ්ණු නාරායණ භාත්ඛණ්ඩේ පඬිතුමා

(4) මහාචාර්ය වී. එස්. නිගාම්

**පාඩම සංවර්ධනය :-**

- තමා කැමති රාගයක ස්වර ප්‍රස්තාරයක් මතකයෙන් ප්‍රස්තාර කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ප්‍රස්තාරකරණයේ නිර්මාතෘවරයා හඳුන්වා දෙමින්, එහි වැදගත්කම පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඇමුණුම අංක I හා II කොටසට අදාළ තොරතුරු ඔස්සේ ඔබ කියවීම් පත්‍රිකා සකස් කර, සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 02)

- ඇමුණුම් අංක III කොටසට අදාළ තොරතුරු ඔස්සේ ඔබ කියවීම් පත්‍රිකා සකස් කර, සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

- ඇමුණුම් අංක IV කියවීම් පත්‍රිකාවේ ඇතුළත් තොරතුරු අනුගමනය කරමින් ක්‍රියාකාරකම, සංවර්ධනය කරගන්න. සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් විෂය කොටසක් අවසානයේ ලිඛිත ප්‍රවේශ මඟින් අගයන්න.

**පැවරුම :-**

ඔබ ඉගෙන ගත් සංගීතඥයන් හතර දෙනාගේ ජීවන තොරතුරු හා සංගීතයට කළ සේවය පිළිබඳ සටහනක් සකස් කරවන්න.

**අතිරේක උදවු :-**

- 2009 අ.පො.ස. (උ.පෙළ) පෙරදිග සංගීතය - 13 ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
- සංගීත ප්‍රවේශිකා - ඇම්. ශ්‍යාමලී කුසුමා පෙරේරා
- භාරතීය සංගීතයේ ප්‍රභවය හා විකාශය - ජාතික අධ්‍යාපන ආයතනය, දූරස්ථ මොඩියුලය
- Musicology of India - PART I, II, III, IV

  (මහාචාර්ය V. S. නිගම්)
- විශ්ව සංගීත ක්ෂේත්‍ර - සී. ද එස්. කුලතිලක.

**ඇමුණුම - විෂය කරුණු හා බැඳි ශීර්ෂ :-**

**ඇමුණුම අංක I කොටස**

- සාරංගදේව පඬිතුමා උපන් වර්ෂය හා උපන් ස්ථානය.
- කාශ්මීර වාසීන් වීම. පසු ව දකුණේ වාසය කිරීම.
- පියා බිල්ජි රජවරුන් අතර සේවය කිරීම.
- සංගීත රත්නාකරය ග්‍රන්ථය රචනා කිරීම.
- එම ග්‍රන්ථයේ ඇතුළත් තොරතුරු.

**ඇමුණුම අංක II කොටස**

- අමීර්ඛුස්රු උපන් වර්ෂය හා ස්ථානය හා ඔහුගේ සම්පූර්ණ නම.
- පර්සියාවේ පිළිගත් මහා කවියෙකි. සංගීතඥයෙකි. සොල්දාදුවෙකි.
- හින්දුස්ථානි, පර්සියානු, සංකලනයෙන් රාග බිහි කිරීම.
- විජයනගර්හි රාජ සභාවේ පැවති ගායන තරගයෙන් ජයග්‍රහණය කළ ආකාරය.
- නිර්මාණය කළ රාග, තාල, ගායන ශෛලීන්, සංගීත භාණ්ඩ.

**ඇමුණුම අංක III කොටස**

- චතුර්පණ්ඩිත් ශ්‍රී විෂ්ණු නාරායණ භාත්ඛන්ඩේ පඬිතුමා උපන් වර්ෂය.
- සංගීතය හැදෑරීමට යොමු කරන ලද්දේ මව විසින් වීම.
- කුඩා කල දී තරගවලින් ලබාගත් ජයග්‍රහණ.
- උපාධිය ලබා ගත් පසු ගුරු වෘත්තියේ යෙදීම.
- නීතිඥයකු වීම. බොම්බායේ නීති විද්‍යාලයයට බැඳී සේවය කිරීම.
- සංගීත විද්‍යාලය පිහිටුවීම.
- භාෂා ප්‍රවීණයකු වීම. විවිධ පොත්පත් ලිවීම.

- මේල 10 මත රාගවර්ගීකරණය
- රාගධාරී සංගීතයට නව ප්‍රස්තාර ක්‍රමයක් සකස් කිරීම.
- සංගීත සම්මේලන විශාල සංඛ්‍යාවක් පැවැත්වීම.
- ක්‍රමික පුස්තක් මාලිකා 1 - 6 දක්වා කාණ්ඩ වශයෙන් ලිවීම.
- 1936 සැප්. 19 දිවියෙන් සමුගැනීම.

**ඇමුණුම අංක IV කොටස**

## කියවීම් පත්‍රිකාව

## මහාචාර්ය වී. එස්. නිගම්

මහාචාර්ය වි. එස්. නිගම් උත්තර භාරතීය සංගීතඥයෙකි. ලක්නව් රාජේන්ද්‍ර නගර් හි ඉපදී ඇත. අධ්‍යාපන සුදුසුකම් වශයෙන් M.A., L.L.B, B Music ලබා ඇත. ලක්නව්හි පිහිටි භාත්ඛණ්ඩෙ සංගීත විද්‍යා පීඨයේ හිටපු අධ්‍යක්ෂවරයෙකි. විභාග පාලක පරීක්ෂකවරයෙකි. මෙතුමා විසින් ලියන ලද Musicology of India PART I, II, III, IV වශයෙන් කාණ්ඩ හතරකින් යුත් සුවිශේෂ ග්‍රන්ථ කිහිපයක් ලෙස හඳුන්වා දිය හැකිය. මෙම කාණ්ඩ හතර ඉන්දියානු රාගධාරී සංගීතය ලෝකයේ අනෙක් රටවලට ද ව්‍යාප්ත කිරීම සඳහා රාගධාරී හා සිද්ධාන්ත කොටස් ඇතුළත් කොට රචිත ග්‍රන්ථයක් ලෙස හැඳින්විය හැකිය. සරල ඉංග්‍රීසි බසින් රචනා කර ඇති මෙම කාණ්ඩ 4 භාත්ඛණ්ඩේ සංගීත විශාරද විභාගයට ඉදිරිපත් වන සිසුන්ට අත්වැලක් වේ.

රාගයන්ගේ සමාන-අසමානතා, ථාට හා මේල, සංගීතඥයන්ගේ තොරතුරු මෙම ග්‍රන්ථයේ පැහැදිලි ව සිත් ගන්නා ආකාරයට දක්වා කර ඇත. මීට අමතර ව සංගීත කෞමදී PART I සිට IV තෙක් ග්‍රන්ථ කාණ්ඩ 4ක් මෙතුමා ලියා ඇත.

**ක්‍රියාකාරකම 29**

## එක් එක් යුගවල දී මෙරට චිත්‍රපට සංගීතයේ ඇති වූ වෙනස්කම්

**නිපුණතාව 7.0** :- ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 7.1** :- ව්‍යාවහාරික සංගීතයේ නිර්මාණ පිළිබඳ ව තර්කානුකූල ව අදහස් දක්වමින් තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම** :- එක් එක් යුගවල දී මෙරට චිත්‍රපට සංගීතයේ ඇති වූ වෙනස්කම් (මුල් යුගයේ දකුණු ඉන්දීය ආභාසය රේඛාව චිත්‍රපටයේ සංගීතය හා සත් සමුදුර චිත්‍රපටයේ සංගීතය ඇසුරෙන් විචාරය)

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-

- මෙරට චිත්‍රපට සංගීතයේ වර්ධනීය අවස්ථා නම් කරයි.
- දකුණු ඉන්දීය ආභාසය රැගත් චිත්‍රපට නම් කරයි.
- රේඛාව චිත්‍රපටයේ සංගීතය පිළිබඳ අදහස් දක්වයි.
- සත් සමුදුර චිත්‍රපටයේ සංගීතය පිළිබඳ අදහස් දක්වයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ඇමුණුම 7.1.1ට අයත් කියවීමේ පත්‍රිකාව
- ඇමුණුම 7.1.2ට අයත් ද්‍රවිඩ අනුකරණ පිළිබඳ විස්තර ඇතුළත් වගුව
- ඇමුණුම 7.1.3ට අයත් රේඛාව චිත්‍රපටයේ තොරතුරු
- ඇමුණුම 7.1.4ට අයත් සත් සමුදුර චිත්‍රපටයේ තොරතුරු ඇතුළත් පත්‍රිකාව.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

ශ්‍රී ලංකාවේ චිත්‍රපට සංගීතයෙහි ද්‍රවිඩ ආභාසයත්, එහි ඇති වූ වර්ධනීය තත්ත්වයට පසුබිම් වූ රේඛාව හා සත් සමුදුර චිත්‍රපටවල සංගීතමය තත්ත්වයත් විමසා බැලීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය. කාලච්ඡේද 4ක් ඇති මෙම පාඩමෙහි කියවීමේ පත්‍රිකා 4ක් ද ඇත. මෙම පාඩම ක්‍රියාත්මක කිරීමට යෝජිත ක්‍රමය හෝ වෙනත් සුදුසු ක්‍රමයක් හෝ අනුගමනය කරමින් මෙම පාඩම සංවර්ධනය කිරීමේ නිදහස ගුරුවරයා සතු ය.

**පාඩම සංවර්ධනය :-**

- ඇමුණුම 7.1.1ට අයත් කියවීමේ පත්‍රිකාව සිසුන්ට ලබා දී කියවීමට යොමු කර වාචික ප්‍රශ්න මඟින් විමසීමක් කරන්න.

  (කාලච්ඡේද 01)

- ඇමුණුම 7.1.2ට අයත් කියවීමේ පත්‍රිකාව සිසුන්ට කියවීමට අවස්ථාව ලබා දෙන්න. එහි ඇති තොරතුරු පිළිබඳ ව ගවේෂණය කරන්න. සටහනක් පිළියෙළ කරන්න.

  (කාලච්ඡේද 01)

- ඇමුණුම 7.1.3ට අයත් කියවීමේ පත්‍රිකාව සිසුන්ට යොමු කිරීමෙන් අනතුරු ව රේඛාව චිත්‍රපටයේ සංගීතය පිළිබඳ ව විමසීමක් කරන්න. සටහනක් පිළියෙළ කරන්න.

  (කාලච්ඡේද 01)

- ඇමුණුම 7.1.4ට අයත් කියවීමේ පත්‍රිකාව සිසුන්ට කියවීමට යොමු කරන්න. අනතුරු ව සත් සමුදුර චිත්‍රපටයේ සංගීතමය තොරතුරු පිළිබඳ ව විශ්ලේෂණයක යෙදෙන්න.

  (කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් කොටස අවසානයේ වාචික ව හෝ ලිඛිත ව ප්‍රශ්න මඟින් හෝ අගයන්න.

**පැවරුම :-**

සියලු විෂය කොටස් ආවරණය වන පරිදි ලිපියක් සකස් කරන්න.

**අතිරේක උදවු :-**

- සිංහල චිත්‍රපට ගීත සාහිත්‍යය - සමන්ත හේරත්
- සිංහල චිත්‍රපට ගීතාවලිය (1947-1956) සුනිල් ආරියරත්න
- සිංහල චිත්‍රපට ගීතාවලිය (1957 - 1965) සුනිල් ආරියරත්න

ඇමුණුම 7.1.1

## චිත්‍රපට සංගීතය

චිත්‍රපට සංගීතය වූ කලී චිත්‍රපට ගීත, පසුබිම් සංගීතය හා තේමා සංගීතය යනුවෙන් ගොඩනැඟෙන ඉතා පුළුල් විෂය ක්ෂේත්‍රයකි. මෙහි දී ලාංකේය චිත්‍රපට ක්ෂේත්‍රයේ නම් චිත්‍රපට ගීත සාහිත්‍යයක් ද ගොඩනැඟී ඇත. එය එතරම් ම ප්‍රබල කලා මාධ්‍යයකි. සරල ගීතයේ වර්ධනය සඳහා ද චිත්‍රපට ගීතය ඉවහල් වී ඇති බව සංගීත ඉතිහාසය අධ්‍යයනය කරන විට පෙනේ.

1947න් ඇරඹි මුල් යුගය තුළ ශ්‍රී ලාංකේය චිත්‍රපට කර්මාන්තය හැදී වැඩී පෝෂණය වූයේ දකුණු ඉන්දියාව මුල් කොටගෙන ය. ඉන්දීය චිත්‍රපට නිෂ්පාදකයන්, සංගීතඥයන්, වාදකයන්, ගායක-ගායිකාවන් හා ඉන්දීය චිත්‍රාගාර පසුබිම් කොටගෙන චිත්‍රපට බිහි වූ නිසා ඒවායෙහි දක්නට ලැබුණේ දැඩි ද්‍රවිඩ අනුකරණයකි.

1957න් ඇරඹි දෙවන දශකය තුළ විජාතික චිත්‍රපට අධ්‍යක්ෂවරුන් හැරුණු කොට දේශීය අධ්‍යක්ෂවරුන් කිහිප දෙනෙක් චිත්‍රපට කර්මාන්තයට එකතු වූහ. 1956 ජාතික ව්‍යාපාරයත් සමඟ රට තුළ උද්ගත වූ සමාජ දේශපාලන තත්වය චිත්‍රපට කර්මාන්තයට ද බලපෑ අතර එහි දී දේශීයත්වයට නැඹුරුවක් ඇති විය.

1967න් ඇරඹි තෙවන යුගය තුළ විවිධ ක්ෂේත්‍රවල නව ප්‍රවණතාවයක් දක්නට ලැබිණ. නවකතා, කෙටිකතා, කවිය, නාට්‍ය වැනි කලා අංග ගණනාවක නව පිබිදීමක් දක්නට තිබූ අතර චිත්‍රපටයට ද එම තත්ත්වය ම ආරෝපණය විය. විවිධ උගතුන් සමාජගත වීමත් සමඟ ම කලාවේ ද යම් යම් සාධනීය ප්‍රවණතා ඇති විය. එම නිසා මෙම යුගය තුළ නිර්මිත චිත්‍රපටවලට දේශීය නිර්මාණකරුවෝ බහුතරයක් දායක වූහ. මේ අනුව ගායක-ගායිකාවෝ ද, සංගීත අධ්‍යක්ෂවරු ද නව සම්ප්‍රදායයට අනුගත වෙමින් සිටියහ.

### මුල් යුගයේ චිත්‍රපටවලට දායක වූ අය

| | | |
|---|---|---|
| සංගීත අධ්‍යක්ෂවරු (ඉන්දීය) | - | ටී. ආර්. පාපා, එස්. එස්. වේදා, එස්. දක්ෂිණ මූර්ති, ආර්. නාරායන් අයියර් |
| ගායක-ගායිකාවෝ (ඉන්දීය) | - | ජමුණා රාණි, කේ. රාණි, ඒ. එම්. රාජා, සරෝජා, සත්‍යවතී, ලතා මංගේෂ්කර් |
| සංගීත අධ්‍යක්ෂවරු | - | මොහොමඩ් ගවුස්, ආර්. මුත්තුසාමි, බී. එස්. පෙරේරා, ආර්. ඒ. චන්ද්‍රසේන, පී. එල්. ඒ. සෝමපාල |
| ගායක-ගායිකාවෝ (ලාංකේය) | - | මොහිදීන් බෙග්, රුක්මණී දේවි, ඩබ්. ඩී. ඇල්බට් පෙරේරා (අමරදේව) එඩී ජයමාන්න, වසන්තා සන්දනායක, ධර්මදාස වල්පොල, ලතා වල්පොල, පී.එස්.බී. රාණි |

1947න් ඇරඹි මුල් යුගයේ චිත්‍රපට 39ක් තිරගත වුව ද එයින් රේඛාව චිත්‍රපටය හැරෙන්නට අනිකුත් ඒවායේ අවස්ථෝචිත පසුබිම් සංගීතය ගැන සිතූ බවක් පෙනෙන්නට නැත. ඒවායේ අසන්නට ලැබුණේ

නිහඬ බව නැති කිරීම, හිස් බව නැති කිරීම, විකට ශබ්ද නිපදවා ගැනීම ආදි දේවල් ය.

දෙමළ, හින්දි අනුකරණ නිසා ඇති වූ යහපත් මෙන් ම අයහපත් ප්‍රතිඵල ද ඇත. අපට කියා සංගීත සම්ප්‍රදායයක් නොමැති කල පිළිගත් සංගීත සම්ප්‍රදායයක ඇසුර ලබා එම නිර්මාණ රසවිඳින්නට ලැබීම රසිකත්වය දියුණු වීමකි. එසේ ම අනුන්ගෙන් ම යැපීම නිසා අපේ නිර්මාණකරුවන් බිහිවීම පමා වීම තවත් ආකාරයක අවාසනාවකි. අනුකාරක ගීත නිර්මාණය කිරීමෙහි ලා ඔවුන් වඩාත් රසවත් ගී තනු තෝරාගත් බව ද පෙනේ.

ඒ සඳහා කදිම නිදසුන් කීපයක් පහත දැක්වේ.

| සිංහල චිත්‍රපටය | ගීතය | දෙමළ/හින්දි චිත්‍රපටය | ගීතය |
|---|---|---|---|
| 1. කඩවුණු පොරොන්දුව | සන්ධ්‍යාවේ ශ්‍රීය රම්‍යා ලෙස පේනා | රත්තන් | පරදේශි බාලා මාබාදල් ආයා |
| 2. උමතු විශ්වාසය | සුදට සුදේ සිරිය දිලේ පුන් සඳේ | තරානා | තීන්මිලේ තීනු හුවේ බාවරේ |
| 3. කැලෑ හඳ | අන්න සුදෝ අර පාට වලා | ජාල් | අප්නී කහෝ කුච් මේරී සුනො |
| 4. සුජාතා | පෙම් රැල්ල නැගී | අම්බර් | හම් තුම් හේ බහාර් |
| 5. දෛව විපාකය | සාගර හිමිය සොයා | ශ්‍රී 420 | රමෛයා වසාවයා |

**චිත්‍රපට සංගීතයේ සාධනීය අවස්ථා**

සිංහල චිත්‍රපට ගීත ඉතිහාසයේ ස්වතන්ත්‍ර තනු නිර්මාණකරණයෙහි යෙදුණු සංගීත නිර්මාණකරුවෝ කිහිප දෙනෙක් ද වෙති. ඔවුන් විසින් ඉතා මධුර තනු නිර්මාණය කරන ලද්දාක් මෙන් ම දේශීය ලක්ෂණ චිත්‍රපට ලෝකය තුළ මතු කරවන්නට උත්සාහ ගන්නා ලදි.

| සංගීත අධ්‍යක්ෂවරයා | චිත්‍රපට | ගීතය |
|---|---|---|
| මොහොමඩ් ගවුස් (ගවුස් මාස්ටර්) | අශෝකමාලා | ශාන්ත මේ රාත්‍රියේ, ප්‍රීති ප්‍රීති |
| ආර්. මුත්තුසාමි | මාතලන් | සිරිනි සරුසර වීලා<br>ඇයි කළේ යමෙක් ආලේ, හවේ<br>හීත හැරදා, රන්වන් දුල් කරලින<br>පැසිලා, උපත ලබා මේ ලෝකේ<br>ඉවසනු හදේ, සඳ රාහු මුඛයේහි |
| ආනන්ද සමරකෝන් | සුජාතා - සැඩසුළං | මන රංජන දර්ශනීය ලංකා<br>මා ප්‍රියාදර ජය භූමී |
| බී. ඇස්. පෙරේරා | පෙරකදෝරු බෑණා | ආදර නදිය ගලා |
| සුනිල් ශාන්ත | රේඛාව | ඕළු නෙළුම් නෙරිය රඟාලා<br>වෙසක් කැකුළු අතු අග<br>සුදු සඳ එළියේ |

සන්දේශය, කුරුලු බැද්ද, සිකුරු තරුව, සුදෝසුදු, සාමා, සාරවිට, සැනසුම කොතන ද, පරසතු මල්, සීතල වතුර, රන් සළු, ගොළු හදවත, රේඛාව බිහි කළ ප්‍රවණතාවට අනුගත වූ බවක් සැලකිය හැකිය.

රන් මුතු දූව, ගැටවරයෝ, රෑන ගිරව්, ආදරවන්තයෝ, නාරිලතා ආදි චිත්‍රපට සන්දේශය බිහිකළ ප්‍රවණතාවට අනුගත වූ බවක් සැලකිය හැකි ය.

පසු කලෙක ප්‍රේමසිරි කේමදාස, සෝමදාස ඇල්විටිගල, වික්ටර් රත්නායක, ඩබ්. ඩී. අමරදේව, ෂෙල්ටන් ප්‍රේමරත්න, ලයනල් අල්ගම, එඩ්වින් සමරදිවාකර, සරත් දසනායක, රෝහණ වීරසිංහ වැනි සංගීතඥයෝ චිත්‍රපට සංගීතයේ නැවුම් අත්දැකීම් ලබා දෙන්නට සමත් වූහ. ඔවුහු ගීතය පමණක් ය යන සංකල්පයෙන් බැහැර පසුබිම් සංගීතය තෙක් විකාශනය වූ චිත්‍රපට සංගීතයක් අපට දායාද කළෝ ය.

**ඇමුණුම අංක 02**

**ඇමුණුම 7.1.2**

**ද්‍රවිඩ චිත්‍රපටවල ඍජු අනුවාද**

| ද්‍රවිඩ චිත්‍රපටය | සිංහල චිත්‍රපටය |
|---|---|
| ලයිලා මජ්නු | දිව්‍ය ප්‍රේමය |
| නව ජීවනම් | ප්‍රේම තරගය |
| බාරි බෙහෙන් | සුජාතා |
| මරුමගල් සහ ගුමස්තා | පුදුම ලේලි |
| හල්ඩල් | වරද කාගෙ ද |
| මංගම් හා සපතම් | මාතලන් |
| දේවදාසි | රම්‍යලතා |
| වේලක්කාරමගල් හා පරාශක්ති | අහංකාර ස්ත්‍රිය |

**ඇමුණුම අංක 03**

**ද්‍රවිඩ චිත්‍රපටවල අධ්‍යක්ෂවරු සහ චිත්‍රපට**

| චිත්‍රපට අධ්‍යක්ෂවරු | චිත්‍රපටය |
|---|---|
| ජේ. සිංහ | කඩවුණු පොරොන්දුව, වැරදුණු කුරුමානම, පෙරළෙන ඉරණම |
| කේ. සුබ්‍රනියම් | කපටි ආරක්ෂකයා |
| ඩී. එස්. බාබු | දිව්‍ය ප්‍රේමය |
| ඒ. බී. රාජ් | ප්‍රේම තරගය, පෙරකදෝරු බෑනා, රම්‍යලතා |
| ටී. ආර්. සුන්දරම් | සුජාතා, වරද කාගෙ ද, අහංකාර ස්ත්‍රිය, රදළ පිළිරුව |
| ටී. සෝමසේකරම් | සැඩ සුළං |
| ඒ. එස්. නාගරාජන් | මාතලන් |
| ඒ. එස්. ඒ. සාමි | ඩිංගිරි මැණිකා |

ඇමුණුම අංක 04

**ද්‍රවිඩ සංගීත අධ්‍යක්ෂවරු සහ චිත්‍රපට**

| චිත්‍රපට අධ්‍යක්ෂවරු | චිත්‍රපටය |
|---|---|
| ආර්. නාරායන් අයියර් | කඩවුණු පොරොන්දුව, බණ්ඩා නගරයට පැමිණීම |
| සී. එන්. පාණ්ඩුරංගන් | කපටි ආරක්ෂකයා, අම්මා |
| එම්. ආර්. පද්මනාභශාස්ත්‍රි | දිව්‍ය ප්‍රේමය |
| එස්. එස්. වේදා | උමතු විශ්වාසය, කැලෑ හඳ |
| එස්. දක්ෂිණ මූර්ති | සුජාතා, වරද කාගෙද, රදළ පිළිරුව, සැඩ සුළං, දුප්පතාගේ දුක |
| ටී. ආර්. යාපා | සුරඟනී, සුරතලී |

ඇමුණුම 7.1.3

**රේඛාව චිත්‍රපටයේ සංගීතය**

චිත්‍රපට අධ්‍යක්ෂණය - ලෙස්ටර් ජේම්ස් පීරිස්

සංගීත අධ්‍යක්ෂණය - බී. ඇස්. පෙරේරා

ගී තනු නිර්මාණය - සුනිල් සාන්ත

ගීත ප්‍රබන්ධය - මර්සලීන් ජයකොඩි පියතුමා

ගායක-ගායිකාවෝ - අයිවෝ ඩෙනිස්, ලතා ප්‍රනාන්දු, ඉන්ද්‍රාණි විජේබණ්ඩාර, තිලකසිරි ප්‍රනාන්දු, සිසිර සේනාරත්න

තිරගත වූ වර්ෂය - 1956

ඇතුළත් වූ ගීත - ඕළු නෙළුම් නෙරිය රඟාලා, වෙසක් කැකුළු, සුදු සඳ එළියේ, මිණි මුතු පසට යට, අනුරාපුර පොළොන්නරුව, සීගිරි ළඳකගෙ

වසර 10ක පමණ කාලයක ද්‍රවිඩ ආභාසයට නතු වූ දේශීය චිත්‍රපට කලාව තුළ යාන්තමින් හෝ සිංහල ලකුණ සටහන් වූයේ රේඛාව චිත්‍රපටය මඟිනි. ද්‍රවිඩ අනුකරණයෙන් තොර ගී තනු හා සංගීතය මෙහි දී කැපී පෙනේ. ගී තනු වල ඇති දේශීයත්වයත් සරල බවත් සුනිල් සාන්තයන්ගේ ප්‍රතිභාව මැනවින් විදහාලයි. ගී තනුවලට ගැළපෙන සංගීතය යෙදීමෙන් බී. ඇස්. පෙරේරා හා කේ.එම්.දයාරත්න ද තම කෞශල්‍ය මැනවින් විදහා දැක්වූහ. මර්සලින් ජයකොඩි පියතුමාගේ මධුර ගීත රචනාවලට මධුර තනු නිර්මාණය කළ සුනිල් සාන්තයන්ගේ ප්‍රථම චිත්‍රපට තනු නිර්මාණය මෙය විය.

මෙම චිත්‍රපටයෙහි එන ගීත නැවුම් රසයක් ගෙන දුන් අතර ඒවායේ සරල පදමාලාව හා සරල තනු ස්වතන්ත්‍ර නිර්මාණ විය. මෙතෙක් පැවති භාරතීය අනුකරණයෙන් බැහැර වූ බවක් පෙනිණි. සිංහල ලකුණ තැබූ චිත්‍රපටයක් ලෙස මෙය හැඳින්විය හැකි ය.

ඇමුණුම 7.1.4

**සත් සමුදුර චිත්‍රපටයේ සංගීතය**

චිත්‍රපට අධ්‍යක්ෂණය - මහාචාර්ය සිරි ගුනසිංහ

සංගීත අධ්‍යක්ෂණය - සෝමදාස ඇල්විටිගල

ගී තනු නිර්මාණය - සෝමදාස ඇල්විටිගල

ගීත ප්‍රබන්ධය - මහගම සේකර

ගායක-ගායිකාවෝ - ඩබ්. ඩී. අමරදේව

තිරගත වූ වර්ෂය - 1967

ඇතුළත් වූ ගීත - සිනිඳු සුදුමතු තලාවේ, පිපුණ කුසුම පර වූවා

සත් සමුදුර චිත්‍රපටයේ සංගීතය වඩාත් සිනමාරූපී සංගීතයකි. සිනිඳු සුදුමුතු තලාවේ යන ගීතය සංගීත සන්ධ්වනියක් වැනි ය. සාගරයේ රළ නැඟෙන බිඳෙන ආකාරය, මුහුදු තීරයේ ජීවත් වන්නන්ගේ අවිනිශ්චිත ජීවිතය ආදිය ගැන සංගීතවේදියා විසින් කරනු ලබන භාවමය ප්‍රකාශනය අතිවිශිෂ්ට ය. සංගීත භාණ්ඩ යොදා ගැනීම විවිධ තාල රූප ඇසුරු කිරීම බටහිර සංගීත ශිල්ප ක්‍රම ආදිය යොදා ඇති ආකාරය ඉතා රම්‍ය වේ. චිත්‍රපටයෙන් පරිබාහිර ව ගත්ත ද සංගීත රැවියක් සේ අගය කළ හැකි මෙම ගීතය රූප රාමු සමඟ බද්ධ වීමේ දී වඩාත් උසස් මට්ටමේ නිර්මාණ ගුණයක් ළඟා කරගෙන ඇත.

හින්දුස්ථානි සංගීතයේ හා බටහිර සංගීතයේ ඇතැම් ශිල්ප ක්‍රම මෙම නිර්මාණ තුළ යොදාගෙන ඇත. විවිධ තාල රූපඅනුව නිර්මාණය වී ඇති බැවින් එහි විවිධ රස භාව ජනිත වේ. ගීතයකට වඩා එහි සන්ධ්වනියක ගතිලක්ෂණ පෙනේ. ගායනයට වඩා වාදනය මඟින් භාව නිරූපණයට සංගීතඥයා සමත් වී ඇත. එතෙක් පැවති චිත්‍රපටවල සංගීතය යැයි හඳුනා ගැනීමට ඇත්තේ ගී තනු හා විවිධ සංගීත කොටස් පමණි. සත් සමුදුර චිත්‍රපට සංගීත නිර්මාණ ශිල්පියා ඉන් ඔබ්බට ගොස් පසුබිම් සංගීතයත් ගී තනුවල විචිත්‍ර බවත් වැඩි කොට එමඟින් අලුත් ම සංගීත අත්දැකීමක් ලබා දීමට සමත් වී ඇත.

ක්‍රියාකාරකම 30

## නිර්දේශිත චිත්‍රපටවල සංගීත අධ්‍යක්ෂවරයා හා සංගීත නිර්මාණය පිළිබඳ ව සැකෙවින් සාකච්ඡා කිරීම

**නිපුණතාව 7.0** :- ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 7.1** :- ව්‍යාවහාරික සංගීතයේ නිර්මාණ පිළිබඳ ව තර්කානුකූල ව අදහස් දක්වමින් තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම 7.1.2** :- නිර්දේශිත චිත්‍රපටවල සංගීත අධ්‍යක්ෂවරයා හා සංගීත නිර්මාණය පිළිබඳ ව සැකෙවින් සාකච්ඡා කිරීම

**කාලච්ඡේද** :- 06

**ඉගෙනුම් පල** :-

- නිර්දේශිත චිත්‍රපටවල සංගීත අධ්‍යක්ෂවරුන් නම් කරයි.
- නිර්දේශිත චිත්‍රපටවල සංගීත නිර්මාණය පිළිබඳ ව අදහස් දක්වයි.
- නිර්දේශිත චිත්‍රපටවල එන ගීත නම් කරයි.

**ගුණාත්මක යෙදවුම්** :-

- ඇමුණුම 7.1.2ට අයත් නිර්දේශිත චිත්‍රපටවල සංගීත අධ්‍යක්ෂවරු සහ වෙනත් විස්තර ඇතුළත් පත්‍රිකාව
- නිර්දේශිත චිත්‍රපට ගීත ඇතුළත් ශ්‍රව්‍ය-දෘශ්‍ය උපකරණ

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :-

නිර්දේශිත චිත්‍රපටවල සංගීතමය තොරතුරු සාකච්ඡා කිරීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. එම ගීත ශ්‍රවණයට සලස්වා එහි සංගීතමය තත්ත්වය සාකච්ඡා කිරීම වැදගත් වේ.

**පාඩම සංවර්ධනය** :-

- ඇමුණුම 7.1.2ට අයත් වගු සටහන් ප්‍රස්තාරය සිසුන්ට ලබා දෙන්න.
- වගුවේ සඳහන් එක් එක් චිත්‍රපටයට අදාළ විස්තර අනුව සාකච්ඡාවක් මෙහෙයවන්න.

  (කාලච්ඡේද 2)
- එක් එක් ගීතය ශ්‍රවණයට සලස්වන්න.

  (කාලච්ඡේද 02)
- ගීතය ශ්‍රවණයෙන් පසු නැවත සාකච්ඡාවක් මෙහෙයවන්න.

  (කාලච්ඡේද 01)
- එක් එක් සංගීත අධ්‍යක්ෂවරයාගේ නිර්මාණශීලී භාවය පිළිබඳ අදහස් විමසන්න.

  (කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :-

- වගුවෙහි සඳහන් තොරතුරු ආවරණය වන සේ සකස් කරගත් කෙටි ප්‍රශ්නාවලියකින් අගයන්න.

**පැවරුම** :-

නිර්දේශිත චිත්‍රපටවල අඩංගු සියලු ම ගීත ලැයිස්තුවක් පිළියෙළ කර එක් ගීතයක් බැගින් පදමාලාව ලියන්න. පොතක් සකස් කරන්න.

**අතිරේක උදවු** :-

- චිත්‍රපට ගීත ..................... සමන්ත හේරත්
- සිංහල චිත්‍රපට ගීතාවලිය (1947-1956) සුනිල් ආරියරත්න
- සිංහල චිත්‍රපට ගීතාවලිය (1957 - 1965) සුනිල් ආරියරත්න

ඇමුණුම 7.1.2

| නිර්දේශිත චිත්‍රපටය | චිත්‍රපට ගීතය | සංගීත අධ්‍යක්ෂ | නිර්මාණ ස්වභාවය | ගායනය |
|---|---|---|---|---|
| රේඛාව | ඕළු නෙළුම් | බී. ඇස්. පෙරේරා තනුව සුනිල් සාන්ත | ස්වාධීන තනුවකි. | සිසිර සේනාරත්න |
| මාතලන් | කොවුලන් හඬයි | ආර්. මුත්තුසාමි | පද නිර්මාණය වෙනත් ජාති ලක්ෂණයකි. තනු නිර්මාණය ඊට වෙනස් ජාති ලක්ෂණයක් අනුව ය. | ධර්මදාස වල්පොල |
| සංදේශය | කටේ කිරි සුවඳ | ආර්. මුත්තුසාමි | සාම්ප්‍රදායික කවි නාද රටා අනුව නිර්මාණය වී ඇත. | ධර්මදාස වල්පොල |
| රන්මුතුදූව | ගලන ගඟකි | ඩබ්. ඩී. අමරදේව | මාත්‍රා 3 4 තාල රූපය අනුව නිර්මාණය වී ඇත. | ඩබ්. ඩී. අමරදේව |
| සත් සමුදුර | සිනිඳු සුදුමුදු | සෝමදාස ඇල්විටිගල | සාමාන්‍ය ගී තනුවකට වඩා ඉදිරියට යමින් සන්ධ්වනියක ආකාරයෙන් නිර්මාණය වී ඇත. | ඩබ්. ඩී. අමරදේව |
| බඹරු ඇවිත් | උදුම්බරා | ප්‍රේමසිරි කේමදාස | ස්ථායි අන්තරා ආකෘතියකින් තොර වීම ය. | ටී. එම්. ජයරත්න |
| හිතක පිපුණු මල් | කමලාසිනී | ෂෙල්ටන් ප්‍රේමරත්න | හින්දුස්ථානි ඛ්‍යාල් ශෛලියේ ආකෘතිය අනුව නිර්මාණය වී තිබීම | පී. වී. නන්දසිරි |
| හුලවාලි | කුඩා ගමේ | වික්ටර් රත්නායක | ගැමි ජීවිතයේ අහිංසක ආදරය කියාපාන ගීතයකි. | සුනිල් එදිරිසිංහ |
| එක්ටැම්ගේ | උන්මාද සිතුවම් | සරත් දසනායක | සාගරය පිළිබඳ රූප රාමුවලට උචිත අයුරින් විරහව දැක්වෙන ගීතයකි. | ගුණදාස කපුගේ |
| විසිදෑල | ගුමු ගුමුව වදුලේ | රෝහණ වීරසිංහ | භූපාලි රාගය අනුව නිර්මිත ගීතයකි. | සමිතා මුදුන්කොටුව |

ක්‍රියාකාරකම 31

## තෝරාගත් චිත්‍රපට ගීතයක් ගායනය

**නිපුණතාව 7.0** :- ව්‍යාවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 7.1** :- ව්‍යාවහාරික සංගීතයේ නිර්මාණ පිළිබඳ ව තර්කානුකූල ව අදහස් දක්වමින් තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම** :- ගුරුවරයාගේ අභිමතය පරිදි තෝරාගත් චිත්‍රපට ගීතයක් ගායනය හා භාණ්ඩ මඟින් වාදනය.

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-

- චිත්‍රපට ගීයක් ගායනය කිරීමේ කුසලතාව ලබයි.
- චිත්‍රපට ගීයක් වාදනය කිරීමේ කුසලතාව ලබයි.
- චිත්‍රපට ගීයක ආවේණික ලක්ෂණ පිළිබඳ විස්තර කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- 

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

ගුරුවරයාට අභිමත චිත්‍රපට ගීතයක් ගායනය හා වාදනය හුරු කරවීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. නිර්දේශිත ගීතවලින් එකක් මේ සඳහා තෝරා ගත හැකි ය. චිත්‍රපට ගීයක ආවේණික ලක්ෂණ හා චිත්‍රපට ගීතය හා චිත්‍රපටය අතර සම්බන්ධතාව පිළිබඳ ව ද කෙටියෙන් හෝ සාකච්ඡා කිරීම වඩාත් ඵලදායී වේ.

**පාඩම සංවර්ධනය :-**

- නිර්දේශිත චිත්‍රපට ගීතයක කොටසක් ගායනය කරමින් පාඩමට පිවිසෙන්න.
- ගුරුවරයා විසින් සකස් කර ගන්නා ලද ගීතය ඇතුළත් පත්‍රිකාව සිසුන්ට ඉදිරිපත්කරන්න. ගීතය ශ්‍රවණයට අවස්ථාවක් සලසා දෙන්න. (ගායනය කිරීමෙන් හෝ තාක්ෂණික මෙවලම් භාවිතයෙන්)

  (කාලච්ඡේද 01)
- ශ්‍රවණය කරන අතරතුරේ ම ගායනය කිරීමට සලස්වන්න. පසු ව කොටසින් කොටස අවධාරණය කරමින් ගායනයට යොමු කරන්න.

  (කාලච්ඡේද 01)
- අදාළ ගීතයේ ස්වර ප්‍රස්තාරය සිසුන්ට ඉදිරිපත් කරන්න. අභිමත ස්වර වාද්‍ය භාණ්ඩයකින් එය වාදනය කිරීමට යොමු කරන්න.

  (කාලච්ඡේද 01)
- චිත්‍රපට ගීයක ආවේණික ලක්ෂණ ඇතුළත් ඇමුණුම අංක 01ට අයත් තොරතුරු පත්‍රිකාව සිසුන්ට ඉදිරිපත් කර ඒ පිළිබඳ ව සාකච්ඡාවක් මෙහෙයවන්න.

  (කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- කොටසින් කොටස ගායනයට සලස්වා ඇගයීමට ලක් කරන්න.

**පැවරුම :-**

නිර්දේශිත අනෙකුත් චිත්‍රපට ගීත ශ්‍රවණය කිරීමට උපදෙස් දෙන්න.

**අතිරේක උදවු :-**

- සිංහල චිත්‍රපට ගීත සාහිත්‍යය - සමන්ත හේරත්
- සිංහල චිතප්‍රට ගීතාවලිය - සුනිල් ආරියරත්න
- 1948 - 1956 සිංහල චිත්‍රපට ගීතාවලිය - සුනිල් ආරියරත්න
- 1957 - 1961 සිංහල චිත්‍රපට ගීතාවලිය - සුනිල් ආරියරත්න

අදාළ චිත්‍රපට ගීත ලැයිස්තුව පහත දැක්වේ
ගුරුවරයාට කැමති ගීතයක් තෝරාගෙන ගායනය/වාදනය පුහුණු කරවන්න.

| චිත්‍රපටය | ගීතය |
|---|---|
| රේඛාව | ඕලු නෙළුම් |
| මාතලන් | කොවුලන් හඬයි |
| සංදේශය | කටේ කිරි සුවඳ |
| රන්දූනු දූව | ගලන ගඟකි |
| සත් සමුදුර | සිනිඳු සුදුමුතු තලාවේ |
| බඹරු ඇවිත් | උදුම්බරා |
| හිතක පිපුණ මල් | කමලාශනී |
| හුලවාලි | කුඩාගමේ |
| එක්ටැම් ගේ | උන්මාද සිතුවම් |
| විසි දැල | ගුමු ගුමුව වදුලේ |

ඇමුණුම අංක 01

**චිත්‍රපට ගීයක ආවේණික ලක්ෂණ**

චිත්‍රපට ගීතය වූකලී චිත්‍රපටයේ තිර නාටකය නැතහොත් තේමාව හා බැඳුණු එකකි. චිත්‍රපටයෙන් බැහැර ව හුදෙකලා වූ චිත්‍රපට ගීතයක් නොමැත. හැම චිත්‍රපට ගීතයක් ම චිත්‍රපටයට බද්ධ වී ඇත. ගීත ඇතුළත් නොවූ චිත්‍රපට ද ඇත. ගීත කිහිපයක් ඇතුළත් ව ඇති චිත්‍රපට ද ගීත 01ක් හෝ 02ක් හෝ පමණක් ඇතුළත් චිත්‍රපට ද ඇත. චිත්‍රපටයේ තේමාව අනුව ගීත ප්‍රමාණය යොදා ඇත. වාණිජ චිත්‍රපටයක් නම් ගීත ප්‍රමාණය වැඩි ය.

බොහෝ විට චිත්‍රපට ගීයක ධාවන කාලය නැතහොත් ගායනය කිරීමට ගත වන කාලය සරල ගීයකට වඩා වැඩි වේ. එහි පදමාලාව චිත්‍රපටයේ තේමාව හා සම්බන්ධ ය. එය ආදර ගීතයක්, විරහ ගීතයක්, සමූහ ගීතයක්, දේශාභිමාන ගීතයක් වුවත් අවස්ථානුකූල ව චිත්‍රපටය හා සම්බන්ධ වූවකි.

සරල ගීතයක නම් බොහෝ විට ආරම්භක සංගීත ඛණ්ඩයත් (Introduction) අතුරු සංගීතයත් (Interlude) එක ම වේ. එහෙත් චිත්‍රපට ගීයක ආරම්භක සංගීතය හා අතුරු සංගීත ඛණ්ඩ වෙනස් ව නිර්මාණය වේ. එයට හේතු වන්නේ ඒ හා සබැඳුණු ජවනිකාවක් හෙවත් දර්ශනයක් තිබීම ය. ආරම්භක සංගීත ඛණ්ඩයට අදාළ ජවනිකාව මුහුදු වෙරළක දර්ශනයක් විය හැකි ය. අතුරු සංගීත ඛණ්ඩයේ ජවනිකාව නුවරඑළියේ මල් වත්තක විය හැකි ය. එහි දී ඒ සඳහා සංගීත ඛණ්ඩයේ වෙනස බලපායි.

චිත්‍රපට ගායනය සඳහා කවර හෝ ගායකයකුගේ හෝ ගායිකාවකගේ හෝ කටහඬ සුදුසු වන්නේ නැත. ඒ සඳහා (Screen voice) නළුවාගේ හෝ නිළියගේ හඬට හා රූපයට ගැළපෙන කටහඬක් තිබිය යුතු ය. එසේ හඬ පිහිටා ඇති ගායක-ගායිකාවෝ විරල ය. ශ්‍රී ලාංකේය සිනමාවේ එසේ නළුවෙකුට ගැළපෙන කටහඬක් සහිත ගායකයා වන්නේ එච්. ආර්. ජෝතිපාල ය. කවර වුවද නිළියකගේ හඬට ගැළපෙන ගැහැනු කටහඬවල් (Female voice) අතර ඇන්ජලීන් ගුණතිලක, ලතා වල්පොල ප්‍රධාන වෙති.

භාරතීය සිනමාවේ මොහොමඩ් රාෆි, කිශෝර් කුමාර්, මන්නඩේ යන ගායකයෝ ත් ලතා මංගේෂ්කාර්, ආශා බෝස්ලේ යන ගායිකාවෝත් ඉතා ජනප්‍රිය ය.

චිත්‍රපට ගීත නිර්මාණයේ දී ඒ සඳහා යොදාගන්නා සංගීත භාණ්ඩ ප්‍රමාණය බොහෝ විට සරල ගීයකට වඩා වැඩි ය. ඒ සඳහා යොදාගන්නා ශිල්පීය දක්ෂතා ද වැඩි ය. සාමාන්‍ය චිත්‍රපට ගීතයක අන්තරා කොටස් දෙකකට වඩා වැඩි ය. සමහර ගීතවල අන්තරා කොටස් (verse) හතරක් තිබෙන අවස්ථා ද ඇත. මේ සඳහා හොඳම නිදසුන සිනිඳු සුදුමුතු තලාවේ ගීතයයි. එය සංධ්වනියක ස්වරූපයෙන් වාද්‍ය කොටස් වලින් පෝෂිතය.

එක්තරා කාලයක චිත්‍රපට ගීත වට්ටෝරුවක් තිබිණි. ප්‍රේම ගීත, විරහ ගීත, ළමා ගීත, බජව් ගීත, නැළවිලි ගීත ආදි වශයෙනි.

බොහෝ චිත්‍රපට ගීත සරල ගීතවලට වඩා සංගීතමය වශයෙන් පෝෂණය වූ ඒවා බව පෙනේ. චිත්‍රපටයක ඇත්තේ සීමිත ගීත ප්‍රමාණයක් බැවින් සංගීත නිර්මාණකරුවාගේ මුළු වැර යොදා එම ගීත නිර්මාණය කළා විය හැකි ය.

ගීතය චිත්‍රපටයට ආලෝකයක් විය. සමහර චිත්‍රපට ප්‍රචාරක පාඨවලින් ද කියැවී තිබුණේ ඉමිහිරි ගීත චිත්‍රපටයෙන් ඇසිය හැකි බව ය.

චිත්‍රපට ගීත රචකයාට තම ස්වාධීන නිර්මාණයක් ලෙස රචනා කිරීම උගහට ය. මන්ද චිත්‍රපට අධ්‍යක්ෂවරයාගේ අභිමතය හා අවශ්‍යතාව පරිදි ගීත රචනා කිරීමට සිදු වන බැවිනි.

චරිත විසින් ගයනු ලබන ගීතයක් රචනා කිරීමේ දී එම චරිතවල ස්වභාවය උගත්, නූගත්, නාගරික, ගැමි ආදි තත්ත්වයන් සැලකිය යුතු ය. නූගත් පිරිසක් සාද අවස්ථාවක දී ගයන ගීතයකට ඉතා ප්‍රබුද්ධ වචන යෙදුවහොත් එම ගීතය අසාර්ථක වේ. ඔවුන්ගේ සමාජ මට්ටම හා භාවිතය පිළිබඳ අවබෝධයෙන් ගීතය රචනා කිරීම කළ යුතු ය. මෙවැනි සීමාවලට කොටුවීමට ගීත රචකයාට සිදු වේ.

**ක්‍රියාකාරකම 32**

## හංසධ්වනි රාගය

**නිපුණතාව 1.0** :- සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.2** :- උත්තර භාරතීය සංගීතයට අයත් විවිධ ස්වර සංගති සහ ස්වභාවයන්ගෙන් යුත් රාග කිහිපයක ස්වභාවය හඳුනා ගනිමින් ශිල්පීය ගුණාංග සහිත ව ගායනයේ වාදනයේ යෙදෙයි.

**ක්‍රියාකාරකම** :- හංසධ්වනි රාගය

**කාලච්ඡේද** :- 19

**ඉගෙනුම් පල** :-

- හංසධ්වනි රාගයේ ස්වර අභ්‍යාස ගායනය/වාදනය කරයි.
- හංසධ්වනි රාගයේ රාග ලක්ෂණ සහ ස්වභාවය අවබෝධ කර ගනී.
- හංසධ්වනි රාගයේ සර්ගම් ගායනය/වාදනය කරයි.
- හංසධ්වනි රාගයේ මධ්‍යලය ගීතය ගායනය/වාදනය කරයි.
- හංසධ්වනි රාගයේ ආලාප හා මධ්‍යාලාප ගායනය/වාදනය කරයි.
- තානාලංකාර නිර්මාණය කර ගනී. ගායනය/වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්** :-

- තාම්පුරාව, සර්පිනාව, තබ්ලාව, දෘශ්‍යාධාර

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්** :-

හංසධ්වනි රාගයේ ස්වර අභ්‍යාස, සර්ගම්, මධ්‍යලය ගීතයෙහි ආලාප, මධ්‍යාලාප, තානාලංකාර ප්‍රායෝගික ව ගායනය/වාදනය පුහුණු කිරීම මෙම ක්‍රියාකාරකමෙන් අපේක්ෂිත ය. මේ තුළින් රාග සංගති රාග ස්වභාවය පිළිබඳ මනා අවබෝධයක් ලැබෙන අතර රාග රස වින්දන ශක්තිය වර්ධනය වී නිර්මාණකරණයට ද අවස්ථාව ලැබෙනු ඇත.

මේ සඳහා හංසධ්වනි රාගයේ ස්වර අභ්‍යාස, සර්ගම්, මධ්‍යලය ගීත, මධ්‍යාලාප, තානාලංකාර පුහුණුව හා ඇගයීමට කාලච්ඡේද 19ක් වෙන් කර ඇත.

රාග ස්වභාවය මැනවින් විදහා දක්වෙන ගීත මේ සඳහා යොදාගත හැකි ය. ඇමුණුමේ දක්වෙන ගීත හෝ වෙනත් සුදුසු මධ්‍යලය ගීතයක් හෝ තෝරා ගත හැකි ය.

වාදනය කරන සිසුන් සඳහා රාගාංග මැනවින් විදහා දක්වෙන වාදිතයක් යොදා ගත හැකි ය.

ශ්‍රැතිය, ස්වර ස්ථාන, ස්වර සංගති, තාලය සහ මිහිරිතාව රස භාව පිළිබඳ වඩාත් සැලකිලිමත් වෙමින් පුහුණු කිරීමේ කාර්යයෙහි යොදවන්න.

මෙම නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් අතරතුර දී හා අවසානයේ දී කරනු ලබන ඇගයීම් මඟින් සිසුන් ළඟා වී ඇති නිපුණතා මට්ටම පිළිබඳ සොයා බලා දුර්වලතා මඟහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකි ය.

**පාඩම සංවර්ධනය** :-

- පාඩම අංක 01 ජයජයවන්ති රාගය පාඩම් සැලසුම අනුව සැලසුම් කරගන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස්** :-

- පාඩම ආරම්භයේ සිටම නිවැරැදි ස්වර ස්ථාන, ශ්‍රැතියට හා තාලයට අනුකූල වීම පිළිබඳ නිරන්තර ඇගයීමක් කළ යුතු ය.
- හංසධ්වනි රාගයේ මධ්‍යලය ගීතය ගායනය/වාදනය කරවා සුදුසු ලෙස අගයන්න.

- නිවැරැදි ව ප්‍රස්තාර කිරීම හා රාගයේ සුවිශේෂතා තහවුරු වීමට සුදුසු ඇගයීම් සකසා ගන්න.

**ඇමුණුම අංක 03**

**හංසධ්වනි රාගය**

මේලය - බිලාවල්

ආරෝහණ - සරිගප නිසं

අවරෝහණ - සं නි ප ග රි ස

ජාතිය - ඖඩව ජාති

වාදී - ස

සංවාදී - ප

මුඛ්‍යාංගය - ගප නිප ග රි, රිග ප රි ස

ගානසමය - රාත්‍රී ප්‍රථම ප්‍රහරය

කර්ණාටක පද්ධතියට ආවේණික රාගයකි. මධ්‍යමය හා ධෛවතය වර්ජිත ය. ආරෝහණයේ දී රි ස්වරය දුර්වල බවක් දක්වෙතත් අවරෝහණයේ දී ප්‍රබල ව යෙදේ.

ස නි̣ රි ග ප රි, ස ගරි නි̣ ප̣, ප රි රි ග රි ස,

ග රි ග ප රි, ග ප රි ග, ග ප නි ප, ග නි ප ග රි

නි̣ ප̣ ස, ග ප සं - සं -, (සं) නි ප, ප නි රිं ගं නි

වැනි ස්වර සංගති නිතර යෙදේ.

ස්වර විස්තාර කිරීමේ දී නි̣ රි ස, ප රි ස යන ස්වර සංගතීන් නිතර යෙදෙන බැවින් කල්‍යාණ මේලයට උචිත බව ඇතැම් සංගීතඥයින්ගේ මතයයි.

**ඇමුණුම අංක 03**

**හංසධ්වනි**

**ස්වර අභ්‍යාස**

- ගගරිස

  පපගප ගගරිස

  පපගප නිපගප ගගරිස

  පපගප නිසं නිපගප ගගරිස

  පපගප නිසं රිंසं නිපගප ගගරිස

- ගප ගග රිස

  ගපනිප ගප ගග රිස

  ගප නිසं නිප ගප ගග රිස

  ගප නිසं රිंසं නිසं නිපගප ගග රිස

  ගප නිසं රිं ගं රිं සं නි සं නිප ගප ගග රිස

ඇමුණුම අංක 03

### හංසධ්වනි රාගය
### සර්ගම්

| × | | | | 2 | | | | 0 | | | | 3 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | ග | රි | ස | රි | ග | ප | - | රි |
| ග | - | - | ප | රි | රි | ස | - | නි̣ | ප̣ | නි̣ | ස | රි | ග | ස | රි |
| ග | ප | - | රි | ග | රි | ස | - | | | | | | | | |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | ග | රි | ස | රි | ග | ප | - | නි |
| ස̇ | - | - | ස̇ | රි̇ | ග̇ | ස̇ | - | ග̇ | රි̇ | ස̇ | රි̇ | ස̇ | නි | ප | ස̇ |
| නි | ප | ග | ප | ග | රි | ස | - | | | | | | | | |

### රාගය - හංසධ්වනි
### මධ්‍යලය ගීතය - ත්‍රිතාලය

ස්ථායි

| 0 | | | | 3 | | | | X | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | – | – | රි | – | ස | ස | නි̣ | ප̣ | රි | – | ස | ගප | ගරි | ස | රි |
| ලා | s | s | ගී | s | ල | ග | න | ප | තී | s | ස | බීs | ss | ස | ම |
| ප | ග | ප | – | ප | – | නි | රි̇ | ස̇ | ප | – | ගප | රි | – | ස | රි |
| ප | ර | ම | s | s | s | සු | බ | අ | තී | s | ආs | න | න් | ද | න |

අන්තරා

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | ග | ග | රි | – | රි | ස | ප̣ | ප̣ | රි | රි | රි | ගප | ගරි | ස | රි |
| ආ | යෙ | න | යේ | s | ම | ද | න | ක | ම | න | ස | බ s | නs | බ | න |
| ග | ගග | ප | පප | ස̇ | ස̇ස̇ | ස̇ | ප | ස̇ | – | – | ස̇ | රි̇ | ග̇ | ස̇ | – |
| අං | ගසු | ගං | දන | චං | දන | මා | තේ | තී | s | s | ල | ක | ග | රේ | s |
| ප | නි | ග̇ | රි̇ | – | ස̇ | ග̇ | රි̇ | ස̇ | – | ප | ස̇ | රි̇ | ග̇ | ස̇ | – |
| දෘ | ග | න | නෛ | s | න | අ | ං | ජ | න | න | ක | බ | ග | යේ | s |
| ග̇ | රි̇රි̇ | ස̇ | ප | ග | රි | ස | ස | ගප | නිස̇ | ග̇රි̇ | ස̇රි̇ | ස̇ස̇ | පප | ගරි | සරි |
| අ | මර | හෝ | s | නි | ත | ප | ති | කාs | ss | ss | ජේ | ss | සුs | ජs | නs |
| 0 | | | | 3 | | | | X | | | | 2 | | | |

## රාගය - හංසධ්වනි
## ලක්ෂණ ගීතය - ත්‍රිතාලය

ස්ථායි

| 0 | | | | 3 | | | | X | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ස | රි | ග | රි | ස | රි | නි̣ | ස | නි̣ | ප̣ | නි̣ | ස | ස | – | – | ස |
| ගු | ණී | ජ | න | හ | ං | ස | ධ්ව | නි, | කෝ | ස | ම | ජා | ऽ | ऽ | ය |
| ස | – | ග | රි | ග | – | ග | ග | ස̇ | නි | ප | ප | රි | – | – | නි̣ |
| ශ | ං | ක | ර | භූ | ऽ | බ | න | මේ | ऽ | ල, | මි | ලා | ऽ | ऽ | ය |

අන්තරා

| 0 | | | | 3 | | | | X | | | | 2 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ග | – | ග | – | ප | – | නි | නි | ස̇ | ස̇ | රි̇ | නි | ස̇ | ස̇ | ස̇ | ස̇ |
| අං | ග,සු | ගං | ධන | චං | දන | මා | ථේ | ති | ල | ऽ | ක | ऽ | ධ | රේ | ऽ |
| ග̇ | රි̇ | නි | රි̇ | නි | ප | ග | රි | නි | ප | ග | රි | ග | රි | ස | – |
| ග | රි | නි | රි | නි | ප | ග | රි | නි | ප | ග | රි | ග | රි | ස | ऽ |

## හංසධ්වනි රාගය
## මධ්‍යලය ගී

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | ග | - | ප | රි | - | ස | ස | ස |
| | | | | | | | | ලා | - | - | ගී | - | ල | ග | න |
| ප̣ | - | - | ප̣ප̣ | නි̣ස | රිග | රි | - | ගරි | සරි | ගප | නිරි | ස̇ | - | ප | ග |
| කෙ | - | - | සෙ- | -- | -- | නා | - | තු- | -- | -- | -- | ම | - | රෙ | බි |
| පග | රි | - | රි | ගරි | සරි | ගප | ග | | | | | | | | |
| න- | කෙ | - | සෙ | රා- | -- | -- | හු | | | | | | | | |
| × | | | | 2 | | | | 0 | | | | 3 | | | |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | ප | ප | ස̇ | ස̇ | ස̇ | ස̇ | ස̇ | ස̇ |
| | | | | | | | | තු | ම | රේ | - | කා | - | ර | ණ |
| රි̇ | නි | ප | පප | ගප | නිරි̇ | ස̇ | ස̇ | - | පනි | -ස̇ | රි̇ | ග̇ | රි̇ | - | ග̇රි̇ |
| ක | රි | යෙ | මා- | -- | -- | නී | - | - | මොරෙ | -ම | න | ජී | යා | - | ආ- |
| ස̇නි | පනි | ගරි | ස | ග | රි | - | ස | නි̣ | ප̣ | නි̣ | ස | ග | ප | නි | ස̇ |
| -- | රී- | - | රෙ | පි | යා | - | ක | ර | ත | මු | සෙ | ප්‍යා | - | රි | - |
| පනි | ස̇රි̇ | ග̇රි̇ | ස̇රි̇ | ස̇නි | පප | ගරි | සරි | | | | | | | | |
| තු- | -- | -- | -- | ම- | -- | -- | රෙ- | | | | | | | | |

**ක්‍රියාකාරකම 33**

## ත්‍රිතාල්, ඒක්තාල්, තබ්ලාවෙන් නිරූපණය කිරීම

**නිපුණතාව 1.0** : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.4** : තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය හා භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම** : ත්‍රිතාල්, ඒක්තාල්, තබ්ලාවෙන් නිරූපණය කිරීම හා තාල අභ්‍යාසය.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

**ඉගෙනුම් පල** :

- ත්‍රිතාල් හා ඒක්තාල් තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කරන අයුරු ප්‍රායෝගික ව අවබෝධ කරගනියි.

**ගුණාත්මක යෙදුම්** : අදාළ තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කරන අයුරු දැක්වෙන ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හා තබ්ලා.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

ත්‍රිතාල් හා ඒක්තාල් තාලවල ඨේකා තබ්ලාවෙන් වාදනය කිරීම පිළිබඳ ප්‍රායෝගික අවබෝධය සිසුන්ට ලබාදීම මෙම පාඩමින් අපේක්ෂිත යි.

අදාළ අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි තබ්ලාවෙන් උත්පාදනය කරන ආකාරය පිළිබඳ අවබෝධය සිසුන්ට ලබාදෙන්න. මේ සඳහා අදාළ තාලවල ඨේකා ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය ඛණ්ඩ භාවිත කළ හැකි ය. පහත දැක්වෙන ආකාරයට එක් තාලයක් සඳහා එක් කාලච්ඡේදයක් බැගින් වෙන් කරගනිමින් පාඩම සැලසුම් කරගන්න.

**පාඩම් සංවර්ධනය :**

ත්‍රිතාල් ඨේකාවට අයත් අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි හඳුනාගැනීම සඳහා ඔබ විසින් සූදානම් කරගත් ශ්‍රව්‍ය දෘශ්‍ය ඛණ්ඩය සිසුන්ට ඇසීමට සලස්වන්න. එම ධ්වනි තබ්ලාවෙන් උපදවාගන්නා ආකාරය එකිනෙක පැහැදිලි කරමින් නැතහොත් දෘශ්‍ය උපකරණයක් මගින් අවනද්ධාක්ෂර නිකුත් වන ස්ථාන පැහැදිලි කරමින් ඨේකාව තබ්ලාවෙන් වයා පෙන්වන්න. සිසුන් ලවා ඨේකාව තබ්ලාවෙන් වාදනය කරවමින් ඔවුන් ප්‍රායෝගික අභ්‍යාසයෙහි යොදවන්න.

(කාලච්ඡේද 04)

ඒක්තාල් ඨේකාවට අයත් අවනද්ධාක්ෂරවල නිවැරදි ධ්වනි හඳුනාගැනීම සඳහා ඔබ විසින් සූදානම් කරගත් ශ්‍රව්‍ය දෘශ්‍ය ඛණ්ඩය සිසුන්ට ඇසීමට සලස්වන්න. එම ධ්වනි තබ්ලාවෙන් උපදවා ගන්නා ආකාරය එකිනෙක පැහැදිලි කරමින් ඨේකාව තබ්ලාවෙන් වයා පෙන්වන්න. සිසුන් ලවා ඨේකාව තබ්ලාවෙන් වාදනය කරවමින් ඔවුන් ප්‍රායෝගික අභ්‍යාසයෙහි යොදවන්න.

(කාලච්ඡේද 04)

ක්‍රියාකාරකම 34

## ස්වර පුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව වාදනය

**නිපුණතාවය 3.0** :- වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 3.2** :- ස

**ක්‍රියාකාරකම** :- ස්වර පුවරුව සහ ස්වර වාද්‍ය භාණ්ඩය හෝ තබ්ලාව වාදනය

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් ඵල** :-

- ස්වර පුවරුවෙන් ගීත වාදනය කරයි.
- තෝරාගත් වාද්‍ය භාණ්ඩයෙන් ගීත වාදනය කරයි.
- තබ්ලාව වාදනය කරයි.
- වාද්‍ය භාණ්ඩ වාදනයට කැමැත්ත ප්‍රකාශ කරයි.
- වාද්‍ය භාණ්ඩ වාදනයේ ශිල්ප ක්‍රම පිළිබඳ ව දැන ගනියි.

**ගුණාත්මක යෙදවුම් :-**

- වීඩියෝ දර්ශන පෙන්විය හැකි උපකරණයක්.
- අදාළ වාදන ඇතුළත් CD/DVD හෝ Pen එකක්.
- සිසුන් විසින් සපයා ගත් සංගීත භාණ්ඩ.
- ගීත ප්‍රස්තාර ඇතුළත් දෘශ්‍යාධාරය.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

ස්වර පුවරුව, තෝරාගත් වාද්‍ය භාණ්ඩය හා තබ්ලාව පිළිබඳ වූ ඒ ඒ භාණ්ඩයන්ට ආවේනික ශිල්ප ක්‍රම කිහිපයක් හෝ හඳුන්වා දෙමින් වාදනය සඳහා සිසුන්ව පෙලඹවීම මෙම පාඩමින් අපේක්ෂිත ය.

සිසු කුසලතාවන්ට ගැළපෙන අයුරින් ඔබ විසින් තෝරාගත් ගීත වාදනයට සලස්වන්න. චිත්‍රපට ගී, නූර්ති, නාඩගම් මෙන් ම රාගධාරී සංගීතයට අයත් ඛ්‍යාල් (මධ්‍යලය) ගීතයක් (ස්වර වාද්‍ය භාණ්ඩය සඳහා) යොදා ගන්න. ඛ්‍යාල් ගීතය සඳහා තානාලංකාර ද භාවිත කිරීමෙන් සිසුනට වඩාත් පහසුවෙන් ප්‍රායෝගික පරීක්ෂණයට මුහුණ දීමට අවශ්‍ය හුරුව ලබා දිය හැකි ය. මෙම වාරයේ පාඩමින් ප්‍රායෝගික පරීක්ෂණයට අත දීමක් සිදුවන අයුරින් ම පාඩම සැලසුම් කරන්න.

සිසුන් සියල්ලන් ම ස්වර පුවරුව වාදනය කළ යුතු ය. එසේම සියලු ම සිසුන් විසින් තෝරාගත් ස්වර වාද්‍ය භාණ්ඩයක් හෝ තබ්ලාව වාදනය කළ යුතු ය.

**පාඩම සංවර්ධනය :-**

- කෙටි ඕර්ගන් වාදනයක්, ඛ්‍යාල් වාදනයක් හා තබ්ලා වාදනයක් නැරඹීමට සලස්වන්න. ඒ අයුරින් වාදනයට නිසි පුහුණුව අත්‍යවශ්‍ය බව අවධාරණය කරමින් පාඩමට පිවිසෙන්න.
- ස්වර පුවරුව සඳහා ඔබ විසින් තෝරාගත් ගීතයන්හි ස්වර ප්‍රස්තාර ප්‍රදර්ශනය කරමින් පුහුණු වීමට සලස්වා අවශ්‍ය සහාය ලබා දෙන්න.

(කාලච්ඡේද 01)

- සිසුන් සියලු දෙනා විසින් තෝරාගත් වාද්‍ය භාණ්ඩයෙන් බයාල● තබ්ලාව තෝරාගත් සිසුනට දී ඇති අදාළ පාඩම් වාදනයට සලස්වන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

සිසුන්ගේ වාදන කුසලතා ඇගයෙන අයුරින් ඇගයීම සකසා ගන්න.

**අතිරේක උදවු :-**

වීඩියෝ දර්ශන (youtube) හා ගීත ප්‍රස්තාර ඇතුළත් පොත්.

**ක්‍රියාකාරකම 35**

## ගසල් ගායන ශෛලිය

## (උස්තාද් ගුළාම් අලි- පංකජ් උදාස් - ජග්ජිත් සිං)

**නිපුණතාවය 4.0** :- සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟාකර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 4.1** :- සම්භාව්‍ය සංගීත ශිල්පීන් හඳුනා ගනිමින් ඔවුන්ගේ සංගීත කෘති රසාස්වාදනයේ හුරුවෙයි.

**ක්‍රියාකාරකම** :- ගසල් ගායන ශෛලිය
(උස්තාද් ගුළාම් අලි, පංකජ් උදාස්, ජග්ජිත් සිං)

**කාලච්ඡේද** :- 06

**ඉගෙනුම් පල** :-
- ගසල් ගායන ශෛලිය පිළිබඳ අදහස් දක්වයි.
- ගසල් ගායකයින් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**
- නිර්දේශිත ශිල්පීන් තිදෙනා විසින් ගයන ලද ගසල් ගීත
- ගසල් ගායනයක් ශ්‍රවණයට සැලැස්වීම සඳහා අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ
- සර්පිනාවක්, තබ්ලාවක්

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

භාරතයේ ප්‍රචලිත ගායන ශෛලියක් වූ ගසල් ගායන ශෛලියෙහි ප්‍රවීණයන් පිළිබඳ ව ඉදිරිපත් කිරීමක් ගසල් ගායන ශෛලිය රසවිඳීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය. ගායනය ශ්‍රවණයට සලස්වා ඒ පිළිබඳ ව විචාරාත්මක අධ්‍යයනයක් කිරීමට සිසුන් මෙහෙයවීම ගුරුවරයාගේ වගකීමකි.

**පාඩම සංවර්ධනය :-**

- නිර්දේශිත ගසල් ගායකයින් පිළිබඳ තොරතුරු ඇතුළත් පත්‍රිකාව සිසුන්ට ලබා දී එය කියවීමට යොමු කරන්න.

(කාලච්ඡේද 01)

- ගසල් ගායකයින්ගේ තොරතුරු සාකච්ඡා කරන්න.

(කාලච්ඡේද 01)

- ගසල් ගීතයක් ශ්‍රවණයට සලස්වන්න.
- නිර්දේශිත ශිල්පීන් විසින් ගයන ලද ගසල් ගීත කොටස් කිහිපයක් ශ්‍රවණයට සලස්වන්න.

(කාලච්ඡේද 02)

- ගසල් ගායන ශෛලිය හඳුන්වා එහි සුවිශේෂ ලක්ෂණ පිළිබඳ ව සිසු අභ්‍යාස පොතෙහි සටහනක් ගොඩනැගීමට උපදෙස් දෙන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ගසල් ගායනයේ සුවිශේෂ අංග පිළිබඳ ව වාචික ප්‍රශ්න මඟින් ඇගයීමට ලක් කරන්න.

**පැවරුම :-** ගසල් ගායන ශෛලිය තුළ දක්නට ලැබෙන ලක්ෂණ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

**අතිරේක උදවු :-** අන්තර්ජාලය ඇසුරින් ගසල් ගී ශ්‍රවණයට යොමු කරන්න.

1. **ගුලාම් අලි**



උස්තාද් ගුලාම් අලි 1940 දෙසැම්බර් 05 වන දින පන්ජාබ් ප්‍රාන්තයේ සියල්කොට් දිස්ත්‍රික්කයේ ( නූතනයේ පාකිස්ථානයට අයත් ) උපත ලැබූ අයෙකි. මෙතුමා උස්තාද් බඩේ ගුලාම් අලිඛාන් ගේ ගෝලයෙක බවද සඳහන් වේ. මේතුමා ලෝක ප්‍රසිද්ධ ගසල් ගායකයෙක් ය. සිය ගණනක් ගසල් ගී අතරින් එතුමාගේ ජනප්‍රිය ගසල් ගීත ලෙස *Chupke Chupke Raat Din, සහ Humko Kisi Ke Gham Ne Maara* , යන ගීත ඉතා ජනප්‍රියය. ඊට අමතරව Kal Chaudhvin Ki Raat Thi, Hungama Hai Kyon Barpa, Kiya Hai Pyar Jisé, May Nazar Sé Pee Raha Hoon, Mastana Peeyé, Yé dil yé pagal dil, බිවාගා චිත්‍රපටයට ගැයූ Teri yaad Yaad yaad, 1990 දී ආවාරාගී චිත්‍රපටයට ගැයූ Chamakte Chand Ko යන ගීත ද ඉතා ජනප්‍රිය ගීත වේ. 1960 දී පකිස්ථාන් රේඩියෝවේ ගසල් ගායකයෙක් ලෙසට සමබන්ධ වූ මෙතුමා චිත්‍රපට පසුබිම් ගායකයෙක් ලෙසට සම්බන්ධ වන්නේ 1982 දී ''නිකාහ් '' නම් චිත්‍රපටයට ගැයූ චුප්කේ චුප්කේ රාතධින් නම් ගීතයත් සමගය. ( written by the poet Hasrat Mohani in B. R. Chopra's film, Nikaah (1982)). මෙතුමා පහත දැක්වෙන සම්මාන දිනා ඇත.


- Pride of Performance Award in 1979 by the President of Pakistan
- Sitara-i-Imtiaz Award (Star of Excellence) in 2012 by the President of Pakistan

2. **පන්කජ් උදාස්** :-

මෙතුමා 1951.05.17 දින ගුජරාටි ප්‍රාන්තයේ ජෙට්පර්, හි දී උපත ලබා ඇත. ඉන්දියාවේ සිටින දක්ෂතම ගසල් ගායකයින් අතරින් එක් අයෙකි. උර්දු පදමාලාවන් සහිත ගසල් ගායනය පොදු ජනයා අතර ප්‍රචලිත කිරීම සම්බන්ධයෙන් මොහුට විශේෂ ස්ථානයක් හිමිවේ. මොහුගේ වැඩිමහල් සොයුරන් වන මන්හාර් උදාස් සහ නිර්මල් උදාස් චිත්‍රපට පසුබිම් ගායකයන් ලෙස ප්‍රසිද්ධ ය. මුබායිවල Xavier's විද්‍යාලයෙන් ඉගෙනුම ලබා ඇත. මොහු චිත්‍රපට පසුබිම් ගායනය සඳහා ද විශාල වශයෙන් දායක වී ඇත. 1986 තිරගත වූ '' නාම් '' චිත්‍රපටයට ගැයූ '' Chitthi Aayi Hai ''යන (ගසල්) ගීතය,ද, Chandi Jaisa Rang නම් ගසල් ගීතය ද ඉතා ජනප්‍රියය. 1991 ''සාජන්'' චිත්‍රපටයට ගැයූ "Jiye To Jiye Kaise" ගීතය, 1991 තිරගත වූ ''සංගීත්'' චිත්‍රපටයට ගැයූ "Jo Geet Nahin Janma " ගීතය, ප්‍රචලිත චිත්‍රපට ගී කිහිපයකි. 1985 සිට සම්මාන 18 ක් පමණ ලබා ඇති මෙතුමා 2006 දී විසිපස් වසරක ගසල් ගායනය වෙනුවෙන් පද්ම ශ්‍රී සම්මානයෙන් පිදුම් ලබා ඇත. ජනප්‍රිය චිත්‍රපට සඳහා ගීත ගායනා කර ඇත. උමාර්, සහ බාබුල් යන චිත්‍රපටවල පසුබිම් ගායනය කර ඇත.



**3. ජග්ජිත් සිංග් :-**



මෙතුමා 1941.02.08 දින රාජස්ථානයේ, ගන්ගනාගර් නගරයේ දී උපත ලැබූ අයෙකි. ලෝක ප්‍රසිද්ධ ගසල් ගායකයෙකි. හින්දි, පංජාබි, උර්දු, බෙන්ගාලි, ගුජරාටි සහ නේපාල් භාෂාවන්ගෙන් ගසල් ගීත විශාල ප්‍රමාණයක් ගායනා කර ඇත. කුරුක්ෂේත්‍ර විශ්වවිද්‍යාලයෙන් ඉතිහාසය පිළිබඳ උපාධියක් ලබා ඇත. 1976 දී H. M. V. L. P තැටි විශාල ප්‍රමාණයක් එළි දක්වා ඇත. ජග්ජිත්සිංගේ සුවිශේෂත්වය වන්නේ පැහැදිලි කටහඬ සහ අර්ධ ශාස්ත්‍රීය බව, ගසල් ගායනා තුළින් මනාව පිළිබිඹු වීමයි. 1967 දී ජග්ජිත්, චිත්‍රා සමඟ විවාහ විය. දෙදෙනාම එක්ව ගායනය කරන ලද ගසල් ගායනා ද ඉන් පසු ප්‍රචලිත වී ඇත. මීට අමතර ව බොලිවුඩ් චිත්‍රපට සඳහා පසුබිම් ගායකයෙක් ලෙසට ද ප්‍රසිද්ධ වී ඇත.

1982 දී තිරගත වූ '' සාත් සාත් '' චිත්‍රපටයට ගැයූ "Tum Ko Dekha Toh Ye Khayal" යන ගීතය,
1998 දී තිරගත වූ '' දුෂ්මන් '' චිත්‍රපටයට ගැයූ "Chithi na koi sandes" යන ගීතය,
2000 දී තිරගත වූ '' ෂාහර් '' චිත්‍රපටයට ගැයූ "Tere aane ki jab khabar mehke" යන ගීතය,
චිත්‍රපට ගී අතර ජනප්‍රිය ගසල් ගීත කිහිපයකි.

එමෙන් ම ගසල් ගීත බොහොමයක් රචනා කිරීමෙන් ද දායක වී ඇති මෙතුමා භජන් ගායනයෙහි ද ඉතා දක්ෂයෙක් ලෙස ප්‍රකට ය. පද්ම භූෂණ සම්මාන 2003. Teacher's Achievement සම්මානය 2006 දී ලබා ඇත. මෙතුමා 2011 ඔක්තෝම්බර් 10 වන දින මෙලොවින් සමුගෙන ඇත.

**ක්‍රියාකාරකම 36 A**

## තබ්ලා වාදනයක අංග

**නිපුණතාවය 4.0** :- සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්ත්වයන් ළඟා කර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 4.1** :- සම්භාව්‍ය සංගීත ශිල්පීන් හඳුනා ගනිමින් ඔවුන්ගේ සංගීත කෘති රසාස්වාදනයේ හුරුවෙයි.

**ක්‍රියාකාරකම** :- තබ්ලා වාදනයක අංග (පහත දැක්වෙන ශිල්පීන්ගේ වාදන ඇසුරින්) (උස්තාද් අල්ලා රක්ඛා, උස්තාද් සZකීර් හුසේන් පණ්ඩිත් අනින්දෝ චැටර්ජි, අෆාක් හුසේන් ඛාන්)

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් ඵල** :-
- තබ්ලා වාදනය පිළිබඳ නිපුණතා ඇති සංගීතඥයන් නම් කරයි.
- තබ්ලා වාදනයක ඇතුළත් අංග නම් කරයි.
- එක් එක් අංග පිළිබඳ විස්තර කරයි.
- තබ්ලා වාදනයක් රසවිඳීමට හුරු වෙයි.

**ගුණාත්මක යෙදවුම් :-**
- තබ්ලා වාදන ශිල්පීන් පිළිබඳ ව විස්තර ඇතුළත් තොරතුරු පත්‍රිකාව.
- තබ්ලා වාදනයක අංග ඇතුළත් තොරතුරු පත්‍රිකාව.
- තබ්ලා වාදනයක් ශ්‍රවණය කිරීමට අවශ්‍ය ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

තබ්ලා වාදනයක් රසවිඳීමත්, තබ්ලා වාදනයක ඇතුළත් අංග පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමත්, තබ්ලා වාදකයින් පිළිබඳ හඳුනා ගැනීමත් මෙම පාඩමෙන් අපේක්ෂිත ය. තබ්ලා වාදනයක් ශ්‍රවණය කිරීමට සලස්වා ඒ පිළිබඳ ව සාකච්ඡා කිරීමෙන් මෙම පාඩම සාර්ථක කර ගත හැකි ය. ගුරුවරයාට තබ්ලා වාදනය කිරීමේ ශිල්පීය ප්‍රාගුණ්‍ය තිබේ නම් මෙම පාඩම වඩාත් ආකර්ෂණීය ව සිසුන්ට ඉදිරිපත් කළ හැකි ය.

**පාඩම සංවර්ධනය :-**
- තබ්ලා වාදනයක අංග හා තබ්ලා වාදන ශිල්පීන් පිළිබඳ තොරතුරු ඇතුළත් පත්‍රිකාව සිසුන්ට සපයන්න.
- එම පත්‍රිකාවේ සඳහන් තොරතුරු කියවීම සඳහා සිසුන්ට අවස්ථාවක් ලබා දෙන්න.
- තබ්ලා වාදනය ශ්‍රවණයට අවස්ථාව දෙන්න.
- විස්තර පත්‍රිකාවේ සඳහන් තොරතුරු හා තබ්ලා වාදන අංග පිළිබඳ සාකච්ඡා කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**
- පත්‍රිකාවල ඇතුළත් තොරතුරු පිළිබඳ ව වාචික ප්‍රශ්න මඟින් විමසන්න.
- තබ්ලා වාදනයේ විවිධ කොටස් ශ්‍රවණයට සලස්වා ඒ පිළිබඳ ව ප්‍රශ්න යොමු කරන්න.

**පැවරුම :-**

අන්තර්ජාලය ඇසුරින් විවිධ තබ්ලා වාදකයින්ගේ වාදන ශ්‍රවණයට යොමු කරන්න.

**අතිරේක උදවු :-**

- 2009 පෙරදිග සංගීතය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය
- අභිනව තාල දීපනී - ඩී. ආර්. පීරිස්
- තබ්ලාව - විජේරත්න රණතුංග
- තබ්ලා ධ්වනි - ඩී.චානක පීරිස්
- තබ්ලා වාදනය - රංග පෙරේරා

**ඇමුණුම 01**

ප්‍රවේශය : තබ්ලා වාදන කොටසක් ශ්‍රවණයට සලස්වන්න. ඒ පිළිබඳ ව සිසු අදහස් විමසන්න.

**කියවීමේ පත්‍රිකාව**

**ක්‍රියාකාරකම අංක 01 - තබ්ලා වාදනයක ඇතුළත් අංග**

යේකාව : තබ්ලා වාදනයට පදනම් වූ තාලයේ අවනද්ධාක්‍ෂර සමූහය.

කායදා : මූලික හස්ත සාධන අභ්‍යාස සඳහා යොදාගැනේ. එක් කායදාවක් ආවර්ත 01 කට සීමා වේ. ගුණ කරන පද විශේෂයකි.

ධා ධා ති ට / ධා ධා තු නා / තා තා තිට / ධා ධා තු නා / (ත්‍රිතාල් කායදා)

පල්ටා : අදාළ කායදාවට අනුව වර්ධනය කරන පද ප්‍රබන්ධයකි.

පල්ටා - ධා ධා ති ට/ධා ධා ති ට/ධා ධා ති ට/ධා ධා තු නා

තා තා ති ට/තා තා ති ට/ධා ධා ති ට/ධා ධා තු නා

ගත් : ආවර්ත 02කට හෝ 03කට සීමා වූ පද විශේෂයකි.

මුඛුඩා : ගුණ කරන පද විශේෂයකි. ආවර්ත 1කට හෝ 02කට සීමා වේ. මෘදු ධ්වනියක් නිකුත් වන ආකාරයට අක්‍ෂර ප්‍රබන්ධ වී ඇත.

පරන් : ආවර්ත 4ක් හෝ ඊට වැඩි ගණනක් තිහායි සහිත ව වාදනය වන ගාම්භීර පද විශේෂයකි.

තිහායි : යම් කිසි පද කොටසක් තාලයේ සමග්‍රහයෙන් හෝ වෙනත් මාත්‍රාවකින් හෝ ආරම්භ කොට එය එක ම අයුරකින් තෙවරක් වාදනය කෙරේ නම් ඒ තිහායි නම් වේ. තිහායි එක සඳහා වාදනය කරනු වන පද කොටස 'පල්ලාවක්' ලෙස හඳුන්වනු ලැබේ.

ලෙහෙරා : තබ්ලා වාදනය සඳහා පදනම් වූ තාලයට අනුව ස්වර වාද්‍ය භාණ්ඩයකින් තාලයේ නිශ්චිත මාත්‍රා සංඛ්‍යාව අනුව යම් කිසි නාදමාලාවක් වාදනය කිරීම ලෙහෙරාවයි. වයන තාලයේ නියමිත මාත්‍රා සංඛ්‍යාවට ගැළපෙන පරිදි කිසියම් ස්වර වාද්‍ය භාණ්ඩයකින් (සර්පිනාව, සාරංගි, වයලීන්, එස්රාජ්) රාගාශ්‍රිත ව ප්‍රබන්ධ කොට වැයෙන වාදන අංගයයි. මෙම සංගීත ඛණ්ඩය තාලයේ සමග්‍රහය අවධාරණයෙන් දැනෙන පරිදි ප්‍රබන්ධ කොට ඇත. ලෙහෙරාව නග්මා ලෙස ද හඳුන්වයි.

චක්‍රදාර් : තිහායි සහිත වූ යම් කිසි පද කොටසක් තෙවරක් වාදනය කොට අන්තිම ධ අක්ෂරය සමග්‍රහයට පැමිණීම චක්‍රදාරය නම් වේ.

**ක්‍රියාකාරකම 36**

## තබ්ල වාදන ශෛලිය (උස්තාද් අෆාක් හුසේන් ඛාන්, උස්තාද් අල්ලා රක්ඛා, උස්තාද් සකීර් හුසේන්, පණ්ඩිත් අනින්දෝ චැටර්ජි)

**නිපුණතාව 1.0** : සම්භාව්‍ය සංගීතයේ ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම 1.4** : තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය හා භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

**ක්‍රියාකාරකම** : තබ්ල වාදන ශෛලිය (උස්තාද් අෆාක් හුසේන් ඛාං, උස්තාද් අල්ලාරක්ඛා, උස්තාද් සකීර් හුසේන්, පණ්ඩිත් අනින්දෝ චැටර්ජි)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :

- භාරතීය තබ්ලා වාදන ශිල්පීන් පිළිබඳ තොරතුරු රැස් කරයි.
- උත්තර භාරතීය ප්‍රවීණ තබ්ලා වාදන ශිල්පීන් ගේ නිර්මාණ රස විඳියි. අගයයි.
- ඔවුන් ගේ වාදන රසවින්දනයට පෙළඹෙයි.

**ගුණාත්මක යෙදුම්** : ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ කියවීම් පත්‍රිකා.

**විෂය කරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

තබ්ලා වාදන රසවිඳීමට සිසුන් හුරු කරවීම මෙම පාඩමින් අපේක්ෂිත ය. භාරතීය ප්‍රවීණ තබ්ලා වාදන ශිල්පීන් සිවුදෙනකු වන උස්තාද් අෆක් හුසේන් ඛාං, උස්තාද් අල්ලාරක්ඛා, උස්තාද් සzකීර් හුසේන් හා පණ්ඩිත් අනින්දෝ චැටර්ජි යන වාදන ශිල්පීන් පිළිබඳ හැඳින්වීමක් කරන්න. මේ සඳහා ඇමුණුමෙහි ඔවුන් පිළිබඳ සපයා ඇති තොරතුරු ආධාර කරගන්න. ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක භාවිතයෙන් ඔවුන් ගේ වාදන සිසුන්ට ඇසීමට සලස්වන්න. ඉගැන්වීමට නියමිත කාලච්ඡේද 04 ට ගැළපෙන පරිදි ක්‍රියාකාරකම් සැලැස්ම ගුරුවරයා විසින් ගොඩනඟාගත යුතු වෙයි.

**පාඩම් සංවර්ධනය :** උස්තාද් අෆක් හුසේන් ඛාං, උස්තාද් අල්ලාරක්ඛා, උස්තාද් සzකීර් හුසේන් හා පණ්ඩිත් අනින්දෝ චැටර්ජි යන භාරතීය තබ්ලා වාදන ශිල්පීන් සිවුදෙනා පිළිබඳ ඔබ විසින් සැකසූ කියවීම් පත්‍රිකා සිසුන් වෙත ලබා දෙන්න. මේ සඳහා ඇමුණුමෙහි දක්වා ඇති ඡායාරූප හා විස්තර ආධාර කරගත හැකි ය. එම වාදන ශිල්පීන් ගේ වාදන ඇතුළත් ශ්‍රව්‍ය දෘශ්‍ය ඛණ්ඩ සිසුන්ට ඇසීමට සලස්වන්න.

(කාලච්ඡේද 04)

**ඇගයීම් හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

ඉහත ශිල්පීන් සිවු දෙනා ගේ විස්තර ඇතුළත් කර පැවරුමක් සකස් කිරීමට උපදෙස් දෙන්න. සුදුසු පරිදි අගයන්න.

**අතිරේක උදවු :**

සම්භාව්‍ය තාල දීපනී - ඩී. ආර්. පීරිස් - පිටු අංක 16-17 හා 104
අමරණීය භාරතීය සංගීතවේදියෝ* සනත් නන්දසිරි * පිටු අංක 17*19, 205*207

ඇමුණුම

**උස්තාද් අෆාක් හුසේන් ඛාන්**




උස්තාද් අෆාක් හුසේන් ඛාන් ලක්නව් තබ්ලා ගුරුකුලයේ උස්තාද් ඛලීෆා වජිද් හුසේන් ඛාන් ගේ පුත්‍රයා ය. ක්‍රි.ව.1930 දී මෙලොව එළිය දුටු අෆාක් ඛාං වයස අවුරුදු හතරේ දී තම සීයා වූ ඛලීෆා අබිද් හුසේන් ඛාන් යටතේ තබ්ලා වාදන අධ්‍යයනය ආරම්භ කළේ ය. ඛලීෆා අබිද් හුසේන් ඛාන් ගේ අභාවයෙන් පසු ව තම පියා වන ඛලීෆා වජිද් හුසේන් ඛාන් හා මව වන කාසිම් බේගම්ගෙන් තාල වාදන අධ්‍යයනය කළේ ය.

ක්‍රි.ව. 1950 දී සමස්ත ඉන්දියා ගුවන්විදුලියේ විශිෂ්ට ශ්‍රේණියේ වාදන ශිල්පියකු ලෙස අෆාක් හුසේන් පත් කෙරිණි. වර්ෂ 1977 සිට ලක්නව් රූපවාහිනී මධ්‍යස්ථානය සහ සංගීත් නාටක් ඇකඩමිය හා සම්බන්ධ ව සේවය කළ මොහු ඒකල වාදනයේ දී දැක්වූ ශිල්ප හරඹ ආසාමාන්‍ය ය.

ශ්‍රී ලාංකේය තබ්ලා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි පුරෝගාමීන් වූ ඩී. ආර්. පීරිස් හා පී. වී. නන්දසිරි දෙපල උස්තාද් අෆාක් හුසේන් ගේ තබ්ලා ශිෂ්‍යයෝ ය. ලක්නව් තබ්ලා ගුරුකුලයේ වර්තමාන ආධිපත්‍යය හොබවන උස්තාද් ඉල්මාස් හුසේන් ඛාන් ගේ පියා ද උස්තාද් අෆාක් හුසේන් ඛාන් ය. කලක සිට රෝගාතුර ව සිටි අෆාක් හුසේන් මුළු තාල ශාස්ත්‍රයටත් ප්‍රේක්ෂකයාටත් මහඟු සේවයක් කොට වර්ෂ 1990 දී අභාවප්‍රාප්ත විය.

**උස්තාද් අල්ලාරක්ඛා ඛාන්**



වර්ෂ 1918 දී පංජාබයේ රතන්ගර්හි උපත ලද උස්තාද් අල්ලාරක්ඛා ඛාන් ගේ පියා වෘත්තියෙන් ගොවියෙකි. තරුණ වයසේ සිට ම සංගීතය උගනීමෙහි දැඩි ආශාවෙන් පසු වූ මෙතුමා වයස අවුරුදු 16 දී පතන්කෝට් නාටක් ඇකඩමියට සම්බන්ධ විය. එහි දී කාදිර් බක්ස් නම් වූ පංජාබි සරාණාවේ මහා තබ්ලා වාදන ශිල්පියා ගේ ශිෂ්‍යයෙකු වූ ලාල් මුහම්මද් ගෙන් තබ්ලා වාදනය හැදෑරීම ආරම්භ කළ මෙතුමා පසු ව උස්තාද කාදීර් බක්ස් ගේ පූර්ණ කාලීණ ශිෂ්‍යයෙකු විය.

තාල වාදනයෙහි හසල බුද්ධියක් තිබූ මෙතුමා පංජාබි තබ්ලා වාදන ශෛලියේ නිපුණත්වයක් ලබා ඇත. පණ්ඩිත් රවි ශංකර් ගේ සහාය තබ්ලා වාදන ශිල්පියා වීමෙන් පසු ව මෙතුමා ජාත්‍යන්තර කීර්තියට පත් විය. මෙතුමා යටතේ තබ්ලා වාදනය හැදෑරූ ශිෂ්‍යයන් විසින් මෙතුමන් හඳුන්වනු ලැබුවේ **අබ්බාජි** යනුවෙනි. වර්ෂ 1990 දී හෆිස් අලී ඛාන් සම්මානයෙන් පිදුම් ලද මෙතුමා වර්ෂ 2000 පෙබරවාරි මස 03 වන දින අභාවප්‍රාප්ත විය.

**උස්තාද් සZකීර් හුසේන්**



වර්ෂ 1951 බොම්බායේ දී උපත ලද සZකීර් හුසේන් ගේ පියා උස්තාද් අල්ලාරක්බා ය. තම පියාණන් ගෙන් තබ්ලා වාදන ශිල්පය මනා ව උගත් සZකීර් හුසේන් තමාට ම ආවේනික වාදන ශෛලියක් නිර්මාණය කර ගත් ශිල්පියකු ලෙස ප්‍රසිද්ධ ය. කුඩා කාලයේ දී බොම්බායේ ශාන්ත මයිකල් විද්‍යාලයයට ඇතුළු වූ මොහු ශාන්ත ක්ෂෙවියර් විශ්වවිද්‍යාලයයෙන් උපාධිය ලබාගත්තේ ය.

වර්ෂ 1992 දී තම තබ්ලා වාදන පටිගත කිරීම ඇරඹූ උස්තාද් සZකීර් හුසේන් තම නිර්මාණ ලෝක ප්‍රසිද්ධ කිරීමට සමත් විය. තබ්ලා වාදනය පමණක් නො ව චිත්‍රපට සංගීත නිර්මාණකරණයට ද පිවිසි සZකීර් ඒ සඳහා සම්මාන ද හිමි කරගැනීමට සමත් විය. තම සංගීත දිවියේ දී බොහෝ සම්මාන හිමි කරගත් සZකීර් 2002 දී **පද්ම භූෂණ සම්මානය** හිමි කරගත්තේ එම සම්මානය හිමි කරගත් ලාබාලතම භාරතීය සංගීතවේදියා වශයෙනි. උස්තාද් සZකීර් හුසේන් වර්තමානයේ භාරතයේ සිටින අසහාය තබ්ලා වාදන ශිල්පියෙකි.

**පණ්ඩිත් අනින්දෝ චැටර්ජි**



පණ්ඩිත් අනින්දෝ චැටර්ජි ෆරුකාබාද් තබ්ලා වාදන ශෛලිය ප්‍රගුණ කළ වාදන ශිල්පියෙකි. භාරතයේ ප්‍රසිද්ධ සංගීත පවුලක උපත ලද මොහු වයස අවුරුදු පහේ දී තබ්ලා වාදනය හැදෑරීම ආරම්භ කළේ ය. පණ්ඩිත් අනින්දෝ චැටර්ජි පණ්ඩිත් ඥාන් ප්‍රකාෂ් ගෝෂ් ගේ ශිෂ්‍යයෙකි. භාරතයේ ප්‍රමුඛ පෙළේ ශාස්ත්‍රීය ගායන වාදන ශිල්පීන්ගේ නිර්මාණ සඳහා තබ්ලාවෙන් දායකත්වය ලබා දී ඇති මොහු ප්‍රේක්ෂක සිත් අමන්දානන්දයට පත් කිරීමට සමත් මධුර වාදන ඉදිරිපත් කරන ශිල්පියකු ලෙස ප්‍රසිද්ධ ය. වර්ෂ 2002 දී **සංගීත් නාටක ඇකඩමි** සම්මානයෙන් පිදුම් ලද මොහු වර්තමාන භාරතීය ප්‍රමුඛ පෙළේ තබ්ලා වාදන ශිල්පියෙකි.

ක්‍රියාකාරකම 37 A

## සිතාර්, එස්රාජ්, දිල්රුබා, සාරංගි, සරෝද්, සන්තූර්, බටනලා, වයලින්, ෂෙහනායි වාදන රසාස්වාදන

**නිපුණතාවය 4.0** :- සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැඳි මානසික තත්වයන් ළඟා කරගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 4.1** :- සම්භාව්‍ය සංගීත ශිල්පීන් හඳුනාගනිමින් ඔවුන්ගේ සංගීත කෘති රසාස්වාදයට හුරුවෙයි.

**ක්‍රියාකාරකම 4.1.1** :- සිතාර්, එස්රාජ්, දිල්රුබා, සාරංගි, සරෝද්, සන්තූර්, බටනලා, වයලින්, ෂෙහෙනායි වාදන රසාස්වාදය.

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් ඵල** :-

- නියමිත වාද්‍ය භාණ්ඩයන්හි හඬ හඳුනාගනිමින් නම් කරයි.
- වාදන රස විඳිමින් ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කරයි.
- හින්දුස්ථානී වාද්‍ය භාණ්ඩ වාදනය ඉගෙනුමට කැමැත්ත ප්‍රකාශ කරයි.
- විවෙක කාලයෙහි වාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- අදාළ වාදන භාණ්ඩ ඇතුළත් උපකරණ (Pen, CD ආදිය) අන්තර්ජාල පහසුකම්.
- එම වාදන ශ්‍රවණයට සැලැස්වීමට අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

**විෂය කරුණු පැහැදිළි කිරීමට අත්වැලක් :-**

ඉහත භාණ්ඩයන්ගෙන් වාදන තෝරාගැනීමේදී උසස් පෙළ විෂය නිර්දේශයට අයත් රාගයන්ට අදාළ වාදන තෝරාගැනීමෙන් ඵලදායීතාවය වැඩිවනු ඇත.

- නිවැරදි රසාස්වාදය පිළිබඳව පැහැදිළි කරන ලද පාඩමේ පියවරක් ආවර්ජනය කරමින් ප්‍රායෝගිකත්වය ප්‍රධානව මෙම පාඩම සංවිධානය විය යුතුය. එක් කාලඡේදයකට වාද්‍ය භාණ්ඩ දෙක බැගින් පුහුණු කරවන්න. 4 වන කාලඡේදයේදී සිසුන් අත්පත් කොටගෙන ඇති ප්‍රගතිය පිළිබඳව විමසීමට ලක් කොට අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබාදෙන්න.
- මෙම වාද්‍ය භාණ්ඩයන්හි ස්වභාවය පිළිබඳව ඉතා කෙටි හැඳින්වීමක් සහිතව රූප මගින් හෝ භාණ්ඩ අධ්‍යයනය කිරීමට සැලැස්වීමද අවශ්‍යය.

**පාඩම සංවර්ධනය :-**

- අදාළ භාණ්ඩ ශ්‍රවණයට සලස්වන කාලඡේදයන්හි සුදුසු ප්‍රවේශයකින් පාඩමට පිවිසෙන්න.
- චිත්ත රූප හා මනෝභාවයන් අත්විඳිමින් වාදන ශ්‍රවණය කරමින් රසාස්වාදයට පොළඹවන්න.
- සෑම වාදනයක් අවසානයේදීම අත් විඳි රූප හා මනෝභාවයන් පිළිබඳව සිසුන් සමග කෙටි සංවාදයක් මෙහෙයවන්න.

(කාලච්ඡේද 01)

- සිවුවන කාලච්ඡේදයේ දී පෙර රසවිඳි වාද්‍ය භාණ්ඩයන් කෙටියෙන් ශ්‍රවණයට සලස්වා හඳුනාගැනීමට යොමු කරමින් පාඩමට පිවිසෙන්න.

- වාද්‍ය භාණ්ඩයන්හි නාද රටා, එයින් නැගෙන හඬෙන් ඇතිවන භාවයන් වැනි කරුණු පදනම් කරමින් විචාරශීලී සාකච්ඡාවක් මෙහෙයවන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

ඉලෙනුම් එල මැනෙන පරිදි ඇගයීම සකසාගන්න.

**අතිරේක උදවු :** www.youtube.com වෙබ් අඩවිය පරිශීලනයට සිසුන් යොමු කරන්න.

ක්‍රියාකාරකම 37 B

## සිතාර්, එස්රාජ්, දිල්රුබා, සාරංගි, සරෝද්, සන්තූර්, බටනලා, වයලින්, ෂෙහනායි වාදන රසාස්වාදන

**නිපුණතාවය 4.0** :- සංගීත රසාස්වාදයේ යෙදෙමින් ජීවිතයේ සතුට හා බැදි මානසික තත්ත්වයන් ළඟාකර ගැනීමට හුරු වෙයි.

**නිපුණතා මට්ටම 4.1** :- සම්භාව්‍ය සංගීත ශිල්පීන් හඳුනා ගනිමින් ඔවුන්ගේ සංගීත කෘති රසාස්වාදනයේ හුරුවෙයි.

**ක්‍රියාකාරකම** :- සිතාර්, එස්රාජ්, දිල්රුබා, සාරංගි, සරෝද්, සන්තූර්, බටනලා, වයලින්, ෂෙහනායි වාදන රසාස්වාදන

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් ඵල** :-

- සිතාර්/සරෝද් වාදකයින් හඳුනා ගනිමින් වාදනයක් රසවිඳියි.
- එස්රාජ්/දිල්රුබා/සාරංගි වාදකයින් හඳුනා ගනිමින් වාදනයක් රසවිඳියි.
- සන්තූර් වාදකයින් හඳුනා ගනිමින් වාදනයක් රසවිඳියි.
- බටනලා වාදකයින් හඳුනා ගනිමින් වාදනයක් රසවිඳියි.
- වයලින් වාදකයින් හඳුනා ගනිමින් වාදනයක් රසවිඳියි.
- ෂෙහනායි වාදකයින් හඳුනා ගනිමින් වාදනයක් රසවිඳියි.

**ගුණාත්මක යෙදවුම් :-**

- වාද්‍ය භාණ්ඩවලට අදාළ වාදන ශ්‍රවණය කිරීමට සැලැස්වීම සඳහා අවශ්‍ය උපකරණ
- ඇමුණුම අංක 1 ට අයත් සංගීත ශිල්පීන්ගේ නාමාවලිය. ඇමුණුම අංක 2 ට අයත් වාදන පිළිබඳ සකස් කළ කෙටි සටහන් සහිත පත්‍රිකාව

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

උත්තර භාරතීය සංගීත පද්ධතිය තුළ තිබෙන සම්භාව්‍ය සංගීත කෘතීන් හා ඒවා වාදනය කරනු ලබන ශිල්පීන් හඳුනා ගැනීම මෙම පාඩමෙන් අපේක්ෂිත ය. ඇමුණුමෙහි දක්වා ඇති වගු සටහන මේ සඳහා උපයෝගී කර ගත හැකි ය. ශ්‍රවණය කිරීමට සුදුසු වාදන සපයා ගැනීමත් ඒවා පිළිවෙළින් ඉදිරිපත් කර පෙන්වීමත් ගුරුවරයා සතු කාර්යභාරයකි. වීඩියෝ දර්ශන ඉදිරිපත් කිරීම මෙම පාඩම වඩාත් ඵලදායී කිරීමට හේතුවකි. වාදනය අතරමගදී ඒ පිළිබඳ සාකච්ඡා කිරීමෙන් මෙම පාඩම වඩාත් රසවත් වනු ඇත.

**පාඩම සංවර්ධනය :-**

- සිතාර් වාදනයක් ඉදිරිපත් කර පාඩමට ප්‍රවේශය ලබා ගන්න.
- සරෝද් වාදනයක් ඉදිරිපත් කර පාඩමට ප්‍රවේශය ලබා ගන්න.
- ශ්‍රවණය කළ වාදනයට අදාළ කෙටි සටහන් කියවීමට යොමුකර සාකච්ඡාවක යෙදෙන්න.

(මිනිත්තු 30)

- එස්රාජ්/දිල්රුබා/සාරංගි වාදනයට අදාළ කෙටි සටහන් කියවීමට යොමුකර වාදනය ශ්‍රවණයට සලස්වන්න.

(මිනිත්තු 20)

- සන්තූරයට අදාළ කෙටි සටහන් කියවීමට යොමුකර වාදනය ශ්‍රවණය කිරීමට සලස්වන්න.
- බටනලාවට අදාළ කෙටි සටහන් කියවීමට යොමුකර වාදනය ශ්‍රවණය කිරීමට සලස්වන්න.

- වයලීනයට අදාළ කෙටි සටහන් කියවීමට යොමුකර වාදනය ශ්‍රවණයට සලස්වන්න.
- ෂෙහනායි භාණ්ඩයට අදාළ කෙටි සටහන් කියවීමට යොමු කර වාදනය ශ්‍රවණයට සලස්වන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් වාදනය අවසානයේ වාචික ප්‍රශ්න මඟින් අගයන්න.

**පැවරුම :-**

එක් එක් සංගීත භාණ්ඩවලට අදාළ ව තවත් වාදන රසාස්වාදය කිරීම සඳහා යොමු කරන්න.

**අතිරේක උදවු :-**

- අන්තර්ජාලය ඇසුරින් වාදන ශ්‍රවණයට යොමු කරන්න.

සිතාර් : පණ්ඩිත් රවිශංකර්, පණ්ඩිත් නිඛිල් බැනර්ජි, උත්තාද් විලායත් ඛාන්, ලයනල් එදිරිසිංහ, ඩී.ඩී. දේවගේ, කේ.දයාරත්න, ටයිටස් නොනිස්, ආචාර්ය නිර්මලා කුමාරි රොද්‍රිගු, ප්‍රදීප් රත්නායක, කේ.ඒ.ධර්මසිරි පෙරේරා.

සරෝද් : උස්තාද් අලි අක්බර් ඛාන්, උස්තාද් අම්ජාඩ් අලිඛාන්, රත්න දිසානායක.

එස්රාජ්/දල්රුබා: පණ්ඩිත් අසීස්චන්ද්‍ර බෙනර්ජි, රනාධීර් රෝයි, සුදත් වික්‍රමසිංහ, අනිල් මිහිරිපැන්න, නිශාද් හඳුන්පතිරණ.

සාරංගි : අස්තාද් සුල්තාන් ඛාන්, පණ්ඩිත් රාම් නාරායන්, සදානන්ද පට්ටිආරච්චි.

සන්තූර් : පණ්ඩිත් ශිවකුමාර් ශර්මා, පණ්ඩිත් කරුණාරත්න කිරිවත්තුඩුව.

බටනලා : පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා, පණ්ඩිත් පන්නාලාල් ඝෝෂ්, අනිල් මිහිරිපැන්න, වී. හේමපාල පෙරේරා.

වයලින් : පණ්ඩිත් වී.ජී.ජෝග්, ආචාර්ය එන්.රාජම්, ටී.එස්.කන්නන්, බාලාජි, සෝමසිරි ඉලේසිංහ, බී.වික්ටර් පෙරේරා, ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී.අමරදේව, ගුණපාල පෙරේරා, ආචාර්ය තුෂාර රත්නායක.

ෂෙහනායි : ඔස්තාද් බිෂ්මිල්ලා ඛාන්.

**ඇමුණුම 01**

**කියවීමේ පත්‍රිකාව**

සිතාර් : සිතාරය ගත් ශෛලියේ වාද්‍ය භාණ්ඩයකි. ගත් විලම්භ ලය (මසිද්ඛානි) සහ මධ්‍ය ලය (රසාඛානි) වශයෙන් වාදනය කෙරේ. ගත් ශෛලිය ආරම්භයේ දී ආලාපය දීර්ඝ ය. එම ආලාපය අවසානයේ ජෝඩ් ආලාප වාදනය කෙරේ. එය රිද්මයානුකූල බවක් පෙන්වයි. ගත් මධ්‍යයේ ද ආලාප භාවිත වේ. ඉන් පසු ව (තෝඩා) තානාලංකාර වාදනය කරන අතර මධ්‍යලය ගත් වාදන මධ්‍යයේ විවිධ විචිත්‍ර තානාලංකාර වාදනය කෙරේ. අවසානයේ ද්‍රැත ලයෙන් ඣාලා වාදනය කර තිහායි හෝ චක්‍රදාර් වාදනයෙන් අවසන් කෙරේ. සිතාර් වාදනය සඳහා මිස්රාබ් නම් උපකරණය භාවිතා කරයි.

එස්රාජ් : එස්රාජ් වාදනය සඳහා ඊට ම සුවිශේෂ වූ ගත් ශෛලියේ වාදන සහ ගායකී ශෛලියේ

දී ඛ්‍යාල් ගීත වාදන සඳහා යොදා ගනී. මෙහි දී විලම්භ, මධ්‍ය සහ ද්‍රෘත ආදී වශයෙන් වාදනය කරන අතර ආලාප තානාලංකාර හා ඣලා ද යොදා ගනී. වාදනය ආරම්භයේ වයනු ලබන ආලාපයට පසු උපජ් ආදිය ද යොදාගනී.

සන්තූර් : සන්තූරය අනෙක් තත් භාණ්ඩවලට වඩා වෙනස් භාණ්ඩයකි. මෙහි තත් සංඛ්‍යාව අනෙකුත් තත් භාණ්ඩවලට වඩා වැඩි ය. (එක් ස්වරයට තත් තුන බැගින් යෙදේ) ක්වාලම් නමැති උපකරණ කට්ටලයකින් වයනු ලැබේ. එම උපකරණය භාවිතයෙන් තතට තට්ටු කිරීමෙන් හඬ උපදවන අතර එහි දී යම් ආකාරයක කම්පනයක් (තතෙහි) ඇති වේ. සන්තූර් ද ගත් ශෛලිය විචිත්‍ර ලෙස භාවිත වන වාද්‍ය භාණ්ඩයකි. වාද්‍ය භාණ්ඩයේ ශිල්ප ක්‍රමයන් ඇසුරෙන් ඊට ම ආවේණික ශෛලියකින් ආලාප යොදා ගනී. මධ්‍යලය ද්‍රෘත ලය ගත් මෙන්ම, විලම්භලය ගත් ද වාදනය කෙරේ. විවිධ තානාලංකාර ක්‍රම සහ ඣලා වාදන එම භාණ්ඩයෙහි වාද්‍ය ශිල්ප ක්‍රමයන්ට ආවේණික ව හා උචිත පරිදි භාවිත වේ.

බටනලාව : බටනලා වාදනය ශාස්ත්‍රීය වශයෙන් වැඩි දියුණු කිරීම උදෙසා පණ්ඩිත් පන්නාලාල් ඝෝෂ් හා පණ්ඩිත් හරිප්‍රසාද් චෞරසියා අගනා මෙහෙයක් කර ඇත. එක ම ස්ථානයෙන් පහළ හා ඉහළ ස්වර ඉපදවීමේ හැකියාව බටනලාව සතු ය. මෙය ගායකී භාණ්ඩයකි. විලම්බ ලය මධ්‍ය ලය ගීත ද ගත් ද වාදනය කෙරේ. ආලාප තානාලංකාර ඣලා සහ උපජ් මෙම භාණ්ඩයෙන් ඉතා විචිත්‍ර ව වාදනය කළ හැකි ය.

වයලීනය : වයලීනය ඉතා ජනප්‍රිය තත් භාණ්ඩයකි. මෙය පෙරදිග ද අපරදිග ද එක සේ භාවිත කෙරේ. මධුර ලෙස ගීත වාදනය කළ හැකිය. ගත් ශෛලියේ වාදන ද ඉදිරිපත් කෙරේ. අලංකාර ලෙස මීන්ඩ්, ගමක් ඉපදවීම කළ හැකි ය. විලම්භ ලය මධ්‍යලය සහ දෘත ලය වාදන ඉදිරිපත් කෙරේ. සුවිශේෂී තානාලංකාර හා ඣලා වාදන වැයිය හැකිය.

ෂෙහනායි : මෙය ශුෂිර වාද්‍ය භාණ්ඩයකි. ශෝකී හඬක් මින් නිකුත් වන අතර රාගධාරී සංගීතය තුළ ජනප්‍රිය කරන ලද්දේ උස්තාද් බිස්මිල්ලා ඛාන් විසිනි. ප්‍රධාන ෂෙහනායි වාදකයාට සහාය වීම පිණිස තවත් වාදකයින් කීප දෙනෙකු යොදා ගැනීම සාම්ප්‍රදායයකි. මීන්ඩ් ලක්ෂණ අපූරුවට ඉපදවිය හැකි ය. තාල වාදනය සඳහා යොදා ගන්නේ නක්කරා නමැති තාල වාද්‍ය භාණ්ඩයයි. ඛ්‍යාල් ගීත හා ගත් වාදන, තානාලංකාර හා ඣලා වාදන ආදිය මෙම භාණ්ඩයේ ආවේණිකත්වය අනුව සුවිශේෂී ව යොදාගැනේ.

සරෝද් : සරෝදය ගත් ශෛලීය වාද්‍ය භාණ්ඩයකි. ජවා නැමති උපකරණයකින් වාදනය කෙරේ. සුවිශේෂී වූ මීන්ඩ් (සූත්) සහ ඝෂීට් අලංකාර වාදනය කළ හැකිය. තුම්බාව හමක් අවුරා සකසා ඇති මෙම භාණ්ඩයේ, පර්දා රහිතය. ස්වර ඉපැදවීම සඳහා රිදී ආලේපිත තහඩු ස්වර පුවරුවක් සවිකර ඇත. සිතාරයේ මෙන් ගත්, තානාලංකාර හා ඣලා ආදී වාදන ශිල්පක්‍රම යොදාගනී.

සාරංගි : මෙය ගායකී ශෛලීය වාද්‍ය භාණ්ඩයකි. අළුවකින් වැයේ. නියපොත්තේ මතුපිට තත් වල ගැවෙන පරිදි රඳවා ස්වර උපදවයි. තුම්බාව හමක් අවුරා ඇති උසින් අඩු භාණ්ඩයකි. මිනිස් කටහඬට ඉතා සමාන වූ හඬකින් යුක්තය. වඳුරන්ගේ බඩවැල් හෝ මතස්‍ය බඩවැල් වේලා තත් සකස් කරගනී. උතුරු ඉන්දියාවට ආවේනණික සංගීත භාණ්ඩයකි. ප්‍රධාන තත් තුනක් හො හතරක් සහිතය. අනුතත් රාශියක් ඇත. මෙම භාණ්ඩය ගායනයට සහාය වාද්‍ය භාණ්ඩයක් ලෙස යොදාගනු ලබන අතර, රාගධාරී වාදන භාණ්ඩයක් ලෙසද ප්‍රචලිතය. විලම්භ, මධ්‍ය සහ දෘත බයාල් වාදනය සිදුකරන අතර, ඣලා වාදනය සිදුකරනු ලබයි.

දිල්රුබා : සාරංගියේ සහ සිතාරයේ සම්මිශ්‍රණයකින් සකසා ඇත. තුම්බාව හමක් අවුරා ඇති අතර, සාරංගි භාණ්ඩයේ හැඩය ඇත. ස්වර පුවරුව සිතාරයේ මෙන් පර්දා සහිතය. ගායකී ශෛලියට විලම්භ, මධ්‍ය හා දෘත ලය වාදන, තානාලංකාර හා ඣලා වැනි වාදන විධි යොදාගනී. එස්රාජයේ උපත දිල්රුබාවේ ආභාෂයෙන් සිදු වී ඇත. දිල්රුබාව කරෙහි රඳවා අළුවකින් වැයේ. ප්‍රධාන තත් 6ක් සහ අනු තත් රාශියකින් යුක්ත වේ.

ක්‍රියාකාරකම 38

## Interlude, Introduction (ගීතයක පෙර වාදනය සහ අතුරු වාදනය)

**නිපුණතාවය 8.0** :- සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 8.1** :- සරල ගීයක අන්තර්ගතය විමසමින් විවිධ සුවිශේෂී කොටස් සහිතව ගීත නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** :- Interlude, Introduction (ගීතයක පෙර වාදනය සහ අතුරු වාදනය) විමසීම හා අධ්‍යයනය

**කාලච්ඡේද** :- 4

**ඉගෙනුම් ඵල** :-

- ගීතයක මූලික සංගීතාංග 2ක් වන Interlude, Introduction (ගීතයක පෙර වාදනය සහ අතුරු වාදනය) කොටස් හඳුනා ගනී.
- ඉහත කොටස්වල විශේෂතා පිළිබඳ සොයා බලයි.
- Interlude, Introduction කොටස් නිර්මාණය කරයි.
- නිර්මාණය කර ගනු ලබන කොටස් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- හාර්මෝනියම්, තබ්ලාව, විදුලි ඕගනය, ගිටාරය ඇතුළු සංගීත භාණ්ඩ කිහිපයක්, ගීතයක් සම්පූර්ණයෙන් ම සංගීතාංග ඇතුළත්ව ලියා ඇති ස්වර ප්‍රස්තාරයක් හෝ කිහිපයක්. (දෘශ්‍යාධාරක වශයෙන්)

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

සරල ගීත ආකෘතිය විවිධාකාරයෙන් විවිධ පිළිවෙලින් ලෝක සංගීතය තුළ දක්නට ඇත. ශ්‍රී ලංකාවේ සරල සංගීතය තුළ ද විවිධ ආකෘතිවලින් යුත් සරල ගීත දක්නට ලැබේ. ඒ අනුව සමහර ගීතවල ආකෘති අනුව Intro, Inter එක සමාන ය. සමහර ගීතවල Intro එක් ස්වර ඛණ්ඩයකි. 1st Inter වෙනත් ස්වර ඛණ්ඩයකි. 2nd Inter තවත් ස්වර ඛණ්ඩයකි. සමහර ගීතවල Intro වෙනුවට Adlib කොටසක් යොදා ගනු ලබයි. මේ ආකාරයෙන් සංකීර්ණතාවක් පෙන්වනු ලබන වර්තමාන සරල ගී ආකෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීම ඉතා ප්‍රයෝජනවත් ය. කෙසේ වෙතත් ශ්‍රී ලංකාවේ ප්‍රචලිත සරල ගීත ආකෘතිය පහත දක්වේ.

Intro → Chorus → 1st Inter → 1st Verse → Chorus → 2nd Inter →

2nd Verse → Last Chorus

මෙම පාඩමට ඊළඟ පාඩම් දෙක ම සම්බන්ධ වන බැවින් සංගීතාංග නිර්මාණය කිරීම අවසානයේ දී කිරීම වඩාත් ප්‍රයෝජනවත් සහ උචිත වනු ඇත. එබැවින් මෙහි ලබා දී ඇති කාලච්ඡේද සංඛ්‍යාවන් ඔබට අවශ්‍ය අයුරින් වෙන්කොට ගෙන පාඩම සංවිධානය කර ගන්න.

**පාඩම සංවර්ධනය :-**

- ඔබ විසින් සපයාගත් ස්වර ප්‍රස්තාරයක් හෝ කිහිපයක් සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. එහි ඇති Intro සහ Inter යන කොටස් හඳුනා ගැනීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම ප්‍රස්තාරය හෝ ප්‍රස්තාර කිහිපය ගයා/වයා බැලීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න. ඔබත් ඒ හා එකතු වන්න.

(කාලච්ඡේද 01)

- ගීතයක ඉහත කොටස්වල වැදගත්කම පිළිබඳ ව හා එහි ඇති අවශ්‍යතාව පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඉහත කොටස් නිර්මාණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳ ව සිසුන් විමසන්න. එහි දී ගුරුවරයා වශයෙන් ඔබගේ අදහස් ද සිසුන් හා පවසන්න.

(කාලච්ඡේද 01)

- වර්තමානයේ සහ අතීතයේ ප්‍රචලිත ගීත කිහිපයක් උදාහරණයට ගෙන ඉහත කොටස් පිළිබඳ ව සිසු අදහස් විමසන්න. ඔවුන්ට එම කොටස්වල සුවිශේෂීතා පිළිබඳ ව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙම කොටස් නිර්මාණය කිරීමට හා ඉදිරිපත් කිරීමට මේ හා සම්බන්ධ ඉදිරි පාඩම් අවසානයේ දී කාලය වෙන් කර ගන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ගීතයක Inter සහ Intro යන කොටස් පිළිබඳ සිසු අදහස් විමසා ඒ පිළිබඳ ව අගයන්න.
- සරල ගීත 20ක Intro, Inter යෙදෙන ආකාරය පිළිබඳ ව විමසා කුඩා පර්යේෂණයක් කිරීමට සිසුන් පොළඹවන්න.

**ක්‍රියාකාරකම 39**

## Bits, Counter Points, Chord, Adlib යන සංකල්ප පිළිබඳ අවබෝධය

**නිපුණතාවය 8.0** :- සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 8.1** :- සරල ගීයක අන්තර්ගතය විමසමින් විවිධ සුවිශේෂී කොටස් සහිතව ගීත නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** :- Bits, Counter Points, Chord, Adlib යන සංකල්ප පිළිබඳ අවබෝධයක් ලබයි.

**කාලච්ඡේද** :- 4

**ඉගෙනුම් ඵල** :-

- ගීතයක විශේෂ සංගීතාංගයන් වන Bits, Counter Points, Chord, Adlib යන සංකල්ප පිළිබඳ අවබෝධය.
- ඉහත කොටස්වල විශේෂතා සහ යෙදෙන අයුරු පිළිබඳ ව සොයා බලයි.
- Bits, Counter Points, Chord, Adlib කොටස් නිර්මාණය කරයි.
- නිර්මාණය කර ගනු ලබන කොටස් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- හාර්මෝනියම්, තබ්ලාව, විදුලි ඕගනය, ගිටාරය ඇතුළු සංගීත භාණ්ඩ කිහිපයක්, ගීතයක් සම්පූර්ණයෙන් ම සංගීතාංග ඇතුළත් ව ලියා ඇති ස්වර ප්‍රස්තාරයක් හෝ කිහිපයක්. (දෘශ්‍යාධාරක වශයෙන්)

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

සරල ගීතයක ආකෘතිය දෙස බැලීමේ දී ඉහත කොටස්වලින් සරල ගීයක් පරිපූර්ණ වන බව පෙනී යයි. විශේෂයෙන් ම සාමාන්‍ය ස්වර ප්‍රස්තාරයක ඉහත කොටස් සඳහන් නොවුණත් සම්පූර්ණයෙන් ම ලියන ලද ස්වර ප්‍රස්තාරයක ඉහත සියලු කොටස් සටහන් විය යුතු ය. පාඩම අවසානයේ ඇමුණුම් ලෙස යොදා ඇති ස්වර ප්‍රස්තාරය පරීක්ෂා කර බලන්න.

ශ්‍රී ලංකාවේ සරල සංගීතයේ දී සරල ගීය සඳහා විශේෂයෙන් ම Counter Points යන කොටස් එකතු වීමේ ඇරඹුම දක්නට ලැබෙන්නේ සහ ඒ පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු වී ඇති බව පෙනෙන්නේ සංගීතවේදී වික්ටර් රත්නායකයන් විසින් බව පැහැදිලි ව පෙනී යන කරුණකි. ඔහුගේ ගීත කිහිපයක් ශ්‍රවණය කොට මෙම Counter Points යෙදී ආකාරය පිළිබඳ විමසන්න. එමෙන්ම ඉහත සියලු සංගීතාංග පිළිබඳ ගුරුවරයා විසින් සුවිශේෂ අධ්‍යයනයක් කොට මෙම පාඩමට පිවිසීම අත්‍යවශ්‍ය වේ.

**පාඩම සංවර්ධනය :-**

- ඇමුණුම 01 ස්වර ප්‍රස්තාරය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න. එහි ඇති Bits, Counter Points, Chord, Adlib යන කොටස් හඳුනා ගැනීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම ප්‍රස්තාරය හෝ ප්‍රස්තාර කිහිපය ගයා/වයා බැලීමට සිසුනට අවස්ථාව ලබා දෙන්න. ඔබත් ඒ හා එකතු වන්න.

(කාලච්ඡේද 01)

- ගීතයක ඉහත කොටස්වල වැදගත්කම පිළිබඳ ව හා එහි ඇති අවශ්‍යතාව පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඉහත කොටස් නිර්මාණය කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු

පිළිබඳ ව සිසුන් විමසන්න. එහි දී ගුරුවරයා වශයෙන් ඔබගේ අදහස් ද සිසුන් හා පවසන්න.

(කාලච්ඡේද 01)

- වර්තමානයේ සහ අතීතයේ ප්‍රචලිත ගීත කිහිපයක් උදාහරණයට ගෙන ඉහත කොටස් පිළිබඳ ව සිසු අදහස් විමසන්න. ඔවුන්ට එම කොටස්වල සුවිශේෂීතා පිළිබඳ ව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙම කොටස් නිර්මාණය කිරීමට හා ඉදිරිපත් කිරීමට මේ හා සම්බන්ධ ඉදිරි පාඩම් අවසානයේ දී කාලය වෙන් කර ගන්න.

(කාලච්ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ගීතයක Bits, Counter Points, Chord, Adlib යන කොටස් පිළිබඳ සිසු අදහස් විමසා ඒ පිළිබඳ ව අගයන්න.
- සරල ගීත 20ක Bits, Counter Points, Chord, Adlib යන කොටස් යෙදෙන ආකාරය පිළිබඳ ව විමසා කුඩා පර්යේෂණයක් කිරීමට සිසුන් පොළඹවන්න.

**ක්‍රියාකාරකම 40**

# Interlude, Introduction, Bits, Counter Points, Chord, Adlib යන කොටස් ඇතුළත් වන ලෙස ගීතයක් නිර්මාණය කිරීම

**නිපුණතාවය 8.0** :- සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 8.1** :- සරල ගීයක අන්තර්ගතය විමසමින් විවිධ සුවිශේෂී කොටස් සහිතව ගීත නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** :- Interlude, Introduction, Bits, Counter Points, Chord, Adlib යන කොටස් ඇතුළත් වන ලෙස ගීතයක් නිර්මාණය කිරීම

**කාලච්ඡේද** :- 4

**ඉගෙනුම් ඵල** :-
- ගීතයක විශේෂ සංගීතාංගයන් නිර්මාණය කරයි.
- නිර්මාණය කර ගත් එම කොටස් ස්වර ප්‍රස්තාරයක් ඇසුරින් ඉදිරිපත් කරයි.
- නිර්මාණය කර ගත් එම ස්වර ප්‍රස්තාරය සාමූහිකව ගයා/වයා ප්‍රදර්ශනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- හාර්මෝනියම්, තබ්ලාව, විදුලි ඕගනය, ගිටාරය ඇතුළු සංගීත භාණ්ඩ කිහිපයක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

පසුගිය පාඩම් කිහිපයෙන් අධ්‍යයනය කරන ලද ඉහත කොටස් නිර්මාණය කිරීම මෙම පාඩමෙන් අපේක්ෂා කෙරේ. මේ සඳහා ඔබ විසින් ඉතා සරල සහ පැහැදිලි ක්‍රමවේදයක් සිසුන්ට ඉදිරිපත් කළ යුතු ය. මුලින් ම තනුවක් නිර්මාණය කොට එම තනුවට උචිත වන පරිදි Chord යොදා ඒ අනුව Bits, Counter Point යොදා ගීතයේ මුල හෝ මැද හෝ අග Adlib කොටසක් ද ඇතුළත් වන පරිදි ගීතයක් සිසුන් සමඟ එක් වී නිර්මාණය කොට එය ගායනය/වාදනය කොට රස විඳින්න.

**පාඩම සංවර්ධනය :-**

- සාමාන්‍ය සරල ගීත කෘතියක ඇතුළත් වන පරිදි ගීතයක් නිර්මාණය කරන්න. (මෙහි දී C major ස්කේලයේ යන 3/4 රිද්මයට ගයන ගීතයක් නිර්මාණය කර ගැනීම වඩාත් උචිත ය.

(කාලච්ඡේද 01)

- Chord සංකල්පය පැහැදිලි කර දී ඉහත නිර්මාණය කර ගත් ගීතයට Chord යොදන්න.
- එම තනුවට උචිත Bits යොදන්න.

(කාලච්ඡේද 01)

- අවසානයේ යෙදූ Chord අනුව Counter point කිහිපයක් නිර්මාණය කරන්න.

(කාලච්ඡේද 01)

- නිර්මාණය කොට ගත් ගීත ස්වර ප්‍රස්තාරය සිසුන් සමඟ එක්ව වාදනය කර රස විඳින්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- ගීතයක සුවිශේෂී කොටස් පිළිබඳ ව හැඳින්වීමක් කිරීමට අවස්ථාවක් ලබා දී අගයන්න.
- නිර්මාණය කරන ලද කොටස් අගයන්න.

**ක්‍රියාකාරකම 41**

## ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය

**නිපුණතාවය 7.0** :- ව්‍යවහාරික සංගීතය සහ රංග කලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

**නිපුණතා මට්ටම 7.1** :- ව්‍යවහාරික සංගීතයේ නිර්මාණ පිළිබඳ ව තර්කානුකූලව අදහස් දක්වමින් තොරතුරු ගවේෂණය කරයි.

**ක්‍රියාකාරකම 7.1** :- ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය තුළින් මතුවන සිංහල සංගීතයෙහි බටහිර අඩයාලම

**කාලච්ඡේද** :- 04

**ඉගෙනුම් පල** :-

- කණ්ඩායම් ගීත පිළිබඳව තර්කානුකූලව අදහස් දක්වයි.
- කණ්ඩායම් ගීතවල නිර්මාණාත්මක අගය පිළිගනියි.
- කණ්ඩායම් ගීත ශ්‍රී ලංකාවේ සංගීතය කෙරෙහි ඇති කරන ලද බලපෑම පිළිබඳ ව තර්ක කරයි.
- කණ්ඩායම් ගීතයක් ගායනය කරයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ස්වර පුවරු භාණ්ඩයක්, වයලිනයක්, ගිටාරයක්, ටැම්බරිනයක් වැනි භාණ්ඩ
- කණ්ඩායම් ගීත ලියූ දෘශ්‍ය උපකරණයක්.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්:-**

මේ සම්බන්ධව මහාචාර්ය සුනිල් ආරියරත්න සූරීන් විසින් රචිත ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය නම් ග්‍රන්ථයේ එන තොරතුරු පාදක කර ගත හැකි ය. ඇමුණුමේ දැක්වෙන සංක්ෂිප්ත තොරතුරු පාඩම සංවර්ධනය සඳහා යොදා ගත හැකි ය.

**පාඩම සංවර්ධනය :-**

- ඇමුණුමේ දැක්වෙන තොරතුරුවල සඳහන් කණ්ඩායම් ගීත සියල්ල ම හෝ ඒ අතරින් ඔබට ගායනය කළ හැකි ගීත වැඩි ප්‍රමාණයක මුල් කොටස් වැඩි ප්‍රමාණයක් ගයා වයා පෙන්වන්න. ඒ මගින් කණ්ඩායම් ගීතවල නාද රටා තුළ ඇති විශේෂත්වය හඳුනාගැනීමට උපකාරී වන සේ සාකච්ඡා කරන්න. (කාලච්ඡේද 01)
- ඇමුණුමේ දැක්වෙන විෂය කරුණු කියවීමේ පත්‍රිකාවක් ලෙස සකසා සිසුන්ට බෙදා දෙන්න. කියවීමට යොමු කරන්න. අත්‍යවශ්‍ය විෂය කොටස් මතුවන සේ ප්‍රශ්න නගන්න. බටහිර සංගීතයේ ආභාසය ලබා ඇති අවස්ථා සාකච්ඡා කරන්න. (කාලච්ඡේද 01)
- ඇමුණුමේ දැක්වෙන නිර්දේශිත කණ්ඩායම් ගීත දෙකෙන් එකක් තෝරාගෙන ගායනය හුරු කරවන්න. (කාලච්ඡේද 01)
- ගායනට හුරු වූ ගීතයේ ඇති විවිධ හාර්මනී කොටස් ආදිය සහ ගිටාර් ආදී වාදනය ද සමග ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමට හුරු කරන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් කාලඡේදයට හිමි විෂය කොටස් අවසානයේ මිනිත්තු 05 බැගින් යොදා ගෙන වාචික හෝ කෙටි ලිඛිත ප්‍රශ්න මගින් අගයන්න.

පැවරුම • ''මෙරට ව්‍යවහාරික සංගීතය බටහිර සංගීතයෙන් පෝෂණය වූ අවස්ථා ඇත.'' ශ්‍රී ලංකාවේ කණ්ඩායම් ගීත ඇසුරින් මෙම කියමන පැහැදිලි කරන්න.

අතිරේක උදවු • ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය - මහාචාර්ය සුනිල් ආරියරත්න.

ඇමුණුම:-

මේ සම්බන්ධ ව මහාචාර්ය සුනිල් ආරියරත්න සූරීන් විසින් රචිත ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය නම් ග්‍රන්ථයේ එන තොරතුරු පාදක කර ගත හැකිය. පහත දක්වෙන සංක්ෂිප්ත තොරතුරු පාඩම සංවර්ධනය සඳහා යොදා ගත හැකි ය.

කණ්ඩායම් සංගීතය සහිත සිංහල ගීයක් ගැයූ ප්‍රථම කණ්ඩායම නම් හලාවත නෙවිල් ප්‍රනාන්දු නම් ගිටාර් වාදකයාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ගත් ''ලොස් කැබෙලරෝස්''(LOS CABELLEROS ) නම් සංගීත කණ්ඩායමයි. මෙම කණ්ඩායමේ ගීත තුළ ස්පාඤ්ඤ සංගීතයේ ආභාසය දක්නට ලැබේ. රුක්මණී දේවිය ද මෙම කණ්ඩායමේ ගායිකාවක් ලෙසට සම්බන්ධ වී ඇත. (සඳක් නැගී සඳක් ගිලේ සාගරේ, මැණිකේ ඔබේ සිනාවේ) ගිටාර්, වයලින් රීඩ් බටනලා, කැස්ටනට්ස්, ගයිරෝ මර්කාස්, කොංගෝ ඩ්‍රම්ස්, බොංගෝ ඩ්‍රම්ස්, මාරිම්බා, ස්ටීල් ඩ්‍රම්, ආදි සංගීත භාණ්ඩ ස්පාඤ්ඤ සංගීතයේ භාවිත වූ නිසා මෙම කණ්ඩායම ද ඔවුන් සතු වයලින්, ගිටාර්, ගයිරෝ, කොංගෝ වැනි සංගීත භාණ්ඩ යොදා ගෙන ඇත. මෙම කණ්ඩායම චිත්‍රපට සඳහා ද සංගීත නිර්මාණය කර ඇත. කණ්ඩායම් කිහිපයක් විසින් 60-70 දශකවල සිංහල සංගීත ක්ෂේත්‍රයට එක් කරන ලද අදත් වඩාත් ජනප්‍රිය වී ඇති ගීත කිහිපයක් පහත දක්වේ.

- ලොස් කැබලෙරෝස් :- මල්බර හිමිදිරියේ, සඳක් නැගී සඳක් ගිලේ සාගරේ, මැණිකේ ඔබේ සිනාවේ,
- ලා සිලොනියන්ස් :- හොයියා හෝයියා, තරුණ ජීවිතේ

(මෙම කණ්ඩායම නොයෙල් බ්‍රයන් රණසිංහගේ ප්‍රධානත්වයෙන් සය දෙනෙකුගේ යුත් කණ්ඩායමකි. බතික් සරොම් ඇඳ, තද පැහැති අත්කොට කමිසයක් සමඟ, දෙපා සපත්තු සෙරෙප්පුවලින් තොර ව, හිසට පන්කොළ තොප්පියක් පැලඳීම සිදුකර ඇත. පසුකාලයේ මිල්ටන් මල්ලවආරච්චි සූරීහු ද මෙම කණ්ඩායම සමඟ එක්වී ඇත. 70 දශකයේ ආරම්භයේ දී මෙම කණ්ඩායම කැලිප්සෝ කණ්ඩායම යන සුවිශේෂ නාමයෙන් ද හඳුන්වා ඇත. මොරිස් දහනායක විසින් ගයන ලද ''සුදෝ පොඩ්ඩක් අඬන්න'' නැමති ගීතය කැලිප්සෝ ගී තනුවකි. ප්‍රචලිත කණ්ඩායම් කිහිපයක් හා ඔවුන් අතරින් නිර්මිත ගීත කිහිපයක් පහත දක්වේ.

- ලා බම්බාස් :- කළේ උකුළෙ තියාලා, එන්න යන්න නෙළුම් විලේ නෙළුම් කඩන්න.
- මී මැස්සෝ :- මුළු ගතම වෙහෙසුනා,
- ධර්මරත්න බ්‍රදර්ස් :- හෝ වැස්ස වහිනවා, වාසිටි කොල්ලෝ
- මූන්ස්ටෝන් :- මංගෝ කළු නැන්දේ, රුවන්පුරේ අපේ ගම තමයි, කළුමාමේ අපෙ කළු මාමේ, දිල්හානී දුවනී, වන දෙව් ලිය තුරුලේ, කාගෙද ගොන්වස්සා,
  (මෙම කණ්ඩායම රත්නපුරය කේන්ද්‍ර කර ගෙන බිහිවී ඇත. ක්ලැරන්ස් විජේවර්ධන සහ ඇනස්ලි මාලේවන යන ප්‍රසිද්ධ ගායකයින් මෙම කණ්ඩායමේ සාමාජිකයන් වූහ.
- සමනලයෝ :- නැළවෙන මවු උකුළේ,
- ත්‍රී සිස්ටර්ස් :- ඔබ සොයනා කළු කෙල්ල මමයි,
- ගෝල්ඩන් චයිම්ස් :- මා ආදරෙයි නංගියෙ, සුරඟන වෙස් වලා, අද වෙයි හිරු දින,
- සුපර් ගොල්ඩන් චයිම්ස්, :- කඳ සුරිඳුනි, මලට බඹරෙකු සේ, සිහින ලොවක් දුටුවා, ගමෙන් ලියුමක් ඇවිල්ලා, මුව හසරැලි සාගරේ, හා හා හොරේ දුනුණා,
- ජෙට් ලයිනර්ස් :- කැදූල්ලේ ඇති වූ කිරිල්ලී වගේ.
- ජිප්සීස් :- තොරන් බඳින්නට, කුරුමිට්ටෝ, දූන දූන වැරදි කරනවා,

කෝඩ්ස් මත පිහිටා තනු නිර්මාණය කිරීමේ සම්ප්‍රදායත්, සුසංවාද (Harmony) සහිත ගායනය වාදනය ඉදිරිපත් කිරීමත් කණ්ඩායම් ගීතවලින් සිදුවිය.

කණ්ඩායම් ගීත අභාවයට යෑමට හේතු කිහිපයක් මුල් විය. 1973 දී ගුවන්විදුලියේ අධ්‍යක්ෂ ජනරාල් ධූරය ලත් රිජ්වේ තිලකරත්න මහතා ඉන්දියානු සංගීතය ප්‍රිය කළ කෙනෙක් නිසා ගුවන්විදුලියේ කණ්ඩායම් ගීතයට හිමි ව තිබුණු තැන ස්ථානය අහිමිවිය. එවකට ජනප්‍රිය EP තැටි වෙනුවට කැසට් පටි පැමිණීමත් තවත් හේතුවක් විය. සමාජය පිළිගත් සංගීත නිර්මාණකරුවන් බොහොමයක් කණ්ඩායම් ගීත පහත් ලෙස සලකා විවේචනය කිරීමත් මෙම ගීත අභාවයට යෑමට හේතුවක් විය. දක්ෂතා ඇති කණ්ඩායම් ගීත නිර්මාණකරුවන් බිහි නොවීම තවත් හේතුවක් විය.

ගායනය සඳහා කණ්ඩායම් ගීතයක්.
තනු නිර්මාණය හා ගායනය :- ලා සිලොනියන්ස්

හොයියා හෝයියා හොයියා හෝයියා
හොයියා හෝයියා හොයියා හෝයියා

චන්ද්‍රයා අඳුරු අහසෙ එයි නැගී
සිසිල් සුළඟ අවට හමයි වේගෙනී.
නංවා රුවල අප සැමා
පදිමු පදිමු වෙරළ බල බලා

සමුදුරේ මසුන් බොහෝ ඇත ජලේ
සමගියේ බලේ - අප ජීවනේ බලේ
රාත්‍රියේ මේ ජලාසයේ
පැදපල්ලා පැදපල්ලා වෙරළ බල බලා

තනු නිර්මාණය හා ගායනය - මීමැස්සෝ

දුප්පත් වෙලා -------- මම කම්මලෙ-------වෙහෙසෙනවා-----------
මුල් ගතම වෙහෙසුනා - දහඩියෙන් නැහැවුණා
කුසගින්න නිවා ගන්න මෙමා යකඩ තලන්නා

වෙහෙසීලා - දුක් විඳලා
කම්මලේ - යකඩ තලා //

පාන්දරින් නැගිටලා - දෙවියන් වැඳ පුදලා
දරුවන් මුව සිඹ ලා - ගිනි මැලය දල්වලා
යකඩ ගිනියම් කරලා - ගොන්ට ලාඩම් හදලා
ගැලට පණ උපදවලා - දවසෙ වැඩ අරඹාලා

ද ඹු අඬුව තද කළා - යකඩෙ ඊට හයි කළා
දෑත වාරුව යොදලා - පීර කිරි කීරි ගාලා
පිහිය හැඩ වැඩ දාලා - මුවට පන්නර තියලා
හැඳුවෙ කම්මලෙ තියලා- මාගෙ වරුණ පෙන්නලා

කඩ ඇණය ඇදවෙලා - යකඩ පට්ටම් ගෙව්ලා
බරබාගෙ පෙරළිලා - මා ළඟට පැමිණිලා
මම වරුණෙ පෙන්නලා - කඩි මුඩියෙ වැඩ කළා
බර බාගෙ නැගිටිලා - යළි යෑම අරඹලා

ක්‍රියාකාරකම 42

## සංගීත වාද්‍ය ඛණ්ඩයක් සාමූහිකව නිර්මාණය

**නිපුණතාවය 8.0** :- සංගීත නිර්මාණකරණයේ අත්හදා බැලීම් කරයි.

**නිපුණතා මට්ටම 8.1** :- සරල ගීයක අන්තර්ගතය විමසමින් විවිධ සුවිශේෂී කොටස් සහිතව ගීත නිර්මාණය කරයි.

**ක්‍රියාකාරකම** :- සංගීත වාද්‍ය ඛණ්ඩයක් සාමූහිකව නිර්මාණය

**කාලච්ඡේද** :- 06

**ඉගෙනුම් ඵල** :-

- ගායනයක සහ වාදනයක ඇති වෙනස පිළිබඳ අදහස් දක්වයි.
- වාද්‍ය ඛණ්ඩයක කේවල බව සහ සාමූහික බව පිළිබඳ වෙනස් දක්වයි.
- සමූහ වාදනයක් මිහිරි වීමට බලපාන හේතු පැහැදිලි කරයි.
- සංගීත වාද්‍ය ඛණ්ඩයක් සාමූහිකව නිර්මාණය කරයි.
- නිර්මාණය කළ වාද්‍ය කණ්ඩයේ අගය විමසයි.

**ගුණාත්මක යෙදවුම් :-**

- ස්වරපුවරු භාණ්ඩ, ගිටාරය, වයලීනය, බටනලාව වැනි සංගීත භාණ්ඩ කිහිපයක්.

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

සිසුන් මේ වන විට නිර්මාණ සංගීතයේ භාවිත වන සංකල්ප රාශියක් අධ්‍යයනය කර ඇත. ඒවා ප්‍රායෝගිකව නිර්මාණකරනයේ දී යොදා ගැනීමට අත්දැකීම් ලැබෙන ලෙස මෙම පාඩම් සැළසුම් කර ගත යුතුව ඇත.

Interlude, Introduction, Bits, Counter Points, Chord, Adlib කොටස් පිළිබඳ මේ වන විට සිසුන් අධ්‍යයනය කර ඇත. ඒ මගින් ලැබූ ඉගෙනුම මෙම පාඩමේ දී ද ඵලදායි වනු ඇත. ප්‍රමාණවත් පරිදි සිසුන් වැඩි සංඛ්‍යාවක් පන්තියේ සිටී නම් මෙම ක්‍රියාකාරකම කන්ඩායම් ක්‍රියාකාරකමක් ලෙස ඉටු කර ගත හැකිය. සංඛ්‍යාව අඩු නම් සුදුසු පරිදි වෙනස් කර ගත හැකිය.

**පාඩම සංවර්ධනය :-**

- ඇමුණුමේ දැක්වෙන තොරතුරුවල සඳහන් කරුණු කියවා අවබෝධ කර ගැනීමට සිසුන්ට මග පෙන්වන්න. (කාලච්ඡේද 01)
- ඇමුණුමේ දැක්වෙන අයුරින් සාමුහිකව නිර්මාණය කරන්න අවස්ථාව සළසන්න. (කාලච්ඡේද 05)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- නිර්මාණය කළ සමූහ වාදනයේ ගුනාත්මක බව අනුව සුදුසු ඇගයීමක් කරන්න.
- ඉටුකළ නිර්මාණයේ ගුනාත්මක බ ව වැඩි කර ගැනීමට තවදුරටත් අවධානය යොමු කළ යුතු කොටස් පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- අවශ්‍යතාවය අනුව ඔබගේ නිර්මාණාත්මක හැකියාවද මතු කර දක්වන්න.

**ඇමුණුම.**

නිර්මාණය යන්න ඉගැන්විය හැකි දෙයක් නොවේ. නිර්මාණ කුසලතාවය තමා විසින් ම තමා තුළ ගොඩ නගා ගත යුතු කුසලතාවයකි. ඒ සඳහා අත්දැකීම්, මග පෙන්වීම් , පරිචය හා පරිකල්පන ශක්තිය අත්‍යාවශ්‍ය වේ. සංගීතමය නිර්මාණයක් හැමවිට ම ශ්‍රාවකයින් ගේ රසවින්දනය ට හා අමන්දානන්දය ට හේතු විය යුතුය. එහි ඇති නාද, ස්වර සංයෝජනය, රිද්මය, ලය, ශ්‍රැතිස්වරය, ස්කේලය ආදී සිද්ධාන්තමය කරුණු රස භාව ඇති කිරීමටත් , නාද රූපයේ රමණීයත්වය ඇති කරලීමටත් හේතු වනු ඇත. විශේෂයෙන් තනුවක් නිර්මාණයේ දී ප්‍රස්ථුතය හෝ තේමාව පිළිබඳ අවධානය යොමු කළ යුතුවේ. ඊට ගැලපෙන ලෙස මතු කියවූ සිද්ධාන්තමය කොටස් තෝරා ගත යුතුවේ. ඒ සඳහා නිර්මාණකරුවාගේ සතත අභ්‍යාසයත්, ප්‍රතිභාවත් අවශ්‍යමය කරුණු වේ.

මේ නිසා අභ්‍යාසයේ යෙදීමට නිර්මාණාත්මක සරල ක්‍රියාකාරකම් වල යෙදීම අවශ්‍යය. තනිවම හෝ සාමූහිකව පහත දැක්වෙන මග පෙන්වීම් ඔස්සේ සරල ක්‍රියාකාරකමක යෙදී ස්වර සුසංයෝගය, රිද්මය, ස්කේලය, ශ්‍රැතිය ආදී කරුණු මත ගොඩ නැගෙන තනුවේ මිහිරියාවය පිළිබඳ අත්දැකීමක් ලැබිය හැකිය. මෙම නිදහස් සරල ක්‍රියාකාරකම සඳහා පහත දැක්වෙන සිද්ධාන්තමය කොටස් පිළිබඳ අවධානය යොමු කරමු.

| | | | |
|---|---|---|---|
| ශ්‍රැතිය | - | මධ්‍ය '' ස '' | - ( C ) |
| ස්කේලය | - | ශුද්ධ ස්වර | - ( C major ) |
| රිද්මය | - | මාත්‍රා 3 තාලය | - ( 3,4 Rhythm ) |
| ලය | - | මධ්‍යලය | - ( Mid Tempo ) |

මෙම ක්‍රියාකාරකම පහසුවෙන් ඉටු කරගෙන අත්දැකීමක් ලබා ගැනීමට ශ්‍රැතියට හා ස්කේලයට අදාල මූලික කෝඩ්ස් තුන තෝරාගත් රිද්මයට අනුව පෙළ ගසමු.

C - - C - - F - - G - -
G - - F - - C - - C - -

දැන් ඉහත කෝඩ්ස් පෙළ දෙක අදාල රිද්මයට අනුව ගිටාරයකින් හෝ ස්වර පුවරුවකින් තාලානුකූලව වයන්න. මීලඟට එම කොඩ්ස් වලට අදාලවන ස්වර තෝරා රිද්මයට ගැලපෙන ලෙස ස්වර පාද දෙකක් ගොඩ නගමු.

ස ග ස ග ප - ධ - ම ප - -
ප - - ම - - ග ප ග ස - -

මෙම ස්වර පාද දෙක බටනලාවට වෙන් කරමු. එම කොටසම සිවුවරක් වාදනය කරමු. ඒ මත අදාල පරිදි කෝඩ්ස් වාදනය කළ යුතුවේ. මීලඟට එම ස්වර පාද දෙකට ගැලපෙන ලෙස වෙනත් ස්වර පාද දෙකක් නිර්මාණය කරමු.

ග - - ප - - ධ - - නි - -
රි නි රි ස ධ ම ප - - ග - -

මෙම ස්වර පාද දෙක වයලීනය ට වෙන් කරමු. එම කොටසම දෙවරක් වාදනය කරමු. වාදනය ආරම්භ කරනුයේ බටනලාවට හිමි ස්වර පාද දෙක එක් වරක් වාදනයකළ පසුවයි. මීලඟට එම ස්වර පාද වලට ගැලපෙන ලෙස බේස් හඬ තලයේ ස්වර පාද දෙකක් නිර්මාණය කරමු.

ප - - ස - - ධ - - ප - -
නි - - ස - - ප - - ප - -

මෙම ස්වර පාද දෙක බේස් හඬ නිකුත් කරන චෙලෝවක ට වඩාත් ගැලපේ . චෙලෝවක් පාසලේ නැත්නම් සර්පිනාවක මන්ද්‍ර ස්වර මගින් හෝ එකෝඩියන් එකක මන්ද්‍ර ස්වර මගින් හෝ වාදනය කරමු. වාදනය ආරම්භ කරනුයේ බටනලාවට හිමි ස්වර පාද දෙක දෙවරක් වාදනයකළ පසුවයි. මීලඟට එම ස්වර පාද වලට ගැලපෙන ලෙස Harmony ස්වර පාද දෙකක් නිර්මාණය කරමු.

ග ප ග ප නි - ස - ධ නි - -
නි - - ධ - - ප නි ප ග - -

මෙම ස්වර පාද දෙක වයලීනය ට වෙන් කරමු. වාදනය ආරම්භ කරනුයේ බටනලාවට හිමි ස්වර පාද දෙක තුන් වරක් වාදනයකළ පසුවයි. ස්වර පාද දෙකක් වූවාට එය ක්‍රමක්‍රමයෙන් නාද රටා වර්ධනය වන අයුරු මෙමගින් ඔබට හඳුනාගත හැකිවේ. සමූහ වාදනයක ස්වභාවය මෙසේ වේ.

කිසියම් තේමාවක් මතුවන ලෙස ස්වර ඛණ්ඩ කිහිපයක නිර්මාණ අත්දැකීම් ලැබීමට පහත දැක්වෙන ප්‍රස්තාරය වයලීනයකින් වයන්න. එම ප්‍රධාන තනුව ආරක්ෂා වන පරිදි ඒ මත වැයිය හැකි තවත් ස්වර පාද නිර්මාණය කරන්න. එම ස්වර පාද සියල්ලටම ගැලපෙන ලෙස කෝඩ්ස් ඇතුළත් කරන්න. කෝඩ්ස් මත නිර්මාණ කිරීම එතරම් ගැලපෙන කාර්යයක් නොවේ. මුල් ක්‍රියාකාරකම එසේ කළේ සරල අත් දැකීමක් ලබා ගැනීමට පමණි. තනුව හා ස්වර සුසංයෝජන සියල්ල නිර්මාණය කර අවසානයේ ඒ මත කෝඩ්ස් යෙදීම සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින්නකි. පහත ක්‍රියාකාරකම සඳහා මාත්‍රා 4 බැගින් වන තාලය තෝරා ගනිමු. තාල වාද්‍ය භාණ්ඩයකින් ඊට ගැලපෙන රිද්ම රටාවක් වාදනය කරන්න. ඒ මත පහත ස්වර පාද වයලීනයකින් වාදනය කරන්න. ඊට පසු එක් එක් ස්වර පාදයට ගැලපෙන තවත් ස්වර පාද පළමු ක්‍රියාකාරකමේ පරදි නිර්මාණය කර අත්දැකීම් ලබන්න. අවසානයේ සුදුසු කෝඩස් යොදා රසවත් කරගන්න. වාදනය අවසානයේ ඉන් මතුවන තේමාව හෝ මාතෘකාව සොයා බලන්න.

| | | | |
|---|---|---|---|
| ප + + + | + + + + | ප + + + | + + + + |
| ප + + + | ප + + + | ප + ප + | ප + ප + |
| ප+ ප+ ප+ ප+ | පප පප පප පප | පධ නිස රිග මප | ධනි ස්රි ග්ම් ප්- |
| පස-ප ස - | - - - - | පස-ප ස - | - - - - |
| ස ග රි ග | ස ග රි ග | ස ග රි ග | ස ග රි - |
| රි ම ග ම | රි ම ග ම | රි ම ග ම | ප ම ග - |
| ප - - ධ | ම - - - | ම - - ප | ග - - - |
| ග - - ම | රි - - - | රි - - ග | ස - - - |
| පස්-ප ස් - | - - - - | පස්-ප ස් - | - - - - |

ඔබ ට සිතෙන පිරිදි මෙම නිර්මාණය මගින් මතුවන මාතෘකාව කුමක් ද? ඒ අනුව මාතෘකාවට ගැලපෙන පරිදි ඉතිරි පාද නිර්මාණය කරන්න. නිර්මාණය කළ මුල් ස්වර පාද ප්‍රධාන තනුව ( Melody) යැ යි සළකා ඒ එක් එක් ස්වර පාදයට සුසංයෝග වන පරිදි ස්වර පාද මත වාදනය කළ හැකි harmony, Bass parts හෝ Counters නිර්මාණය කරන්න. එකවර වාදනය වන ස්වර පාද දෙක හෝ කිහිපය පිළිබඳ සිතා බලා එක් එක් විභාගයට ගැලපෙන කෝඩ්ස් ( Chords ) ලියා කිහිප දෙනෙක් එක්ව වාදනය කර බලන්න. සමූහ වාදනය නිර්මාණයක අත්දැකීම් ලබන්න. මෙවැනි නිර්මාණ නැවත නැවත කිරීමෙන් නිර්මාණ කරුවා තුළ සතත අභ්‍යාසය පිහිටයි. මේ නිසා පසුව කරන නිර්මාණ වල ගුණාත්මක බව වැඩි වේ. මෙහි දැක්වෙන්නේ එකම ස්වර කිහිපය නැවත නැවත යෙදෙන සරල නිර්මාණයකි. ඔබගේ දක්ෂතාවය මත විවිධත්වයෙන් යුත් ස්වර රටා නිර්මාණය කර ගත හැකිය. ඉදිරි පාඩමේ දැක්වෙන්නේ අපරදිග ස්වර ප්‍රස්තාර වල දක්නට ලැබෙන ප්‍රකාශන සංකේතයන්ය. එම පාඩම අධ්‍යයනය කිරීමෙන් පසු එම සංකේත සුදුසු පරිදි මෙම ප්‍රස්තාරය මත යොදා ඒ අනුව සාමූහිකව වාදනය කර බලන්න. වයලීන වාදන කොටස් වල ට Pizzicato, Stecato , Slur ආදී බෝ උපක්‍රම ගැලපෙන පරිදි යොදන්න. අඩු හඬකින් වාදනය කළ යුතු කොටස් හෝ වැඩි හඬකින් වාදනය කළයුතු කොටස්, හෝ ක්‍රමක්‍රමයෙන් හඬ වැඩි වන කොටස් සඳහා ඉදිරි පාඩමේ දැක්වෙන සංකේත යොදා ඒ අනුව වාදනය කර බලන්න. දැන් මුලදී ට වඩා වෙනස් මිහිරියාවක් වාදනය තුළින් ඔබට දැනෙනු ඇත.

ක්‍රියාකාරකම 43

# අපරදිග සංගීත ප්‍රස්තාරවල ප්‍රකාශන සංකේත

**නිපුණතාව 9.0** : සංකේතානුසාරයේ සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 9.1** : විවිධ සංකේත ඇසුරු කරමින් සංගීත ප්‍රස්තාර කරයි.
**ක්‍රියාකාරකම** : ප්‍රකාශන සංකේත හඳුනාගැනීම.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 02

**ඉගෙනුම් පල** :
- f.ff.p.pp.slur, staccato, legato, pizzicato යන සංකේත හා සංකල්ප විස්තර කරයි.
- එම සංකේතවලින් මතු වන අදහස පැහැදිලි කරයි.
- එම සංකේත ප්‍රස්තාරයක් මත ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- වාද්‍ය භාණ්ඩවල රූප සටහන්

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- අපරදිග සංගීත ප්‍රස්තාර ක්‍රම ශිල්පය ලෝකයේ දියුණුම ප්‍රස්තාර ක්‍රමය වේ. ලෝකය විශ්ව ගම්මානයක් ලෙස පරිවර්තනය වීමේ දී විවිධ රටවල දැනුම් සම්භාරයන් එකිනෙකා අතර හුවමාරු කර ගැනීමට ඉංග්‍රීසි බස යොදා ගන්නා සේ විවිධ රටවල සංගීත නිර්මාණ හෝ සංගීත තොරතුරු හුවමාරු කර ගැනීමට බටහිර ප්‍රස්තාර යොදා ගනු ලැබේ. භාරතීය රාගධාරී සංගීතය බටහිර ලෝකය වෙත ගෙන යෑමට අන්තර්ජාලය තුළ බටහිර ප්‍රස්තාර ක්‍රමය අද භාවිත කර ඇත.
  බටහිර ප්‍රස්තාර ක්‍රමය ඉතා දියුණු ප්‍රස්තාර ක්‍රමයකි. එම ප්‍රස්තාරවල ස්වර තාල පමණක් නොවේ, වේගය නැතහොත් ලය, එක් එක් ස්වර ඛණ්ඩ වාදනය කළ යුතු ක්‍රමය, ඒවායේ හඬ නිකුත් කළ යුතු ප්‍රමාණය, වයලීනයක් දී නම් බෝව හැසිරවිය යුතු ආකාරය, ආදිය පවා ප්‍රස්තාරයේ ඇතුළත් ය. මේ නිසා ලෝකයේ කුමන රටක දී වුවත් වාදනය කෙරෙන්නේ එකම ආකාරයෙන්ය. විශේෂයෙන් බටහිර සම්භාව්‍ය සංගීතයේ පිළිගත් වාද්‍ය ඛණ්ඩවල මෙම ලක්ෂණය දක්නට ඇත. මේ සඳහා විශේෂ සංකේත භාවිත කරනු පෙනේ. එම සංකේත අතරින් කිහිපයක් මෙම පාඩමින් අධ්‍යයනය කළ හැකි වේ.

**පාඩම සංවර්ධනය**

- බටහිර සංගීත භාණ්ඩයක් හෝ වයලීනයක් බටහිර ක්‍රමයට වයා පාඩමට පිවිසෙන්න. විශේෂතාවය පැහැදිලි කරන්න. ඇමුණුමේ දක්වා ඇති ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න. එහි දැක්වෙන ප්‍රකාශන සංකේත වෙන්කර මතුකරගන්න. f.ff.p.pp යන සංකේත පිළිබඳ හඳුන්වන්න. සාකච්ඡා කරන්න.
  (කාලඡේද 01 යි.)
- වයලීන පවුලේ භාණ්ඩ වාදනයේ දී slur, staccato, legato, pizzicato යන ක්‍රම යොදා ගන්නා බව ප්‍රායෝගික ව පැහැදිලි කරන්න. තෝරා ගත් ස්වර ඛණ්ඩයක්

එක් එක් ආකාරයෙන් වාදනය කරන විට මතුවන ප්‍රකාශනය පැහැදිලි කරන්න.
ඒම සංකල්ප අනුව බෝ හැසිරවීමේ ක්‍රම ප්‍රායෝගික ව පැහැදිලි කරන්න.
(කාලඡේද 01 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් ඃ**

- එක් එක් විෂය කොටස අවසානයේ වාචික හෝ ප්‍රායෝගික කොටස් මගින් අගයන්න.

පැවරුම -

- සපයා ගත් බටහිර සංගීත ප්‍රස්තාර කොටසක ඇතුළත් ප්‍රකාශන සංකේත සොයා හඳුනා ගන්න.

අතිරේක උදව් -

- Theory & Rudiments of Music - Royal College of Music.

ඇමුණුම:-

බටහිර සංගීතයේ ස්වර ප්‍රස්තාරවල දක්නට ලැබෙන ප්‍රකාශන සංකේතවල අදහස් පහත දැක්වේ.

Pianissimo - පියානිසිමෝ - සංකේතය :- *pp* - Very soft.

මෙම සංකේතය ඇති තැන ඇති ස්වර හඬ ඉතා අඩුවෙන් වාදනය හෝ ගායනය කළ යුතු වේ.

Piano - පියානෝ - සංකේතයඃ- *p* - Soft; louder than pianissimo.

මෙම සංකේතය ඇති තැන ඇති ස්වර හඬ තරමක් අඩුවෙන් වාදනය හෝ ගායනය කළ යුතු වේ.

Forte - ෆොටේ - සංකේතයඃ- *f* - Loud. Used as often as piano to indicate contrast.

මෙම සංකේතය ඇති තැන ඇති ස්වර තරමක් හඬ වැඩියෙන් වාදනය හෝ ගායනය කළ යුතු වේ.

Fortissimo ෆොටේසිමෝ - සංකේතයඃ- *ff* - Very loud. Usually the loudest indication in a piece,

මෙම සංකේතය ඇති තැන ඇති ස්වර හඬ ඉතා වැඩියෙන් වාදනය හෝ ගායනය කළ යුතු වේ.

Crescendo A gradual increase in volume. Can be extended under many notes to indicate that the volume steadily increases during the passage.

ක්‍රෙසෙන්ඩෝ. සංකේතයඃ- (ඉදිරි රූප සටහනේ දක්වා ඇත)

මෙම සංකේතය ඇති තැන ඇති ස්වරවල හඬ අඩුවෙන් ආරම්භ කර ක්‍රමක්‍රමයෙන් ටිකෙන් ටික වැඩි වන සේ වාදනය හෝ ගායනය කළ යුතු වේ.

Diminuendo or නැතහොත් decrescendo

A gradual decrease in volume. Can be extended in the same manner as crescendo.

ඩිමිනියැන්ඩෝ නැතහොත් ඩික්‍රෙසෙන්ඩෝ (ඉදිරි රූප සටහනේ දක්වා ඇත)

මෙම සංකේතය ඇති තැන ඇති ස්වරවල හඬ ඉතා වැඩියෙන් ආරම්භ කර ක්‍රමක්‍රමයෙන් ටිකෙන් ටික අඩු වන සේ වාදනය හෝ ගායනය කළ යුතු වේ.

වයලීන පවුලට අයත් භාණ්ඩ වාදනයේ දී බෝව හසුරුවන ආකාරය දක්වෙන සංකේත කිහිපයක් ද ඇත. ඒවා හඳුනා ගනිමු.

Staccato :-

This indicates the musician should play the note shorter than notated, usually half the value, the rest of the metric value is then silent. Staccato marks may appear on notes of any value, shortening their performed duration without speeding the music itself.

ස්ටෙකාටෝ :- මෙම සංකේතය යොදා ඇති තැන දක්වෙන ස්වරය හෝ ස්වර කිහිපය ඉතා කෙටි හඬකින් යුක්තව වාදනය කෙරේ.

Pizzicato :- is a playing technique that involves plucking the strings of a string instrument. The exact technique varies somewhat depending on the type of stringed instrument.

පිzසිකාටෝ :- මෙම සංකේතය යොදා ඇති තැන දක්වෙන ස්වරය හෝ ස්වර කිහිපය බෝව අල්ලා ගත් අතේ දබරඟිල්ලෙන් වාදනය කෙරේ. කෙටි ස්වරයක් නිකුත් වේ. .

On bowed string instruments it is a method of playing by plucking the strings with the fingers, rather than using the bow. This produces a very different sound from bowing, short and percussive rather than sustained.

Legato:- In music performance and notation, legato indicates that musical notes are played or sung smoothly and connected.

ලෙගාටෝ :- මෙම සංකේතය යොදා ඇති තැන දක්වෙන ස්වරය හෝ ස්වර කිහිපය ඉතාමත් සුසිනිඳු ලෙස හා සියුම් ලෙස බෝව හසුරුවමින් වාදනය කෙරේ.

A slur is a symbol in Western musical notation indicating that the notes it embraces are to be played without separation, i.e. with legato articulation. A slur is denoted with a curved line generally placed over the notes if the stems point downward, and under them if the stems point upwards:


ස්ලර් :- මෙම සංකේතය යොදා ඇති තැන දක්වෙන ස්වර කිහිපය එකිනෙක අතර සම්බන්ධතාවය රැකෙන පරිදි හඬ නොනවත්වා එක දිගට වාදනය කෙරේ. බෝ වේ සම්පූර්ණ දිග ම භාවිත කෙරේ.

මෙම සංකේත රූපසටහන් මගින් අධ්‍යයනය කරමු.





පිසිකාටෝ



ස්ටෙකාටෝ




dynamics

Vitha

| Term: | Symbol: | Effect: |
|---|---|---|
| **piano** | *p* | soft හඬඅඩු |
| **pianissimo** | *pp* | very soft ඉතා අඩු හඬ |
| **mezzo piano** | *mp* | slightly soft ඉතාමත්ම අඩු හඬ |
| **forte** | *f* | loud හඬ වැඩි |
| **fortissimo** | *ff* | very loud ඉතා වැඩි හඬ |
| **mezzo forte** | *mf* | slightly loud ඉතාමත්ම වැඩි හඬ |
| **crescendo** | < | gradually louder ටිකටික වැඩිහඬ |
| **diminuendo** | > | gradually softer ටිකටික අඩු හඬ |

**ක්‍රියාකාරකම 44**

# සරල ප්‍රස්තාරයක් ඇසුරින් අපරදිග සංකේත භාවිත හුරුව

**නිපුණතාව 9.0** : සංකේතානුසාරයේ සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 9.2** : විවිධ සංකේත ඇසුරුකරමින් සංගීත ප්‍රස්තාර කරයි.

**ක්‍රියාකාරකම** : අපරදිග සංගීත සංකේත භාවිත හුරුව

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- අපරදිග ස්වර ප්‍රස්තාර සංකේත ප්‍රායෝගික ව හඳුනාගනියි.
- අපරදිග ස්වර ප්‍රස්තාරවල ඇති Systematical බව පිළිගනියි.
- අපරදිග ස්වර ප්‍රස්තාරකිරීමේ ක්‍රම ශිල්ප සෑම සංගීත ක්ෂේත්‍රයකටම අවශ්‍ය බවට තර්ක කරයි.
- විවිධ සංකේත භාවිත කිරීමේ හුරුව ලබයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා
- ඇමුණුමේ දක්වෙන ස්වර ප්‍රස්තාරය ඇතුළත් දෘශ්‍ය උපකරණයක්.

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- මේ වනවිට සිසුන් තුළ අපරදිග ක්‍රමයට ස්වර ප්‍රස්තාර කිරීමේ කුසලතාවය වර්ධනය වී ඇත. ස්වර, තාල, ස්කේල හා වටිනාකම් ආදි සංකේත රාශියක පුහුණුව ද සිසුන් ලබා ඇත. බේතෝවන්, මෝසාර්ට් ආදී බටහිර සම්භව්‍ය සංගීතඥයින්ගේ සංගීත නිර්මාණ දක්වෙන ස්වර ප්‍රස්තාරවල මතු කියවූ සංකේතවලට වඩා වෙනස් විවිධ සංකේත රාශියක් ද භාවිත වේ. ඉන් සමහරක් සංගීත ඛණ්ඩවල ප්‍රකාශන ගුණය ඇති කිරීමට ද, සමත් වේ. එබැවින් එවැනි සංකේත කිහිපයක් පිළිබඳ ව මීට ඉහත පාඩමින් සිසුන් අධ්‍යයනය කර ඇත. මෙම පාඩමින් එම සංකේත කිහිපයක් භාවිත කිරීමට හුරුව ලබා දීම අපේක්ෂිත ය. මෙහි ඇමුණුමේ දක්වා ඇති ස්වර ප්‍රස්තාරය තවදුරටත් වර්ධනය කරමින් වෙනස් වූ සංකේත යොදා ගායනය හෝ වාදනය තුළින් ප්‍රායෝගික ව විවිධ සංකේත භාවිත කිරීමට හුරු කරන්න. ඇමුණුමේ දක්වෙන්නේ නිර්මාණය කළ තනුවකි. සම්භාව්‍ය වාදනයක් ඇතුළත් ස්වර ප්‍රස්තාරයක් සපයා ගෙන එහි දක්වෙන සංකේත හඳුනාගනිමින් සිසුන්ගේ දක්ෂතාවය මත වාදනයට යොමු කළ හැකි ය.

**පාඩම සංවර්ධනය**

- ඇමුණුමේ දැක්වෙන බටහිර ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න. එහි දක්වෙන විවිධ සංකේත පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එක් එක් සංකේත වෙන් කර හඳුනාගැනීමට සහාය වන්න.

(කාලඡේද 01 යි.)

- වයලීන වාදනයේ යෙදෙන සිසුන් සඳහා එම ප්‍රස්තාරයේ ඇති විවිධ සංකේත හඳුන්වා දෙන්න. එක් එක් සංකේතයේ අදහස් මතු වන අයුරින් වාදනයේ යොදවන්න.

(කාලඡේද 01 යි.)

- එම ප්‍රස්තාරයේ ඇති විවිධ සංකේත හඳුන්වමින් එක් එක් සංකේතයේ අදහස් මතු වන අයුරින් වාදනයේ පුහුණු කරවන්න.

(කාලච්ඡේද 01 යි.)

- ඔබ විසින් සපයා ගත් ස්වර ප්‍රස්තාරයේ ඇති විවිධ සංකේත හඳුන්වමින් එක් එක් සංකේතයේ අදහස් මතු වන අයුරින් වාදනයේ පුහුණු කරවන්න.

(කාලච්ඡේද 01 යි.)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් විෂය කොටස අවසානයේ ප්‍රායෝගික කොටස් මගින් අගයන්න.

පැවරුම -


- බටහිර සම්භාව්‍ය සංගීත ප්‍රස්තාර කොටසක ඇතුළත් ප්‍රකාශන සංකේත සොයා හඳුනා ගන්න.

අතිරේක උදව් -

- Theory & Rudiments of Music - Royal College of Music.

ඇමුණුම:-

ප්‍රකාශන සංකේත ඇතුළත් සරල ප්‍රස්තාර කොටසක් පහත දැක්වේ.



ක්‍රියාකාරකම 45

# නූතන සරල සංගීතයේ ප්‍රස්තාර විධි

**නිපුණතාව 9.0** : සංකේතානුසාරයේ සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

**නිපුණතා මට්ටම 9.1** : විවිධ සංකේත ඇසුරු කරමින් සංගීත ප්‍රස්තාර කරයි.

**ක්‍රියාකාරකම** : ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීතයේ ප්‍රස්තාර විධි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

**ඉගෙනුම් පල** :
- ව්‍යවහාරිකසංගීත ප්‍රස්තාර කිරීමේ සංකේත හා සංකල්ප විස්තර කරයි.
- එම සංකේත වලින් මතු වන අදහස පැහැදිලි කරයි.
- එම සංකේත ප්‍රස්තාරයක් මත ලියා දක්වයි.
- එම සංකේත ඇතුළත් ස්වර ප්‍රස්තාරයක් වාදනය කරයි.
- අනාගත රැකියා අවස්ථාවකට ගැළපෙන ගුණාංග කිහිපයක් රැස්කරගනියි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- ස්වර ප්‍රස්තාරය ලියා දැක් වූ දෘශ්‍ය උපකරණයක්

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලාංකේය ව්‍යවහාරික සංගීතයේ පවතින සරල ගී, චිත්‍රපට ගී, නාට්‍ය ගී ආදියේ ස්වර ප්‍රස්තාර ලිවීමේ දී අපරටටම ආවේනික වූ ක්‍රමවේදයක් ශිල්පීන් විසින් භාවිත කරනු දක්නට ලැබේ. මුල දී ශ්‍රී ලංකා ගුවන් විදුලියේ සරල ගී පටිගත කිරීමේ දී වාද්‍ය ශිල්පීන් සඳහා භාවිත කළ මෙම ප්‍රස්තාර ක්‍රමය පසුව චිත්‍රපට සංගීතය, නාට්‍ය සංගීතය ටෙලිනාට්‍ය සංගීතය ආදියට ද ගලා විත් ඇත. කුඩා වෙනස්කම්වලින් යුත්ක වුවත් සෑම ශිල්පියෙක් පාහේම ක්ෂේත්‍රයේ එකසමාන ප්‍රස්තාර ක්‍රමයක් භාවිත කරනු පෙනේ. සමහර සංකේත යොදා ගෙන ඇත්තේ බටහිර සංගීතයෙන් ය. එම සංකේත අතරින් කිහිපයක් මෙම පාඩමින් අධ්‍යයනය කළ හැකිවේ.

**පාඩම සංවර්ධනය**

- සරල ගීතයක දෘශ්‍ය උපකරණය ප්‍රදර්ශනය කර එම ප්‍රස්තාරය සර්පිනාවකින් හෝ වයලීනයකින් වයා පාඩමට පිවිසෙන්න. ඇමුණුමේ දක්වා ඇති ප්‍රස්තාරය ප්‍රදර්ශනය කරන්න. එහි දැක්වෙන සංකේත වෙන්කර මතුකරගන්න. එම සංකේත පිළිබඳ හඳුන්වන්න. සාකච්ඡා කරන්න..

  (කාලජේද 01 යි.)
- ඇමුණුමේ දැක්වෙන ස්වර ප්‍රස්තාරය වාදනය යොමු කරන්න. සංකේත පිළිබඳ අවධානය යොමු කරන්න. ශිල්පීය දක්ෂතා මතුවන පරිදි වාදනයට යොමු කරන්න.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**

- එක් එක් විෂය කාල පරිච්ඡේදය අවසානයේ ප්‍රායෝගික කොටස් මගින් අගයන්න.


පැවරුම - • සරල සංගීත ප්‍රස්තාර සපයා ගෙන වාදනයේ යෙදෙන්න.

අතිරේක උදව් - • ගීත ප්‍රස්තාර ශතකය - අනුර වන්නිආරච්චි.

ඇමුණුම:-

සංකේත ඇතුළත් සරල ප්‍රස්තාර කොටසක් පහත දැක්වේ. එහි ඇති සංකේත කොටස් හඳුනාගනිමු.

සුවඳ සබන් ඇඟ ගාලා F m 8/6



සංකේතඃ-

- 6/8 - මෙම සංකේතයෙන් හැඟෙන්නේ ප්‍රස්තාරයට අදාළ තාලයයි. 3/4, 4/4, ආදි වශයෙන් ද විවිධ තාල ලකුණු දක්වනු ලැබේ.

- F $^{m}$ - මෙම සංකේතයෙන් දැක්වෙන්නේ ස්වරප්‍රස්ථාරය අයත් ස්කේලය යි. මෙම ස්වර ප්‍රස්තාරය F Minor ස්කේලයට අයත්ය. $E^{b}$, $B^{b}$ ආදී වශයෙන් විවිධ ව යෙදේ.
- Intro - Introduction යන වචනය කෙටි කර මෙම වචනය භාවිත වේ. ගීතයක පෙරවාදන කොටස මෙනමින් හැඳින්වේ.
- Inter - Interlude යන වචනය කෙටි කර මෙම වචනය භාවිත වේ. ගීතයක අතුරුවාදන කොටස මෙනමින් හැඳින්වේ. (එක ම කොටසක් පෙර වාදනයට හා අතුරු වාදනය යන දෙකටම භාවිත වේ නම් මෙම ප්‍රස්තාරයේ ඇති පරිදි Intro/Inter යන පද දෙකම එකට යොදනු ලැබේ.)


(G$^{m}$) - ගීතයේ එක් එක් විභාගයට අදාළ Guitar Chords ලිවීමට මෙවැනි සංකේත භාවිත කෙරේ.

Chorus - මෙම වචනයෙන් දැක්වෙන්නේ ස්ථායි කොටසයි.

Verse - මෙම වචනයෙන් දැක්වෙන්නේ අන්තරා කොටසයි.

Bit - මෙම වචනයෙන් දැක්වෙන කොටස ඉරකින් සටහන් කර ඇත. එම කොටස ගීතයේ ඇදෙන ස්ථාන අලංකාර කිරීම සඳහා යොදනු ලබන ස්වර ඛණ්ඩයකි.

 - මෙම සංකේතයෙන් දැක්වෙන්නේ, එම සංකේතයට පෙර ඇති විභාගය හෝ ස්වර නැවත නැවත එම සංකේතය ඇති තැනට වාදනය කළ යුතු බව ය.

 - Repitation Mark යනුවෙන් මෙය හැඳින්වේ. මෙම සංකේත දෙකට මැදි ව ඇති කොටස දෙවරක් වැයේ. .

 - Sign to Sign යනුවෙන් මෙය හැඳින්වේ. මෙම සංකේතය මුලින් යොදා ප්‍රස්තාරයේ නැවත යෙදෙන තැනක් ඇත. එවිට එම ලකුණ දුටු විට පළමු ව එම ලකුණ යොදා ඇතිතැන සිට නැවත වාදනය කෙරේ. බටහිර සංගීතයේ දැක්වෙන Dalsigno නම් සංකේතය මෙරටට ගැළපෙන ලෙස සකස්වී ඇත. මෙම සංකේතය ලිවීමේ දී සුළු වෙනස්කම් දැකිය හැකි ය.

**ක්‍රියාකාරකම 46**

# සංගීත චිකිත්සාව

**නිපුණතාවය 11.0** :- සංගීතයේ මනෝ විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර තම ජීවිතය වඩාත් සාර්ථක කරගනී.

**නිපුණතා මට්ටම 11.1** :- සංගීතය හා බැඳි මනෝ විද්‍යාත්මක කරුණු අධ්‍යයනය කර එහි ඇති වාසිදායක තත්වයන් ජීවිතයට එකතු කරගනියි.

**ක්‍රියාකාරකම 11.1.1** :- මනෝ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් ලෙස, මානසික ආතතිය පහ කරන ප්‍රතිකාර ක්‍රමයක් ලෙස සංගීතය.

**කාලච්ඡේද** :- 02

**ඉගෙනුම් ඵල** :-

- සංගීත චිකිත්සාව පිළිබඳව කරුණු දැන පවසයි.
- සංගීතය යනු ලෙඩ සුව කිරීමට පවා ශක්තිය ඇති විෂයක් බව හඳුනාගෙන පවසයි.
- සංගීතය ප්‍රායෝගික භාවිතයෙන් මානසික සුවතාව ළඟා කර ගනියි.

**ගුණාත්මක යෙදවුම් :-** ඇමුණුම 01

- සුදුසු සංගීත භාණ්ඩ
- වාදනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ

**ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට උපදෙස් :-**

**විෂය කරුණු පැහැදිලි කිරීමට අත්වැලක් :-**

චිකිත්සාව යනු ප්‍රතිකාරයකි. සංගීත චිකිත්සාව යනු සංගීතය භාවිතයෙන් කරනු ලබන ප්‍රතිකාරයයි. සංගීතය විභාග කේන්ද්‍ර කරගනිමින් අධ්‍යයනය කළ යුතු විෂයක් නොවන බවත්, එයින් සුවිශේෂී ප්‍රයෝජනයක් ලද හැකි බව සිසුනට අවබෝධ කළ යුතුය. විභාග ඇසුරින් තම ජීවිත සාර්ථක කරගැනීම හා එදිනෙදා ජීවිතයේදී වින්දනයක් ලද හැකි විෂයක් වනවා මෙන්ම ස්ව හා අන්‍යයන්ගේ කායික සා මානසික සුවතාව ළඟාකර ගතහැකි විෂයක් බව සිසුනට අවබෝධ විය යුතුය.

සංගීත චිකිත්සාව පිළිබඳව අවබෝධ කරනු වස් ඇමුණුම 01 හිදී ඇති කියවීම් පත්‍රිකාව භාවිත කරන්න. පළමු කාලඡේදය තුළ ඇමුණුම 01 ඇසුරින් සෛද්ධාන්තික අවබෝධය ලබා දී දෙවන කාලඡේදයේ දී තෝරාගත් කෘතියක් භාවිත කරමින් සිසුනට කිසියම් අත්දැකීමක් ලබාදීමට උත්සාහ කරන්න. ගැළපෙන රාග තෝරාගැනීමේදී පසුගිය 13 ශ්‍රේණියේ ගුරු මාර්ගෝපදේශයෙහි ඇතුළත් තොරතුරු භාවිත කරන්න. මෙම පාඩම සැළසුම් කිරීමේදී පසුගිය ගුරු මාර්ගෝපදේශයෙහි තොරතුරු පරිශීලනය අත්‍යාවශ්‍යය.

**පාඩම සංවර්ධනය :-**

- පහත රට බෙරයක් ප්‍රදර්ශනය කරමින් එය භාවිත ශාන්ති කර්ම ක්‍රමයක් පිළිබඳව කෙටියෙන් සාකච්ඡා කරන්න. එය වාදනය කිරීමට හැකිනම් වයා පෙන්වන්න. නැතිනම් වෙනත් අයෙකු ලවා වාදනය කරවන්න. නැතිනම් පටිගත කල වාදනයක් ශ්‍රවණයට සලස්වන්න. අනතුරුව එම බෙර වාදනයෙන් ශාන්තිකර්මයට අදාළ ආකාරයට සිදුවන මානසික ප්‍රතිකාරය ගැන විචාරශීලීව පැහැදිලි කරමින් පාඩමට පිවිසෙන්න.

- ඇමුණුම අංක 01 හි සඳහන් පත්‍රිකාව සිසුන් අතට ලබා දී සංගීත චිකිත්සාව පිළිබඳව අධ්‍යයනයට යොමු කරන්න.
- එම පාඩම අනාවරණය වන පරිදි වාචික හෝ ලිඛිත ප්‍රශ්න මගින් පාඩම පිළිබඳව තක්සේරුවක් කර අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබාදෙන්න

(කාලච්ඡේද 01)

- ඔබ විසින් සපයා ගත් සුදුසු සංගීත භාණ්ඩයක් ශ්‍රවණයට සලස්වා, සංගීත චිකිත්සාවේ දී දැනෙන මානසික සුවය පිළිබඳව සිසුනට අත්දැකීම් ලබාදෙන්න.
- සිසුන් ලද අත්දැකීම් විමසමින් මෙම පාඩම සංවර්ධනය කරන්න.

(කාලච්ඡේද 01)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

සංගීත චිකිත්සාව පිළිබඳ ව ඇගයීමට ලක්වන පරිදි පුවත්පතකට ලිපියක් සකස් කිරීමට යොමුකරන්න.

**අතිරේක උදවු :-**

සංගීත චිකිත්සාව පිළිබඳ වෙබ් අඩවි.

www.youtube.com, වෙනත් සුදුසු පොතපත

ඇමුණුම 01

සංගීත චිකිත්සාව

මිනිසාගේ කායික හා මානසික තත්වයන් උසස් කරනු සඳහා සංගීතය භාවිතයෙන් සිදුකරනු ලබන ප්‍රතිකාර සංගීත චිකිත්සාව වේ. එම විෂය පථය තුළ මෙම කාර්යය අර්ථ දක්වා ඇත්තේ පහත පරිදිය.

''පුද්ගලයෙකුගේ කායික හා මානසික තත්වය, චිත්තවේග පාලනය, සමාජශීලීත්වය සෞන්දර්යාත්මක හැඟීම් හා ආධ්‍යාත්මික තත්වයන් සංගීතය භාවිතයෙන් දියුණු කිරීම සංගීත චිකිත්සාවයි''

නොදියුණු මට්ටමින් හෝ සංගීත චිකිත්සාව අනාදිමත් කාලයක සිට පැවත එන්නකි. සංගීත චිකිත්සාව පිළිබඳව මුල්ම තොරතුරු හමුවන්නේ ග්‍රීක වෛද්‍ය විද්‍යාවෙනි. ප්ලේටෝ, ඇරිස්ටෝටල් වැනි දාර්ශනිකයින් ද සංගීතය හා ක්‍රීඩාව මිනිසාගේ ශාරීරික සුවතාවට ඉවහල් වන බව පවසා ඇත.පෙරදිග ආයුර්වේදය තුළද සංගීත චිකිත්සාව පිළිබඳ තොරතුරු ඇත. ඉපැරණි සංගීත සම්ප්‍රදායක් වන භාරතීය සංගීතයෙහි භාවිත රාග මගින් රෝග සමනය කලහැකි යැයි පැවසීමෙන් ඒ බව පසක් වේ.

පළමු ලෝක යුද්ධ සමයේදී තුවාල වී රෝහල් ගතවූ සෙබළුන්ගේ හිතසුව පිණිස ඇතැම් රෝහල් තුළ සංගීතය ශ්‍රවණයට සලස්වා ඇති අතර, එකී රෝහල් තුළ ප්‍රතිකාර ලැබූ තුවාල කරුවන්, සංගීතය ශ්‍රවනය නොකළ තුවාලකරුවන්ට වඩා වේගයෙන් සුවපත් වී ඇති බව ඔවුනට පසක් වී ඇත. දෙවන ලෝක යුද්ධ සමයේදී රෝගීන් සඳහා සංගීතය භාවිත කිරීම පර්යේශණාත්මකව සිදුවිය. එහි ප්‍රතිඵලය වූයේ සංගීතය ශ්‍රවනය කළ සෙබළුන් සංගීතය ශ්‍රවනය නොකළ සෙබළුන්ට වඩා වේගයෙන් සුවපත්වීමයි. සංගීත චිකිත්සාව පිළිබඳව බටහිරින් විදිමත් පර්යේෂණ ඇරඹයේ ඉන් පසුවය.

අප ගැමියන් අතර භාවිත ශාන්තිකර්මයන්හි ගැයුනු ගීත ගායනාවන්ගෙන් සිදුවූයේද චිකිත්සාවකි. පිරිත් සජ්ජායනා සිදු කරනුයේ ගායනාවක ස්වරූපයෙනි. එහි ගායනා ස්වරූපය පමණක් සැලකිල්ලට ගතහොත් එයින්ද සංගීතමය චිකිත්සාවක් සිදුවේ.

ඔබට සංගීත චිකිත්සතයෙකු ලෙස කටයුතු කිරීමේ අදහසක් ඇති වී නම්, ඔබ තුළ වර්ධනය කරගතයුතු ගුණාංග රාශියක් ඇත. එයින් අත්‍යාවශ්‍ය කරුණු කිහිපයක් පහත දක්වා ඇත.

සංගීත චිකිත්සාවේ සේවය ලබාගැනීමට පැමිණෙන පුදගලයාව එම වෘත්තිකයන් හඳුන්වන්නේ සේවා දායකයා Client ලෙස බව අප දත යුතුය. මෙම කාර්යය වෙනත් රටවලදියුණු මට්ටමින් සිදුකරන වෘත්තියකි.

1. සංගීතය පිළිබඳ පුළුල් දැනුමක් තිබිය යුතුයි.
2. වාද්‍ය භාණ්ඩ වාදනය හා ගායනය අත්‍යාවශ්‍යය. (තම සේවදොයකයාට ගැලපෙන වාද්‍ය බණ්ඩය හෝ ගීතය තමා විසින්ම ගැයීම වැයීම තමා විසින්ම සිදුකරන්නේ නම් එහි ප්‍රතිඵල ඉහළ යනු ඇත)
3. මනෝ විද්‍යාව පිළිබඳ හදාරා තිබිය යුතුය.
4. සිරුරේ හෝරමෝන ක්‍රියාවලිය පිළිබඳ විධිමත් හැදෑරිමක් කොට අවබෝධය ලබා තිබිය යුතුය. (විශේෂයෙන් සැහැල්ලු හා කැළඹුන සිත් ඇති විට හෝර්මෝන ක්‍රියාකාරීත්වය)
5. චිකිත්සකයාගේ සිත සමාධියෙහි පිහිටුවාගෙන තිබීම. (චිකිත්සකයාගේ සිත නිශ්චල නොවේ නම් මෙම කාර්යය අසාර්ථකය)
6. සාර්ථකව චිත්තවේග පාලනය කරගත හැකි අයෙකු වීම.

**ක්‍රියාකාරකම 04**

යුතුවේ.

( කාල ඡේද 02)

- මොසාර්ට් සංගීත නිර්මාපකවරයාගේ ඡායාරූපය පන්තියට ප්‍රදර්ශනය කරන්න. ඇමුණුම් ii කොටසට අදාළ ඔබ විසින් සකස් කර ඇති කියවීම් පත්‍රිකාව සිසුනට ලබා දෙන්න. එහි සැළසුම් කළ ක්‍රියාකාරකම්හි සිසුන් යොදවන්න.
- බේතෝවන් සංගීත නිර්මාපකවරයාගේ ඡායාරූපය පන්තියට ප්‍රදර්ශනය කරන්න. ඇමුනුම් 03 කොටසට අදාළ ඔබ විසින් සකස් කර ඇති කියවීම් පත්‍රිකාව සිසුනට ලබා දෙන්න. එහි සැළසුම් කළ ක්‍රියාකාරකම්හි සිසුන් යොදවන්න.

(කාල ඡේද 02)

- බාර්ක් සංගීත නිර්මාපකවරයාගේ ඡායාරූපය පන්තියට ප්‍රදර්ශනය කරන්න. ඇමුනුම් 03 කොටසට අදාළ ඔබ විසින් සකස් කර ඇති කියවීම් පත්‍රිකාව සිසුනට ලබා දෙන්න. එහි සැළසුම් කළ ක්‍රියාකාරකම්හි සිසුන් යොදවන්න.

(කාල ඡේද 02)

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :-**

- එක් එක් කාලඡේද අවසානයේ දී වාචිකව හෝ කෙටි ලිඛිත ප්‍රශ්න මගින් සිසුන් අගයන්න.

පැවරුම්:- මොසාර්ට්, බේතෝවන් හා බාක් යන සංගීතඥයින්ගේ ජීවන තොරතුරු, සංගීත නිර්මාණ, සංධ්වනි ප්‍රස්තාර ආදිය

- ඒ ඒ සුවිශේෂි කොටස් පැහැදිලි වන පරිදි සංධ්වනිවල ස්වභාවය, සංගීතය පිලිබඳව හෝ මොසාර්ට්, බේතෝවන් හා බාක් යන සංගීතඥයින්ගේ ජීවන තොරතුරු, සංගීත නිර්මාණ, සංධ්වනි ප්‍රස්තාර ආදිය අළලා එක් සංගීතඥයෙක් පිළිබඳව කුඩා පොත් පිංචක් සකස් කිරිමට මග පෙන්වන්න. සුදුසු පරිදි අගයන්න.

අතිරේක උදව්:-

- 1997 පෙරදිග සංගීතය අ.පො.ස උසස් පෙළ ගුරු අත්පොත පිටු අංක 70 සිට පිටු අංක 80
- අන්තර්ජාලය U tube පිරික්සීම.

ඇමුණුම :- (විෂය හා බැඳි ශීර්ෂ)

සංධ්වනි පිළිබඳ නිර්වචන කිහිපයක්:-

- .. Music Written For the Ochestra..'' ..වාදක මණ්ඩලයක් සඳහා ලියන ලද සංගීත සංරචනය සංධ්වනියයි...
- ..එකවර නාද වීමයි..''

**සංධ්වනියක ස්වරූපය හා විශේෂ ලක්‍ෂණ:-**

තේමාවක් තිබීම.
කොටස් 4 කින් හෝ 5කින් සමන්විත වීම.
එක් නාද රූපණයක් සංධවනියම පුරාම විටින් විට නාද වීම.
අදහස් ප්‍රකාශනය සඳහා සංකේත භාවිතය. (
භාවාත්මක හැඟීම් ප්‍රකාශය විශේෂත්වය ලෙස සැළකීම.
විවිධ ස්වර පරාසයන්ට අයත් විවිධ සංගීත භාණ්ඩ රාශියක් භාවිතා විම.

ආරම්භයේ පටන් ස්වර සංවාදාත්මක ලක්‍ෂණය තිබීම.
මෙහෙයවන්නෙක් සිටීම.

**සංධ්වනියකට අයත් වන සංගීත භාණ්ඩ**

මූලික වර්ග හතරකට ම අයත් වන භාණ්ඩ තිබීම.
(Wood wind. Bass wind,String and Percussion )
සංගීත භාණ්ඩ වාදකයින් අවම 35 කට වැඩි ප්‍රමාණයක් සිටිය යුතු වීම. ( එක් එක් යුගවලදී ප්‍රමාණයේ වෙනසක් තිබිය හැකිය.)
එක් එක් සංගීත භාණ්ඩ වර්ගයට සාපේක්‍ෂව අනෙක් සංගීත භාණ්ඩ යොදා ගැනීම.
( පහත දැක්වෙනුයේ සංගීත භාණ්ඩ ප්‍රමාණය දැක්වෙන දළ සටහනකි.)

| සංගීත භාණ්ඩය | සංධ්වනියක් සඳහා තෝරා ගන්නා ප්‍රමාණය | ස්වර පරාසය (ප්‍රායෝගික භාවිතයෙන් ස්වර පරාසය හඳුනාගන්න) |
|---|---|---|
| 0 | | |
| වයලීන් | 36 | ප සිට ස දක්වා |
| වියෝලා | 10 | ස සිට ස දක්වා |
| චෙලෝ | 10 | ස සිට ග දක්වා |
| කොන්සට් ෆ්ලූට් | 02 | ස සිට ස දක්වා |
| පිකලෝ | 01 | රි සිට නි දක්වා |
| ඕබෝ | 02 | නි සිට ප දක්වා |
| කොරැන්ගලී | 01 | ග සිට ධ දක්වා |
| ක්ලැරිනට් | 02 | රි සිට ධ දක්වා |
| බේස් ක්ලැරිනට් | 01 | රි සිට ධ දක්වා |
| බැසූන් | 03 | නි සිට ම දක්වා |
| ෆ්‍රෙන්ච් හෝන් | 04 | නි සිට ම දක්වා |
| ට්‍රම්පට් | 03 | ම සිට නි දක්වා |
| ත්‍රොම්බෝන් | 03 | ග සිට නි දක්වා |
| ටියුබා | 01 | ග සිට ම දක්වා |
| ටිම්පනි ඩ්‍රම් | 2 හෝ 4 | ග සිට ප දක්වා |

• සංධ්වනි ආකෘතිය හෝ සමූහ වාදන ආකෘතිය අනුගමනය කරමින් ගොඩනැගූ දේශීය නිර්මාණ

පන්සිළු - ලයනල් එදිරිසිංහ
ගොයම් දා මගුල - ඩබ්.බී. මකුලොලුව
මහාභිනිෂ්ක්‍රමණය - „
මාර පරාජය - „
හිරගෙයින් මරුමුවට - „
උකුසා වන්නම ආශ්‍රිත සමූහ වාදන - ෂෙල්ටන් ප්‍රේමරත්න
සිංහල අවුරුද්ද - ප්‍රේමසිරි කේමදාස
වැස්ස - „
මගේ කාලයේ මවුනි - „

**ඇගයීම්.**

1. **ඇගයීම් අවස්ථාව :- -**

2. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම:- සංගීත ස්වරවල භෞතික විද්‍යාත්මක පදනම විමසමින් ස්වර සුසංයෝග කිරීමේ හැකියාව ලබයි.

3. ආවරණය කෙරෙන විෂය සන්ධාරය -
   - සම්පූර්ණ ස්වර සප්තකයේ සංඛ්‍යාත
   - තරංග ප්‍රස්තාර ඇසුරින් ස්වර සුසංයෝග වන අයුරු
   - ගණිතමය සාධක පදනම් කර ගනිමින් කෝඩ්ස් සෑදීම
   - ස්වර සුසංයෝග කිරීම

4. **උපකරණයේ ස්වභාවය:-**
   - ශිෂ්‍ය කාර්ය සාධන ගොනුවකි. (Portfolio)

5. **අරමුණු** :-
   - සම්පූර්ණ ස්වර සප්තකයේ සංඛ්‍යාත ගණනය කරයි.
   - ආදේශ සංඛ්‍යාතයක් මගින් ඉතිරි ස්වරවල සංඛ්‍යාතයන් ගණනය කරයි.
   - ප්‍රස්තාර කඩදාසියක් මත සරල තරංග රටා නිර්මාණය කරයි.
   - ස්වර කිහිපයක් එකවර ඇසෙන විට සිදුවන වෙනස තරංග ප්‍රස්තාර ඇසුරින් පැහැදිලි කරයි.
   - ගණිතමය සාධක පදනම් කරගනිමින් කෝඩ්ස් සකසයි.
   - කෝඩ්ස් ඇතුළත් පොතක් සකසයි.
   - ස්වර 12 ට අයත් විවිධ කෝඩ්ස් නිර්මාණය කර ගොනුවක් සකසයි.
   - එක් එක් ස්වර සුසංයෝග වීමේ දී මතුවන රසභාව පිළිබඳ විමසයි.
   - ඕනෑ ම කෝඩ් එකක් ස්වර පුවරුවෙන් වාදනය කර පෙන්වයි.

6. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

**ගුරු උපදෙස්**

- මෙම ඇගයීම හා සම්බන්ධ එක් එක් පියවර නිපුණතා මට්ටම හා බැඳි ක්‍රියාකාරකම් පන්තියේ ක්‍රියාත්මක කරනු ලබන නැතහොත් ඉගෙනීම සිදුවන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ හැකි ය. සප්තකයේ සංඛ්‍යාත හා සම්බන්ධ ක්‍රියාකාරකම අවසානයේ දී පළමු පියවරත්, කෝඩ්ස් ගොඩනැගීමේ ක්‍රියාකාරකම අවසානයේ දෙවන පියවරක් වශයෙන් උගන්වන අතරතුරේ දී ම ඇගයීම හාසම්බන්ධ මාතෘකා ඔස්සේ කරුණු රැස්කිරීමට අවස්ථාව දිය හැකි ය. අවශ්‍ය නම් මේ සම්බන්ධ ක්‍රියාකාරකම් සියල්ල අවසානයේ දී ද යොමුකළ හැකිය. ඔබට සුදුසු පිළවෙළක් යොදා ගන්න.

- එක් එක් පියවර නිම කිරීමට ශිෂ්‍යා ගන්නා උත්සාහය ඇගයීමට අවශ්‍ය Check List එකක් ඔබ විසින් සකසා ගෙන භාවිත කරන්න.

**පියවර 01**

- ස්වරපුවරුවක රූප සටහනක් ඇඳ ''ස'' ස්වරය සංඛ්‍යාතය 256 සේ සලකා ස්වර 12 සංඛ්‍යාත දක්වන්න.
- ''ස'' ස්වරය සංඛ්‍යාතය 240 සේ සලකා අනුපාත සංඛ්‍යා සැලකිල්ලට ගනිමින් ස්වර 12 සංඛ්‍යාත ගණනය කරන්න.
- ප්‍රස්තාර කඩදාසි සපයා ගන්න. ස, ග, ප, යන ස්වරවලට අයත් ලෙස සරල තරංග රූපසටහන් වෙන වෙන ම අඳින්න. (මෙහි දී අනුපාත සංඛ්‍යා පිළිබඳ අවධානය යොමු කරමින් එක් එක් ස්වරයට හිමි තරංගයට අදාළ කොටු ගනන් තීරණය කරන්න.)
- සී මේජර් කෝඩ්එකකට අයත් ස්වර තුන එකවර වාදනය වීමේ දී ගොඩනැඟෙන තරංග රූප සටහනක් වෙන ම අඳින්න.

**පියවර 02**

- පහත වගුව උපයෝගී කරගනිමින් කෝඩ්ස් ගොඩනගන්න. හිස්තැන්වල කෝඩ්ස් නාම ලියන්න.

| අනු අංකය | මූලික ස්වරය | අතරත අර්ධස්වර | දෙවන ස්වරය | අතරත අර්ධස්වර | තෙවන ස්වරය | අතරත අර්ධස්වර | සිව්වන ස්වරය | අතරත අර්ධස්වර | පස්වන ස්වරය | කෝඩ් නාමය |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | ස | +3 | | +2 | | | | | | C-Major |
| 2 | ස | +3 | | +2 | | +3 | | | | C-Major |
| 3 | ස | +3 | | +2 | | +3 | | +2 | | Added 9th |
| 4 | ස | +3 | | +3 | | | | | | C Augmented |
| 5 | ස | +2 | | +3 | | | | | | C-Minor |
| 6 | ස | +2 | | +3 | | +2 | | | | C-Minor 7th |
| 7 | ස | +2 | | +3 | | +2 | | +3 | | .................. |
| 8 | ස | +2 | | +2 | | | | | | .................. |

- පහත වගුව ඡායාපිටපත් කරගන්න. එහි මූලික ස්වර පිළිවෙලින් නොලියන්න. අවසාන තීරු දෙක ඔබට කැමති කෝඩ්ස් වර්ග දෙකක් සඳහා යොදාගන්න. වගුව තුළ එක් එක් කොටුවේ අදාළ කෝඩ්ස්වලට අයත් ස්වර අපරදිග ක්‍රමයට ගොඩනගන්න.

| කෝඩ් නාමය | Major | Major 7th | Augmented | Minor | Minor7th | Diminished | ……….. | ……….. |
|---|---|---|---|---|---|---|---|---|
| ස්වර අතරත අර්ධස්වර සංඛ්‍යාව | +3+2 | +3+2+3 | +3+3 | +2+3 | +2+3+2 | +2+2 | ………... | ……….. |
| C | | | | | | | | |
| F | | | | | | | | |
| G | | | | | | | | |
| $B^b$ | | | | | | | | |
| $E^b$ | | | | | | | | |
| A | | | | | | | | |
| $C^\#$ | | | | | | | | |
| E | | | | | | | | |
| $A^b$ | | | | | | | | |
| D | | | | | | | | |
| $F^\#$ | | | | | | | | |
| B | | | | | | | | |

**ක්‍රියාකාරකම 0**

## අපට සංගීතය ඇසෙන අයුරු

**නිපුණතාව 10.0** : සංගීතය හා බැඳි භෞතික විද්‍යාත්මක සහ ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

**නිපුණතා මට්ටම 10.2** : සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි.

**ක්‍රියාකාරකම** : සංගීතයේ දී කර්ණේන්ද්‍රියේ ක්‍රියාකාරිත්වය

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් පල** :
- අපට සංගීත ඇසෙන ආකාරය විස්තර කරයි.
- කර්ණේන්ද්‍රියේ කොටස් නම් කරයි.
- කර්ණේන්ද්‍රියේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරයි.
- සංගීතය විෂයයේ දී කර්ණේනද්‍රියේ වැදගත් කම පිළිගනියි.
- සංගීත ඉගෙනීමේ දී කර්ණේන්ද්‍රිය පුරුදු පුහුණු කිරීමට අභ්‍යාසයේ යෙදෙයි.

**ගුණාත්මක යෙදවුම්:**
- මාතෘකාවට අදාළ විෂය කරුණුවලට ගැළපෙන ලෙස සැකසූ දෘශ්‍ය උපකරණ. කියවීමේ පත්‍රිකා සහ
- කර්ණේන්ද්‍රි යේ කොටස් නම් කළ දෘශ්‍ය උපකරණයක්

**විෂයකරුණු පැහැදිලි කරගැනීමට අත්වැලක් :**

- 

**පාඩම සංවර්ධනය**

- මීටපෙර

කාලඡේද 03 යි.

- අධ්‍යයනය

කාලඡේද 03 යි.

**ඇගයීම හා තක්සේරුකරණය සඳහා උපදෙස් :**
- එක් එක් විෂය කාල පරිච්ඡේදය අවසානයේ ප්‍රායෝගික කොටස් මඟින් අගයන්න.

පැවරුම - • සරල සංගීත ප්‍රස්තාර සපයා ගෙන වාදනයේ යෙදෙන්න.

අතිරේක උදවු - •

සිංහල සංගීතයේ බටහිර බලපෑම

මේ සම්බන්ධව මහාචාර්ය සුනිල් ආරියරත්න සූරීන් විසින් රචිත ශ්‍රී ලංකාවේ කණ්ඩායම් සංගීතය නම් ග්‍රන්ථයේ එන තොරතුරු පාදක කර ගත හැකි ය. පහත දැක්වෙන සංක්ෂිප්ත තොරතුරු පාඩම සංවර්ධනය සඳහා යොදා ගත හැකි ය.

- නූර්ති ගීත නිර්මාණයේ දී බටහිර ගී තනු යොදා ගැනීම (1902 නීතිඥ ජෝන් ද සිල්වා මහතාගෙ ''සිංහල පරාභව නාටකය'' නම් නාට්‍යයේ "Soldiers are We" නැමති ඉංග්‍රීසි ගී තනුව අනුව ''විස්කී බී දූන්'' නමින් ගීයක් රචනා වී තිබීම)

1903 නීතිඥ ජෝන් ද සිල්වා මහතා රචනා කළ ''සිරිසඟබෝ'' නූර්තියේ ඇතුළත් 'දන්නෝ බුදුන්ගේ' ගීතය බටහිර පල්ලිවල ගායනා කළ ගීතයක තනුවක් වීම.

## 13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය
## පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 1.2**

උත්තර භාරතීය සංගීතයට අයත් රාගකිහිපයක ස්වභාවය සහ සමවිෂමතා හඳුනා ගනිමින් ගායනයෙ වාදනයේ යෙදේ.

**2. විෂය සන්ධාරය -**

- ජය ජයවන්ති, රාගයේ ගමක්, මීන්ඞ් සහිතව ස්වර අභ්‍යාස
- ජය ජයවන්ති, රාගයේ සර්ගම්
- ජය ජයවන්ති, රාගයේ මධ්‍යලය ගීත, විශේෂ සංචර සංගති, පූර්වාලාප සහ බඩත් ආලාප සමග රාග විස්තාරණය
- ජය ජයවන්ති, රාගයේ විවිධ තානාලංකාර ගායනය/වාදනය ශිල්පාංග සහිතව ඉදිරිපත් කිරීම

**3. උපකරණයේ සවභාවය**

- ප්‍රායෝගික ව ගායනයේ / වාදනයේ යෙදවීම.

**4. කාලය** කාලච්ඡේද 02

**5. අරමුණු** -

- රාගධාරී ගීත ශිල්පාංග සහිතව ඉදිරිපත් කරයි.
- රාගයේ ස්වභාවය ප්‍රායෝගිකව පැහැදිලි කරයි.
- රාග විස්තර පැහැදිලි කරයි.
- රාගධාරී සංකල්ප කිහිපයක් පිළිබඳ ව පැහැදිලි කරයි.

**6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

ගුරු උපදෙස්

- මෙම ඇගයීම පිළිබඳ ව සිසුන් මුලින්ම දැනුවත් කරන්න.
- පළමු වාරයට අයත් ජයජයවන්ති රාගය පළමු වාරයේ ප්‍රායෝගික ඇගයීම සඳහා යොදා ගත හැකිය. මේ අනුව ඉදිරි වාරවලට අයත් රාග ද මේ අනුව සකසා ගත හැකිය.
- ක්‍රියාත්මක කරවීම.
  1 රාගයට අයත් සර්ගම් ගීතය ගායනයට/වාදනයට සලස්වන්න.
  2 ස්වර විස්තාරයක් හෝ ස්වර සංගති 4 ක් ගායනයට/වාදනයට සලස්වන්න.
  3. රාගයට අයත් මධ්‍යලය ගීතය ගායනයට හෝ වාදනයට සලස්වන්න.
  4. රාගයට අයත් තානාලංකාර ගායනයට හෝ වාදනයට සලස්වන්න.
  5. ඉදිරියේ දැක්වෙන ප්‍රශ්න 4 ඉදිරිපත් කර පිළිතුරු ලබා ගන්න. (එක් පිළිතුරකට ලකුණු 01 බැගින් පිළිතුරු 4 ට ලකුණු හතරකි)

1 රාගයේ වාදි සංවාදී නම් කරන්න.
2 රාගයේ මුඛ්‍යාංගය ප්‍රායෝගික ඉදිරිපත් කරන්න.
3 ආලාප වර්ග නම් කර ඉන් එක් වර්ගයකට ප්‍රායෝගික උදාහරණයක් ලෙස කෙටි ආලාප කොටසක් ඉදිරිපත් කරන්න.
4 රාගයේ ආරෝහණ - අවරෝහණ ප්‍රායෝගික ව ඉදිරිපත් කරන්න.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | සර්ගම් ගීතය නිවැරදි ව ගායනය කිරීම | ලකුණු 04 |
| 2 | ස්වර විස්තාරයක් හෝ ස්වර සංගති 4 ක් ගායනයට/වාදනයට | ලකුණු 04 |
| 3. | මධ්‍යලය ගීත නිවැරදිව ගායනය / වාදනය කිරීම | ලකුණු 04 |
| 4 | තානාලංකාර ගායනයට හෝ වාදනයට | ලකුණු 04 |
| 5 | කෙටි ප්‍රශ්න හතරේ පිළිතුරුවල නිරවද්‍යතාවයට | ලකුණු 04 |

13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය

**පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික නොවන**

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 3.1**

- තාලයේ ගති ලක්ෂණ පැහැදිලි කරමින්, දේශීය සහ භාරතීය විවිධ තාල අතර ස්වභාවය හඳුනා ගනිමින් තාල නිරූපණය කරයි.

**2. විෂය සන්ධාරය -**

- ඒක්තාල්, තිලවඩා, හඳුනා ගැනීමේ අභ්‍යාස සහ සමගුණ නිරූපණය
- ඉහත තාලපද සමග සමගාමී වෙනත් තාලපද හා සන්සන්දනය

**3. උපකරණයේ සවභාවය**

- ශ්‍රවණය මගින් ඒක්තාල්, තිලවඩා, තාල පද හඳුනාගැනීම, හඳුනාගත් තාල පද ලිඛිත ව ප්‍රස්තාර කිරීම, අදාල තාලපද සමගුණ නිරූපණය, ඒක්තාල්, තිලවඩා, යන තාල පද සමග සමගාමී වෙනත් තාල පද ප්‍රස්තාර කරවීම, හා ඒවා අතර සමවිෂමකම් දක්වීම වැනි ප්‍රායෝගික හා ලිඛිත කොටස් ඇතුළත් මිශ්‍ර ඇගයීමකි. ලිඛිත ස්වභාවය වැඩි නිසා ලිඛිත ඇගයීමක් ලෙසට වර්ග කර ගත හැකිය.

**4. කාලය**

- කාලච්ඡේද 02

**5. අරමුණු**

- ශ්‍රවණය මගින් තාල පද වෙන්කර හඳුනාගෙන ප්‍රස්තාර කරයි.
- එම තාල පද සමගුණ වශයෙන් අතින් නිරූපණය කරයි.
- එම තාල පද සමග සමගාමී වෙනත් තාල පද ප්‍රස්තාර කර සමගුණ වශයෙන් අතින් නිරූපණය කරයි.
- ඒවා අතර සමවිෂමකම් ලිඛිතව දක්වයි.

6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්

ගුරු උපදෙස්

- මෙම ඇගයීම ඒක්තාල්, තිලවඩා, චෞතාල්, ත්‍රීතාල් සහ පංජාබි යන තාල පද පහක් ඇසුරින් පවත්වන බව සිසුන් ට කල්වේලා ඇතුව දැනුම් දෙන්න. මෙහි විෂය සන්ධාරයේ ඇතුළත් පාඩම් දෙක නිම කර අවසානයේ මෙම ඇගයීම තවත් කාල ඡේද 2 ක දී නිම කළ හැකිය. එම පාඩම් පිළිබඳ ඉගෙනුම දීර්ඝ කිරීමට මෙම ඇගයීම යොදා ගත හැකිය. මෙම සිසුන් ත්‍රීතාල් තාලය පිළිබඳ අභ්‍යාස පහළ ශ්‍රේණි වල දී ද , ඉටු කර ඇති නිසා ඉතිරි තාල පද 04 ට වැඩි අවධානය යොමු කරන්න.
  පහත දක්වෙන පියවර අනුගමනය කරන්න
  පියවර 01.
- ඒක්තාල්, තිලවඩා, චෞතාල්, සහ පංජාබි යන තාල පද ඇතුළත් ශ්‍රව්‍ය පටයක් සකසා ගෙන ශ්‍රවණයට සළසන්න. නැතහොත් ඔබගේ තාල පද වාදනයේ දක්‍ෂතාවය මත ( නිවැරදි අවනද්ධාක්‍ෂර සහිත ) එම තාල සජීවී ව තාල පද වාදනයේ යෙදෙන්න. ශ්‍රවණය කළ පිළිවෙළ අනුව තාල පද වෙන් කර නම් කරවන්න. '' තිටකත ගදිගන '' , '' තිරිකිට ධිං'' වැනි අවනද්ධ කොටස් වාදනය කර හෝ ශ්‍රවණයට සළසා නිවැරදිව ලිවීමට යොමු කරන්න.
  පියවර 02.
- ශ්‍රවණය කළ පිළිවෙළ අනුව එම තාල පද නියමිත සංඥා ආදිය සහිතව ප්‍රස්තාර කරවන්න.
  පියවර 03.
- එම තාල පද සුදුසු ලය මත සමගුණයෙන් අතින් තාල නිරූපණය කරවන්න.
  පියවර 04.
- ශ්‍රවණය කළ පිළිවෙළ අනුව තාල පද වලට සමගාමී වන වෙනත් තාල පද දෙකක් ප්‍රස්තාර කරවා ඒවායේ සමගුණ අතින් නිරූපණය කරවන්න.

පියවර 05.

- සුදුසු වගුවක් භාවිත කර ඒක්තාල්-චෞතාල් සහ තීලවඩා-පංජාබි හෝ ත්‍රිතාල් සමග සැසඳීමක් කරවන්න.

නිර්ණායක -

1 ශ්‍රවණය කළ පිළිවෙළ අනුව තාල පද වෙන් කර නම් කිරීම. '' තිටකත ගදිගන '' '' තිරිකිට ධිං'' වැනි අවනද්ධ කොටස් ශ්‍රවණය මගින් නිවැරදිව ලිවීම. ලකුණු 04

2 ශ්‍රවණය මගින් හඳුනාගත් තාල පද නිවැරදිව ප්‍රස්තාර කිරීම ලකුණු 04

3. තාල පද සමගුණ වශයෙන් නිරූපණය ලකුණු 04

4. ඉහත තාල සමග සමගාමී වන වෙනත් තාල පද දෙකක් ප්‍රස්තාර කර ඒවායේ සමගුණ අතින් නිරූපණය ලකුණු 04

5 සුදුසු වගුවක් භාවිත කර ඒක්තාල්-චෞතාල් සහ තීලවඩා-පංජාබි හෝ ත්‍රිතාල් සමග සැසඳීම ලකුණු 04

----------

මුළු ලකුණු 20 යි.

----------

ලකුණු 20 න් 15 කට අඩුවෙන් ලැබූ සිසුන් සඳහා නැවත මෙම පාඩම් සරලව ඉගැන්විය යුතුවේ.

13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය
පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික නොවන

1. **ආවරණය කෙරෙන නිපුණතා මට්ටම**
   සේ ගී පිළිබඳ අදහස් දක්වමින් ගී ගායනයේ / වාදනයේ දක්ෂතා දක්වයි.
2. **විෂය සන්ධාරය** :-
   මුදුපදය සහිත ප්‍රශස්ති, හටන් කාව්‍ය, සැවුලා වන්නම , ගණපති සව්දම, අස්නෙ, වැලපුම් ගී යන සේ ගී වර්ග

3. **උපකරණයේ ස්වභාවය** :- විවෘත ග්‍රන්ථ පරීක්ෂණ, ඉදිරිපත් කිරීම සහ පැවරුම මිශ්‍ර ව.

4. **කාලය** :- කාලච්ඡේද 02

5. **අරමුණු** :-
   - සේ ගී වර්ගවල ස්වභාවය අවබෝධ කර ගනියි.
   - නිර්දේශිත ගී වර්ග වල සුවිශේෂතා පැහැදිලි කරයි.
   - නිර්දේශිත ගී වර්ග එකින් එක සංසන්දනය කරයි.
   - නිර්දේශිත ගී වර්ගවල විශේෂ ලක්ෂණ පිළිබඳ තර්කානුකූලව අදහස් දක්වයි.

5. **උපකරණය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

**පහත දැක්වෙන ග්‍රන්ථ පරිශීලනය මගින් මෙම ඇගයුමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට සිසුන් ට කාලය ලබා දෙන්න. මෙම ග්‍රන්ථ ඔබ පුස්තකාලයේ නොමැති නම් පහත දැක්වෙන පිටු අංක වල ඡායා පිටපත් හැකි ප්‍රමාණයක් රැස්කර සිසුන්ට ඒවා පරිශීලනය කිරීමට යොමු කරන්න.**

- ශ්‍රී ලංකාවේ සංගීත සම්භවය - සී. ද එස්. කුලතිලක (පිටු අංක 186 - 190 ) 8 වන පරිච්ඡේදය
- ප්‍රශස්ති කාව්‍ය රසය - ජේ ඊ සේදරමන් ( පෙරවදන හා මුල් පිටු කිහිපය )
- හෙළ ගී මග - ඩබ්.බී. මකුළොලුව ( ඉහත විෂය සන්ධාරයට අයත් කොටස් )
- ශ්‍රී ලංකාවේ සංගීත ප්‍රභවය හා විකාශය - දුරස්ථ ගුරු අධ්‍යාපනය ( පිටු අංක 1 - 15)
- ශ්‍රී ලංකාවේ ජන සංගීතය - දුරස්ථ ගුරු අධ්‍යාපන ( පිටු අංක 18 - 20)

**මෙම ඇගයීම ඉදිරිපත් කිරීමට පාසලේ පහසුකම් ඇති පරිදි සහ සිසුන්ගේ හැකියාව පරිදි, පහත දැක්වෙන ක්‍රියා මාර්ග එක් එක් සිසුවාට තෝරාගත හැකිය.**

- **ශ්‍රී ලංකාවේ සේ ගී අතරින් තෝරා ගත් ගී " යන නම මාතෘකා කර ගැනීම හා රැස්කර ගත් කරුණු එක් කළ** Power Point Presentation **එකක් හෝ නිර්මාණය කළ** CD **තැටියක්.**
- **ඉහත මාතෘකාව මත ප්‍රේක්ෂකයින් ඉදිරියේ පවත්වනු ලබන විනාඩි 15 කට නොඅඩු නිදර්ශණාත්මක කථාවක්.**
- **ඉහත මාතෘකාව යොදා ගනිමින් අනුමාතෘකා යටතේ රැස්කර ගත් තොරතුරු ඇතුළත් කර , අවශ්‍ය අවස්ථාවලදී රූපසටහන් එක්කර සැකසූ අභ්‍යාස පොතක්.**
- **රැස්කර ගත් තොරතුරු පිළිවෙළට ඇසුරු ලිපි ගොනුවක්**
- **පන්තියේ බිත්තියේ එල්ලා තැබීමට සුදුසු දෘශ්‍ය උපකරණයක්.**

**ඉහත ක්‍රියාමාර්ග දක්වා ඇත්තේ ගුණාත්මක බවින් වැඩි ක්‍රියාමාර්ගය අංක එකට යොදමින්ය. ඉදිරියේ දක්වන ක්‍රියාමාර්ග තුළද ගුණාත්මක බවින් වැඩිම ක්‍රියාමාර්ගය මුලින් දක්වා ඇත.**

**අභිමත ක්‍රියාමාර්ගයක් යොදා ගන්න ද, එක් එක් විෂය මාතෘකාව සඳහා ලබා දෙන ඉඟි සිසුන් විසින් ආවරණය කළ යුතුවේ. පන්තියේ දී ලබා ගත් සටහන් පමණක් ප්‍රමාණවත් නොවේ. ලකුණු පිරිනැමීමේ දී ශිෂ්‍යා ගේ ඉදිරිපත් කිරීමේ ක්‍රියාමාර්ගය පිළිබඳව ද අවධානය යොමු කරන්න.**

- අනු මාතෘකා

**සේ ගී**

- සේ ගී යන්නට කෙටි නිර්වචනයක් සපයන්න.
- සේ ගී වර්ග කර දක්වන්න.
- සේගීවල සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.

**ප්‍රසස්ථි හා හටන් ගී**

- ප්‍රශස්ති ගීතවල ආරම්භය හා ව්‍යාප්තිය හා සුවිශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න. ඒවා ඇතුළත් ග්‍රන්ථ නම් කරන්න.
- පන්තියේ අධ්‍යයනය නොකළ තවත් ප්‍රශස්ති ගීතයක් දක්වන්න. ( සවුන්ඩ් ට්‍රැක් හෝ වීඩියෝ ට්‍රැක් එකක් මගින්, තමන්ගේ ම ගායනය මගින්, ගීත ස්වර ප්‍රස්තාරයක් මගින්, පදමාලාවක් පමණක් ලියා දක්වමින් )
- හටන් ගී හා ප්‍රශස්තිවල සමවිෂමතා දක්වන්න.

**සවුදම්, මංගලම් හා අස්නෙ**

මේවා පිළිබඳ කෙටි විස්තරයක් සහ භාවිත කරන අවස්ථා.

නිදසුන් සඳහා ගායනයක් හෝ ගීත ස්වර ප්‍රස්තාරයක්.

**වැළපුම් ගී**

- වැලපුම් ගී වල නාදමාලාව, පදමාලාව, රිද්මය, අතර ඇති සම්බන්ධතාවය හා ස්වර පරාසය, තාලය පිළිබඳ ඇති වෙනස්කම් විස්තර කරන්න.

**වන්නම්**

- වන්නම් පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
- උඩරට, පහතරට, සබරගමු, වන්නම්වල ආරම්භය හා විශේෂ ලක්ෂණ
- ඔබ කැමති වන්නමක් නිදසුන් ලෙස ගායනයක් හෝ ගීත ස්වර ප්‍රස්තාරය

6. **ඇගයීම් නිර්ණායක**

1. ඉදිරිපත් කිරීම සඳහා තෝරාගත් ක්‍රියාමාර්ගයේ නිර්මාණාත්මක බව -ල. 04
2. දී ඇති අනුමාතෘකාවල විෂය කරුණු වල නිරවද්‍යතාවය - ල. 04
3. එක් එක් අනුමාතෘකාවේ තොරතුරු පැහැදිලි කිරීම හා ශෛලිය - ල. 04
4. ඉදිරිපත් කිරීමේ ක්‍රියාමාර්ගයේ ආකර්ශණීය බව - ල. 04
5. අනුමාතෘකා ආවරණය වන පරිදි ප්‍රායෝගික නිදසුන් දැක්වීම - ල. 04

**13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය**
**පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික**

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම - 10.1**

සංගීත ස්වරවල භෞතික විද්‍යාත්මක තත්ත්වයන් පරීක්ෂා කර ස්වර සුසංයෝග කිරීමේ හැකියාව ලබයි.

**2. විෂය සන්ධාරය -**

- ස්වර සුසංයෝග කිරීමේ ක්‍රියාකාරකම් සහ කෝඩ්ස් ගොඩනැගෙන අයුරු Chords & Harmony

**3. උපකරණයේ සවභාවය**

- නිර්මාණාත්මක ක්‍රියාකාරකම්

**4. කාලය**

- කාලච්ඡේද 02

**5. අරමුණු**

- ස්වර සුසංයෝග වීමේ සිද්ධාන්ත පසුබිම පිළිබඳ අදහස් දක්වයි.
- සරල තනුවක් නිර්මාණය කරයි.
- විවිධ ශිල්ප ක්‍රම ( Chords & Harmony )යොදා ගනිමින් ස්වර සුසංයෝග කරයි.
- නිර්මාණය ඉදිරිපත් කරයි.

**6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

ගුරු උපදෙස්

- මෙම ඇගයීම ගුරුවරයාගේ මග පෙන්වීම් මත කරනු ලබන නිර්මාණාත්මක ක්‍රියාකාරකමකි. තනිතනිව හෝ සිසුන් කණ්ඩායමක් ලෙස යොදා ගෙන ඉටු කළහැකිය.
- මේ සඳහා ශිෂ්‍යා තුළ Chords & Harmony සංකල්ප පිළිබඳ ප්‍රායෝගික දැනුම අවශ්‍ය වේ.
- ක්‍රියාත්මක කරවීම.

1. සරල තනුවක කොටසක් ( Melody) ශිෂ්‍යාට සපයන්න.

නිදසුනඃ-

ස - ග - / ප - ම ග / රි - ග ම / ප - - - /
ප - ග - / ම - රි - / ග - රි - / ස - - - /

2. ස්වර පුවරු භාණ්ඩයක් යොදා ගනිමින් ශිෂ්‍යයාට තනිව පුහුණු වීමට ඉඩ සළසන්න. ( ස්වරස්ථාන නිවැරදි නොවේ නම් උපකාරී වන්න)
3. ශිෂයාගේ දැනුම මත 3rd Harmony, or 5th Harmony Chords යොදවන්න.
4. ශිෂයාගේ දැනුම මත Bass Part or Counter Part යොදවන්න.
5. එම කොටස් 3 ස්වරපුවරු වාද්‍ය භාණ්ඩයක් හෝ වෙනත් වාද්‍ය භාණ්ඩයක් මගින් වැයීමට සලස්වන්න.
6. ශිෂයාගේ දැනුම මත Melody කොටසට ගැලපෙන ලෙස තවත් ස්වර පාද දෙකක් සිසුන් ලවා නිර්මාණය කරවන්න. එම ස්වර පාද වල සුදුසු බව පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
7. ශිෂයාගේ දැනුම මත Harmony, Bass Part , Counter Part යොදවන්න.
8. පන්තියේ සිසුන් ප්‍රමාණවත් පරිදි සිටී නම් එක් එක් කොටස් එකිනෙකාට බෙදා දී එකවර ගායනයේ හෝ වාදනයේ යොදවා ඉදිරිපත් කරවන්න. ප්‍රමාණවත් සිසුන් නොමැති නම් 10, 11 ශ්‍රේණි වල සිසුන් සහභාගී කරවා ගනිමින් සුදුසු ලෙස ඉදිරිපත් කිරීමට සිසුන් යොමු කරන්න.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | Chords & Harmony යෙදීමේ නිවැරදි තාවය | ලකුණු 04 |
| 2 | Bass Part or Counter Part යෙදීමේ නිවැරදි තාවය | ලකුණු 04 |
| 3. | නිර්මාණය නිවැරදිව ගායනය / වාදනය කිරීම/ඉදිරිපත් කිරීම | ලකුණු 04 |
| 4 | සහභාගීත්වය/නිර්මාණශීලි බව | ලකුණු 04 |
| 5 | සමස්ත නිර්මාණයේ මිහිරිතාවය ට | ලකුණු 04 |

**13 ශ්‍රේණිය- පෙරදිග සංගීතය**

**පළමු වාරයේ ඇගයීම - ප්‍රායෝගික නොවන**

**1. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම -**

11.1සංගීතය සඳහා උපයෝගී වන ජීව විද්‍යාත්මක තත්ත්වයන් අධ්‍යයනය කර තම ප්‍රායෝගික හැකියා වඩාත් සාර්ථක ව ඉදිරිපත් කරයි.

11.1 සංගීතය හා බැඳි මනෝ විද්‍යාත්මක කරුණු අධ්‍යයනය කර එහි ඇති වාසිදායක තත්ත්වයන් ජීවිතයට එකතු කර ගනියි.

**2. විෂය සන්ධාරය -**

- අපට සංගීතය ඇසෙන අයුරු
- ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු
- කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු
- බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාවය (හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය ඇසුරින්)

**3. උපකරණයේ සවභාවය**

- කථනය

**4. කාලය**

- කාලච්ඡේද 02

**5. අරමුණු**

- සංගීතය සඳහා උපකාරීවන ඉන්ද්‍රියන් පිළිබඳ අදහස් දක්වයි.
- කටහඬෙහි ගුණාත්මක බව ඇති වීමට බලපාන හේතු සාකච්ඡා කරයි.
- හොවාර්ඩ් ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධි න්‍යාය ඇසුරින් බුද්ධිය සහ සංගීතය අතර සම්බන්ධතාවය විමසයි.

**6. උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්**

ගුරු උපදෙස්

- මෙම ඇගයීම රැස්කරගත් තොරතුරු ඇසුරින් ශිෂ්‍යා විසින් කරනු ලබන කථාවකි.
- ක්‍රියාත්මක කරවීමට පහත දැක්වෙන කරුණු ඔස්සේ ශිෂ්‍යා මෙහෙයවන්න

1. සංගීතය විෂයේ දී පුද්ගලයාට උපකාරී වන ස්වරාලයේ සහ කර්ණේන්ද්‍රියේ ක්‍රියාකාරීත්වය දළ රූපසටහන් මගින් පැහැදිලි කිරීම.
2. අපට සංගීතය ඇසෙන අයුරු.
3. කටහඬෙහි මිහිර ඇති වීමට හේතු.
4. ගාඩ්නර්ගේ බහුවිධ බුද්ධිය කෙටියෙන්.
5. සංගීතය හා බුද්ධිය අතර සම්බන්ධය පිළිබඳ අදහස්.
6. බුද්ධි වර්ධනයට සංගීකය විෂය ඉවහල් වන අයුරු.

නිර්ණායක -

| | | |
|---|---|---|
| 1 | ඉදිරිපත් කරනු ලබන කරුණු වල නිවැරදි තාවය | ලකුණු 04 |
| 2 | අදහස් ඉදිරිපත් කිරීමේ පිළිවෙළ/ පැහැදිලි බව | ලකුණු 04 |
| 3. | කථන කුසලතා/ඉදිරිපත් කිරීම | ලකුණු 04 |
| 4 | තර්කානුකූල බව | ලකුණු 04 |
| 5 | සමස්තය | ලකුණු 04 |